# සිත සිරුර සහ නිවණ

හෙවත්

# ධමමසංගණී

පූජ්‍ය වනවාසී

යාගොඩ ධර්මප්‍රභ ස්වාමීන් වහන්සේ විසින්

සම්පාදිතයි.

# සිත සිරුර සහ නිවණ

හෙවත්

# ධම්මසංගණී

අභිධර්ම පාඩම් 41 කින් යුතුය.

වනවාසී පූජ්‍ය
යාගොඩ ධර්මප්‍රභ ස්වාමීන් වහන්සේ විසින්
සම්පාදිතයි.

ආර්. හෙට්ටිආරච්චි මහතා විසින්
ප්‍රකාශිතයි.

මරදානේ මාලිගාකන්ද පාරේ සමයවර්ධන යන්ත්‍රාලයේ
මුද්‍රිතයි.

# පින්පෙත්

මෙම උතුම් විජම් බණපොත් කරණයෙහි මා උනන්දු හා උපකාර කළ ජේ. මදනායක මැතිනිය, සෝමාවතී ඉඹුලාන මැතිනිය, සයිමන් හේව:-විතාරණ මැතිනිය, සුසන්තාද පොන්සේකා මැතිනිය, ඒ. වික්‍රමපාල මැතිනිය, ඩී. ඇස්. ඇතුලත් මුදලි මැතිනිය, බී. ජ්. ප්‍රනාන්දු මැතිනිය මෙ මහත් පිණ සසුන් ලැදි සනාබර සිය හිමියනට උතුම් නිවන් සුව සඳහා වේවායි පතති. දෙස්තර ඕ. ආර් මැඩොන්සා, ඩී. පී. ජ්. ගුණවර්ධන, ජ්. ඇම්. විජේරාම සිය දයාබර පියාණන්ට ශාන්ත නිවන් සුව මෙ පිණෙන් පතති. එහැම සහ මා දයාබර මාහිමි වන්හිමි ගුරුන් දෙගුරුන් හා සිසුන් සොයුරන්ද හැම සත්හුද මෙපිණෙන් උතුම් සුව ලබත්වා!!!

කර්තෘ



මහනුවර උපොෂථ පුෂ්පාරාම විහාරධ්‍යයාධිපති

අතිගරු අමුණුගම

# රාජගුරු ශ්‍රී විපස්සයාභිධාන

ස්‍යාමෝපාලි මහා නිකායේ මහා නායක

මාහිමියන් වහන්සේ

# ධම්මසංගණිය හෙවත් සිත, සිරුර සහ නිවණ

මෙනම් ග්‍රන්ථය ගැන මගේ හැඟීම ඉතාම ප්‍රසන්නය. මෙය සිංහලයට පරිවර්තනය කිරීමෙන් භික්ෂූන් වහන්සේලාටත්, ඉගෙණීම ලබන ශිෂ්‍ය භික්ෂූන්ටත්, බෞද්ධ උපාසක මහතුන්ටත් විපුල ප්‍රයෝජනයක් ලබාගැනීමට අත්‍යන්තෝපකාරීවනු ඒකාන්තයි. අභිධර්මය පිළිබඳ මනා හැඟීමක් "ධම්මසඞ්ගිණි" ප්‍රකරණයෙන් ලබාගැණීමට අත්ථසාලිනියද බැලීම අත්‍යවශ්‍යයි ඒ එම ධර්මග්‍රන්ථයේ අටුවාව-හෙවත් විස්තර කථාව බැවිනි ඊට අනුව වනවාසී යාගොඩ ධර්මප්‍රභ ස්ථවිරයන් වහන්සේ විසින් ඉතා උනන්දුවෙන් සකස්කරගෙණ යනු ලබන මේ සිත, සිරුර සහ නිවණ නැමැති සිංහල අනුවාදය අපි ඉතා පරීක්ෂාවෙන් කියවීමු මේ කෘත්‍යය සම්පූර්ණවූ විට ධර්මකාමීන්ට වටිනා සේවයක් වෙනවාට කිසිම සැකයක් නැත එසේම පිරිවෙන් ශිෂ්‍යයින්ටත් මහඟු සේවයක් වේයයි සිතමු. මෙවැනි කටයුතු සඳහා නිර්ලෝභීව ආධාර කිරීම බෞද්ධාබෞද්ධ සියලුදෙනාගේම යුතුකමකැයි සිතමු විශේෂයෙන් අභිධර්ම පිටකය පිළිබඳ අභිධම්මත්ථ සංග්‍රහයට පමණක් සන්න භාවසන්නලියා ඇතත් සප්ත ප්‍රකරණය පළිබඳව කිසිම ග්‍රන්ථයකට මේ දක්වා මෙවැනි පැහැදිලි භාවයක් කිසිවෙකු විසින් නොලීම කනගාටුවට කාරණයකි. එවැනි අඩුපාඩුවත් යථෝක්ත ධර්මප්‍රභ ස්ථවිරයන් අතින් ඉටුවීමට අපේ අමන්දානන්දයට හේතුවේමැයි එම නිසා මේ ග්‍රන්ථය සෑම භික්ෂුවක් විසින්මත්, සෑම බෞද්ධයෙකු විසින්මත් මනාව පරිශීලනය කොට මෙලොව පරලොව යන උභයාර්ථ සිද්ධිය සාදාගන්නා ලෙස කරුණාවෙන් දන්වමි.

ඒවගත් මෙසේම,

මහනුවර උපෝසිත පුෂ්පාරාම විහාරාධිපති
අමුණුගම රාජගුරු ශ්‍රී විපස්සාභිධාන විහාරවංශික
ස්‍යාමෝපාලි මහා නිකායේ මහානායක
ස්ථවිරපාදයන් වහන්සේ වම්හ.

අමුණුගම ශ්‍රී විපස්සී

# හැඳින්වීම

බුදුරජාණන් වහන්සේ විසින් දේශනා කරන ලද මාතිකාවන් විග්‍රහකරමින් සංගායනා වලදී පිටකයක් වශයෙන් අභිධර්මය සංගෘහීත විය. පසු කාලීන ආචාර්ය වරයන් විසින් අට්ඨකථා ලිවීමෙන් එවා මනා කොට විස්තර කොට ඇති අතර අනුරුද්ධ, බුද්ධදත්ත ආදී විචක්ෂණ මහ තෙරවරුන් විසින් අභිධර්ම පිටකය අලලා "අභිධම්මත්ථ සංගහ, අභිධම්මාවතාර, නාමරූප පරිච්ඡේද ආදී සංග්‍රහ ග්‍රන්ථ රාශියක් ගද්‍යයෙන් හා පද්‍යයෙන් නිපදවා ඇත. එයින් විශිෂ්ටතම සංග්‍රහය වූ "අභිධම්මත්ථ සංගහ" නම් වූ පොතට පාලියෙන් හා සිංහලෙන්ද ලියන ලද විස්තරකතා රාශියක් ප්‍රචලිතව ඇත. එහෙත් අභිධර්මපිටකයේ මූල්ම ග්‍රන්ථයන් වූ "ධම්මසංගණී" ආදී ප්‍රකරණ සයට අට්ඨකථානුසාරයෙන් ලියන ලද කිසිම ග්‍රන්ථයක් මෙතෙක් සිංහල භාෂාවෙන් පලවී ඇති බවක් දක්නට නැත්තේය.

ධම්මසංගණියේ ධර්මපදාර්ථයන් විස්තර කරන අටුවාව "අත්ථසාලිනිය"යි. බුද්ධ ඝෝෂාචාර්යපාදයන් විසින් ලියන ලද මෙම ග්‍රන්ථය අභිධර්ම පිටකය පිළිබඳ පෙරවදනක් මෙන්ම ආදර්ශතලයක්ද බඳුවේ. අත්ථසාලිනිය පරිශීලනය නොකොට අභිධර්ම පදාර්ථයන් මනා ලෙස අවබෝධ කර නොගත හැක්කා සේම, කුශලාකුශල කර්මයන් පිළිබඳ ශාස්ත්‍රීය විනිශ්චයක්ද දැනගත නොහැකිය. එම නිසා අත්ථසාලිනී අනුසාරයෙන් සිංහල භාෂාවෙන් ලියා පල කරන යම් ග්‍රන්ථයක් වේ නම් එය සිංහල බෞද්ධයාට කරන ඉමහත් ශාසනික සේවයක් වනු නියතය.

පූජ්‍ය වනවාසී යාගොඩ ධර්මප්‍රභ ස්ථවිර පාදයන් වහන්සේ විසින් පාඩම් මාලාවක් වශයෙන් සම්පාදනය කර තිබෙන "සිත සිරුර සහ නිවණ හෙවත් ධම්මසංගණී" නමැති ග්‍රන්ථය අත්ථසාලිනිය ඇසුරෙන් අබිදහම්

ඉගැන්වීමට කරන ලද විශිෂ්ට ප්‍රයත්නයකි. මෙය වනාකි හුදෙක් අත්ථසාලිනියේ භාවසන්නයක් නොව, ධම්මසංගණි යේ දහම් මග අටුවා නයින් ක්‍රමානුකූලව තෝරා දෙන සරල පාඨම් මාලාවකි. පාලි අටුවාවේ හුදු ගද්‍යවාක්‍ය වශයෙන් දක්වා තිබෙන විවිධ ධර්‍මපදාර්ථ විග්‍රහයන් මෙහි අංක පිළි වෙළින් යොදා පැහැදිලි ලෙස වින්‍යාසකර තිබීම නිසා අවබෝධයට මෙන් ම මතක තබා ගැනීමට ද පාඨකයාට මහත් පහසුවක් ගෙන දෙන්නේය.

මෙහි 120 සිට 123 තෙක් පිටුවල දක්වා තිබෙන ‘අලෝභ, අද්වේස. අමෝහ’’ යන කුසල මූලයන් පිළිබඳ එහි වින්‍යාසයේ ආකාරය නිසා පාඨකයා ප්‍රබෝධයට පත්කරවයි. එනිසාම පාලි අත්ථසාලිනිය කියවීමෙන් එම දහම් පිළිබඳව නොපෙනෙන දර්ශනයක් මේ පොත කියවීමෙන් පාඨකයාට නිතැතින්ම ඇතිවන බව කිව යුතුය. කර්‍ම හා කර්‍මඵල පිළිබඳව අත්ථසාලිනියේ තරම් ගැඹුර ලෙසද, විඥානුකූල ලෙසද, පරිපූර්ණ ලෙසද, විවරණය කර තිබෙන අන් තැනක් කිසිම ග්‍රන්ථයක ඇත්තේ නැත. එය ඉතා සාවධාන ලෙස ග්‍රන්ථ කර්තෘන් වහන්සේ විසින් මෙහි හෙළ බසින් කියන ආකාරය ඉතා ප්‍රසන්නය.

සෑම අතකින් ම සාර්ථක ග්‍රන්ථයක් වූ ‘‘සිත සිරුර සහ නිවණ හෙවත් ධම්මසංගණිය’’ ගරු ධර්‍මප්‍රභ සප්විර පාදයන් වහන්සේගේ විශිෂ්ට අභිධර්‍මඥානය පිළිබිඹු කරවන්නක් වන අතර සදහටම සිංහල බෞද්ධ ලෝකයාගේ මන දෙළ පුරවන්නක් වන බවද ඒකාන්තය.

ධර්‍මපර්‍යේෂණාලය
මොරටුව.

හැගොඩ ඛේමානන්ද
64.9.20

# විමසුම

සිත කුසල අකුසල අබ්‍යාකත යැයි කොටස් තුනකට බෙදේ. (අව්‍යාකෘත හෙවත් කුසල් අකුසල් වශයෙන් නොකියන ලද්දේ අබ්‍යාකතය.) සිරුර රූපස්කන්ධයයි අබ්‍යාකතය සිතේ ගති සහ සිත වේදනා, සඤ්ඤා, සංඛාර විඤ්ඤාණ කඳුවලට බෙදේ. මෙම පඤ්චස්කන්ධයෙන් මිදුණු නිවණද අබ්‍යාකතය මෙම "ධම්මසංගණී" අභිධර්ම පාඩම් මාලාවට **"සිත, සිරුර සහ නිවණ"** යන අපර නාමයක්, යොදන්නට අදහස් වූයේ අභිධර්මය නම් අපම, තම තමාම, බවත් තමාගෙන්ම මිදීම නිවණ බවත් එහෙයින් කවුරුත් විසිනුත් දතයුතු ධර්මයක් බවත් ඒත්තු ගැන්වීමටය.

අභිධර්මය අභිධර්මය වශයෙන්ම දෙසූ බව බුද්ධකාලයෙහිද එනමින්ම පැවති බව **මහාගෝසිංග** ආදී සූත්‍රාන්තයෙන් ඔප්පුවෙයි. සූත්‍රාන්තයට අටුවා ලියා විස්තර සපයා ඇත්තේ අභිධර්මයෙනි. එහෙයින් අභිධර්මයෙහි පැතුරුණු අවබෝධයක් ලදහොත් බුද්ධමතානුකූලව සූත්‍රාන්තය විස්තර කළ හැකිය. එයින් හැඟී යන්නේ බුදු දහමෙහි විද්‍යානුකූල ශාස්ත්‍රීය කොටස අභිධර්මය බවයි. එ හෙයින් **අභිධර්මය වෛද්‍යශාස්ත්‍රය ලෙසත් සූත්‍රාන්තය වට්ටෝරු වෙදකම-ලෙසත් ආභිධම්මික මහාචාර්ය රේරුකානේ චන්දවිමල මහාස්ථවිර ස්වාමිපාදයන් වහන්සේගේ** නිගමනය අතිශය යුක්තියුක්තය.

**ධම්මසංගණී**

බුදුගොස් මාහිමියන්ම

"අභිධම්මස්ස සඞ්ඝයහ – ධම්මෙම අනවසෙසතො
ඨිතාය තස්සා ආරද්ධා – යා මයා අත්ථවණ්ණනා"

"අත්ථසාලිනී නිගමන ගාථා"

අභිධර්ම පිටකයෙහි කුසලාදී දහම් නිරවශෙෂයෙන් (නො ඉතුරුව) සංග්‍රහණය හෙවත් එක්වගෙණ සිටි ධම්ම සංගණියට මවිසින් යම් අර්ථ වර්ණනාවක් කරණ ලදද? එයින් කියන ලදී. අත්‍ථ යෝජනාවෙහි,

"කුසලාදයො ධම්මා සඞ්ගය්හන්ති එත්‍ථාති ධම්මසඞ්ගණී" කුශලාදී ධර්මයෝ මෙහි සංග්‍රහවෙත්නුයි ධම්ම සඞ්ගණී නම් වේ.

ධම්ම සංගණියෙහි මාතෘකා පාලිය පමණක් වුව මුළු මහත් අභිධර්ම පිටකයම සංග්‍රහකොටගෙණ සිටුනා බව පෙනේ. අභිධර්මය ඉගෙණීමේ පැරණි ක්‍රමය මාතිකා පාලිය කටපාඩම්කොට ස්කන්ධ ධාතු ආයතන සත්‍ය ප්‍රතීත්‍ය සමුත්පාදාදී වශයෙන් බෙදා ඉගෙණීමයි. සිතක් පහළවන සැටි ආදී අවබෝධයෙන් තොරව එසේ කටපාඩම් කිරීමෙන් අභිධර්මය හදාරණ ආධුනිකයා මහත් වෙහෙසකට වැටේ. මෙම මාතෘකා පාලිය වටහාගැණීමට ධම්මසංගණියවත් අවසන් කළ යුතුය. අභිධර්ම පිටකයම හෝ හදාල යුතුය. මේ බව සැලකූ පැරණි අභිධර්මාචාර්යයන් වහන්සේලා මාතෘකා පාලිය ඉගෙණීමට පෙර චිත්ත චෛතසිකාදීන් ඉගෙණීමට අභිධම්මත්‍ථ සංගහ, අභිධම්මාවතාර නාමරූප පරිච්ඡේදාදී පොත් සපයන ලදී. මෙසේ අවබෝධයෙන් තොරව අභිධර්මය ඉගෙණීමද අභිධර්මයක් විය.

ධම්මසංගණියෙහි මාතිකාපාලිය මාතෘකා වශයෙන් අවබොධයට මුල් තැන් දෙමින් ඉගෙණීමේ පාඩම් ක්‍රමයක් සකස්කොට චිත්ත චෛතසිකාදීන් පිළිබඳ දැනීමක් ලැබුණු පසු මාතෘකා පාලිය ස්කන්ධාදීන්ගේ වශයෙන් අවබෝධ- යෙන් කටපාඩම් සිටින ලෙස මෙය සකස්කරණලදී. එය පැරණි ක්‍රමය අස්කිරීමක් නොව සැකසීමක් පමණකි. අභිධර්මය ඉගෙනීමට කැමති සුධීන්ගේ බිය දුරුකිරීමකි. සැම බෞද්ධයෙකුමම අභිධර්මය උගත යුතුය.

මෙම පොතෙහි-"සිත සිරුර සහ නිවණ" අවසන් කොටසෙහි විස්තර කරමු. අත්ථසාලිනී අටුවාව බුද්ධඝොෂ හිමියන්ගේ පළමු පොතයැයි ඇති මතයද විමසමු.

මෙය පැසසීමෙන් **අතිගරු අමුණුගම රාජගුරු සිරි විපස්සනාභිධාන මහා විහාරීය මහා නායක මාහිමියන් වහන්සේ** සහ මෙයට හැඳින්වීමක් ලියා දීමෙන් ආභිධම්මික ශාස්ත්‍ර විශාරද (ඇම්.ඒ.) හෑගොඩ ඛේමානන්ද ස්ථවිරයන් වහන්සේද මෙය පැසසීමෙන් විජම් වියත් සිළුමිණි මැදුරු රේරුකානේ චන්දවිමල නාහිමි ඇතුළු වනවාසී ගරුතර නාහිමිවරුන් වහන්සේ හා ආචාර්යපාදයන් වහන්සේලාද ප්‍රූප් බැලීමෙහි සහායවූ කොහෙල්පන්නල සුගතවංස ස්ථවිරයන් වහන්සේද ධම්මසංගණී අභිධර්ම පන්තිය පැවැත්වීම සඳහා ආරාධනා කළ විශ්‍රාම ලත් සිවිල් නිලධාරි ඩබ්ලිව්. ආර්. ඩී. ඇස්. සේනාරත්න මහත්මා ප්‍රධාන ධර්ම සභාවද මහාබෝධි සංගමය සහ තරුණ බෞද්ධ සංගමයද කෘතවේදීව සිහිකරමි.

සියළු හිමිකම් කර්තෘ සතුය.

මෙයට,

ධර්මප්‍රභ ස්ථවිර

**සිරිසඟබෝ**
විපස්සනා භාවනා මධ්‍යස්ථානය,
කුරුණෑගල පාර,
අනුරාධපුරය.

23-9 64.

# ශුද්ධි පත්‍රය

| පිට | පෙළ | අශුද්ධ | ශුද්ධ |
|---|---|---|---|
| 11 | 9 | සදදයත් | සද්දයක් |
| 11 | 17 | ආගාර | ආහාර |
| 12 | 12 | චිතිජ | තිජ |
| 20 | 18 | ලගිත්වා | ලහිත්ව |
| 27 | 23 | කථමං | කතමං |
| 28 | 2 | සම්මිඤ්ජනානසසවා | සමම්ඤ්ජනානස්සවා |
| 32 | 11 | විප්ථාර | විප්ඵාර |
| 34 | 3 | ගව | හව |
| 34 | 4 | මූතිවට්ටසිං | විතිවට්ටයිං |
| 34 | 9 | අජරාමර සිබීභූතං | අජරාමරං සීතිභූතං |
| 34 | 7 | පඤ්ඤ | පඤ්ඤය |
| 34 | 8 | ලොකො | ලොකෙ |
| 34 | 9 | සුවසසිතං | සුඵසසිතං |
| 34 | 17 | විභාග | විභංග |
| 38 | 12 | අංශගණ | ආයූහණ |
| 38 | 28 | අකණිය අසකක | අකණ්හ අසුකක |
| 38 | 29 | කාය | ක්ඛය |
| 39 | 5 | නානකම්මණීක | නානාක්ඛණීක |
| 40 | 12 | විරුසා | ඵරුසා |
| 40 | 13 | සම්ප්පලාපා | සම්ඵප්පලාප |
| 40 | 18 | තැත් | තැන් |
| 40 | 11 | අකුසලාගි | අකුසලාහි |
| 43 | 20 | විප්ථාර | විප්ඵාර |
| 46 | 3 | සම්ප්ජන | සම්පජාන |
| 46 | 24 | හහුට | ඔහුට |
| 47 | 29 | මිනොඃබාරයෙහි | මනොද්වාරයෙහි |
| 53 | 17 | ද්වරය | ද්වාරය |
| 54 | 2 | සාසන්දනය | සංසන්දනය |
| 54 | 21 | විඤ්ඤතත්හි | විඤ්ඤණනාහි |
| 55 | 9 | සොන | සොත |

| පිට | පෙල | අශුද්ධ | ශුද්ධ |
|---|---|---|---|
| 56 | 15 | දුශ්ශීල්‍යං | දුස්සීල්‍යං |
| 59 | 17 | උපකච්ඡේදක | උපච්ඡේදක |
| 60 | 20 | රූපජ්නෙන්ද්‍රිය | රූපජීවිතින්ද්‍රිය |
| 61 | 21 | මේනම් | වේනම් |
| 62 | 11 | ථෙයිය | ථෙය්‍යය |
| 71 | 12 | විච්ඡා | මිච්ඡා |
| 73 | 3 | සංඛාරා | සංඛාර |
| 73 | 5 | විරූ | එරූ |
| 74 | 8 | පිසුනාවාවනයෙන් | පිසුණාවචනයෙන් |
| 74 | 10 | සම්පප්පලාපයෙන් | සම්ඵප්පලාපයෙන් |
| 87 | 6 | උප්ටඨිත | උපටඨිතා |
| 91 | 3 | මනොායතනං | මනායතනං |
| 92 | 8 | කොටස් තුණෙන් | කොටස් සතරෙන් |
| 92 | 28 | ඇකාරයයි | ආකාරයයි |
| 93 | 9 | අරමුණේ | අරමුණට |
| 97 | 8 | බෝතලයක් | බෝලයක් |
| 192 | 9 | සම්පක්ඛඛන | සම්පකඛඛන |
| 119 | 15 | පච්ඡයො | පච්චයො |
| 118 | 3 | ලබත් | ලබත්වා |
| 120 | 18 | විරුධ | විරුද්ධ |
| 121 | 7 | කාමසුඛල්ලාභී-කානුයොගය | කාමසුඛල්ලිකානුයෝගය |
| 126 | 21 | දරඹුගති | දරදඹුගති |
| 137 | 2 | සමුප්පනනා | සමුප්පන්නා |
| 138 | 20 | යෙදයි | ගෙදෙයි |
| 140 | 6 | මධ්‍යස්ථාභාවය | මධ්‍යස්ථභාවය |
| 141 | 5 | විශේෂය | විශෙෂ |
| 442 | 3 | පණිස | සපණිස් |
| 149 | 16 | සොමනස්සන්ද්‍රිය | සොමනස්සින්ද්‍රිය |
| 150 | 10 | එකොසංඛා-රක්ඛන්ධෙ | එකොසංඛාරක්ඛන්ධො |
| 160 | 9 | සමගිතාවය | සමංගිතාවය |
| 668 | 9 | ධම්මසංඞ්ගිණියේ | ධම්මසඞ්ගණියේ |

| පිට | පෙල | අශුද්ධ | ශුද්ධ |
|---|---|---|---|
| 169 | 19 | සංඝකාරික | සසංකාරික |
| 174 | 14 | ජීවගා | ජීවගං |
| 175 | 23 | ඵස්ස | ඵසස |
| 182 | 4 | ඤාණසම්පයුකත | ඤාණසමපයුතත |
| 182 | 28 | කර්මහල | කර්මඵල |
| 142 | 17 | අතිවන | ඇතිවන |
| 142 | 5 | තත්‍රමජඣතතා | තත්‍රමජඣතතාතං |
| 142 | 26 | ලදී | |
| 144 | 6 | සතින්ද්‍රිය | නමින්ද්‍ර |

තවද අර්ථාවබෝධයට බාධා නොවන සුළු වැරදි යෙදීම් සිදුවී ඇති නමුදු ඉතිරි කාණ්ඩත් මුද්‍රණයවූවිට සම්පූර්ණ ශුද්ධි පත්‍රයක් සහ අකාරාදියක්ද යොදනු කැමැත්තෙමු

# සිත සහ සිරුර

හෙවත්

# ධම්මසංගණී

## අභිධම්ම පාඩම්

## 1

නමො සම්මාසම්බුද්ධස්ස

"කුසලා ධම්මා, අකුසලා ධම්මා, අබ්‍යාකතා ධම්මා"

කුශල ධර්මයෝය, අකුශල ධර්මයෝය, අව්‍යාකෘත ධර්මයෝයයි සම්මා සම්බුද්ධ ඥාණබල මහිමයෙන් ලොව සියල්ලම මෙම පද තුණෙහි එක්තැන් කොට අභිධර්ම දේශනාව ආරම්භ කළ සේක,

කුසල් සිතුත් ඒවායේ යෙදෙන චෛතසිකත්, අකුසල් සිතුත් ඒවායේ යෙදෙන චෙතසිකත් විපාක කිරිය සිත් හා එම චෛසිකත්, රූප හා නිබ්බානයත් යනුවෙන් ලොව සියල්ලත් ලෝකෝත්තර වූ නිවණත්, දතයුතු සියල්ල අවබෝධ කර වදාළා වූ සම්බුදුරජාණන් වහන්සේ මේ මාතෘකාවෙන් වදාළ සේක.

මුළුමහත් අභිධර්ම පිටකයෙහිම පට්ඨානයත් සමගම- සියලු ධර්මයන්ගේ මේ බෙදීම බලපවත්නේය. එහෙයින් මේ බෙදීම පළමුකොට ඇතුළත් කර වදාළ ග්‍රන්ථයට ධම්මසංගණී නාමය යෙදීම අතිශයින්ම ගැළපෙන්නේය.

**ධම්මසංගණී :**

"ධම්ම" ශබ්දයෙන් ගැණෙන්නේ ඉහත කියන ලද කුසල අකුසල අව්‍යාකතයන්ය. සත්ත්ව පුද්ගලාදී හැඟීමක් පැණවීමක් මිස ඒ හැඟීම් පැණවීම් සම්මුතීන් සියල්ලමත් ඉහත සඳහන් වචන තුණෙහිම දක්නා ලබන බැවින් සියලු ධර්මයන් සවභාවයන් "සත්ව" නොවන "ජීව" නොවන ඇති සැටිය පමණක්ම වන හෙයින් ධර්මයෝය. තවද සංගණි යන්නෙන් සංගණනය හෙවත් ගණන් ගැනීම යන තේරුම දෙන හෙයින් කුසලාදී වශයෙන් විභාග කොට ගණන් ගැණීමත් මෙහි බැලූ බැල්මට පෙනෙන්නේය.

එසේම ධර්මයන්ගේ සංග්‍රහයක් එක්තැන් කිරීමක් ද මෙහි දක්නේය. මෙසේ අර්ථ රාශියකින් මේ පොතට ධම්ම සංගණි යන නාමය අන්වර්ථ වන්නේය. අර්ථයට අනුව යන්නේය. අභිධර්ම පිටකයේ පොත් සතෙන් පළමුවන අභිධර්ම පොතද මෙය වන්නේය.

**අභිධර්මය :**

අතිරේක ධර්මයට හෙවත් විශේෂ ධර්මයට අභිධර්මයැයි කියනු ලැබේ. සූත්‍ර විනය ධර්මයන්ට වඩා අතිරේකයක් අභිධර්මයෙහි ඇත, සූත්‍රාන්තයෙහි "එවං මෙසුතං" ආදි වශයෙන් හෝ "වුත්තංහෙතං භගවතා" යනාදීන් හෝ විනයෙහි 'තෙන බෝපන සමයෙන' යනාදීන් නිදානයන් දක්වා ඇත. මෙහි කෙළින්ම කාරණයට බැස ඇත. නිදානයක් එක්කිරීම් මාත්‍රයකින්වත් මෙහි සම්මුතිය කිට්ටුකරගෙණ නැත. එය මෙහි ඇති අතිරේක ලක්ෂණයකි. ගුණයෙකි. විශෙෂයෙකි.

චතුරාර්‍ය්‍ය සත්‍යයෙහි සියල්ල ඇතුළත් කරණ විට කෙබඳු සම්මුතීන්ට බැස සිටියත් අභිධර්මයෙහිම ඇතුළත් වනු දක්නා ලැබේ. තිවන් දැකීම හුදෙක් අභිධර්මය ප්‍රත්‍යක්ෂයෙන් දැකීමයි. අභිධර්මය විමයි. සුත්ත සුත්තානුලොම ආචරිය වාද අත්තනොමත යන සතර ධර්ම විනිශ්චයෙහිදී

සූත්‍ර යනුවෙන් දක්වූයේ අභිධර්මයයි. චතුසච්චසුත්ත යනුවෙන් එය නෙත්තියේ සඳහන් වෙයි. බුදු දහමෙහි සියුම් සාරය අභිධර්මයයි. එහෙයින් මෙය අති විශිෂ්ඨ වූ විශේෂ ධර්මයයි.

සූත්‍ර විනය දෙක රැඳෙනුයේ අභිධර්මය මතය. විනය විනිශ්චයක් හෝ ධර්මවිනිශ්චයක් කරන්නට අභිධර්මයෙහි හසල බුද්ධිමතෙකු විය යුතුය. ආභිධම්මික ගොධදත්ත තෙරුන් වහන්සේගේ කථාවෙන්ද එය ඔප්පු වන්නේය. විනයෙහි ඇවැත්වලට පැමිණි බව හෝ නොපැමිණි බව විනිශ්චයෙහි "කිංචිත්තො ත්වං භික්ඛු" භික්ෂුව ඔබ කිනම් සිතකින් ඒසුවා දැයි ඇවැත් පැමිණි වේලෙහි ඔහුගේ සිත ගැන විමසිය යුතුය. ඒ ඒ අවස්ථාවෙහි පහළවන සිත් හා ඒවායේ අවශ්‍යයෙන් යෙදෙන චෛතසික අනුව විනිශ්චයක් දිය යුතුය.

"සොමනස්ස සහගතං ඤාණසම්පයුත්තං" යනාදීන් සිත් උදුරා දක්වීමට මෙම ධම්මසංගණී ප්‍රකරණයෙන් හැර අනිකකින් නොහැක. කම්මන්තරය විපාකන්තරය දැන කුශලාකුශල කර්ම හැඳින නිසැක බෞද්ධයෙක්ව ගත කිරීමට සෑම බෞද්ධයෙකු විසින්ම අභිධර්මය දත යුතුය සියලු සංස්කාරයන්ගේ යථාභූත තත්ත්වය දැන නිවන් ලබා ගැණීමටද අභිධර්මය උගත යුතුය.

**කුසල :**

අසනීපයක් සෑදී සුව වුණාම "දැන් හොඳ" යැයි' ව්‍යවහාර කරයි. මේ "හොඳ" යන තේරුම උඹද "කුසල' ශබ්දය යෙදී තිබේ. මෙහි වනාහි කෙලෙස් රෝග සුවවීම කුසල් සිත් වලිනි. එහෙයින් එම හොඳ සිත් වලට කුසල් යැයි කියනු ලැබේ.

නිවැරදි හැසිරීමක් ඇති තැනැත්තාට "හොඳ" එක් කෙනායයි කියනු ලැබේ. මේ "හොඳ" හෙවත් නිවැරදි යන තේරුම උඹද කුසල්යැයි කියනු ලැබේ. නිවැරදි හැසිරීම නම් කුසල් සිතින් කරණ හැසිරීමයි.

දියුණු වී පොහොසත් වී සැප විඳින කෙනෙකු දැක් මෙන් "එයාට දැන් හොඳ" යැයි කියනු ලැබේ. ඔහු සැප විපාක විඳින අවස්ථාව හෙයින් ඒ "හොඳ" නම් සැප විපාකය. මේ සැප විපාකවලට ද කුසල ශබ්දය යෙදී තිබේ. ඒ සැප විපාක නම් කුසල විපාකයෝය.

තවද නපුරු පාපයන් සොලවා හරින කම්පා කරණ විධ්වංශනය කරණ සිත් කුසල්ය.

"කුච්ඡිතෙ පාපකෙ ධම්මෙ සලයන්නාති චලයන්ති කම්පෙන්ති විද්ධංසෙන්තීති කුසලාති"

අකුසලා :

කුසල් නොවන්නේ අකුසල්ය. සිත කිලිටි කරන අපිරිසිදු කරන ලාමක ධර්ම අකුසල්ය. ඒ අකුසල චෛත සිකය. අකුසල චෛතසික හා එක්ව හටගන්නා සිතුත් අකුසල්ය.

අබ්‍යාකතා :

කුසල් අකුසල් වශයෙන් නොකියන ලද්දේ අබ්‍යාක තය. විපාක, කිරිය සිත් හා චෛතසික රූප නිර්වාණ යන ධර්මයෝය. මුලු මහත් අභිධර්මයෙහිම විස්තර වනුයේ මේ කුසල අකුසල අව්‍යාකෘත ස්වභාවයෝය. එහෙයින් සම්බුද්ධ රජාණන් වහන්සේ කුසලා ධම්මා අකුසලා ධම්මා අබ්‍යා කතා ධම්මා යැයි දෙසීමෙන් මුළු මහත් අභිධර්ම පිටකය හකුළුවා දෙසන ලද්දේ වේ.

කරුණු මෙසේ හෙයින් ශ්‍රද්ධා භක්තිය උපදවා අභි ධර්මය ඉගෙණීමෙන් ඇසීමෙන් සිතීමෙන් ශාන්ත වූ නිවන් සැප ලබා ගැණීමට උත්සාහ කරත්වා.

---

න කුසලා අකුසලා:- කුසලයට විරුද්ධ වූයේ අකු සල්ය. විපාක කිරිය සිත්ද කුසල් "නොවන්නේ" අකුසල් යැයි අකුසල් ගොඩට වැටෙන හෙයිනි. කර්මායුහණය විපාක කිරියයන් ගෙන් නොකෙරෙන හෙයින් මෙහි ඒවා නොගැණේ.

# 2

## නමො සම්මාසම්බුද්ධස්ස

"කතමෙ ධම්මා කුසලා"

කුසල් දහම් කවරහුද?

"යස්මිං සමයෙ කාමාවචරං කුසලං චිත්තං උප්පන්නං හොති. සොමනස්ස සහගතං, ඤාණ සම්පයුත්තං"

යම් වේලාවක සොම්නස හා එකතු වූ නුවණ හා මනාව යෙදුණු කාමාවචර කුසල් සිතක් උපන්නේ වේද?

"කුසලා ධම්මා" යනුවෙන් තබන ලද මාතෘකාව මෙසේ විස්තර කර වදාළ සේක.

මෙම දහම් පාඩම් අභිධර්මය කටපාඩමින් ඉගෙණීමේ අවස්ථාවක් නැති පින්වතුන් සඳහා අවබෝධයට මුල්තැන දී සකස් කරණු ලැබේ. එහෙයින් මාතෘකාපාලිය දිගට නොදක්වා විස්තරයක් සමග දක්වනු ලැබේ.

කුසල් දහම් කවරහුද?

ප්‍රශ්න කිරීම නොදත් දෙය දැන ගැණීමටද, දත්දෙය සැසඳීමට ද (එක්කර බැලීම) විමති දුරුකිරීමටද අනුමත කිරීමට හෝ කියා දීමට ද කරණු ලැබේ. මුලින් කියන ලද තුන් ආකාරයේ ප්‍රශ්න කිරීමක් බුදුවරුන්ගේ නැත. මෙහි දී කියාදීමට ප්‍රශ්න කරණ ලදී.

**යම් වේලාවක :**

කුසල් සිතක් පහළවීමට වුවමනාකරන උපකාරක ධර්මයන්ගේ එක්වීම නැමති කාලයද, තිරසෙහි ඍපක් කාලය ආදී පින්දහම් කිරීමට සුදුසු

අටවැදෑරුම් නපුරු කාලයන්ගෙන් වෙන් වූ නව වැනි වූ ක්‍ෂණ සම්පත්තියද, සුදුසු පළාතක වාසය සත් පුරුෂ ආශ්‍රය, තමා මනා පිළිවෙතක යොදවා ගැණීම හෙවත් හොඳ අතේ සැවෙන ජීවිතය, පෙරපිත් ඇතිබව යන සතර කරුණුද එක්වීමෙන් කුසල් උපදී.

ස්වභාවයෙන් නැති එහෙත් අතීත කාලය ආදී පැණ වීමද ඵස්ස වේදනාදී ධර්මයන්ගේ එක්වීමද, හේතුන් හෙවත් ඇසට රූපයක් හමුවීමේදී චක්ඛුප්පසාදය, රූප රූපය, ආලෝකය, මනසිකාරය ආදියද චක්ඛුද්වාරික කුසල් සිතක් පහළවීමේ කාලය පමුණුවන බව සැලකිය යුතුය.

පට්ඨානයෙහි කුසලො කුසලස්ස, අකුසලො කුසලස්ස, අබ්‍යාකතො කුසලස්ස යනුවෙන් කුසල් අකුසල් අබ්‍යාක තයන් විපාක පච්ඡාජාත ප්‍රත්‍යශක්තීන් හැර ඉතිරි දෙ විසි ප්‍රත්‍යශක්තීන්ගෙන් කුසලයක් හටගැණීමට උපකාර වන බව දක්වන ලදී. එම දෙවිසි ප්‍රත්‍ය ශක්තීන්ගෙන් යම් කිසි ප්‍රත්‍ය ශක්තියක් ප්‍රකටව ලැබීමට ද මෙසේ කරුණු රැසක යෙදීමෙන් කුසල් සිතක් පහලවන වේලාව දත යුතුය.

මෙසේ යම් වේලාවක කියා දැක්වීමෙන් බුද්ධ ධර්මය ඒක කාරණ වාදය බැහැර කරමින් ඒ ඒ හේතුන් නිසා ඵලයන්ගේ පහළවීම දැක්විමෙන් මවත්නෙකු විශ්වාස කිරීමද අහේතු අප්‍රත්‍ය වාදයද ප්‍රතික්‍ෂෙප කරයි.

සිතක් ඇතිව බිදීයාමට ගතවන්නේ ඉතා සුළුකාල යකි. උපමාවකින් පවා දැක්වීම අපහසුය. එබඳු සුළු කාල යකදී ඇතිව බිඳෙන කුසල් සිතෙක තවත් කුසල් දහම් යෙදෙන බව දැක්වීමට යම් වේලාවක කාමාවචර කුසල් සිතක් පහළ වේදැයි බැලිය යුතු.

**කාමාවචර :**

යටින් අවීචියත්, උඩින් පරනිම්මිත වසවත්ති දෙව් ලොවත් අතර කාම භවයයි.

සැකෙවින් කාමයෝ දෙකෙකි. වත්ථුකාමය, කිලෙස කාමය කියායය. කිලෙස කාමය අර්ථවශයෙන් ඡන්දරාග යයි. ලෝභයයි. තෘෂ්ණාවයි. කැමති වන්නා ලෝභයයි. එහෙයින් "කාමෙතීති කාමො" කැමති වේනුයි කාම නම් වේ.

වත්ථු කාමය නම් රූපාදී සියල්ල ඇතුළත් තුන් භූමි යයි. එහෙයින් "වත්ථුකාමො තෙ භූමක වට්ටං" යනුවෙන් ධම්මසංගණී අටුවාවේ කියන ලදී. ඡන්දරාගය ඇත්තහු විසින් කැමතිවන ලද දෙය භවයයි. එහෙයින් "කාමියතීති කාමො" කැමති වන ලද්දේ කාම නම් වේ.

මෙයින් ත්‍රිවිධ භවයම ගන්නා ලදී මෙම දෙවැදෑරුම් කාමයෙහි පැමිණීම් පැවතීම් වශයෙන් හැසිරේනුයි කාමාවචර නම් වේ. සතර අපාය මිනිස් ලොව සදෙව් ලොව වත්ථුකාමයන්හි ඉපදීම් වශයෙන් හැසිරීම් පැවතීම් වශයෙන් කැමතිවීම කිලෙස කාමයෙන් සිදුවේ. රූප අරූප ලෝකයන්හිද කාම සිත් පහළ වතුදු ඉපදීම් වශයෙන් ඉහත සඳහන් එකොළොස් භූමියට පැමිණෙන සිත් කාමාවචරය.

**කුසල් සිතක්:**

කුසල් යන්න පසුගිය පත්‍රිකාවේ බලන්න අරමුණු සිතන්නේ දැනගන්නේ සිතයි සිත්වැල නොකැඩී දිගට සන්තානයපැවැත්ම ඇතිකරන්නේ සිතයි. කර්ම ක්ලෙශ යන් රැස්කෙළේ නුයි විපාක සිත් ගැණේ.

**උපන්නේ වේද.**

තිබුණ සිත බිඳී යැමෙන් අනන්තර සමනන්තරාදී ප්‍රත්‍යශක්ති ලැබ උපන්නේ නම් වේ. මෙහිදී උප්පාද, ඨිති භංග යන "ක්ෂණ" තුණට පත්ව පවත්නේ උපන්නේ නම්, එනම් වර්තමාන සිතයි.

**සොම්නස හා එකතු වූ**

ප්‍රිය මිහිර විඳීම නම් වූ සොම්නස හා එකවර උපන් නා වූ යන තේරුමයි. සොම්නස් සහගත යන මෙයින් එකවර උපන් යන තේරුම ගතයුතු වුවද රූපය නාමය හා එකවර හටගත් තරමින් සහගතවූයේ නොවේ. නාමය නාමය හා එකවර ඉපදීමෙන් සහගත වේ. සම්ප්‍රයුක්ත ප්‍රත්‍යශක්තිය නාම ධර්ම නාම ධර්මවලට පමණකි. නාමධර්ම රූප ධර්මවලට විප්‍රයුක්ත ප්‍රත්‍ය ශක්තිය දෙයි. මෙහි සම්ප්‍රයුක්ත ප්‍රත්‍යශක්තිය ලබන ලද්දේ සහගත නම් වේ. නුවණින් මනාව යෙදුනු.

එක්ව ඉපදීම, නිරුද්ධවීම. එක වස්තුවක්ම ඇසුරු කිරීම, එකම අරමුණක් ගැණීම සම්ප්‍රයෝග ලක්‍ෂණය. එහෙත් අරූපී බඹලොව ඒක වත්ථුක නොවන්නේ එහි රූපයක් නැති නිසාය.

මෙහි යෙදෙන ඥාණය නම් කම්මස්සක ඥාණය හා විදර්ශනා ඥානයයි. අනිත් ආගම්වල සම්මා දිට්ඨිකයන් කර්මය ස්වකීය කොට අදහන සම්මාදිට්ඨිකයන් ඇති විය හැකිසි.

"බාහිරකො කම්මවාදී කම්මස්සක දිට්ඨියා සම්මාට්ඨි හොති" අනිත් ආගමික කර්මවාදියා කම්මස්සක දිට්ඨියෙන් සම්මාදිට්ඨි වූයේ වේ. (සම්මාදිට්ඨි සුත්ත වණ්ණනා) ශාසනිකයා හෙවත් බෞද්ධයාට කම්මස්සක සම්මාදිට්ඨියෙන් හා විදර්ශනා සම්මාදිට්ඨියෙන්ද යුක්ත විය හැකිය.

**මෙපමණකින්.**

සොමනස්ස සහගත "තිහෙතුක" ඥාණසම්ප්‍රයුත්ත අසංඛාරික මහා කුසල් සිත ගන්නා ලදී.

මෙහි 1 සොමනස්ස සහගත වීම

2 ඥාණ සම්ප්‍රයුත්ත වීම

3 අසංඛාරික වීම යන අංග තුණක් දක්නා ලැබේ තුන් වැනි අසංඛාරික වීමේ හේතුවක් නොදක්වන ලදී. එහෙත් මෙම ධම්ම සංගණියෙහි දෙවනි සිත දක්වන තැන,

"සොමනස්ස සහගතං ඤාණසම්පයුත්තං සසංඛාරෙන" සසංඛාරෙන යන්නෙන් සසංඛාරික බව ගන්නා ලද හෙයින් මෙහි සඳහන් වන පළමු සිත අසංඛාරිකය.

දැන් කාමාවචර කුසල් අටම ගත හැකිය.

1 සොමනස්ස සහගත ඤාණ සම්පයුත්ත අසංඛාරිකය
2 ,, ,, ,, ,, සසංඛාරික ය.
3 ,, ,, ,‘ විප්පයුත්ත අසංඛාරිකය.
4 ,, ,, ,, ,, සසංඛාරික ය.

මෙහි සොමනස්ස සහගත වෙනුවට උපෙක්ඛා සහගත යොදා දැන් කාමාවචර කුසල් 8 සාදා ගන්න.

මෙහි වචන සයක් එක් වී සිත් අටක් සැදෙන හැටි කල්පනාවෙන් බලා වටහා ගන්න.

විසුද්ධිමග්ග, අභිධම්මාවතාරය, අභිධම්මත්ථ සංගහ යන පොත් වල මෙසේ මෙසිත් සිත් උදුරා දක්වා ඇත.

---

ධම්ම සංගණී පෙළෙහි පළමුවන සිත දක්වූ තැන අසංඛාරෙන යනුවෙන් යොදා නැත. එහෙත් දෙවෙනි සිත සංසංඛාරෙන, යි දක්වූ හෙයින් හෙයින් පළමු සිත ඉබේටම අසංඛාරනැයි ගත යුතු බව සැලකිය යුතුයි.

# 3

## නමෝ සම්මාසම්බුද්ධස්ස

"රූපාරම්මණං වා, සද්දාරම්මණං වා, ගන්ධාරම්මණං වා, රසාරම්මණංවා ඵොට්ඨබ්බා රම්මණං වා, ධම්මාරම්මණං වා, යං යං වා පනාරබ්භ"

**"රූපාරම්මණං වා"** රූපයක් අරමුණු කොට හෝ කුසල් සිතක් පහළ වේ. මෙහි රූපාරම්මණය මේ වර්ණ රූපයයි. සෑම රූප කලාපයක (ගොඩක) ම පැහැයක් ද ඇති වේ. එයද රූප කලාපයෙන් එක් කොටසකි.

පඨවි, ආපෝ, තේජෝ, වායෝ, වණ්ණ, ගන්ධ, රස, ඕජා යන අට අඩුම රූප කලාපයයි. කර්මයෙන්, සිතෙන් ශීත උෂ්ණ ආදී සෘතු ගුණයෙන්, ආහාරයෙන් යන සතර ආකාරයෙන් රූප කලාප හටගැණෙති. එහෙයින් මෙකී යන රූපාරම්මණය චතු සමුට්ඨානිකය.

දැකීමට සුදුසු. හෙවත් ප්‍රකාශ වීමට ද රූප ශබ්දය යෙදේ. එහෙයින් මෙහි ප්‍රකාශවීම ලක්ෂණ වූයේ රූපයයි. සියලු රූපයන්ට පොදු වෙනස්වීම් ලක්ෂණය ද වේ. රූප රූපයට පුද්ගලික ලක්ෂණය ප්‍රකාශ වීමයි. මෙසේ චතු සමුට්ඨානික වූ අතීත අනාගත වර්තමාන වූ රූපයම රූප, රම්මණයයි දත යුතුය.

මෙසේ මෙහිදි අරමුණු උපකාර කරගෙණ අරූප ධර්ම හෙවත් සිත් දක්වන ලදී "චක්ඛු සම්ඵස්ස" "චක්ඛු විඤ්ඤාණ" ආදි තැන්වල ඇස ඇසුරු කොට හටගත් ඵස්සය, ඇස ඇසුරු කොට හටගත් සිතය සනාදීක් ඔස්තූත් දක්ඛං අරූප ධර්ම දක්වනා ලදී.

"චක්ඛුංච පටිච්චරූපෙචුප්පජ්ජති චක්ඛු විඤ්ඤාණං" ඇසද රූපයද නිසා චක්ඛු විඤ්ඤාණ සිත උපදී යනාදී තන්හි වස්තුවත් අරමුණත් දෙකම දක්වා අරූප ධර්ම දක්වන ලදී.

"අවිජ්ජා පච්චයා භික්ඛවෙ සංඛාරා" යනාදී තන්හි කිසිවක උපකාරයක් නැතිව කෙළින්ම අරූප ධර්ම දක්වන ලදී.

"සද්දාරම්මණං වා"

සද්දයක් අරමුණු කොට හෝ කුසල් සිතක් පහළ වේ.

සිතෙන් සිතා ක්‍රියා කිරීමෙන්ද සද්ද හට ගැණේ. ගින්නෙන් සුළඟින්ද මෙසේ සෘතුවෙන්ද සද්ද හටගැණේ. එසේම අතීත වූ ද, වර්තමාන වූ ද ශබ්දය අරමුණු කොට සිත් හට ගැණේ.

"ගන්ධාරම්මණං වා"

ගඳක් අරමුණු කොට හෝ කුසල් සිතක් පහළ වේ.

ගඳ යනුවෙන් සුගඳ දුගඳ දෙකම ගැණේ. එය වනාහි "කම්ම" "චිත්ත" "උතු" "ආහාර" යන සතරෙන්ම හට ගැණේ. එසේ ම අතීත වූ ද, වර්තමාන වූ ද, අනාගත වූ ද, ගන්ධය අරමුණු කොට සිත් හට ගැණේ.

"රසාරම්මණං වා"

රසය අරමුණු කොට හෝ කුසල් සිතක් පහළ වේ.

මධුර වූ හෝ අමධුර වූ රසයක් මෙහි ගැණේ. එද චතුසමුට්ඨානික වූ අතීතාදි කාලත්‍රයෙන් එකකට අයිති විය හැකිය.

"ඵොට්ඨබ්බාරම්මණං වා"

හැපීමක් අරමුණු කොට හෝ කුසල් සිතක් පහළ වේ

හැපීමක් පවත්නේ "පඨවි" "තේජෝ" "වායෝ" යන රූපස්කන්ධය. මේ ධාතූණම වෙන්ව පහළ නොවන නිසා

ඵොට්ඨබ්බාරම්මණය නම් මේ තුනෙහිම ඇති හැපීමයි. මෙයද චතුසමුට්ඨානිකය, එසේම අතීත, අනාගත, වර්තමාන ඵොට්ඨබ්බය අරමුණු කොටම සිත් පහළ වේ.

"ධම්මාරම්මණං වා"

ධම්මාරම්මණයක් අරමුණු කොට හෝ කුසල් සිතක් පහළ වේ.

මෙහි ධම්ම ශබ්දයෙන් ගැණෙන්නේ කලින් කියන ලද අරමුණු හැර ඉතිරි සියලු නාම රූප නිබ්බාන සවභාවයන්ය එහි කම්මජ වසයෙන් හා උතුජ වසයෙන් හට ගන්නා එකජ රූපද කම්මජ හා චිත්තජ උතුජ හා චිත්තජ වසයෙන් ලැබෙන ද්විජ රූපද කම්ම චිත්ත උතු වශයෙන් ලැබෙන බ්‍රහ්මයන්ගේ ත්‍රිජ රූපද චතුජ රූපද මේ එක විධියකින්වත් නැති අතීතානාගත වර්තමාන චිත්ත චෛතසික හා කසිණ නිමිති ආදී පඤ්ඤත්ති අරමුණුද නිවණද ධම්මාරම්මණය.

මෙසේ පසාද රූප සුඛුම රූප චිත්ත චෛතසික නිබ්බාණ පඤ්ඤත්ති යන වශයෙන් සවැදෑරුම් ධම්මාරම්මණයන් අරමුණු කොටද සිත් පහළ වේ.

ඉදිරියට (හමුවට) නොපැමිණි රූපාදී අරමුණු ධම්මාරම්මණයැයි ඇතැම් අයගේ මතයකි එහෙත් චක්ඛු ද්වාරික සිත් අනිත් දොරටුවෙක අරමුණු නොගනී. ඒ බව "න අඤ්ඤ මඤ්ඤස්ස ගොචර විසයං පච්චනු භොන්තානං" යනුවෙන් එක දොරටුවෙක සිත් අනිත් දොරටුවෙක අරමුණු නොගන්නා බව දක්වා තිබේ. එසේම දිබ්බ චක්ඛු ඤාණාදියට ඉදිරියට නො පැමිණි රූපාදී අරමුණු ගණු ලැබේ. එසේම අතීතාදී අරමුණු ද ගණු ලැබේ. ඒවා ධම්මාරම්මණ නොවේ.

"දොරටු දෙකකට"

මේ එක අරමුණක් දොරටු දෙකකට ඉදිරිපත් වෙයි. එනම් රූපාරම්මණය, චක්ඛුප්පසාදයෙහි ගැටීමෙක්

මනොද්වාරයෙහිද ඉදිරිපත් වේ. භවංග චලනයට හේතුවේ. කුරුල්ලෙක් අත්තක වසත විට අත්තක වැසීමත් ඡායාව බිම වැදීමත් එක විට සිදු වේ. මෙහි භවංගය සෙලවීමට සිදීමට, භවංගය ගණිමින් තිබුණ අරමුණ වෙනස්වීමට අනික් අරමුණකට සිත මාරුවීමට අවශ්‍ය හෙයින් ඒ අර මුණ චක්ඛුප්පසාදයේ මාර්ගයෙන් එළඹ සිටීම ගතයුතුය.

මෙසේ භවංගය සිදී චක්ඛු විඤ්ඤාණ සම්පටිච්ඡන සංතීරණ වොත්ථපන සිත් ඉපදී ඒ රූපාදි අරමුණක් ගෙණ මේ මහා කුසල් සිත උපදී.

"මනොද්වාරයෙහි"

සුද්ධ මනොද්වාරයෙහි පසාද රූප හා ගැටීමක් නැත, කලින් දකින ලද, අසන ලද, සිඹින ලද, රස බලන ලද. හැපීම ලද මෙම අරමුණු මනොද්වාරයට වැටෙයි. එවිට භවංග චලන භවංග උපච්ඡේදයන් බිඳී මනොද්වාරාවජ් ජන සිත ඇතිව බිඳී මේ මහා කුසල් සිත ලැබේ.

පෙර චෛත්‍ය වන්දනා කිරීම්, බණ ඇසීම්, මල් සුවඳ පිදීම් ආදී වශයෙන් කරණ ලද පින්කම සිහි කිරීමේදී ඒ චෛත්‍ය දැකීම් ආකාරයෙන් බණ ඇසීම් ආකාරයෙන් මෙසේ මනොද්වාරයෙහි කුසල් සිත් උපදින අයුරු සිතා ගත යුතුය.

කෙණෙකු කළ කුසලයක් අසා අනුමෝදන් වීමේදී ඒ කුසලය කරනු දකින්නා මෙන් වැටහි මනොද්වාරයෙහි අනුමෝදන් කුසල් සිත් හට ගනී.

මෙසේ එක එක අරමුණ ගෙණ උපදනා ජවන් සිත් දෙරටු දෙකක වීපි දෙකක පහළ වන බව දැන කුසල් පුරා නිවන් සැප පතා ගත යුතුය.

# 4

## නමො සම්මාසම්බුද්ධස්ස

### කුසල් සිතක් වන හැටි හා ප්‍රභෙද

රූපයක් අරමුණු කොට පළමු මහා කුසල් සිත පහළ වන සැටි දැක්විණ. රූපය නම් මෙහි නිල්, රත්, රන්, සුදු, ආදි පැහැය ඇති මල් පහන් රෙදි අඟර ආදී සුබ නිමිත් තක් වූ ඉෂ්ඨාරම්මණයකි. ඉෂ්ඨාරම්මණයෙහි ලෝබය ඇති වන හෙයින් මෙය කුසල් සිතක් වන්නේ කෙසේද?

"නියමිත වශයෙන්, පරිනාමිත වශයෙන්, සමුදාචාර වශයෙන් ආභුජ්ජිත වශයෙනි

මේ සතර ආකාරයකින් කුශලයක් යයි නිගමනය වන බව දක්වා තිබේ. එනම්:

1 නියමිත වශයෙන්-මම මේ කරන්නේ කුසලයක් යයි කුසල් කරන තැනැත්තාගේ නියම කරගැණීමක් ඇති හෙයින් ඔහුගේ සිත නියම කර ගැණීම් වශයෙන් කුසලයකි

2 පරිනාමිත (පෙරලීම්) වශයෙන් - අකුසල් පැත්තෙන් වලකා කුසල් පැත්තට සිත පෙරලීම්, පැමිණවීම් වශ යෙන්ද මේ කුසලයකි.

3 සමුදාචාර වශයෙන්- ඔහුගේ සිත නිතර කුසල් කිරී මෙහි යෙදෙන හෙයින් වැඩිපුර කුසලයන්හි යෙදෙන හෙයින් වැඩිපුර හැසිරීම් වශයෙන්ද කුසලයකි

4 බලාපොරොත්තුවීම් වශයෙන්- ඔහුගේ අදහස කුසල යක් කර ගැණීමට ය ප්‍රතිරූප (සුදුසු) දෙශයක වාසය කිරීම ආදී කරුණුවලින් උපනිශ්‍රය, ශක්තිය ලැබ නුව ණින් කල්පනා කිරීම් වශයෙන් මේ කුසලයක්ය.

ඉෂ්ඨාරම්මණයෙහි ලෝභය ඇති වේ. ලෝභය දැඩිව ඇතිවූයේ නම් දීමක් කළ නොහැකිය. ලෝභ සහගත අකුසල් සිත් පහළ වේ. එහෙත් මෙහි ලෝභය යටපත් වෙයි. අලෝභය මතුවී ක්‍රියාකාරී වී සිටියි. ලෝභය යටින් සිට හෙවත් සන්තානයෙහි අනුශය වශයෙන් පවත්නේ මෙය කුසලයක්වීමට උපකාර කෙරේ. මක්නිසාද යත්, ලෝභය සම්පූර්ණයෙන් නැති සන්තානයක කුසල් අකුසල් පහළ නොවන හෙයිනි.

මෙහි පින් කරමියි කලින් කරගත් නියමයත් පින් අතට සිත යැවීමක් නිතර පින් කිරීමත් මෙය කුසල් සිතක් යයි කීමට තිබෙන බාහිර කරුණුය. ඒවා ප්‍රබල සාධකද නොවේ. මක්නිසාද යත්, පින්ම කරමියි නියම කරගත්තේ ඒ අතට සිත ගියත් නිතර පින් කළත් අකුසල් සිත්ද ඇතිවිය හැකිය.

සතර වැනි වූ සුදුසු කරුණු හෙවත් උපනිශ්‍රය ශක්තීන් ලැබ නුවණ ද යොදා ගැනීම පින්කමක් වීමේ මූලික මෙන්ම ප්‍රධාන හේතුව වශයෙන් ද ගත යුතුය. මක්නිසාද යත්, නුවණ යෙදෙන කුසලය ත්‍රි හේතුක කුසලයක් වීමත් එහි අලෝභ, අද්වේෂ හේතු ඒකාන්තයෙන් යෙදීමත් සිදුවන හෙයිනි.

**සෝමනස්ස සහගතවීම.**

ඉෂ්ඨාරම්මණයක් වීම සොම්නස් සහගතවීමට හේතුය. මෙසේ අරමුණ සොම්නසට, දොම්නසට, උපෙක්ෂාවට, ප්‍රධාන කාරණය වේ.

එසේ: (1.) පිරිසිදු ශ්‍රද්ධාවක් ඇතිවීමද, (2) දියුණු නුවණක් ඇතිවීමද, (3) අනුසස් දක්නා බවද යන කරුණු තුණද සොම්නස් ඇති වීමට හේතුය.

තව්ද පීති සම්බොජ්ඣංගය ඇති වීමට කරුණු එකො ළොසක් දක්වා තිබේ. එනම්: බුද්ධානුස්සති,- ධම්ම- සංඝ- සීල- චාග- දෙවතා- උපසමානුස්සති යන භාවනාවන් වැඩීම නිසා විශෙෂයෙන් ප්‍රීතිය වැඩේවේ.

කටුක පුද්ගලයන් දුරුකිරීම සෞම්‍ය පුද්ගලයන් සේවනය කිරීම, පැහැදීම ඇතිවන බණ ඇසීම, ප්‍රීතිවීමේ කැමැත්ත යන කරුණු එකොළොස, සිත සොම්නස්වීමට හේතුය. නරක් නොවූ හොඳ හිතක් ඇති බව "සුමනස්ස භාවො සොමනස්සං" යනුවෙන් දක්වා තිබේ.

**ඤාණසම්පයුත්තවීම:**

1 කරන කටයුතුවල වශයෙන්ද සිතෙහි නුවණ යෙදේ. දහම් දෙසීම්, නිවැරදි ශිල්ප ශාස්ත්‍ර ඉගැන්වීම් ධර්ම කථිකයන්ට සත්කාර කිරීම් මතු නුවණ ඇතිවේවායි පතා දන්දීම් ආදී නොයෙක් පින්කම් කිරීම නිසා කුසල් සිත් උපදින ඔහුට "කම්මස්සකතා" නුවණ යෙදේ.

2 දුක් අඩු ලොවක ඉපදීම, දෙව් මිනිස් දෙගතිය ඉපැදීම සුඛ බහුල තන්හි උපදින අයට සිහිය ඉපැදීම කලාතුරෙකින් නමුදු ඔවුහු ඉක්මණින් විශෙෂ නුවණ උපදවත් එහෙයින් උත්පත්ති වශයෙන්ද ඤාණසම්ප යුක්ත වීමට හේතුය

3 ඉන්ද්‍රියන් මේරීම හෙවත් ඇස්, කන්, නාසාදී ඉඳුරන් ගෙන් නා නා අරමුණු ගෙන තැලී පොඩිවී තැන්පත් වුණු එහෙයින් ලොව යමක් නිඃම ලෙස සිතන්නට පුළුවන් වයසට හෙවත් ප්‍රඥා දසකයට පැමිණීම ද කුසලය නුවණින් යුක්තවීමට හේතුය.

4 කෙලෙසුන්ගෙන් දුරුව සීලාදී ගුණදම් රැකීම ධ්‍යාන ඉපදවීමෙන් කෙලෙස් විෂ්කම්භණය කිරීමද නුවණ ඇතිවීමේ හේතුය.

''යොගාවෙ ජායතෙභූරි'' භාවනා කිරීමෙන් නුවණ වැඩේ යයි වදාළේ එහෙයිනි. තවද කරුණු හතක් නුවණ දියුණුවීමට හේතුය.

1 පිළිවිසීම හෙවත් නැවත නැවත ඇසීම.
2 පිරිසිදු බව හෙවත් ඇතුලත පිටස්තර පිරිසිදු බව.
3 ඉන්ද්‍රියන් සම බව හෙවත් ශ්‍රද්ධා ආදි ඉදුරන් සම බව.
4 නුවණ නැති අය දුරු කිරීම.
5 නුවණ ඇති අය ඇසුරු කිරීම.
6 ගැඹුරු දහම් විමසීම.
7 නුවණ දියුණු කිරීමෙහි ඇලීම.

මෙම කරුණු අසා දියුණුවන නුවණ ඇති පුද්ගලයාට ඇතිවන කුසල් සිත්හි නුවණ යෙදේ.

**අසංඛාරං:**

සකස් කිරීමක් හැඩගැස්වීමක් නැතිව උපන් හෙයින් මේ කුසල්සිත අසංඛාර නම් වේ.

**ත්‍රිවිධ නියමය:**

මේ කුසල් සිත දානමය, ශීලමය හෝ භාවනාමය වේ. මල් සිවුරු ආහාර ආදිය යමක් පුදන විට එහි වර්ණය අරමුණු වේ. මෙසේ වර්ණය අරමුණු කොට දාන-මය කුසල් සිතක් පහළ වේ.

මල් පිදීම අපේ පරම්පරාවේ ස්වභාවයක්, ධර්මයක්, චාරිත්‍රයක්, හැටියට යුතුකමක් හැටියට කිරීමෙන් එය ශීලමය කුසල් සිතක් වේ. මල් ආදි යමක් පුදා එය අනිත්‍ය වශයෙන් මෙනෙහි කිරීමේදී භාවනාමය කුසලයක් ලැබේ. මෙහි වර්ණයෙක් අරමුණු වීමෙන් දාන මය කුසලයක් කරද්දී එය ශීලමයය, භාවනාමය, කුසල යක් බවටද පත්විය හැකිබව උගත යුතුය. මෙහි භාවනා නම් විදර්ශනා භාවනාවය. එම දානමය කුසල් සිතෙහි යෙදෙන නුවණ එක්කෝ කම්මස්සකතා ඤාණය විය යුතුය.

නැති නම් සච්චානු ලෝමික ඥාණය විය යුතුය. මේ දෙවැදෑරුම් නුවණින් බෞද්ධයා සම්‍යක් දෘෂ්ටිකයෙක් වන්නේය. අනිත්‍යාදී නුවණ යෙදීමෙන් ඒ දානමය කුසලය භාවනාමය කුසලයක් වන්නේය. ඒ කුසල් සිතත් දාන වස්තුත් ප්‍රතිග්‍රාහකයනුත් විදර්ශනා කිරීමෙන් විදර්ශනා භාවනාමය කුසල් ම ලැබෙන්නේය

**ත්‍රිවිධ කර්මය:**

අත් ආදී කයෙන් කරන දීම කාය කර්ම වූ කුසලයකි. වචනයෙන් දෙමි ආදී වශයෙන්ද අනුන් ලවා දීමද වාක්කර්මය වූ කුසලයකි.

තිබෙන පූජා වස්තුවක් අරමුණු කොට මෙය පුදමියි සිතින් පිදීම මනෝ කර්ම වූ කුසලයකි. විනය ක්‍රමයට වනාහි දෙමියි, කරමියි; වචනයෙන් හෝ කීමෙන් දානමය කුසලයක් වේ. අභිධර්ම ක්‍රමයකට ඇති වස්තුවක් අරභයා දෙමියි සිතින් සිතූ කල් පටන් දානමය කුසල් සිත් පහළ වේ. සිතින් සිතීම පමණක් විනයෙහි ගණන් නො ගැණේ. කය වචනය දෙකින් ක්‍රියා කළ යුතුය. ඒ වනාහි විනය කය වචනය දෙක පිළිබඳ හෙයිනි. එහෙත් අභිධර්මයෙහි හැටියට සිත් කුසල් අකුසල් විය හැකිය.

# 5

## නමො සම්මාසම්බුද්ධස්ස

### දානමය කුසලයක් ශීලමය හා භාවනාමය වන හැටි:

පළමු පාඩම්හි රූපයක් අරමුණු කොට දානමය කුසල් සිතක් කාය කර්ම වාග් කර්ම මනඃ කර්ම වශයෙන් සිදුවන හැටි දක්වන ලදී. එම දානමය කුසලයම ශීලමය භාවනාමය කාය කර්මාදීන්ගේ වශයෙන් ද දක්වන ලදී.

1 දාන ශීල - කාය කර්මයක් වීම.

දන්දීමට සුදුසු ඉට්ඨාරම්මණ වස්තුවක් ලැබී දීම අපේ කුලයෙහි වංශයෙහි පරපුරෙහි ස්වභාවයකැයි ශීලයකැයි සිරිතකැ යි සිතා දන්දීම එම දානමය කුසලය චාරිත්‍ර ශීලයක් බවටද පත්වේ නිද්‍රාශීලි, සභා ශීලි ආදි වචන වල නිදීමෙහි නිතර යෙදෙන සභාවල ගැවසීමෙහි නිරත හෙවත් නිදීමාදිය ස්වභාවය හැටියට කරගත් යන තේරුම් ලැබේ, එසේම මෙහි දන්දීමෙහි නිතර යෙදෙන දන්දීම ස්වභාවය කරගැණීම දානශීලි-දන්දීම ශීලයක් කරගත් තනු කියන ලදී.

එසේම දන් නොදීමෙන් වැලකීමක්ද දන් දෙන්නහු අතින් ඉබේම සිදුවේ. එවිට දන්දීම දන් නොදීමෙන් වැලකීමේ ශීලයක්ද විය හැකිය. මෙසේ දානය හැසිරිය යුතු චාරිත්‍ර ශීලයක් ලෙසද ස්වභාව ශීලයක් ලෙසද වාරිත්‍ර ශීලයක් ලෙසද ගත හැකිය මෙසේ දානය තමන්ගේ ස්වභාවයක් සිරිතක් නොදීමෙන් වැලකීමක් යයි සිතා සියතින් දන් දෙයිද, එම දානය ශීලමය කායකර්ම කුසලයක් වෙයි.

2 මෙසේ සිතා දූ දරු ආදීන්ට අණ කොට නියම් කොට, දෙවයිද, තමන්ම වචනයෙන් දෙයිද එම දානය ශීලමය වාග් කර්ම කුසලයකි.

3 එසේම තිබෙන දෙයක් අරමුණු කොට එය දෙමියි සිතාද එම දානය සීලමය මනොකම්ම කුසලයකි.

**දානය භාවනාමය කාය කර්මාදි කුසල්වන හැටි.**

1 පූජා වස්තුවක් ලැබී තෙරුවන් පුද සත්මන් කරන්නේ අනිත්‍යයෙහි සිත පිහිටුවාද (ඛයවය) එකල දානය භාවනාමය කාය කර්ම කුසලයකි.

2 දන්දී (සබ්බේ සංඛාරා අනිච්චා) යනාදි වශයෙන් වචනයෙන් සම්මර්ශනය කෙරේ නම් එම දානය භාවනාමය වාග්කර්ම කුසලයකි.

3 කය වචනයෙන් ක්‍රියාවෙහි නොයොදවා දන් දී සිතින් එය අනිත්‍ය වශයෙන් මෙනෙහි කෙරේද එකල එම දානය භාවනාමය මනඃ කර්ම කුසලයකි.

1 දානය, භාවනාමය, කාය කර්ම කුසලයක් අත්ථ සාලිනියෙහි.

යදාපන තං වුත්තප්පකාරං වත්ථුං ලභිත්වා තිණ්ණං රතනානං පූජෙත්වා චංක මනෙනා ඛයවයං පට්ඨ පෙති තදා භාවනාමයං කාය කම්මං හොති''.

යම් කලෙක එකියන ලද වස්තුවක් තෙරුවන් පුද හෙවත් දන්දී සත්මන් කරන්නේ විදර්ශනා වඩාද එකල භාවනාමය කාය කර්මය වේ

මෙහි දානය භාවනාමය කාය කර්මය වන සැටි දක්වා තිබෙන්නේ හුඟක් ඈතින්ය. දානය නම් පරිත්‍යාග චේතනාව යෙදෙන කුසල් සිතයි. එම චේතනාව යෙදෙන සිතෙහිම හෙවත් දීම් ක්‍රියාව කරන ජවන කුසලයෙහිම ''දෙමි දෙමි'' යනුවෙන් සිහිය පිහිටුවීමෙන් විදර්ශනා ප්‍රඥාවද යෙදිය හැකිය. එවිට එම දානමය හෙවත් (දන් දීමේ කුසල් සිතම භාවනාමය කාය කර්ම කුසලයක්වේ.

දන්දී පසුව සක්මන් කරමින් එම දානමය කුසලය අර මුණු කොට විදර්ශනා කරන්නේ දානමය කුසලය අර මුණු කොට වෙනම විදර්ශනා කුසල් ඇතිකර ගැණීමකි.

"කුසලං අනිච්චතො දුක්ඛතො අනත්තතො විපස්සති" යනුවෙන් එය පට්ඨානයේ දක්වා ඇත

දානමය කුසල් සිත සීලයක් වන්නේ එම කුසල් සිතෙහි පරිත්‍යාග චේතනාවත් සමග දන්නොදීමෙන් වැළකීම වූ විරතියක් හෝ පරිත්‍යාග චේතනාවම සිරිතක් වශයෙන් සවභාවයක් වශයෙන් ගැනීමෙන් විය යුතුය. මෙසේම දානමය කුසල් සිත භාවනාවක් වන්නේ එහි යෙදෙන විදර්ශනා ප්‍රඥාව නිසාය. පරිත්‍යාග චේතනාවට ශීලය විදර්ශනාව හා චාරිත්‍ර චේතනාව හා ප්‍රඥාවද බලවත් විමෙන් ඒවා සාමාන්‍ය දානයකට වඩා උසස් තත්වයට නෙමේත් බලවත් වූ ධර්මයන්ගේ නාමයෙන් මෙසේ සීල මය හා භාවනාමය කුසල නාමයන් යෙදෙන බවත් සිතිය යුතුය.

මෙහි රූපාරම්මණ කුසලය තුන් පින්කිරිය වත් වශයෙන් නව කම් දොරින් බෙදා දැක්වූ සේක.

මෙසේ සිත් අලවන සද්දාරම්මණය ගෙණ සද්ද දාන මය-වාග්-මනඃ-කුශල කර්මයන් ලැබෙන අයුරුද එම සද්ද දානය ශීලමය කාය-වාග්-මනඃ කර්මයන්ගේ වශ යෙන්ද පළමු පරිදි ගත යුතුය.

මෙහි ශබ්ද දානය නම් බෙර, දවුල්, වීණා, ගණ්ඨාර ආදී වස්තූන් පූජා කිරීමය ඒවායින් ශබ්ද පැවැත්වීම ධර්ම කථික භික්ෂූන්ට සවර, බෙහෙත්, තෙල්, පැණි ආදිය දීම ද ධර්මශ්‍රවණය ඝෝෂනය කිරීම, බණකීම, මිහිරි ලෙස ශබ්ද නගා බණ කීම යනාදිය ශබ්ද දානයෙහි වැටෙන බව සැලකිය යුතුය.

# 6

## නමො සම්මාසම්බුද්ධස්ස

ගන්ධ, රස, ඵොට්ඨබ්බ ධම්ම දානයන් දාන සීල භාවනාදි වශයෙන් බෙදී ලැබෙන කුසල් සිත්:

ගන්ධ දානය = "රජනීය ගන්ධං ආරම්මණං කත්වා"

යනුවෙන් සිත් අලවන සුවඳක් අරමුණු කොට එම සුවඳ සිරුරෙන් හෝ සිරුර සම්බන්ධ දෙයකින් පිදීම ගන්ධ දානමය කාය කම්ම කුසලයයි "1"

වචනයෙන් දෙමියි පුදමියි කියා වචනයෙන් පිදීම ගන්ධ දානමය වචීකම්ම කුසලයයි "2"

තමන් සතු සුවඳක් අරමුණු කොට එය පුදමි-පිදුවෙමියි සිතීම ගන්ධ දානමය මනොකම්ම කුසලයයි "3"

ගන්ධදානය සීලයක් වන සැටි:-

සුවඳ පිදීම අපගේ පරම්පරාවේ චාරිත්‍රයක්, ස්වභාවයක්, සීලයක් වශයෙන් සිතා සිරුරෙන් "අත් ආදියෙන්" හෝ සිරුරට සම්බන්ධ දෙයකින් පිදීම ගන්ධදාන සීලමය කායකම්ම කුසලයයි. "4"

එසේ වචනයෙන් පිදීම ගන්ධදාන සීලමය වචීකම්ම කුසලයයි. "5"

එසේම තමන් සතු සුවඳ වස්තුවක් අරමුණු කොට එය පුදමියි සිතින් සිතීම ගන්ධ දාන මනොකම්ම කුසලයයි. "6"

සුවඳ පිදීමෙ දී කයෙන් කයට සම්බන්ධ දෙයකින් පුදමින් පිදීමේ සිත හා කය අරමුණු කරමින් සිහිය පිහිටුවා පුදමියි-දෙමියි මෙනෙහි කරමින් පුදනා විට පිදීමේ

සිතත්, එම සිතෙන් හටගත් රූපධර්ම නැමති ක්‍රියාත් නුවණට අරමුණු වෙමින් ඒ නාම රූපයන්ගේ ඇතිවීම බිඳීම දක්ක හැකි වන්නේය.

**ගන්ධදාන භාවනාමය කායකර්ම කුශලයයි "7"**

එසේ අනිත්‍යාදීන් මෙනෙහි කරමින් වචනයෙන් දීම.

**ගන්ධදාන භාවනාමය වාග්කර්ම කුසලයයි "8"**

කය වචනයන් ක්‍රියාවේ නොයොදවා පුදමියි දෙමියි ඇතිවන සිත එසේම මෙනෙහි කිරීමෙන් ගන්ධදාන භාවනාමය මනොකම්ම කුසලය ලැබේ. "9"

මෙසේ ගන්ධදාන කුසල් සිත දාන, සීල, භාවනා ත්‍රිවිධ පුණ්‍ය ක්‍රියාවන්ගේ වශයෙන් ගෙන ත්‍රිවිධ කර්මද්වාරයෙන් නව වැදෑරුම් වන සැටි උගත යුතුය.

**රසදානය :**

සිත් අලවන රසයක් අරමුණු කොටද ඉහත සඳහන් අයුරු දාන, සීල, භාවනාමය කුසලයන් කායකර්මාදී නව ආකාරයෙන් සිදුවන බව දත යුතුය. රස දානයෙහි සීල මය කුසලය ගැන "සංඝයාට නොදී අනුභව කිරීම අපගේ පුරුද්දක් නො වේ" යැයි සූළුගුණු යුද්ධයෙන් පැරද පලා ගොස් සිටියදී පවා එක්කෙණෙකුන්ට පමණ වූ ආහාරය දන් දුන්" දුටුගැමුණු රජතුමාගේ කථාව ආදිය ඉතා ප්‍රසිද්ධය එතුමාට ඒතැනදී දානය සීලයක් විය. එය එන රම් බැරුරුම් අවස්ථාවක දීද කඩ කිරීමට නොහැකි සීල-යක් ස්වභාවයක් හැටියක් වී තිබුණු බව මෙයින් වටහා ගත හැකිය.

**ඵොට්ඨබ්බ දානය :**

සිත් අලවන මෘදු ඇඳ පුටු ආදි වස්තුවක් අරමුණු කොටද දාන සීල භාවනාමය කුසල් සිත් තිදෙරින් සිදුවන අයුරු පළමු පරිදි සිතිය යුතුය. ඵොට්ඨබ්බාරම්මණය මේ පඨවි, තෙජෝ. වායෝ යන තුණයි. ආපෝ ධාතුව නොගැනෙන හෙයින් එය නොගන්නා ලදී. එහෙත් මෙම

සතර නොවෙන් කළ හැකිය. ආපො ධාතුව සුඛුම රූප යක් හෙයින් එය ධම්මාරම්මණයෙහි ඇතුළත් වෙයි. තද, මෘදු, උණුසුම්, සිසිල්, පිම්බීම්, හැකිලීම් වශයෙන් පඨවි ආදි ධාතු ගුණයන්ගේ හැපීම දත යුතුය. සිවුරු, රෙදි පිළි, ඇඳපුටු, කොට්ට, මෙට්ට, ආදි වස්තූන්ගේ වශයෙන් ඵොට්ඨබ්බාරම්මණය අරමුණු කොට ගන්නා බව වටහා ගත යුතුය.

**ධම්මදානය :**

මෙහි ධම්මාරම්මණය ලෙස චක්ඛායතනාදී ආයතන සයද ත්‍රි ලක්ෂණයද, වේදනාදී නාමස්කන්ධ තුණද, ආපො ධාතු, භාව රූප දෙක, හදය, ජීවිත, ආහාර හෙවත් ඕජා රූපය, ආකාස රූප, කාය විඤ්ඤත්ති, වචී විඤ්ඤත්ති, යන විඤ්ඤප්ති රූප දෙකද ලහුතා මුදුතා කම්මඤ්ඤතා යන විකාර රූප තුණද, උපචය සන්තති දෙක ජාති රූප වශයෙන් ගෙන ජරතා අනිච්චතා රූපයන් ද යන පසළොස් සුඛුම රූපයන් ද නිබ්බාණ පඤ්ඤත්ති යන මෙහි ඇතුළත් වූ ද නොවූ ද සියල්ල ගන්නා ලදී. මේවා අරමුණු කොට සිත් පහළවීම කිය යුතු හෙයින් සිත නොකියන ලද නමුදු සිතද ධම්මාරම්මණයෙහි ඇතුලත්ය.

මෙහි ධම්දානය යනුවෙන් ඕජාරූප, ආපො රූප, ජීවිත රූපයන්ගේ වශයෙන් ධම්ම දාන කුසලයන් ගත යුතුය. සිත් අලවන ගිතෙල් වෙඬරු ආදි ඕජාවක් හෝ අෂ්ටපාන වගීාදි පැණක් හෝ යන "ධම්මාරම්මණයක්" අරමුණු කොට දෙමියි පුදමියි පළමුපරිදි කුසල් සිත් පහළ වේ. එසේ ම දිවි පැවැත්ම සඳහා සලාක දාන පස ළොස් දිනකට වරක් දෙන දාන සාංඝික දානාදියක් හෝ දිවි රැකීමට ගිලන් භික්ෂූන්ට බෙහෙත් දෙසිඳ, වෙදුන් කැඳවාද, දැල් කෙමන් කුරුළු කූඩු ආදිය විනාශකර

දමයිද, බැමි ලිහාද, සතුන් මැරීම තහනම් කොට බේර හසුරුවා නීති පණවාද දිවි රැක දීමට හෙවත් ජීවිතෙන්ද්‍රිය රැක දීමට තවත් කටයුතු කරවා ද ජීවිත දානමය කුසල් සිත් ලැබේ

මෙය මගේ කුල පරම්පරාවේ සිරිතකැයි සිතා දීමෙන් ධම්ම දාන සීලමය කුසල් ලැබේ. ඕජාදී ධම්මාරම්මණ යන් අරමුණු කොට දෙන සිත් පරම්පරාවෙහිද සිහිය හා ප්‍රඥාව යෙදීමෙන් අනිත්‍යාදී වශයෙන් මෙනෙහි කිරීමෙන් ධම්මදාන භාවනාමය කුසල් ලැබේ. මෙයද ධම්ම දාන කාය කම්මාදී වශයෙන් ත්‍රිවිධ කුසලය දොරටු තව යෙන් බෙදී කුසල් සිත් පහළ වන බව දත යුතුය. ඇතැම් විට මෙම රූපාදී අරමුණු සය එක වස්තුවකින්ම ලැබිය හැකිය.

මෙසේ තුන් පුණ්‍ය ක්‍රියාව කම්ද්වාර තවයෙන් අර මුණු සයෙන් ගුණ වී ලැබෙන කුසල් සිත් 54 ක් බව දත යුතුය.

# 7

## නමො සම්මාසම්බුද්ධස්ස

කුසල් අකුසල් සිත් පිළිබඳව.

කම්ම ද්වාර (කම් දොරටු)

ද්වාර කථාවේදී පහත දැක්වෙන කරුණු පිළිබඳ විස්තරයක් කළ යුතුය.

1 කර්ම තුණ
2 කර්ම දොරටු තුණ
3 විඤ්ඤාණ පහ
4 විඤ්ඤාණ දොරටු පහ
5 ඵස්ස සය
6 ඵස්ස දොරටු සය
7 අසංවර අට
8 අසංවර දොරටු අට
9 සංවර අට
10 සංවර දොරටු අට
I1 දස අකුසල කම්ම පථ
12 දස කුසල කම්ම පථ

1 කර්ම තුණ නම්: ඉහත දක්වන ලද දාන සීල භාවනා පුණ්‍ය කර්මයෝය.

2 කර්ම දොරටු තුණ නම්: කාය කම්ම ද්වාරය, වචී කම්ම ද්වාරය, මනො කම්ම ද්වාරය යනුයි.

**කාය:**

කාය ශබ්දය සමූහය යන තේරුමක් දෙයි. එවිට පඨවි ආදි රූප ධර්ම සමූහයකට කාය යයි කියනු ලැබේ. මේ කය කොටස් හතරකට බෙදනු ලැබේ.

1 උපාදින්නක කාය
2 ආහාර සමුට්ඨාන කාය
3 ඍතු සමුට්ඨාන කාය,
4 චිත්ත සමුට්ඨාන කාය

ඒ සතරයි.

**උපාදින්නක කාය:**

"උපෙතෙන කම්මුනා ආදින්නං උපාදින්නං" යනු වෙන් එළඹ සිටි කර්මයෙන් ගන්නා ලද රූපකායට උපාදින්න කාය යයි කියනු ලැබේ.

එනම්: චක්ඛු, සොත, ඝාණ, ජිව්හා, කාය, භාව, හදය, ජීවිත යන අටත්–පඨවි, ආපො, තෙජො, වායො, වණ්ණ, ගන්ධ, රස, ඕජා යන – අටත් කම්ම සමුට්ඨානය.

එහෙත් අත්ථසාලිනියේ චක්ඛු ආදි අට කම්ම සමුට්ඨාන වශයෙන් දක්වා "චතස්සො, ධාතුයො, වණ්ණො, ගන්ධො රසො, ඕජානි, අට්ඨ, උපාදින්නක කායො නාම" යනු වෙන් කම්මජ සුද්ධට්ඨකය පමණක් උපාදින්නක නාම යෙන් දක්වන ලදී. චක්ඛුපසාදාදිය මේ සතර මහා භූත– යන්ගේම ඔප ගතියයි. එහෙයින් ප්‍රධාන වශයෙන් සුද්ධට්ඨකය ගෙණ එසේ කියන ලද බැව් සැලකිය යුතුයි.

**2 ආහාර සමුට්ඨාන කාය:** ආහාරයෙන් හටගන්නා එම සුද්ධට්ඨකයයි.

**3 ඍතු සමුට්ඨාන කාය:** ඍතු ගුණයෙන් හට ගන්නා පඨවි ආදි එම අටයි.

**4 චිත්ත සමුට්ඨාන කාය:** සිතෙන් හටගන්නා එම රූප අටයි.

කාය කම්මද්වාරය නම් මේ සතරම නොවේ. චිත්ත සමුට්ඨාන රූප අටෙහි එක් ඇඟීමක් ඇත. එයට කාය කම්මද්වාරයයි කියනු ලැබේ. එහෙයින් වදාළහ.

"තත්ථ කථමං තංරූපං කාය විඤ්ඤත්ති" එහි කාය විඤ්ඤත්ති රූපය කවරේද?

කුසල චිත්තස්සවා – කුසල සිත් ඇත්තහුගේ හෝ
අකුසල චිත්තස්සවා – අකුසල් සිත් ඇත්තහුගේ හෝ
අබ්‍යාකත චිත්තස්ස්වා – අබ්‍යාකත සිත් ඇත්තහුගේ හෝ
අභික්කමන්තස්සවා – ඉදිරියට යන්නහුගේ හෝ
පටික්කමන්තස්සවා – ආපසු එන්නහුගේ හෝ
ආලොකෙන්තස්සවා – ඉදිරිය බලන්නහුගේ හෝ

විලොකෙනනසසවා - වටපිට බලන්නහුගේ හෝ
සම්මිඤ්ජනතසසවා - අත්පා හකුළුවන්නහුගේ හෝ
පසාරෙනනතසසවා - දිග හරින්නහුගේ හෝ
කායසස - ශරීරයාගේ
ථම්භනා, සන්ථම්භනා, සන්ථම්භිතත්තං තදවීම, වඩාත් දැඩි වීම, දැඩිවන බව,
විඤ්ඤත්ති, විඤ්ඤපනා, විඤ්ඤපිතත්තං- විඤ්ඤත්තියක් ඇඟවීමක්, හඟවන ලද බවක් වේද

ඉදං තං රූපං කාය විඤ්ඤත්තීති. මේ කායවිඤ්ඤත්ති රූපයයි. කුසල් අකුසල් කිරිය, ජවනයක් විසින් විඤ්ඤත්තිරූපය උපදවන බවත් එය යෑම්, ඊම්, බැලීම්, ඇකිලීම්, දිගඇරීම් ආදි වශයෙන් ශරීරයෙන් ඇතිවන තදවීම්, දැඩිවීම්, හැඟවීම් ගති විඤ්ඤත්තිරූපයයි මෙයින් දේශනාකර වදාළ සේක.

මෙහි ථම්භනා යන වචනයෙන් කරුණු රැසක් හෙළි කරයි. සෑම යන්ත්‍ර සූත්‍රයකම අපට ක්‍රියා කාරිත්වයක් පෙනෙන්නේ එහි ඇතුලත තදවීම් බුරුල්වීම් මාර්ගයෙනි වේගය එක්රැස් කර (ථම්භනය) ක්‍රමානුකූලව යෙදවීමෙන් නොයෙකුත් විශාල යන්ත්‍රයන් ක්‍රියා කරවනු ලැබේ. ශරීර යන්ත්‍රයත් ක්‍රියා කරවීම එපරිද්දෙනි. කම්ම චිත්ත ඍතු ආහාර වශයෙන් දිගටම නොකැඩී යන රූප පරම් පරාව අතරට ජවන් සිත්වලින් හටගන්නා රූපයන්ගේ පහළවීම රූප පරම්පරාවේ දැඩිවීමක් ඇති කරයි. එම දැඩිවීම ජවන් සිතෙහි යෙදෙන චේතනාවේ අන්දමට පැතිරීම් දිග හැරීම් ආදි ක්‍රියාවන්හි යෙදෙයි. එය විඤ්ඤත්ති නම් වේ.

චිත්ත සමුට්ඨාන රූප කලාපයක ඇති ඉහත සඳහන් රූප අටට ඇතුලත් වායො රූපය එක්ව හටගන්නා වූ රූපකාය දැඩිකරයි. උසුලයි, සොලවයි මෙහිදී චිත්ත වීථියක පළමු ජවන් සිතින් හටගත් වායො ධාතුව රූපකාය තදකරන්නට දරන්නට හැකි වේ. සොලවන්නට

නො හැකි වේ. එසේම දෙතුන් සතර පස්වැනි සවැනි ජවනයන්ගෙන්ද සොලවා ලිය නොහැකිය.

ගවයුග හතකින් ඇද්ද යුතු කරත්තය එක යුගයකින් ඇද්දවිය නොහැකිය. චිත්ත සමුට්ඨාන කාය විඤ්ඤත්තිය නොවේ. චිත්ත සමුට්ඨාන වායො ධාතුවගේ එක්ව හටගත් රූපකාය සොලවන්නට ප්‍රත්‍යවන එක් ආකාරයක් ඇත. **මෙය විඤ්ඤත්තියයි**

මෙය අට අටවැදෑරුම් රූපයන් මෙන් චිත්ත සමුට්ඨාන නොවේ. එහෙත් චිත්ත සමුට්ඨාන රූපයන්ගේ හැඟවීමක් හෙයින් විඤ්ඤත්තියද චිත්ත සමුට්ඨාන රූපයක් ලෙස කියන ලදී. චිත්ත සමුට්ඨාන කය සෙලවෙන විට කම්ම සමුට්ඨාන ආදි තුනද සැලේ. ජලය ගමන්කරන විට පරඬැල් ආදියද යන්නා මෙනි.

මොහු අසවල් ක්‍රියාව කරතියි හඟවන නිසා විඤ්ඤත්ති නම් වේ. කය අනෙකකි. කර්මය අනෙකකි. කයෙන් කළ හෙයින් කාය කර්මයයි කියනු ලැබේ. මේ කාය කම්මද්වාරයයි.

# 8

## නමො සබ්බා සම්බුද්ධස්ස

## වචීකම්මද්වාරය

කය- කර්ම දෙරටුවක් වන සැටි ගිය පාඩමෙන් දක්වන ලදී.

වචනය කුසල් අකුසල් කර්ම දෙරකට් වන සැටි.

**වචනය:-** 1. චේතනා වචනය 2. විරති වචනය
3. සද්ද වචනයැයි තුණට බෙදේ.

1. "චතුහි භික්ඛවෙ" අඞ්ගෙහි සමන්නාගතා වාචා සුභාසිතා හොති"

මහණෙනි, අංග සතරෙකින් යුක්ත වචනය සුභාසිත වචනයක් වේ.

(සත්‍යයක්වීම, අර්ථ සහිත වීම, ප්‍රිය වූ වචනයක්වීම සුදුසු කාලයෙහි කීම.)

මෙහි හොඳ වචනයක් කියමියි ඇතිවන චේතනාව ප්‍රධානය. එහෙයින් මෙය චේතනා වාචාය.

2 විරති වචනය:- "යා චතුහි වචී දුච්චරිතෙහි ආරති විරති"

සතර වාග් දුශ්චරිතයෙන් යම් වැළැක්මක් වේද?

මේ දෙශනාවෙහි කියැවෙන්නේ සතර වාග් දුශ්චරිතයෙන් වැළැක්මයි. විරතියයි. මෙම සිත්හි බලපවත්නේ විරති චෛතසිකයයි. චේතනා චෛතසිකයද මෙහි යෙදී කුශල කර්මය වෙයි. ඉහතින් දක්වන ලද්දේ චේතනා ශීලයයි. මෙහි චෛතසික ශීලයයි.

3 සද්ද වචනය: "වාචා ගිරං බ්‍යප්පථො උදීරණං, ඝොසො
ඝොෂ කම්මං, වාචා, වචීභෙදො"

වචනය, නික්මෙන ශබ්දය, ප්‍රකාශනය, උදීරණය, මතුකොට දැක්වීම, ඝොෂය, ඝොෂ කර්‍මය, වචනය, වාග් භෙදය, යන මෙයින් සද්ද වචනය කියැවෙයි. මෙය ඉතා ප්‍රකටය. හැම දෙනාම වචනයයි කියන්නේ කටින් පිට වන අර්ථයක්-තේරුමක් ඇති ශබ්දයකටයි.

චේතනාව කර්‍මයයි. එහෙත් කර්‍ම දොරටුව නොවෙයි. එහෙයින් මෙහි චේතනා චෛතසිකය කර්මද්වාරයක් නො වන බව සලකා ගත යුතුය.

විරතියද කර්‍ම දොරටුව නොවේ. ඒ වැළකීමේ කුසල චෛතසිකයයි. ඒ විරතිය බලවත්ව යෙදෙන සිත්හි ද චේතනාවම කර්‍මය වෙයි.

සද්ද වචනය සමග එක හැඟවීමක්-විඤ්ඤත්තියක් ඇත. මෙය වචීකම්මද්වාරයයි. වචීවිඤ්ඤත්තිය මෙසේ හඳුන්වා ඇත.

**ඒ වචී විඤ්ඤත්ති රූපය කවරේද?**

කුසල් සිතකින් හෝ අකුසල් සිතකින් හෝ විපාක කිරිය සිතකින් හෝ යුක්ත වූවකුගේ යම් වචනයක් ප්‍රකාශයක් මතුකොට ප්‍රකාශ කිරීමක්, ඝොෂණයක්, ඝොෂ කර්මයක්, වාග් භෙදයක් වේද? මේ වචනයයි. කියනු ලැබේ. ඒ වචනයෙන් හැඟවීම් සවභාවයක් වේද මේ ඒ වචී විඤ්ඤත්ති රූපයයි.

ක්‍රියා බවට පත්වන්නේ සිත්ය. ඒ ඒ ක්‍රියාවන් කර වීමට අවශ්‍ය ලෙස සිතත් චෛතසිකයනුත්, සකස් කරන්නේ විශේෂ ශක්තියක් ඇති ඒ සිත් චෛතසික හා එක්වම පහළ වන චේතනා චෛතසිකයයි එහෙයින් චේතනාවම කර්මය වෙයි. ක්‍රියා බවට පත්වන්නේ යැයි කියන්නේ සිතත් චෛතසිකයනුත් රූප නිපදවනු ලැබේ, ඒ සිත් කායික චලනය වාචසික ශබ්ද ඇති කිරීමෙහි සමත් වූවහොත් ඒවා කායික ක්‍රියා වාචසික ක්‍රියා වෙති.

සිතක් පහළ නුවුවහොත් චේතනාව ඇතුළු චෛත සිකයන්ගේ පහළවීමක් සිදු නොවේ. එවිට චිත්තජ රූප යන්ගේද පහළවීමක් නොවේ. මෙසේ එකට බැඳී පහළ වන චිත්ත චෛතසිකයන්ගෙන් හටගන්නා රූප එම චිත්ත චෛතසිකයන් යම් අර්ථයක් සඳහා පහළ විනි නම් එයට අනුව ක්‍රියා කරමින්ම පහළ වෙති.

එම ක්‍රියා කාරිත්වය ඔහු යමක් කරන බව කියන බව හඟවයි. එය කාය විඤ්ඤත්ති වචී විඤ්ඤත්ති වෙයි.

මෙය කියමියි, එය කියමියි විතර්කය හෙවත් කල්පනාව ඇතිවෙයි. ඒ විතර්කයෙන් පහළවන පැතිරෙන ශබ්දයකි. එය විතක්ක විප්ඵාර ශබ්දයයි. එය කණට ඇසෙන්නක් නොවේ සිතටය එය දැනගත හැක්කේ. සිතම ශබ්ද අසයි. කණ නොඅසයි.

මේ විතක්ක විප්ඵාර සද්දය සමහර අටුවා කථා වන්හි නින්දෙන් හා සිහි විකල් බැවින් වැලපෙන ශබ්දය වශයෙන්ද දක්වා තිබේ.

මෙය කියමියි උපදින සිත පඨවි, ආපො, තෙජෝ, වායො, වණ්ණ, ගන්ධ, රස, ඕජා යන රූප අට නිපදවයි

මෙය චිත්ත සමුට්ඨාන ශබ්දයයි. ඒ චිත්ත සමුට්ඨාන පඨවි ධාතුවගේ උපාදාන රූපයක් හා ගැටිමේ හේතුවෙන් හටගන්නා එක්තරා ආකාර විකාරයෙක් වේ. මේ වචී විඤ්ඤත්ති නම් වේ.

මෙසේ වාග් ද්වාරයෙන් එළි දක්නා චේතනාවෙන් බොරු කේලාම් ආදියෙන් වලකියිද සත්‍ය කථා කරයිද මේ වචී කර්මද්වාරයෙන් සිදුවන කුසල් සිත්ය.

මෙසේ කුසල් අකුසල් දැන කුසල් පුරා උතුම් නිවන් සැප ලබා ගනිත්වා!

# 9

## නමො සම්මාසම්බුද්ධස්ස

## මනො කම්මද්වාරය

මන :

මන, මනස, යන ශබ්දයන්ගෙන් ද සිතම කියැ වේ. "යං චිත්තං මනො මානසං" යනාදි දෙශනාවලින් එය පැහැදිලි ය. මනො ධාතු, විඤ්ඤාණ ධාතු, මනො විඤ්ඤාණ ධාතු යනුවෙන්ද ගැනෙන්නේ සිතම ය.

කාමාවචර සිත් 54 ක්ද, රූපාවචර 15 ක්ද, අරූපාවචර 12 ක්ද, ලෝකෝත්තර 8 ක්ද, සිත් සියල්ල 89 ක් ධම්ම සංගණියේ දක්වා ඇත. මනො ධාතු වශයෙන් පඤ්චද්වාරාවජ්ජනය හා සම්පටිච්ඡන දෙක ද, විඤ්ඤාණ ධාතු වශයෙන් චක්ඛු විඤ්ඤාණාදී සිත් 10 ක්ද, හැර ඉතිරි සිත් 76, මනො විඤ්ඤාණ ධාතු වශයෙන්ද බෙදන ලදී.

මනස යන්නෙහි තේරුම අරමුණ දැන ගැනීමය. "ආරම්මණං මිනමානං විය ජානාතීති මනො" අරමුණ මනිමින් මෙන් දැනගන්නේනුයි මන නම් වේ. චක්ඛු විඤ්ඤාණාදි සිත් වෙන්ව දැක්විය යුතු හෙයින් විඤ්ඤාණ ධාතු නාමයෙන් දැක්වූව ද, ඒවා ද අරමුණු දැනගන්නා මනස ම ය.

ආගම් හා දර්ශන වාද හෙද ඇතිවීමට මූලික වූයේ මනස පිළිබඳ නොවැටහීමය යි, කිව යුතුය. වෙනස් නො වන මනසක් ඇතැයි, එය සුවදුක් විඳියි, එය ම මොක්ෂයැ යි හෝ එය සම්පූර්ණත්වයට පත්වීම මොක්ෂ යැයි නිවණැයි බෞද්ධ මෙන්ම අබෞද්ධයෝ ද දෘෂ්ටි ගණිති.

එහෙත් සත් හැවිරිදි වියේදී රහත් වූ සෙලා භික්ෂුණීන් වහන්සේ :

පබ්බජිං මෙ ගව සම්පතෙත-මානසං මුහිවජ්ටයිං
අජරාමර සිවීභූතං -නිබ්බාණං එස්සයිං අහං

අන්තිම අත්බව පැමිණි කල්හි මනස මතු මතු යොදවා, (භාවනා වඩා) මම අජරාමර සිහිල් වූ නිවණ අවබෝධ-ස්පර්ශ කෙළෙමි.

එසේම, "අත්ථි නිස්සරණං ලොකෙ = පඤ්ඤාය මෙ සුඵස්සිතං" නිවණ ප්‍රඥාවෙන් ස්පර්ශ කළ බව දක්වෙයි.

මෙහි මාර්ග සිත්හි මාර්ග ප්‍රඥාවද යෙදෙන හෙයින් සිතින් ස්පර්ශ කිරීමත් නුවණින් ස්පර්ශ කිරීමත් දෙකම එක ය. එහෙත් මෙයින් ප්‍රබල දුර්මතයක් බිඳියයි. එනම් චෛතසිකයන්ගෙන් වෙන්වුණු සිත නිවණයැයි ඇතැම් අය ගන්නා දෘෂ්ටියයි.

නිවණ ධම්මායතනයට අයත් ය. අරහත් මග සිත සතර ස්කන්ධයට අයත්ය. "අරහත්තං චත්තාරො ඛන්ධා" (විභාග අටුවා) නිවණ අසංඛත ය. මාර්ග සිත්වලට ද නිවණ අරමුණු වේ. නිවණ මනස නොවේ චෛතසික යන්ගෙන් වෙන් වූ සිතක් නැත. මෙසේ 89 වැදෑරුම් මනස අසුවල් මනස මනොද්වාරය නොවේ යැ යි නොකිය හැක. යම් සේ අසවල් චේතනාව කර්මය නොවේ යැයි නොකිය හැකිවා මෙනි. අඩුම ගණනේ දෙපස් විඤ්ඤාණ සිත්හිද සබ්බ චිත්ත සාධාරණ චෛතසික යෙදෙන හෙයින් ඒවායේ ද කර්ම පත්‍ය ශක්තිය මහා ප්‍රකරණයෙහි (පට්ඨාන) කියන ලදී.

විපාක කිරිය සිත් අබ්‍යාකත හෙයින් එම අබ්‍යාකත සිත්හි යෙදෙන චේතනා ද අබ්‍යාකත කර්මය. විපාක ශක්තියක් නැති කර්මය. ධර්මානුකූලව එහි සහජාත කර්ම ශක්තියක් මිස නානාක්ෂණික කර්ම ශක්තිය නැත. එවිට එයින් අතීත් චිත්ත චෛතසිකයන් එක් කිරීම, රැස්

කිරීම, පිඬු කිරීම, සිතවීම, කල්පනාව කෙරෙයි. මතුවට යම් විපාකයක් හටගැනීමේ ශක්තියක් නොවේ. විපාක නොදෙන හෙවත් අබ්‍යාකත කර්මයන් බුදු දහම අනුව කර්ම සංඛ්‍යාවට ගණන් නොගත්තු ද කර්ම ප්‍රත්‍යශක්තිය සෑම චේතනා චෛතසිකයකම ඇති බව පිළිගත යුතුය. එහෙත් ඒවා මනො කම්ම මිස මනොකම්මද්වාර බවට පත් නොවේ. හුදෙක් අබ්‍යාකත කර්ම ශක්තිය එක්ව යෙදෙන (සහජාත) ස්කන්ධයන් රැස් කිරීම, සකස් කිරීම් ගොනු කිරීම කරයි විපාක වශයෙන් සසර සකස් කිරීම සිදු නොවේ.

මනොකම්මද්වාර බවට පත්වන්නේ:

"තෙභූමක කුසලාකුසලං එකූන තිංසවිධො මනො කම්මද්වාරං නාම"

තුන් භූමියෙහි කුසල් අකුසල් 29 ක් සිත් මනො කම්මද්වාර නම් වේ.

කාම රූප අරූප යන භූමි තුණෙහි අකුසල් 12 මහා කුසල් 8 රූප අරූප කුසල් 9 යන සිත් කම්මද්වාර වෙති. මෙසේ මතු විපාක දීමේ ශක්තිය ලබා පහළවන කුසලාකුසලයන් මනොකම්මද්වාර නාමයෙන් දක්වන ලදී.

ඉහත සඳහන් කුසලයන්ගෙන් දානාදි පින්කම් හා ප්‍රාණඝාතාදී අකුශලයන් ගෙන් වැලකීමාදිය සිදුවේද, භාවනා වඩා ධ්‍යානයන් උපදවාද, මේ මනොද්වාරිකය. විශේෂයෙන් ධ්‍යාන කුසල් මනොද්වාරික වෙති.

අභිජ්ඣා, ව්‍යාපාද, මිච්ඡා දිට්ඨි ආදිය මනොද්වාරික ප්‍රකට අකුසල්ය.

කර්මය පිළිබඳ මතු විස්තර වේ. මෙසේ මනොකම්මද්වාරික ධර්මයන් දැන අකුසල් දුරු කොට කුසල් පුරා උතුම් නිවන් සැප පතා ගනිත්වා.

# 10

## නමො සම්මාසම්බුද්ධස්ස

**කර්මය යනු කුමක්ද?**

කුසල් අකුසල් දෙකටම අයිති කර්ම තුනකි. එනම් කාය කම්ම, වචී කම්ම, මනො කම්මය. මේ කර්ම තුනට පෙර කර්මද්වාරයන් විස්තර කරන ලදී.

කර්මය යනු කුමක්ද?

"කිං පනෙතං කම්මං නාම?"

මේ කර්මය නම් කුමක්ද?

"චෙතනා චෙව එකච්චෙච චෙතසිකා ධම්මා"

චේතනාවද ඇතැම් චෛතසික දහම්ද කර්මයයි.

බුදු දහම අනුව කර්මය ඉතා සියුම් ලෙස බෙදා වදාරා ඇත. ජෛන ආදී දර්ශනයන්හි කර්මය පිළිගෙණ ඇතද නියම වශයෙන් කර්මය හා එහි විපාක පිළිබඳ පිළිගත හැකි නිගමනයක් නැත.

යෑම්-ඊම්, ඉඳීම්-හිටීම්, හොඳ-නරක' ආදී ක්‍රියා රැසක් නිතරම සත්වයා සිදු කරනු ලැබේ. බුදු දහම අනුව ඒ ක්‍රියා සියල්ලම සිතෙන් හටගන්නා රූපයෝ ය. එහෙයින් සිත ක්‍රියාවට මුල් වන්නේය. ඒ ඒ ක්‍රියාවන් කිරීමට සුදුසු පරිදි සිත හා අනිත් සිතෙහි යෙදෙන ධර්මයන් රැස් කරන - සකස් කරන-සිතෙහිම යෙදෙන චෛතසික යකට චේතනාවයයි කියනු ලැබේ. එහෙයින් චේතනාව කර්මයයි බුදුරජාණන් වහන්සේ වදාළහ.

"චෙතනාහං භික්ඛවෙ කම්මං වදාමි"

"චෙයිත්වා කම්මං කරොති, කායෙන වාචාය මනසා"

මහණෙනි, මම චේතනාව කර්මයයැයි කියමි. චිත්ත චෛතසික එක්කොට - සම්බන්ධ කොට - රැස් කොට කයින් වචනින් මනසින් කර්ම කරයි.

"චෙතයතීති චෙතනා. අභිසන්දහතීති අත්ථො" චෙතනය කෙරේයයි චෙතනය නම් වේ. අභිසන්දහනය හෙවත් වෙසෙසින් මනා කොට එක්කෙරෙනුයි-දරානුයි ගණිනුයි පිහිටුවානුයි යන අර්ථයි. මෙහි අදහස චෙතනාව සිතත් අනිකුත් චෛතසිකත් තමන්ට වුවමනාවන ක්‍රියා වට සුදුසු පරිදි දැරීම සකස් කිරීම, එක් කිරීම කරන බවයි. චේතනාව එසේ ක්‍රියා නො කළේ නම් අපට පෙනෙන දැනෙන ලෙස කය වචන සිතෙන් ක්‍රියාවක් සිදු නොවේ. එහෙයින් කර්මය යන එහි ක්‍රියා සියුම් තැනින්ම ගෙන චේතනාවයයි සියල්ල දත් සම්බුදු පියාණෝ වදාළහ.

එසේම චේතනාවගේ කෘත්‍යය "ආයූහණ රසා" රැස් කිරීම කෘත්‍යයකැයි දක්වා ඇත. චිත්ත චෛතසිකයන් එක අරමුණකට රැස් කිරීමයි එහෙයින් කර්මය යනු ක්‍රියාව නොවේ. ක්‍රියාව ඇති කරවන සිත සකස් කරන චෛතසිකය යි.

මෙහි චේතයිත්වා යන්නෙන් රැස් කොට හෝ එක් කොට යන තේරුම දෙයි.

මල් පුදමු. පිදීමේ ක්‍රියාව කර්මය නොවේ. ඒ රූප සමූහයකි කර්මද්වාරයකි. විඤ්ඤත්ති රූපය ඒ රූප සමූ හයට කර්ම පත්‍ය ශක්තියෙන් චේතනාව උපකාර විය. චේතනාව තනිව හටගත්තේ නැත සිතත් තවත් චෛත සිකත් සමගය. එම සිතටත් චේතනා චෛතසිකයනටත් චේතනා චෛතසිකය කර්මප්‍රත්‍ය ශක්තිය ලබා දෙයි. එසේම කුසල් අකුසල් සිත්හි යෙදෙන චේතනාව මතු විපාක සිත්වලටද කර්මප්‍රත්‍ය ශක්තිය ලබාදෙයි.

මෙසේ සෑම අතින්ම චේතනාව කර්මය බවත් එය චිත්ත චෛතසිකයන් එක් කොට අභිමත ක්‍රියාවක් කර වන බවත් චේතනාව පහළ නුවූයේ නම් ඒ ක්‍රියාව නො සිදු වන බවත් සියලු සිත්හිම චේතනාව යෙදුනද

කුසල් අකුසල් සිත්හි යෙදෙන චේතනාව විපාක ලබා දෙන නානාක්ඛණික කර්මය බවත් අතීත් සිත්හි එක්ව යෙදෙන චිත්ත චෛතසිකයන්ගේ රැස්කිරීම සිදුකරන සහජාත කර්ම ශක්තිය බවත් සැළකිය යුතුය.

තවද අංගුත්තර චතුක්ක නිපාතයෙහි:

"චත්තාරිමානි භික්ඛවෙ කම්මානි"

මහණෙනි, කර්මයෝ සතර දෙනෙකි.

1 කණ්හං කණ්හ විපාකං - කලු කර්ම හෙවත් අකුසල් කලු හෙවත් දුක් විපාක ඇති,

2 සුක්කං සුක්ක විපාකං - සුදු කර්ම හෙවත් කුසල් පිරිසිදු සැප විපාක ඇති,

3 කණ්හ සුක්කං කණ්හ සුක්ක විපාක - කලු සුදු මිශ්‍ර කුසල් අකුසල්, කලු සුදු විපාක දුක් සැප විපාක ඇති,

4 අකණ්හ අසුක්කං අකණ්හ අසුක්ක විපාකං - නො කලු නුසුදු (අකුසල් කුසල් නොවන) නොකලු නුසුදු විපාක ඇති,

මෙහි තුන්වෙනි කණ්හ සුක්ක කර්මය යනුවෙන් කුසල් අකුසල් මිශ්‍ර කර්මය ගන්නා ලදී. චේතනාව කුසල් සිතක යෙදුනොත් කුසල්ය. අකුසල් සිතක යෙදුනොත් අකුසල්ය. චේතනා චෛතසික දෙකක් එක සිතක නොයෙදේ. එසේ නම් මිශ්‍ර කර්මයයි කියන ලද්දේ දානාදි පින්කම් කරන විට කුසල් සිත් පේළි අතරට ලෝභාදි අකුසල චෛතසික යෙදෙන අකුසල ජවන වීථීන් ද ඇතී විය හැකිය. ඉතින් එබඳු පින්කම් කරන විට ඒ පින්කම් පින් පව් මිශ්‍ර කර්ම ලෙස ගෙන මෙසේ දක්වන ලද බැව් සැලකිය යුතුය.

මෙහි "අකණ්හ අසක්ක" කර්මය නම් කර්මය ක්‍ෂය කරන සතර මාර්ග ඥාණ යැයි. අංගුත්තර අට්ඨවාවෙහි දක්වන ලදී.

පෙළෙහි මාර්ගාංග අටත් බොජ්ඣඞ්ග සතක් දක්වා ඇත.

සතර මාර්ග සිත් කුසල්ය. එහෙත් ඒ සිත්හි චේතනාව ප්‍රතිසන්ධි භවංග චුති තදාලම්භන විපාක ඇති කරන නානාකම්ණික කර්ම නොවෙයි. එහෙයින් කර්ම ශක්තිය නැති කරන කර්මයයි වදාළ සේක.

එහෙත් පට්ඨානයේ මාර්ග සිත්හි යෙදෙන චේතනා වද කර්ම ප්‍රත්‍යය වශයෙන් වදාරන ලදී. ඒ වනාහි සහ ජාත වශයෙනි. ඵලසිත් යන මාර්ග සිතින් කෙලෙස් වැනසූ පසු පහළවන ශාන්ත වූ එම සිත්ම ය.

අනිත් කුසල් අකුසල් සිත්හි මෙහි ප්‍රධාන වශයෙන් අනභිජ්ඣා, අව්‍යාපාද, සම්මා දිට්ඨි, අභිජ්ඣා, ව්‍යාපාද, මිච්ඡාදිට්ඨි නමැති සම්ප්‍රයුක්තයන් දැක් වූ සේක.

මාර්ග සිත්හි බොජ්ඣඞ්ග මග්ගඞ්ග සම්ප්‍රයුක්තයන් දැක් වූ සේක. මාර්ගාංග චෛතසිකය ප්‍රධාන වන බැවින් අටුවාවෙහි එය දක්වන ලදී.

ලෝකෝත්තර මාර්ග සිතද බෙදනු ලබන්නේ කාය කම්ම, වචී කම්ම මනෝ කම්ම වශයෙන් බෙදිය හැකිය.

කායික දුසිල් බැවින් සංවරය, කාය කර්මය, සම්මා කම්මන්ත යැයි, වාචසික දුසිල් බැවින් සංවරය වචී කම්මය, සම්මාවාචාය, සම්මා ආජීවය ඒ දෙකෙහි ඇතුළත්ය. සම්මා දිට්ඨි, සංකප්ප, වායාම, සති, සමාධි, මනෝ කම්මය.

මේ කියනලද අභිජ්ඣා ව්‍යාපාද මිච්ඡා දිට්ඨි, අනභිජ්ඣා අව්‍යාපාද සම්මා දිට්ඨි හා බොජ්ඣඞ්ග සතද මාර්ගාංග අටද යන ධර්ම 21 කර්ම බවට පත්වන සම්ප්‍රයුක්තයන් බව එම අංගුත්තර දෙසුමෙන් දක්වන ලදී.

# 11

**නමෝ සම්මාසම්බුද්ධස්ස**

ද්වාර සංසන්දනය, කර්මද්වාර එකට ගලපා බැලීම.

පසුගිය පාඩමෙන් කාය-වචී-මනෝ, කර්මයන් දක්වන ලදී. සියලු කුසලාකුසලයන් මේ තුණට බෙදෙන්නේය. එයින් පළමු කොට අකුසල් බෙදා හා ගලපා බැලීම මෙසේය.

| | |
|---|---|
| 1 පාණාතිපාත<br>2 අදින්නාදාන<br>3 කාම මිච්ඡාචාර | මේවා කර්ම-කර්මපථ බවට පත්වන්නේ කයින් සිදුවීමෙනි. එහෙයින් කාය කර්මය. |
| 4 මුසාවාද<br>5 පිසුණාවාචා<br>6 ඵරුසා වාචා<br>7 සම්ඵප්පලාප | මේවා කර්ම-කර්මපථ බවට පත්වන්නේ වචනයෙන් සිදුවීමෙනි. එහෙයින් වාග් කර්මය. |
| 8 අභිජ්ඣා<br>9 ව්‍යාපාද<br>10 මිච්ඡා දිට්ඨි | මේවා මනෝද්වාරයෙහිම කර්ම-කර්මපථ බවට පැමිණේ. එහෙයින් මනෝකර්මය. |

1 දුශ්චරිතය,
2 කර්මය,
3 කර්ම පථය-කියා මේවා කොටස් කළ හැකිය.

යමෙක් සතුන් මැරීමට යන අදහසින් කා-බි හැඳ-පැළඳ ආයුධ ගෙන වනයට යයි. කිසිම සතකු හමු නොවී ආපසු එයි.

සතුන් මැරීම පිළිබඳව කෙරෙණ පූර්වකෘත්‍යයක් නිසා ඒවා අකුසල්ය අකුසල කර්ම හෝ කර්ම පථ නොවේ. ඒවා දූශ්චරිතය.

එසේ ගිය සතුන් මරන්නෙකුට සතක හමුවී පන්නා පහර දුන් නමුදු. සතා පැන ගියේය. එය කර්මයක් විය. පළමු කියන ලද දුශ්චරිත සංඛ්‍යාවට වඩා බරපතලය.

එසේ සතුන්ට පහරදී මරා ගණියි. එය කර්මපථයක් විය. අංග සම්පූර්ණවීම නිසාය කර්මපථයක් වන්නේ. ප්‍රති සන්ධි විපාක දීමේ ශක්තිය ඇති කර්ම පමණකි. කර්ම පාරක් ප්‍රතිසන්ධිය ලැබීමෙන් සිදුවේ. එනම් ප්‍රතිසන්ධි විපාක වශයෙන් පහළ වූ අකුශල හෝ කුශල කර්මය ප්‍රති සන්ධි විපාකයේ සිට භවාංග විපාක සිත් දිගටම පවත් වමින් තදාලම්බණ චුති විපාක වලටද ඉඩ ලබා දෙයි. මෙසේ විපාක පථයක් ඇති කරන්නේ කර්ම පථයෙනි.

ඉහත සඳහන් කර්මද, ප්‍රවෘත්ති විපාක වශයෙන් අතරතුරදී ඉදිරිපත් වී සුඛ දුක්ඛාදී විපාක විඤ්ඤාණ යන් හා තදාලම්බණ විපාකයන්ද ලබා දෙයි.

දුශ්චරිත වශයෙන් මෙහි හඳුන්වන ලද කොටස ද කර්මය. ඒවාද ප්‍රවෘත්ති විපාක ලබා දීමෙහි සමත්යයි සිතිය හැකිය. කාය දුශ්චරිතාදී වශයෙන් කාය කර්මාදියට ගත් තැන් අංගුත්තර නිකායාදී දේශනාවන්හි දක්වා ඇත මෙහි දක්වන ලද කර්ම පථයටම කර්ම නාමය පොතෙහින් ජනයා අතරත් බොහෝ සෙයින් ව්‍යවහාර වන බව සැලකිය යුතුය.

ඒ බව කාය වචී ද්වාරයන්හි ක්‍රියා සිද්ධියට 'පැමිණ කර්ම පථයට නොපත් කර්ම ඇත. මනොද්වාරයෙහි ද හැසිර කර්ම පථයට නොපත් කර්ම ඇත ඒවා ඒ ඒ දෙරටුවලටම අයිතිය. යමෙක් මුව දඩයමෙහි යමියි දුනු සාදද, දිය අඳිද, ආයුධ 'මුවන් තියාද, බත්කාද.' වස්ත්‍ර අඳිද, මෙපමණකින් නමුදු කායද්වාරයෙහි සෙලවීමට- ක්‍රියා කිරීමට පැමිණියේ වේ. ඔහු අරණ්‍යයෙහි සාවෙක් සමණකුදු නොලැබ එයි.

"ඉදං අකුසලං කායකම්මං නාම හොති? නාහො තීති නහොති, කස්මා කම්මපථං අප්පත්තාය කෙවලං පන කාය දුච්චරිතං නාම හොතීති වෙදිතබ්බං"

මෙය අකුසල කාය කර්මයක් නම් වෙයිද? නොවෙ-යිද? නොවෙයි. මක්නිසාද යත් කර්මපථ බවට නො පැමිණි හෙයිනි. හුදෙක් කාය දුශ්චරිත නම් වේයැයි දත යුතුය. මේ අත්ථසාලිනි දෙශනාවෙහි කර්ම පථ යක් වන කර්මයම කර්මය වශයෙන් සළකා ඇත. එවිට දුශ්චරිත යනුද කර්ම නාමයෙන් ගන්නා හෙයින් කර්මයාගේ විපාක දීමේ ශක්ති වශයෙන් එසේ කොටස් විය හැකි බව සැලකිය යුතුය.

දුනු ගණිව්, මුවන් විදිව්, ආදි අණකිරීම් වශයෙන් අකුසල කායකර්මය වාග්ද්වාරයෙහි හටගනියි. එහෙත් දඩයමක් නොලදෙත් වචි දුශ්චරිතයක් පමණකි· වචි කර්මයක් නොවෙයි.

මනොද්වාරයෙහි වනාහි වධක චේතනාවගේ ඉප දීම් මාත්‍රයෙන් කර්ම පථ භේදය වෙයි. එහෙත් අව්‍යාපද හෙවත් මනො කම්ම වශයෙන් මිස පාණාතිපාත වශ-යෙන් නොවේ:

අකුශල කාය කර්මය කාය වාග් දොරටුවල හට ගැණේ. "අකුසලංහි කාය කම්මං කාය වචී ද්වාරෙසු සමුට්ඨාති"

මනොද්වාරයෙහි නොවේ. "නො මනොද්වාරෙ"
අකුසල වචී කර්මයද එසේය. "යථා අකුසලං වචි කම්මං" අකුසල මනොකර්මය ත්‍රිවිධ ද්වාරයෙහිම හට ගැණේ. "අකුසලං මනො කම්මං පන තීසුපි ද්වාරෙසු සමුට්ඨාති"

කුසල කාය වචී මනො කර්මයන්ද එසේය. "තථා කුසලානි කාය වචි මනො කම්මානි"

1 තමාම සතුන් මරණ, සොරකම් කරණ, වැරදි කාම සේවනයෙහි යෙදෙන නැනැත්තාට අකුසල කාය කර්මය කාය ද්වාරයෙහි හට ගැණේ.

2 යව, අසවල් තැනැත්තා මරව, බඩු සොරකම් කර වයි, අණ කරන්නහුට කාය කර්මය වාග්ද්වාරයෙහි හට ගැණේ. විතණ්ඩ වාදියෙකුට මෙසේ ප්‍රශ්නයක් නැගිය හැකිය.

අකුසල වූ කාය කර්මය මනොද්වාරයෙහිත් හට ගැණෙයි කියා. එයට උදාහරණයක් - නැවතද මහණෙනි, මෙහි ඇතැම් මහණෙක් ඉර්ධිමත් වූයේ අනිකකුගේ කුස ගත ගැබක් පාප අදහසින් යුතුව මේ කුසගත ගැබ හොඳින් නොතික්මේවායි බලාපොරොත්තු වේ. මෙසේ කුසගත ගැබ විනාශ වේ.

මෙසේ සිතූ පමණින් ඒ කුසගත ගැබ වියලී යයි. මෙහි කය සෙලවීමක් හෝ වචනය සෙලවීමක් හෝ නොවේ. මනොද්වාරයෙහි මේ අකුසල කාය කර්මය සිදු වූයේ යයි කියයි ඔහුගෙන් මෙසේ ඇසිය යුතුය.

ඉර්ධියෙන් සත්‍ව ඝාතනය ඔබ කියන්නේද?

හොඳයි, ඉර්ධිය නම්, අධිට්ඨාන ඉද්ධි, විකුබ්බණ ඉද්ධි, මනොමය ඉද්ධි, ඤාණ විප්ඵාර ඉද්ධි. අරිය ඉද්ධි කම්ම විපාකජ ඉද්ධි, පුඤ්ඤවතො ඉද්ධි, විජ්ජාමය ඉද්ධි භාවනාමය ඉද්ධි, සම්මාපයොග පච්චයා ඉජ්ඣනට්ඨේන ඉද්ධි කියා දසවැදෑරුම්ය.

මෙයින් කුමන ඉර්ධියකින්ද?

භාවනාමය ඉර්ධියෙන්.

භාවනාමය ඉර්ධියෙන් සතුන් මැරිය හැකිද? එක වරක් හැකියයි ඇතැම් ආචාර්‍ය්‍යවරු කියත්. හොඳයි බලමු

භාවනාමය ඉර්ධිය කුසලයක්ද? අකුසලයක්ද? අව්‍යා කෘතයක්ද? භාවනාමය ඉර්ධිය කුසල් හෝ වෙයි.

අබ්‍යාකත (රහතන්ගේ) හෝ වෙයි.

හොඳයි භාවනාමය ඉර්ධිය සැප දුක්-නොසැප-නො දුක් වේදනාවෙන් කුමක්ද?

නොසැප-නොදුක් (උපෙක්ඛා) වේදනාය. හොඳයි, සවිතක්ක, සවිචාර, අවිතක්ක, විචාර, මත්ත අවිතක්ක අවිචාර තුණෙන්.

භාවනාමය ඉර්ධිය අවිතක්ක අවිචාරය, හොඳයි, කාමාවචර, රූපාවචර, අරූපාවචර භූමි තුණෙන්.

රූපාවචරයි.

හොඳයි, පාණාතිපාත චේතනාව යෙදෙන සිත, එය නම්, අකුසල්ය, දුක්ඛ වේදනාය, සවිතක්ක, සවිචාරය, කාමාවචරය.

ඉතින් කවුරු කිවත් භාවනාමය ඉර්ධියෙන් කෙසේ වත් සත්ව ඝාතනයක් කළ නොහැකිය.

ඔබගේ කතාව කුසලත්තික, වේදනාත්තික විතක්-කත්තික හා භූම්මන්තරය යන ධර්ම න්‍යායයන් අනුව නොගැළපේ.

එසේ නම් ඒ සූත්‍රය නිරර්ථකද? නැත. එහි එන ඉර්ධිය බුද්ධාගමට අයත් එකක් නොවෙයි. අථබ්බන වේදයෙහි එන පරදි මන්ත්‍ර ජප කිරීමෙන් ඇති කර ගන්නා බලයකි. එම සූත්‍රයෙහිම ''පාපකෙ න මනසා'' යනුවෙන් පාපසිතින් වචනයෙන් හා පිදිවිලි ආදී කායික ක්‍රියාවෙන් සිදුවන ප්‍රාණඝාතය යි.

එමනිසා කෙසේවත් කාය කර්මය මනොද්වාරයෙහි නොහට ගැණේයයි තීරණයට බැසිය යුතුය.

# 12

## නමො] සම්මාසම්බුද්ධස්ස

අකුශල කාය කර්මය කායද්වාරයෙහි හටගැනීම 1

අකුශල කාය කර්මය වචීද්වාරයෙහි හටගැනීම 2

විස්තර වශයෙන්ද අකුශල කාය කර්මය මනොද්වාරයෙහි නොහට හන්නා බවද, පසුගිය පාඩමෙන් දක්වන ලදී.

අකුශල වචීකර්මය - වචීද්වාරයෙහි හටගැනීම 3

වචනයෙන් හෙවත් වචී විඥ්ඥත්තියෙන් බොරු කේලාම් පරුෂ හිස් වචන හුඤයිද, එය අකුශල වචී කම්මය. වචීද්වාරයෙහි හටගත්තේය.

අකුශල වචීකම්මය–කායද්වාරයෙහි හට ගැණීම 4

අතින් හිසින් ආදී ශරීරාවයවයකින් නැත තිබේ. ආදි වශයෙන් බොරු ආදිය ප්‍රකාශ කිරීමෙන් කර්මය වාග් කර්මයයි. එහෙත් එය හටගත්තේ කායද්වාරයේය. මෙසේ අකුශල වචීකම්මය කායද්වාරයෙන් සිදුවේ. මේ සිත්වල යෙදුණු අභිජ්ඣා ව්‍යාපාදාදිය චේතනාවට අනුකූලව චේතනා පක්ෂයෙහිය නැතහොත් ඒවා කර්මයයි කියනු ලැබෙති.

ඉතින් අකුසල වචීකම්මය මනොද්වාරයෙහිද හට ගැණේ යැයි, විරුද්ධ වාදියෙකු (විතන්ඩවාදී) කියා නම්, ත්‍රිවිධ සංගායනාවට නැගුණු සූත්‍රයන් දක්විය යුතුයයි කියන්න.

ඉතින් විනයෙහි එන;

"යො පන භික්ඛු යාවතතියං අනුසාවිය මානෙ සර මානො සන්තිං ආපත්තිං නාවිකරෙය්‍ය, සම්පජ්ජාන මුසාවා දසස හොති"

යම්කිසි භික්ෂුවක් තුන්වන වර දක්වා අස්වනු ලබන කල්හි සිහි කරන්නේ ඇති වරදක් එළි නොකරන්නේ නම් ඔහුට දැන බොරුකීම සිදුවේ. මෙසේ ඇති වරද නොකීමේදී නිශ්ශබ්දව සිටීමේදී සම්පජාන මුසාවාදයෙහි දුක්කටාපත්තිය සිදුවේ. එහෙයින් අකුසල වාග් කර්මය මනොද්වාරයෙහිද හටගැණේ යයි, විතන්ඩාවාදිය තර්ක කරයි. මෙහිදී කාය සෙලවීමක් හෝ වචනයෙන් කීමක් නැතිව මුසාවද වරදකට ඔහු පැමිණෙන බව මෙයින් දැක්වෙන බව ඔහු කියයි.

මෙහි අදහස, භික්ෂූන් වහන්සේලා පාමොක් උදෙසන (පොහෝ කරණ) කළ යම්කිසි භික්ෂුවක් තමන් ඒ වරද කට පැමිණියේ නම්, එය සිහි කරන්නේ නම්, එය එවේලේම කිවයුතුය කලින් ආරෝචනය කළ දෙසීමෙන් පිරිසිදු නොවූ ඇවැතක් තිබේ නම්, එය කිව යුතුය ඉතින් එහෙම වරදක් තියාගෙන ප්‍රාතිමොක්ෂය කියන භික්ෂුව, මෙතෙක් මේ ඇවැත් දේශනා කළ ඔබ වහන් සේලා මෙයින් පිරිසිදු ද? දෙවනුවත් විචාරමි. කෙසේද පිරිසිදු ද? තුන් වෙනුවත් විචාරමි. කෙසේද පිරිසිදුද යි මෙසේ තුන්වරක් විචාරද්දී ඒ වරද කළ, පිරිසිදු නොවූ භික්ෂුව නොකියා නිශ්ශබ්දව සිටියොත්, හහුට මුසාවාදයේ දුක්කට නම් වරද සිදුවේ. සාමාන්‍ය මුසාවාදයෙහි සිදු වන්නේ පච්තියෙකි. මෙහි දුක්කටය. මෙය මුසාවාද ලක්ෂණයෙන් නොව, වචනය ක්‍රියාවේ නොයෙදීමෙන් වන වචීද්වාරයෙන් අකිරිය සමුට්ඨාන හෙවත් ක්‍රියා නොකිරී මෙන් වන ආපත්තියකි.

තමන් අතින් වුණු වරදක් නොකියා සිටීම බොරු කිරීමකි. එය වරදකි. එහෙත් එය බොරුකීම තරම් ලොකු වරදක් නොවේ. එහෙත් එහි බුදු අණ කැඩීමක් හෙයින් සගමොක් දෙකට අන්තරායකරය.

මෙහි කම්මය අකුසල වචීකම්මය යි. දෙරටුව වචනය ක්‍රියාවේ නොයෙදූ නිසා මනොද්වාරයෙහි හට ගැණේයයි විරුඩවාදියා කියයි.

මේ දේශනාව නෙය්‍යත්ථය හෙවත් පමුණුවාගතයුතු අර්ථ ඇත්තේය. මෙසේ ඔහුගෙන් වැඩිදුරටත් විමසිය යුතුය. "විනයස්ස ද්වෙමූලානි" විනයට මුල් දෙකකි. එනම් කය වචන දෙකයි මනොද්වාරයෙහි ඇවැත් පැමිණවීමක් නැත. ඉතින් ඔබ මනොද්වාරයෙහි පණවානම් එය නොදෙසුවක් දෙසුවයි කීමෙන් බුදුරදුන්ට නින්ද කරන්නෙකි. බුදුදහමට පහර ගසන්නෙක් නොවේද?

සම්පජාන මුසාවාදය ක්‍රියාවෙන් හටගනීද? ක්‍රියා නොකිරීමෙන් හට ගණීද? ක්‍රියාවෙන් හටගණීයි. එසේ නම් ක්‍රියා කිරීමක් මෙහි නැත. මෙහි ක්‍රියාව නම් කිවයුතුදෙය නොකියා හැරීමයි. කියා නොකිරිමයි එමනිසා මෙහි වචනයෙන් කිවයුතු දෙය නොකියා හිඳීමෙන් වාග්ද්වාරයෙහි අකිරිය සමට්ඨාන වරදට අසුවේ. මනොද්වාරයෙහි ඇවැත් නොවේ මෙසේ කතා නොකර සිටීමෙනුත්, වාග්ද්වාරයෙහි ඇවැත් සිදුවේ. එහෙයින් අකුසල වචී කම්මය මනොද්වාරයෙහි සිදුනොවන බව නිශ්චයට පැමිණිය යුතුය.

මනොකම්ම–මනොද්වාරය 5

කය වචනයන් ක්‍රියා නොකරවා අභිජ්ඣා, ව්‍යාපාද, මිච්ඡා දිට්ඨි සිත් උපදවාද, එකල්හි මනොකම්මය මනොද්වාරයෙහි හටගණී. මෙසේ අකුසල මනොකම්මයන් මනොද්වාරයෙහි හටගන්නා අයුරුද, දතයුතුය. මෙහිදී චේතනා කම්මයද, චේතනා සම්පයුත්ය කර්මයන්ද මනොද්වාරයෙහිමය.

සාවර්ජ්ජනං භවංගන්තු මනෝද්වාර වචී වුච්චති

ආවර්ජනයෙහි යෙදෙන භවංග සිත මනෝද්වාරයයි ගන්නා ලද හෙයින්, මෙහි මනෝද්වාරය නම් මනොද්වා රාවජ්ජන සිතයි.

මනෝකම්ම-කායද්වාරය 6

අභිජ්ඣා සහගත සිතින් සොරකම් ආදිය සඳහා අන් සතුදෙය අල්වාද, ව්‍යාපාද සහගත සිතින් සතුන් මැරීමට ගන්නා ආයුධ අල්වාද, මිසදිටුවෙන් හුතුම, සිව ආදී දෙවිවරුන් ශ්‍රෙෂ්ඨ යැයි වඳිද, එකල්හි අකුශලය මනො කම්මයයි. ද්වාරය කායද්වාරයයි. මෙසේ අකුසල මනො කර්මය කායද්වාරයෙහි හටගැණේ.

මනෝකම්ම-වචීද්වාරය 7

අභිජ්ඣා සහගත සිතින් අනේ අසවලාගේ දෙය මට වේවායි, අනුන්ගේ දෙය අභිමුඛ කොට සිතා කියාද ව්‍යාපාදයෙන් මොවුන් නැසේවා වැනසේවායි කියාද? මිසදිටුවෙන් දුන් දෙයෙහි විපාක නැත ආදිය කියාද? එකල කර්මය මනො කර්මයයි. දෙරටුව වචීද් වාරයයි.

මේ දෙතන්හි චේතනා කර්මය බලවත් කරණ ලද්දේ, අභිජ්ඣා ආදි සම්ප්‍රයුක්ත කර්මයන් විසිනි. එහෙයින් චේතනා කර්මයට ඉහළින්, සම්ප්‍රයුක්ත කර්ම යන් නැගී සිටින බව දක්වන ලදී.

මෙසේ අකුසල කාය කර්මයන්, කාය වචීද්වාරයන්හි හට ගැණේ.

අකුසල මනොකම්මය කාය වචී මනොද්වාරයන්හි හටගැණේ.

# 13

### නමො සම්මාසම්බුද්ධස්ස

### ද්වාර සංසන්දනය

අකුසල කාය කම්ම වචීකම්ම මනොකම්මයන්ගේ දෙරටු සසඳා බැලීම පසුගිය පත්‍රිකාවන්හි විස්තර කරණ ලදී. මෙහිදී කුසල කර්මයන්ගේ ද්වාරයන් (දෙරටු) එක් කොට බැලීම කරණු ලැබේ.

### දස කුසල කර්මපථ

1 ප්‍රාණඝාතයෙන් වැලකීම
2 අදත්තාදානයෙන් වැලකීම.
3 වැරදි කාම සේවනයෙන් වැලකීම.

මේවා කර්මපථ බවට පත්වන්නේ කය පිළිබඳවය.

4 මුසාවාදයෙන් වැලකීම,
5 පිසුණාවාචයෙන් ,,
6 ඵරුසාවාචයෙන් ,,
7 සම්ඵප්පලාපයෙන්,,

මේවා කර්මපථ බවට පත්වන්නේ වචනය පිළිබඳවය. (සංවරයෙනි) එහෙයින් කුසල වචී කම්මය.

8 අනභිජ්ඣා
9 අව්‍යාපාද
10 සම්මාදිට්ඨි

මේවා කම්ම කම්මපථ වන්නේ සිතෙන් සිදුවීමෙනි. එහෙයින් කුසල මනො කම්මය.

කය, වචනය, සිත යන තුන් දෙරින් සිදුවන දස අකුසල කර්මයෙන් වැලකීම, සංවරය ඒ ඒ දෙරටු පිළිබඳවම සිදුවිය යුතුය. එහෙයින් ඒ ඒ අකුසලයන් සිදු

වන දොරටුවලම කුසලයන්ගෙන් වැලකීම පිළිබඳ කර්ම කර්මද්වාරයන් නියම වේ. විශේෂයක් නම් අකුසල කාය කම්ම කායද්වාරයෙහිද වාග්ද්වාරයෙහිද හටගණී. මනොද්වාරයෙහි හට නොගනී. එසේම අකුසල වචීකම්ම වාග් ද්වාර කායද්වාරයෙහිද, හටගනී. මනොද්වාරයෙහි හට නොගනී. අකුසල මනොකම්ම මනොද්වාරයෙහිද, කාය වචිද්වාරයෙහිද හටගනී. ඒ පිළිබඳ සම්පූර්ණ විස්තරය පසුගිය ද්වාර සංසන්දනය 1-2 පත්‍රිකාවන්හි දක්වන ලදී.

දස කුසල දොරටුවලට බෙදන සැටි ඉහත දක්වන ලදී. එහි විශෙෂයක් නම් කුසල කාය කම්මය, කාය ද්වාරය වචිද්වාර, මනොද්වාර යන දොරටු තුණෙහිද වචී කම්මය, වචීද්වාර, කායද්වාර, මනොද්වාර යන දොරටු තුණෙහිද,

මනො කම්මය, මනොද්වාර, කායද්වාර, වචීද්වාරයන්හිද හටගනී. ඒ පිළිබඳව විමසා බැලීමට පෙර ඒ සිදුවන ආකාරය තේරුම් ගත යුතුය.

1 කුසල කාය කම්ම-කායද්වාරය

කථා කරන්නට බැරි කෙනෙක් ප්‍රාණඝාතයෙන් අදත්තාදානයෙන් වැරදි කාම සේවනයෙන් වැලකීමේ ශික්‍ෂා පද වචනයෙන් නොකියා අතින් හෝ හිසෙන් හැඟවීමෙන් සමාදන් වෙයි. ඒ කුසල කාය කර්මය කායද්වාරයෙහි හටගැණීමයි.

2 කුසල කාය කමම- වචීද්වාරය.

එම පාණාතිපාතාදි සිකපද වචනයෙන් කියා සමාදන් වෙයිද, එකල කුසල කාය කමමය වචීද්වාරයෙහි හටගැණේ.

3 කුසල කායකම්ම-මනොද්වාරයෙහි.

එම සිකපද කය වචනයන් ක්‍රියාවේ නොයොදවා සිතින් සමාදන්වීමෙන් කුසල කාය කර්ම මනොද්වාරයෙහි හටගැණේ.

4 කුසල වචී කම්ම-වචීද්වාරයෙහි.

මුසාවාද වෙරමණී ආදී සිකපද සතර වචනයෙන් කියා සමාදන් වීමෙන්, කුසල වචී කම්මය වචීද්වාරයෙහි හටගැණේ.

5 කුසල වචී කම්මය-කායද්වාරයෙහි.

එම සිකපද සතර වචනයෙන් නොකියා අතින් හිසින් ආදී අංග චලනයෙන් සමාදන් වීමෙන් කුසල වචී කම්මය කායද්වාරයෙහි හටගැණේ.

6 කුසල වචී කම්මය මනොද්වාරයෙහි.

එම සිකපදම කය වචනයෙන් නොගෙන, සිතෙන් සමාදන් වෙයිද, එවිට කුසල වචීකම්මය මනොද්වාර යෙහි හට ගැණේ.

7 කුසල මනො කම්මය-මනොද්වාරයෙහි.

කය වචනයෙන් හැඟවීමක් නැතිව අභිජ්ඣාවෙන් සිත පිරිසිදු කරයිද, ව්‍යාපාදයෙන් තොරව මෛත්‍රිය වඩයිද? මිසදිටුව දුරු කරයිද; එවිට කුසල මනො කම්ම මනොද්වාරයෙහි හටගැණේ.

8 කුසල මනො කම්මය-කායද්වාරයෙහි.

අභිජ්ඣාවෙන්, ව්‍යාපාදයෙන්, මිසදිටුවෙන් තොරව චෛත්‍ය මලු ඇමදීම ආදිය කරයිද, එවිට කුසල මනො කම්මය – කායද්වාරයෙහි හටගැණේ.

9 කුසල මනො කම්මය-වචීද්වාරයෙහි.

අභිජ්ඣාවෙන් තොර වූ සිතින් යුතුව අනුන්ගේ දෙය මට නොවේවායි කියාද, සියලු සත්‍වයෝ සුවපත් වෙත්වායි වචනයෙන් මෙත් වඩාද, දුන් දෙයෙහි ඵලවිපාක ඇතැයි සම්මාදිට්ඨියෙන් යුතුව කියාද, කම්ය මනො කම්මය, දොරටුව මනොද්වාරයයි.

චිත්ත වීථින් ඇතිවීමේදී, මනොද්වාරය යනුවෙන් ගැණෙන්නේ ආවර්ජනයට නැමුණු භවංගයි. මෙහි කර්මද් වාර වශයෙන් කුසලාකුසල සිත්ම මනොද්වාරය වේයි.

කර්මය යනුවෙන් චේතනා සම්ප්‍රයුක්ත කර්ම වශයෙන් එක්ව බලවත්ව යෙදෙන අභිජ්ඣා ව්‍යාපාද, මිථ්‍යා දිට්ඨි, අනභිජ්ඣා, අව්‍යාපාද, සම්මාදිට්ඨි හා කර්මය නැති කරන කර්ම වශයෙන් සත්ත බොජ්ඣංග, අට්ඨ මග්ගංග ධර්මත් සූත්‍ර දේශනාවෙහි දක්වෙන බව ඉහත සඳහන්ය.

අකුසල් කාය වචීකම්ම මනොද්වාරයෙහි නො හට ගැණේ. එසේ හටගැණේ නම් සිතටද විනය නීති පැණ විය යුතුවා පමණක් නොව, ශික්ෂා පද පැණවීම හා රැකීමද ඉතා දුෂ්කර වන්නේය. නිවන් දැකීමේ මූලික පිය වර තබන්නට, හෙවත් පිරිසිදු ශීලයක පිහිටීමද දුෂ්කර වන්නේය.

පට්ඨානයේදී "අකුශලා චේතනා සම්පයුත්තකානං ඛන්ධානං කම්ම පච්චයෙන පච්චයො" යනුවෙන් අකුශල චේතනාව එක්ව යෙදෙන සියලු චිත්ත චෛතසිකයන්ට කර්ම ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යවන බව දක්වන ලදී ඒ සහජාත වශයෙනි. චිත්තජ රූපයන්ට හා පටිසන්ධි ප්‍රවෘත්ති විපාකස්ඛන්ධයන්ට අකුශල චේතනාව අව්‍යාකෘත ධර්මයන්ට කර්මප්‍රත්‍යයෙන් ප්‍රත්‍ය වේ. මේ නානාක්ෂණික වශයෙනි. කුසලයෙහිද මෙසේය. මෙසේ අභිධර්මයේදී චේතනාවගේ කර්ම ශක්තිය මිස අනිත් කිසි චෛතසිකයක කර්මප්‍රත්‍ය ශක්තියක් දක්වා නැත.

අභිජ්ඣාදී ධර්මයන්ගේ හේතුප්‍රත්‍ය ශක්තින් වදුරා ඇත. කරුණු අනුව සළකා බැලීමේ ලෝභයේ ඉතා දියුණු වූ අවස්ථාව අභිජ්ඣාවයි. එය අකුශල චේතනාව ශක්තිමත් කිරීමට හේතුවන හෙයින් උපකාර ලබන එක්කෙනාට වඩා උපකාරකයා ඉස්මතුව පෙනෙන හෙයින්, සූත්‍රාන්තයේදී ඒවාත් ව්‍යවහාරයට අනුව කර්ම බැගෙන් වදාළ බව සිතිය යුතුය.

කුශල කර්මයන්ගේ විශෙෂයක් නම්: කුසල කාය වචී කම්මයන් මනොද්වාරයෙහිද හටගැනීමයි. එයින් තේරුම් ගත යුතුව ඇත්තේ, අකුශලයන්ගෙන් වැළකීමට කුසල් සිත්හිම යෙදෙන විරති චෛතසිකයන්ගේ බලය බව සිතිය හැකිය. විරතිය අකුසල් සිත්හි නොයෙදේ. කයින් කළයුතු, වචනයෙන් කියයුතු අකුසලයන්ගෙන් වැළකීම කාය වචනයන් ක්‍රියාවේ නොයොදවා, සිතින් ම සිතන විට සිත්හිද විරතිය යෙදෙන බැවින් කුසල කාය කර්මාදිය, මනොද්වාරයෙහි හටගැණේ.

සතෙක් නොමරා කයින් ක්‍රියා නොකොට, සිතෙන් මැරේවායි, සිතිම ව්‍යාපාදයෙහි වැටෙන හෙයින් එය අකුශල මනො කම්ම-මනොද්වාරයම වෙයි.

අණකොට සතුන් මැරීමේදී, කර්මය කායකර්මය ද්වරය කායද්වාරයයි, කීමෙන් කර්මය රැකේ. දොර බිඳේ අතින් ඇඟවීමෙන් බොරු කීමේද, කර්මය කාය කර්මය දොරටුව කායද්වාරයැයි කිවොත් කර්මය බිඳේ. දොරටුව රැකේ.

මෙසේ ඉතා සියුම් වූ කම්මාන්තරයන් වටහා ගෙන සම්මාදිට්ඨියෙහි පිහිටා ශාන්ත නිවන් සැප ලබත්වා.

# 14

## නමො සම්මාසම්බුද්ධස්ස

සත්වැනි අභිධර්ම පාඩමෙහි දක්වූ පරිදි 1. ක
2. කම්මද්වාරයන් හා ද්වාර සංසන්දනය පසුගිය පඨ
මන්හි විස්තර කරණ ලදී.

3. විඤ්ඤාණ පහ
3. විඤ්ඤාණ දොරටු පහ
5. ඵස්ස සය
6. ඵස්ස දොරටු සය
7. අසංවර අට
8. අසංවර දොරටු අට
9. සංවර අට
10. සංවර දොරටු අට

**3. විඤ්ඤාණ පහ**

චක්ඛු විඤ්ඤාණ, සොත, ඝාණ, ජිව්හා· කාය විඤ්
යනු විඤ්ඤාණ පහයි. දැනගණියිනු විඤ්ඤාණ නම්
කුමක් ද දැනගන්නේ? අරමුණුයි. සිතක් පහළවීමට එ
එල්බීමට යම්කිසි අරමුණක් ඇතිවිය යුතුය. අරමු
නැතිව කිසිම සිතක් පහළ නොවේ. එහෙයින් සි
සිත්ම අරමුණු ගන්නා හෙයින් විඤ්ඤාණය, ඇස ඇ
කොට අරමුණු ගන්නා සිතට චක්ඛු විඤ්ඤාණයයි කි
ලැබේ. මෙසේ සොත විඤ්ඤාණාදී සිත් ද දතයුතුය.

විජානාතීතිඛො භික්ඛවෙ තස්මා විඤ්ඤාණන්
වුච්චති"

මහණෙනි, දැනගනීනුයි එහෙයින් විඤ්ඤාණය
කියනු ලැබේ. සියළු සිත්වලටම විඤ්ඤාණ නාමය සා
රණ හෙයින් මෙහි චක්ඛු විඤ්ඤාණ යනාදීන් වෙ

දක්වා ඇත්තේ පස් දෙරින් (සදෙරින්ම) අරමුණු ගැනීම ඉතා ප්‍රකට නිසායැයි සිතාගත හැක. අනිත් සම්පටිච්ඡන සන්තීරණ, වොත්ථපන, ජවනාදි සිත් චක්ඛු විඤ්ඤාණාදී සිත්වලින් ගන්නාලද අරමුණ පිළිගැනීම, තීරණය කිරීම අවසන් නිරණයෙන් පිහිටුවීම, ඇලීම හෝ ගැටීම කරණ හෙයින් පලමුකොට අරමුණ දැනගන්නා සිත විඤ්ඤාණ නාමයෙන් වෙසෙසා දැක්වීම වරදක් නොවේ.

### 4. විඤ්ඤාණ දෙරටු පහ

චක්ඛු විඤ්ඤාණ දෙරටුව, සොත, ඝාණ, ජිව්හා, කාය විඤ්ඤාණ දෙරටුවයැයි දෙරටු පහය. මේ දෙරටු පහ ඇසුර ලබා චක්ඛු විඤ්ඤාණයේ උපදනා චේතනාව කාය කර්මය හෝ වචී කර්මය නොවේ. මනොකම්මය වේ.

මෙහි චක්ඛු විඤ්ඤාණ, සම්පටිච්ඡන, සන්තීරණ, සිත් විපාකය,, වොත්ථපන ක්‍රියාය. විපාක කිරිය ,,සිත් නිරුත් සාහ සාන්ත භාවයෙන් යුතුය. මතු විපාක දීමේ උණුසු මක් නැත. චේතනාව කොහි යෙදුනත් කර්මයක් කරයි. එනම් චිත්ත චෛතසික එක අරමුණකට යොමුකොට එකක් කිරීමට සැලැස්වීමයි. මේ සිත්හි චේතනාව නිරුත් සාහ සාන්ත මතු විපාක පහළ නොකරණ, පෙර කරණ ලද කුශලාකුශලයන්ගේ විපාක (වොත්ථපන හැර) වන හෙයින් මෙහි යෙදෙන කම්මය අබ්‍යාකතය. "විපාකාබ්‍යා කතා කිරියාබ්‍යාකතා චේතනා සම්පයුත්ත කානං ඛන්ධානං චිත්තසමුට්ඨානානංච රූපානං කම්ම පච්චයෙන පච්චයො" යනුවෙන් එම චේතනාවන්ද කර්මප්‍රත්‍ය ශක්තිය ලබන බව පට්ඨානයේ දක්වන ලදී. එහෙයින් විපාක කිරිය සිත්හි යෙදෙන චේතනාව මතු විපාක නොදෙන අබ්‍යාකත කම්මය.

### 5 ඵස්ස සය

චක්ඛු සම්ඵස්ස, සොත, ඝාණ, ජිව්හා, කාය, මනො සම්ඵස්ස යනුයි.

## 6 ඵස්ස දොරමු සය

චක්ඛු සම්ඵස්ස ද්වාරය, සොත, ඝාණ, ජිව්හා කාය මනොසම්ඵස්ස ද්වාරය යනුයි.

මෙහි ඵස්ස යනුවෙන් ගැණෙන්නේ සිත්හි පහළවන ඵස්ස චෛතසිකයයි. සෑම සිතක් පාසාම අරමුණ ගන්නා සිත අරමුණට මුණගස්සන අයුරින් පහළවන චෛතසික යයි. හෙවත් සිතේ ඇතිවන ගතියයි. එහෙයින් එයද මෙහි දක්වන ලදී.

## 7 සංවර අට

චක්ඛු අසංවරය, සොත, ඝාන, ජිව්හා කාය, චොපන කාය, අසංවරය, වාචා අසංවරය, මනො අසංවරයයි අසං වර අටයි.

## 8 අසංවර දොරමු අට

චක්ඛු අසංවර දොරටුව; සොත, ඝාණ, ජිව්හා, පසාද කාය, චොපන කාය, වාචා මනො අසංවරද්වාරය යනුයි. අසංවර නම් අර්ථවශයෙන් දුශ්ශීල බව, මුළා සිහිය නොදැනීම, නොයිවසීම, කුසීත කම යන පහයි.

(දුශ්සීල්‍යං, මුට්ඨ සච්චං, අඤ්ඤාණං, අක්ඛන්තිං, කොසජ්ජං) මේවාද අතිකක් නොව සිතෙහිම ඇතිවන ගතිය. චෛතසික ස්වභාවය. මේවා චක්ඛු විඤ්ඤාණාදී චොප්පනය අවසන් කොට ඇති සිත්හි නොයෙදේ. එහෙයින් එම සිත්හි අසංවරයක් හෝ සංවරයක් නැත. ඒ සිත් කලින් හෙවත් පෙර ආත්මවල හෝ රැස්කළ කුසලාකුසල සිත්හි විපාකයෝය. ඡායාවෝය. අහේතුකයෝය. අමුතු උත්සාහයක් ක්‍රියාකාරිත්වයක් නැත. එහි සෑම දෙයක්ම කලින් කරණ ලද කුසලාකුසල කර්මයන්ගෙන්ම සපයන ලද ඒවාය.

මේවා උපදින්නේ ජවන් සිත්හිය. එහෙයින් "ජවනේ උප්පන්නොපි පඤ්චද්වාරෙ අසංවරො වුච්චති' මේ දුශ් සීලාදි ජවනයෙහි උපන්නේ නමුදු ඒ ඒ චිත්ත වීථින්ට

අනුව ඒ ඒ දොරටුවලම අසංවරයැයි කියන ලදී. මක්නිසාද ඒ සිත් පෙළම ගමන් කරන්නේ ඒ දොරටුව ඇසුරු කරමිනි. ඒ ජවනයන්ට අනුව පළමුව ක්‍රියා කාරී වන්නේත් එම දොරටුවම බව වටහාගත් විට චක්ඛුවාරික ජවනයේ පහළ වන දුශ්සීල බව, මුළාසිහිය අරමුණෙහි නියම තත්වය වසා පවත්නා ගතිය, නොසිවසීම, කුසීත බව, චක්ඛු අසංවරයයි.

චක්ඛුවාරය සම්පටිච්ඡන සිතෙහි ඇති වන ඵස්සය මනොසම්ඵස්සයයි. චක්ඛුසම්ඵස්සවාරයයි. චේතනාව මනොකම්මයයි. සිත මනොකම්මවාරයයි. මෙහි අසංවරයක් නැත. මෙසේ සන්තීරණ වොඨ්ඨපනයන්හිද ගතයුතුය.

එම ජවනයෙහි පහළවන ඵස්සය මනො සම්ඵස්යයි. මනො සම්ඵස්සවාර යයි. චේතනාව මනොකම්මයයි සිත මනොකම්මවාරයයි. මෙහි අසංවරය චක්ඛු අසංවරයයි.

මෙසේ සොත, ඝාණ, ජිව්හා, පසාද කාය වාරික ජවනයන්හිද දත යුතුයි. මෙසේ යම් වේලාවක රූපාදී අරමුණක් ලැබ මනොවාරික ජවනය (සත්වැනි ජවනය) වචීවාරය හැර තනිකර කායවාරය සොළවමින් උපදීද, එවෙලෙහි ඒ ජවනයෙහි යෙදෙන ඵස්සය මනො සම්ඵස්සයයි. චෙතනාව කාය කර්මයයි. චිත්තය මනොවාරය නොවේ. කායවාරය සෙලඹුන බැවිනි. එහෙයින් එය කායවාරයයි. අසංවරය, චොපන කාය අසංවරයයි. මෙසේම වචනය සෙලවීමෙන්, හෙවත් වාග්වාරය ක්‍රියා කිරීමෙන්ද වාචා අසංවරය වෙයි මේ දෙතන්හිම සිත මනොවාර බවට නොපැමිණේ. අබ්බොහාරික නොකිය යුතු යන තේරුමයි එහෙයින් මේ දෙතැන සිත මනො වාරයයි. නොකිය යුතුය.

යම් වේලාවක ජවන් සිත කායවාර වචීවාරයන් නොසොලවා ශුද්ධ වූ මනොවාරයේම උපදීද එකල්හි එහි යෙදෙන ඵස්සය මනොසම්ඵස්සයයි. චේතනාව මනො කර්මයයි. සිත මනො කම්ම වාරයයි. අසංවරය මනො අසංවරයයි. අසංවරවාර යනුද, මේ අසංවරයමය.

9 සංවර අට

10 සංවර දොරමු අට

චක්ඛු සංවර සොත, ඝාණ, ජිව්හා, පසාද කාය
චොපන කාය, මනො සංවරය යනු සංවර-සංවර දොරු
අටයි. සංවර යනු, අර්ථ වශයෙන් ජවන් සිත්හි ලැබෙන
සීල, සති, ඤාණ, ඛන්ති, වීරිය යන කුසල ධර්මයෝය
මේවාද චක්ඛු චාරික කුසල ජවනයක යෙදෙන වි
චක්ඛු සංවරයයි. සොත සංවර චාරිකාදී සිත්හි යෙදෙන
විට සොත සංවර ආදී නම් ලබයි. පළමු සිත් පිළිබ
කළ විස්තරයන්ට අනුව සිතා ගැණීම ඉතා පහසුය.

මෙසේ අකුසල කුසල කර්මයන් පිළිබඳ නිවැර
විනිශ්චයක් දැන අකුසල් දුරු කොට කුසල් පුරා ශාන්
නිවන් සුව ලබත්වා.

# 15

## නමො සම්මාසම්බුද්ධස්ස

දස අකුසල කම්මපථ.

කර්මය විස්තර කිරීම සඳහා දක්වන ලද කරුණු දෙළහෙන් දසයක් පසුගිය පත්‍රිකාවන්හි දක්වන ලදී. අද එකොළොස් වැනි කාරණය එනම් දස අකුසල කම්ම පථය ගැන විස්තර වේ.

කාය කර්ම:

**1 පාණාතිපාත**

පාණ-අතිපාත=පාණාතිපාත පාණ යනු ව්‍යවහාර වශයෙන් සත්ත්වයාය. පරමාර්ථ වශයෙන් ජීවිතේන්ද්‍රියයි. අතිපාත යනු ස්වභාවයෙන් ඔහ පතනය. හෙවත් හෙළීම, ගිලිහීම, තිබියදී එයට පෙර හෙළීම, බිඳ දැමීම, නැසීම, අතිපාතයයි මෙසේ සතකුගේ ජීවිතේන්ද්‍රිය එයට නිසි නියම කාලයේදී ස්වභාවයෙන් වන චුතවීම නොව උපක්‍රමයෙන් තව එම ජීවිතේන්ද්‍රිය පවතින්නට ඉඩ ඇතැයි සැලකෙද්දී එය බිඳ දැමීම ප්‍රාණඝාතයයි. පාණාතිපාතයයි.

කෙනෙකුගේ මරණය, ආයුක්ඛය, කම්මක්ඛය, උභයක්ඛය, උපච්ඡේදක යන්වෙන් කොටස් හතරකට බෙදේ. දෙව් මිනිස් ආදී ගතියකට නියමිත ආයුකාලයක්ද ඇත. එම නියමිත ආයු කාලය ගතවීමෙන් තව කර්ම ශක්තිය ඇතද මරණය පැමිණේ.

ආයුකාලය තිබුණද යම් කර්මයකින් පිළිසිඳ ගත්තේ නම් එම කර්මයට නියමිත කාලය ගෙවීමෙන්ද මරණය සිදු වේ.

මේ දෙකම අවසන් වීමෙන්ද මරණය සිදුවේ.

ඒ ආයු නියමය, කර්ම ශක්තිය දෙකම තිබියදී බලහත් කාරයෙන් ජීවය නැතිවීම උපච්ඡේදක මරණයයි. එයද උපච්ඡේදක කර්ම ශක්තියයි.

එම උපච්ඡේදක කර්ම විපාකය ඉදිරිපත් වීමෙන් මරණයක් සිදුවන්නට තිබියදී ඒ සඳහා කෙනෙකු ඉදිරිපත්වීමෙන් ඔහු පාණාතිපාත කර්මයකට හසුවන්නේ ඔහු ඒ කර්මය විපාක දීමට උපකාර වූ නිසාය. ඇතැම් විට එම උපච්ඡේදක කර්මයට උපකාර ධර්ම නො ලැබීමෙන් ඒ පසුව විපාක දෙන්නට හෝ අහෝසි කර්මයක් වන්නට ඉඩ තිබිණ.

තවද ප්‍රාණයක් නසන්නාගේ සිත්හි වධක චේතනාවක් අවශ්‍යයෙන් ඇති වේ. මේ චේතනාව කර්මය බැවින් ඔහු කර්ම රැස්කළ කෙනෙක් වේ.

මෙහි අතිපාතය කරනු ලබන්නේ රූප ජීවිතේන්ද්‍රියයි. එනම් කර්මජ රූප කලාප නමයෙහි ලැබෙන ජීවිත රූපයයි. නාම ජීවිතේන්ද්‍රිය සිතක් බිඳෙන විට බිඳෙයි. රහතන්ගේ චුති චිත්තයෙන් මෙහා නාම ජීවිතේන්ද්‍රියාගේ අවසානයක් නොලැබේ. එහෙත් එම රූපස්කන්ධය ඇසුරු කරමින් පැවති නාම ජීවිතේන්ද්‍රිය නම් චුති සිත බිඳෙනවා සමගම බිඳේ. රූප ජීදිතේන්ද්‍රියද චුති සිතත් සමගය. චුති සිතට චිත්තක්ෂණ දහතට එහාදී හටගත් කර්මජ රූප කලාප චුති සිත තෙක් පැවති චුති සිත සමගම බිඳෙති.

නාම රූප ජීවිතේන්ද්‍රියන්ගෙන් රූප ජීවිතේන්ද්‍රිය ගස් වැල් වලටත් ඇතැයි ඇතැමුන්ගේ මතයයි. එය ධර්ම විරෝධිය. එසේ නම් ගස් වැල් ආදියත් කර්ම රැස්කර නවායයි ගත යුතුය.

ගස් කොළන්වල ඇත්තේ උතුජ රූප කලාපයය. ඒවා උරාගන්නේත් උතුජ රූපය. ඒවායේ වැඩෙන්නේත් උතුජ රූපමය. අමුතු උතුජ රූපයක් ඇඳගැනීමටත්

එයින් අමුතු උතුජ රූප හටගැනීමත් බීජ නිසාමය. මේ අනුව උතුජ රූපයන්ගේම වෙනස් සංයෝග බල පැවැත්වීමෙනි. සිහිල් දේශගුණයකත් උෂ්ණ දේශගුණය කත් හැදෙන එක වගීයේ ගස්වැල්වල ඇති වෙනස ගැණද සැලකිය යුතුය. එහෙත් බුඩ කාලයේ සිට මහා ජනයා ගස් කොලන්වලටද රූප ජීවිතේන්ද්‍රියක් ඇතැයි පිළිගෙන තිබුණ බව විනයෙහි සඳහන් වේ. එය බුදුරදුන් පිළිගත්තා නොවේ. බුඩ ධර්මයේ එය ඔප්පු නොවේ.

"රූප ජීවිතෙන්ද්‍රියං කටත්තා රූපානං ඉංද්‍රිය පච්චයෙන පච්චයො" යනුවෙන් පට්ඨානයේ රූප ජීවිතේන්ද්‍රිය කර්මජ රූප වලට පමණක් ඉන්ද්‍රිය ප්‍රත්‍ය සක්තියෙන් උපකාර කරන බව දැක්වේ එහෙයින් කර්මජ රූප නැති තැනෙක ජීවිතෙන්ද්‍රිය රූපය ඇතැයි ගැනීම ධර්ම විරෝධිය. එහෙයින් ගස් කොළන් කැඩීමෙන් ප්‍රාණඝාතයක් සිදු නොවේ. උප සපත් භික්‍ෂුන්ට ප්‍රඥප්ති – පැනවීම වරදක් වශයෙන් පවිතියකි. එය දශ අකුශලයට ගැණෙන ලෝක වද්‍යයක් නොවේ.

මෙසේ ප්‍රාණයක් කෙරෙහි පණ ඇතැයි හැඟීමෙන් ජීවිතෙන්ද්‍රිය සිඳ දමන උපක්‍රමයෙන් හටගත් කය වචන දෙරටුවෙකින් ක්‍රියාකාරි වුණු චේතනාව ප්‍රාණඝාතයයි.

කුඩා ප්‍රාණියෙකු මෙ නම් අල්ප සාවද්‍යයය.

මහත් ප්‍රාණියෙකු නම් මහා සාවද්‍යයය.

උපක්‍රමය වෙනස් වන නිසාද සමාන උපක්‍රම්යන් යෙදුවද සත්වයාගේ ලොකු කුඩා කම නිසාද ඒසේ වෙයි. මහත් ගුණ ඇති ප්‍රාණියෙකු නම් මහා සාවද්‍යයය. අල්ප ගුණ ඇති නම් අල්ප සාවද්‍යයය. කෙළෙසුන්ගේද උපක්‍රම යේද දරුණු මෘදු ගති උඩද අල්ප සාවද්‍ය මහා සාවද්‍ය වේ.

අංග පහයි.

ප්‍රාණියෙක්වීම ප්‍රාණියෙක් යයි හැඟීම වදක සිත උපක්‍රමය එයින් මැරීම,

**ප්‍රයෝග හයයි**

තමන් අතින් මැරීම - සාහත්ථික

අණ කොට මැරීම - ආණත්තික

| | |
|---|---|
| බොරු වලේ දමා ආදියෙන් මැරීම | - ථාවර |
| විද්‍යාවෙන් මැරීම | - විජ්ජාමය |
| බාහිර සෘධියෙන් මැරීම | - ඉද්ධිමය |
| දමාගසා මැරීම | - නිසග්ගිය යනුයි. |

**2 අදින්නාදානය**

අදින්න - ආදාන අදින්න නම් නුදුන් දෙයයි. ආදාන නම් ගැණීමයි. මෙසේ නුදුන් දෙය ගැණීම අදින්නාදාන යයි. අනුන් අයිති දෙයක් අනුන් අයිතිය යන හැඟීමෙන් එය ගැණීමේ උපක්‍රමය හටගත් ථෙයිය චේතනාව අදත්තාදානයයි.

වටිනාකම අඩු දෙයෙහි අල්පසාවද්‍යයි.

ප්‍රණීත හෙවත් වටිනාකම වැඩි දෙයෙහි මහාසාවද්‍යයි.

ගුණ හීනයන් සතු දෙයෙහි අල්ප සාවද්‍යයි. ගුණ අධිකයන් සතු දෙයෙහි මහා සාවද්‍යයි.

**අංග පහයි**

අන්සතු දෙයක්වීම, අන්සතු බව දැනීම, සොර සිත, උපක්‍රමය, එයින් ගැණීම, මුලින් ප්‍රාණ වධයෙහි කියන ලද සාහත්ථිකාදි ප්‍රයෝග සයද අදත්තාදානයෙහිද ලැබේ. ගැනීමේ ක්‍රම වශයෙන්:

| | |
|---|---|
| සොරෙන් ගැනීම | - ථෙය්‍යාවහාර |
| බලහත්කාරයෙන් ගැනීම් | - පසය්හවහාර |

හොඳනම් උවමනා දෙය නම් ගැනීම නරක නම් නොගැනීම ආදීන් පරිකල්පනයෙන් ගැනීම කුසපත් ආදිය එංචාවෙන් ගැනීම යනුවෙන් පස් ආකාරය. මෙය විනයෙහි පස්විසි අවහාර වශයෙන්ද දක්වා ඇත.

**3 කාමෙසුමිච්ඡාචාර**

මෙහි කාමයන්හි යනු මෛථුන්දමෙහිය. මිච්ඡාචාර නම් නින්දිත පහත් හැසිරීමෙහි යෙදෙන අදහසින් කායද්වාරයෙහි පැවැති නොයායුතු තන්හි යෙදීමේ චේතනාව කාමයන්හි වරදවා හැසිරීමයි. නොයායුතු තැන් පුරුෂයන්ට: මව විසින් රකිනා, පියා මව්පිය දෙදෙනා, සොහොයුරා, සොහොයුරී, නෑයන් ගෝත්‍රය ධර්මය විසින් රකිනා ස්ත්‍රීන් අට දෙනාද, සාරක්ඛා සපරි දණ්ඩා, ධනක්කීතා, ඡන්දවාසිනී, භොගවාසිනී, පට වාසිනී, ඕදපත්තකිනී ඔභට චුම්බටා, දාසීච භරියා කම්මකාරීච භරියාධජාහටා මුහුත්තිකා යන ස්ත්‍රීන් කෙරෙහිද යෑමෙන් පුරුෂයාට කාමයන්හි වරදවා හැසිරීමෙහි කර්මපථ භෙදයවේ. මෙහි සාරක්ඛා ආදි දොළොස් ස්ත්‍රීන්ටද පුරුෂයන් කරා යෑමෙන් කර්ම පථ භෙදය වේ. ශීලාදී ගුණ සම්පන්න නම් මහ සාවද්‍යය. ගුණ අඩු නම් අල්ප සාවද්‍ය වේ

**අංග සතරයි**

1 නොසෙවිය යුතු කෙනෙකුවීම, 2 සේවන සිත 3 සේවන උපක්‍රමය 4 මගින් මග පැමිණීම ඉවසීම තමා අතින්ම සිදුවිය යුතු හෙයින් මෙය සාහත්ථික නම්.

# 16

නමො සම්මාසම්බුද්ධස්ස

දස අකුසල කම්ම පථ 2.

පසුගිය පත්‍රිකාවේ, කාය කර්ම විස්තර කරණ ලදී.

**වචී කර්‍ම**

**4 මුසාවාද**

මුසානම් වැරැද්දීම පෙරටුකොට අර්ථ භංජන හෙවත් පාඩුවක් කරණ වචිප්‍රයෝගය හෝ කායප්‍රයෝගයයි. අනිකෙකුට අනිත් දෙයක් වැරැද්දීමේ කාය වාග් විඤ්ඤතති ඇති කරන ජවන් සිත්හි පහළ වූ චේතනාව මුසාවාදයයි. තවත් ක්‍රමයකට මුසා කියන්නේ බොරු හෙවත් නොවූ දෙයක්ය. එය ඇති වූ දෙයක්, සත්‍ය දෙයක් වශයෙන් කීම මුසාවාදය. එයින් සුළු පාඩුවක් නම් වෙත්තේ අල්ප සාවද්‍යය.

තමා සතු දෙයක් දීමට අකැමැත්තෙක් නැතැයි කීම අල්පසාවද්‍යය. ඇත්ත නැතී කොට සාක්කි දීමෙන් මහා සාවද්‍යය. ගිතෙල් තලතෙල් ආදිය පිඹු සිහා ගොස් ලැබ අද තෙල් ගඟක් ගලනවායැයි කීච අල්පසාවද්‍යය. නොදුටු දෙය දුටුවායැයි කීම මහා සාවද්‍යය.

**අංග සතරයි**

1 නොසිදුවුණු දෙයක් වීම,
2 වෙනස් කරණ හෝ වරදවන සිත
3 ඒ සඳහා උත්සාහ කිරීම
4 අනිත් අය විශ්වාස කිරීම

# 17

## නමො සම්මාසම්බුද්ධස්ස

**දස අකුසල කම් පථ**

වචී කම්ම ගිය පාඩමේ විස්තර කරන ලදී.

**මනො කම්ම:**

8. අභිජ්ඣා :

පෙනෙන, ඇසෙන, නොයෙකුත් අරමුණු ගනිමින් සිත් පහළ වන සැටිද, ඒ සිත් වැඩි හරියක ඇලීමක් බැඳීමක්, කිපීමක්, නරක්වීමක්, ඇතිවන සැටිද, ඉතාම ටිකක් මධ්‍යස්ථව බලන ගතියක් ඇතිවන සැටිද නුවණින් සලකා බලන හැමටම වටහා ගත හැකිය භාවනා කිරීමෙන් සිත දියුණු නොකළ අය ගැන නම් කියයුත්තේ හොඳ සිතත් මැදහත්ව බලන නො ඇලීම්, නොගැටීම් සහගත සිතක් ලැබෙන්නේ ඉතා කලාතුරකින් බවය. තමන් සතු දෙයෙහි ලෝභය, සාධාරණය, අනුන් සතු දෙයෙහි ඇතිවන ලෝභය විෂම ලෝභයයි.

අභිජ්ඣාව නම් ලෝභයෙහි විෂම දරුණු අවස්ථාවයි අනුන් අයත් දෙයක් අභිමුඛ කොට හෙවත් අරමුණු කොට එය තමාට ලබා ගැනීමේ, නතුකර ගැනීමේ චේතනාවෙන් මැඩුනු දරුණු ලෝභය අභිජ්ඣාවයි.

අභි ශබ්දයෙන් ඉදිරිපත් කොට ගැනීමද, (ඣෙචිංතායං) "ඣ" ශබ්දයෙන් සිතීමද ගැනේ. එවිට අභිජ්ඣා යනු "පරභණ්ඩාභිජ්ඣාන ලක්ඛණ" අනුන්ගේ බඩුවක් එල්ල කොට එය තමාට වේවායි සිතීම ලක්‍ෂණ කොට ඇත්තේද. එහෙයින් අභිජ්ඣාය තිති අභිජ්ඣා වෙසෙසින් සිතානුයි. අන්සතු දෙයක් තමන් සතු කර ගැනීමට සිතානුයි. එම

කිරීම සැක සහිතය. මෙසේ මුසාවාදයෙහි සම්පූර්ණ කර්ම පථ භේදයට සාහත්ථික ප්‍රයෝගය ප්‍රධාන බවද, ආණත්තික නිස්සග්ගිය ථාවර ප්‍රයෝග අනිශය අප්‍රධාන බවද සැලකිය යුතුය.

**පිසුණාවාචා:**

අසත්තා තමන් කෙරෙහි ප්‍රිය කරගැනීමත්, බිඳවිය යුත්තහු කෙරෙහි ප්‍රිය භාවය ශූන්‍ය කිරීමත්, යම් වචන යකින් කෙරේ නම් එය පිසුණාවාචාය. මෙහි එම වච් විසඳුතත්ය ඇති කරවන පවත් සිත්හි යෙදෙන චේත නාවය.

බිඳුවත්තා සීලාදී ගුණ හීන නම් අල්පසාවද්‍යය. මහත් ගුණ ඇත්නම් මහා සාවද්‍යය.

**අංග සතරකි:**

1 බිඳවියයුතු අනිකෙකුවීම.

2 අනිකා බිඳවීම හෝ තමා ප්‍රියවීම සැමති බව.

3 උත්සාහය.

4 ඔහු ඒ බව දැනීම.

මෙහි කර්මපථ භේදය වන්නේ අනුන් බිඳුණු කල් හිය. නොබිඳුණි නම් කර්මය පමණි.

**ඵරුසා වාචා:**

යම් වචනයකින් තමනුත් අනුනුත් ඵරුස බවට වණ්ඩ බවට පැමිණේද? කණට ප්‍රිය නැති, හිතට අල්ලන්නේ නැති, සවභාවයෙන්ම ඵරුස වූ යම් වචනයක් වේද එය ඵරුෂ වචනයයි.

අනුන්ගේ මරුකපන ඒකාන්ත ඵරුස වූ කාය වචන දෙකින් එළිදකින චේතනාව ඵරුස වචනයයි. මරුකැපෙන අව මරු කැපෙන වචනයක් වුවද, මව්පිය ගුරුවරාදීන් කියන ලද්දේ සිත මෘදු හෙයින් ඵරුස වචනයක් නොවේ. වචනය මෘදු වුවද, සිත දරුණු නම් ඵරුස වචනය වේ. (කෙනෙකු මරන්න නොකියා මොහුව බුදිකරවන්නැයි කීයෑ. සිත දරුණු හෙයින් ඵරුෂ වචනයකි.)

ගුණ හීනයනට එරුස වචන කීම අල්පසාවද්‍යය.
මහත් ගුණ ඇතියෙකුට කීම මහා සාවද්‍යය.

**අංග තුණෙකි.**

1 එරුස වචන කිවයුතු අනිකෙකු වීම
2 කිපුණු සිත
3 අක්‍රෝශ කිරීම යනුයි.

**සම්ඵප්‍රලාප:**

හිත සුව නැතිකර දමන නිරර්ථක කීම සම්ඵප්‍රලාප යයි. ප්‍රලාප යනු සාමාන්‍ය ව්‍යවහාරයේ පවා පලක් නැති වචනය. හිස් වචනය. වැඩක් නැති වචන අනුන්ගේ වැඩක් පලක් නැති කරන අදහසින් කීම සම්ඵප්‍රලාපයයි. මෙහි "සං" යනුවෙන් හොඳක්, හෙවත් අර්ථයක් හිතයක් වැඩක්, යන තේරුම දෙයි. "ඵ" යනුවෙන් එය පලාදමන නැති කරණ, යන තේරුමයි. මෙසේ අනුන්ගේ වැඩ පාලුකරණ, අනර්ථයක්, අවැඩක්, ඇති කරණ, කය වචන දෙකින් එළි දකින අකුසල චේතනාව සම්ඵප්‍රලාපයයි

සිතා මතා අනුන්ගේ කටයුතු පාලුකරණ අදහසින් දෙබමලුව හිස් කතා බිණීම එය කරන්නට මහත් අකුසල් සිත් පරම්පරාවක් ඇතිවිය යුතු හෙයින් ඒ ඒ සිත් වලින් ආසේවන ශක්තිය ලොලබන සම්ඵප්‍රලාප කියන සිත්හි චේතනාව අල්පසාවද්‍යය.

**අංග දෙකකි**

1 නිරර්ථක කථාවක් පෙරදැරි බවය.
2 එබඳු කථා කිරීමය.

අනිත් අය මේ සම්ඵප්‍රලාපයක් නොගත්තොත් ඒ නිසා කටයුතු පාලු කර නොගත්තොත් කර්‍මපථ භේදය නොවේ.

මෙහි නිරර්ථක කථානම් රාම රාවණා යුද්ධ ආදී ප්‍රභූ වර්‍ණනාවක් වීමය. ඒ අනිත් සලකන විට නවීන නවකථා, ආදියද සම්ඵප්‍රලාප ගණයට වැටේ. තවත් කරුණක්

5 මෙලොවක් නැත.

6 පරලොවක් නැත

7 මව් නැත.

8 පියෙක් නැත.

9 ඕපපාතික සත්වයෝ නැත

10 සෘඩි ලාභීන් නැත.

යන දස වස්තුක මිථ්‍යා දෘෂ්ටිය ද අහේතුක වාදය ද අකිරිය වාදය ද යනු නියත මිසදිටුයි. මෙම නියත මිස දිටුව ගැණීමෙන් කර්ම පථය වේ. අනික් සියළුම දෘෂ්ටීන් අනියත මිසදිටුය.

**අංග දෙකකි:**

1 දීමෙහි පල නැත, ආදී වස්තු වශයෙන්ද,

2 ගැනීමෙහි හෙවත් අවබෝධයෙහි විපරීත බව වශයෙන්දැයි අංග දෙකකි.

මෙම දස අකුශල කර්‍ම පථය පස් ආකාරයකින් වටහාගත යුතුය.

1 ධම්මතො- චෛතසික ධම්ම වශයෙන් - ප්‍රාණාතිපාතාදී මුල් 7 චෙතනාව ධර්‍ම කොට ඇත. අභිජ්ඣාදී තුණ චේතනා සම්ප්‍රයුක්ත ධර්‍මයෝය.

2 කොට්ඨාසතො - කොටස් වශයෙන් මුල සිට 7 ද මිච්ඡා දිට්ඨියද, කර්‍ම පථ පමණය අකුශල මූල් නොවේ. අභිජ්ඣා, ව්‍යාපාද, කර්ම පථද අකුශල මූල්ද වේ.

2 ආරම්මණ වශයෙන් 4 වේදනා වශයෙන්

5 මූල වශයෙන්,

1 පා= ජීවිතෙන්ද්‍රිය හෙයින් සංඛාරාරම්මණ දුක්ඛ වෙදනා මූල් දෙකයි. ද්‍වේෂ - මොහ

2 අදි= සත්තාරම්මණ හෝ සංඛාරාරම්මණ. සුඛමජ්ඣත්ත මූල් දෙකයි. ලොභ - මොහ

ප්‍රයෝග එකකි.

සාහසිකය, එහෙත් තමා විසින්ම කිය යුතුය. කාම යෙහි වැරදි සේවනය මෙන් මෙයද තමා අතින්ම ප්‍රධාන වශයෙන් සිදුවිය යුතු හෙයින් සාහසිකයැයි දක්වන ලදි. අණකළ තැනැත්තා හුදෙක් වැරදි ක්‍රියාවෙක යෙදීමට උපකාර කළ අසත්පුරුෂයකු පමණක් මුත්, සොරකමට සත්ව ඝාතනයට මෙන් අණ කිරීම බල නොපවත්වයි. අණ කිරීම වනාහි බලයෙන් කරවීමකි. තමන්ගේ වුවමනා වක් නැත්නම් අනුන්ගේ ඕනෑකමට වැරදි සේවනයක් නොකළ හැකි හෙයින් වැරදි කාම සේවනයට ආණත්ති යක් ඇත්තේම නැත. බොරුවද අනුන්ගේ වුවමනාවටම කිව නොහැක තමනුත් ඒ ගැන කල්පනාකාරී වියයුතුය. සොරකමක් සත්ව ඝාතනයක් බලෙන් කරවන්නාක් මෙන් අණ කරන්නහුට බොරුව කියවීමෙහි හෝ කරවීමෙහි බලයක් පැවැත්වීම අපහසුය. ඔහු සැඟ වී එය කරවිය යුතුය.

නැතහොත් අසත්නා මෙය අනුන්ගේ ඕනෑකමට කියන නිසා බොරුවක් බවට පිළිගතහොත් අංග සම්පූර්ණ නොවේ. බොරුව අසත්නා සත්‍යයක් බවට පිළිගත හොත්ය සම්පූර්ණ කර්මපථයක් වෙන්නේ. එහෙත් එකක් කිව යුතුය. වැරදි කාම සේවනයට වඩා බොරු කියවී-මෙහිදී ආණත්තිය බලපැවැත්විය හැකිය. මෙය විමසා ගතයුතු බව බුද්ධඝොෂ මාහිමියන් වහන්සේ වදාරති. එහෙත් අණ කරන්නහුට සත්ව ඝාතනාදියෙහි මෙන් අණ කිරීමම ප්‍රධාන වී බොරුව කළ නොහැකිය. තමනුත් ප්‍රාණඝාතාදියට වඩා සිතා මතා බොරුව පිළිබඳ ක්‍රියා කළ යුතුය. මෙය ඉතා සියුම් තැණකි. බොරුවක් ලියා වුවමනා තැනැත්තා ඉදිරියේ දැමීමෙන් නිස්සග්ගිය ප්‍රයෝගයද, භිත්ති ආදියක බොරුව ලියා තැබීමෙන් ථාවර ප්‍රයෝග යද ගත හැකි සේ පෙනේ. එහෙත් ඒවා අනුන් විශ්වාස

සිතෙහි ඇතිවන බලවත් ලෝභය අභිජ්ඣාවයි. ගුණ සම්පන්න කෙනෙකු සතු දෙයක ඇති අභිජ්ඣාව මහා සාවද්‍යය, ගුණ හීනයෙකු සතු දෙයක අල්ප සාවද්‍යයි.

අංග දෙකකි.

1 අනුන් සතු දෙයක්වීම.

2 තමන්ට වේවායි සිතෙන් පිරිනැමීම

අනුන්ගේ දෙයක ලෝභය උපන් ඇසිල්ලෙහිද කම්පථයක් නොවේ. අහෝ! එය මට වේවායි තමන් වෙත සිතෙන් පැමිණ වීමෙන් අභිජ්ඣාව කම් පථයක් වේ.

9 ව්‍යාපාද

හිත සැප වෙනස් කිරීම, විනාශ කිරීම, ව්‍යාපාදයයි. "හිත සුඛං ව්‍යාපාදිය තීති ව්‍යාපාදෙ" යනුවෙන් කියන ලදී. එය අනුන් විනාශ කිරීමෙහි අනුන්ගේ හිත සැප විනාශ කිරීමට සිතෙහි ඇතිවන දරුණු නරක්වීම මනොමය ද්වේෂය ලක්ෂණ කොට ඇත්තේය.

ද්වේෂය හෙවත් තරහ ගතිය තමන්ගේද, හිත සැප නැති කරයි. සිත නරක් වීමෙන් රෝගාබාධ සෑදෙන බව පිළිගත යුතු සත්‍යයකි. මෙහි අනුන් නැසියන්, වැනසියන්, යනුවෙන් සිත්හි හටගන්නා බලවත් ද්වේෂය අනුන්ගේ හිත සැපයන්ද නැති කිරීමේ දරුණු වූයේ ව්‍යාපාදයයි. සිතෙහි ශාන්ත ගතිය වෙනස් වී, කිළිටි වී, චන්ඩ වී, ප්‍රචන්ඩ වී යාම වැටහෙන ගතියයි.

ගුණවත් කෙනෙකුත් අරහයා ව්‍යාපාදය ඇති කළේ නම් මහා සාවද්‍යයි. ගුණ හීනයෙකුට නම් අල්ප සාවද්‍යයි.

අංග දෙකකි

1 අන්‍ය සත්ත්වයෙකුවීම.

2 ඔහු නැසීමට සිතීම

අන්‍යයෙකු කෙරෙහි ක්‍රෝධය උපන් පමණකින් ව්‍යාපාදය නොවේ. ඔහු නැසේවා, වැනසේවා කියා විනාශය සිතීමෙන් කර්මපථයට අසුවේ.

## 10 මිථ්‍යා දිට්ඨි

මිථ්‍යා නම් වැරදි බොරු යන තේරුම්ය දිට්ඨි නම් දැකීමය. අවබෝධයයි ඇති දෙයක් නැති සැටියෙන් හෝ වෙනස් අයුරකින් දැකීම මිථ්‍යා දිට්ඨියයි.

"යථා භුච්ච ගහනා භාවෙන මිච්ඡා පස්සතීති මිච්ඡ දිට්ඨි"

ඇති සැටිය නොගැනීමෙන් වැරදි ලෙස දකිනුයි මිථ්‍යා දිට්ඨි නම් වේ· දර්ශනය දිට්ඨියයි, වරදවා දැකීම මිථ්‍යා දිට්ඨියයි. දකින්නේ නුවණ මෙහෙයවා විමසීමෙනි· මෙහි ගැනෙන්නේ මිථ්‍යා ඥානයයි. හෙවත් වැරදි අතේ ගිය සත්ත්වයෙක්, පුද්ගලයෙක්, ආත්මයක්, ඇතැයි දක්නා මවන්නෙක් මැවෙන්නක් අදහන, ගුණදහමක් පරලොවක්, නොසලකන මේ ආදි නොයෙකුත් වැරදි වැටහීම් මිථ්‍යාදිට්ඨියයි.

"සා නත්ථි දින්නන්ති ආදිනා ලක්ඛනෙන විපරීත දස්සන ලක්ඛණ"

දීමෙහි ආනිසංස නැතැයි ආදී විපරීත දැකීම් ලක්‍ෂණ කොට ඇත්තේ මිථ්‍යා දෘෂ්ටියයි. අනියත මිසදිටුව අල්ප සාවද්‍යයයි. නියත මිසදිටුව මහා සාවද්‍යයයි.

නියත මිසදිටුව නම්:-

නාස්තික දෘෂ්ටිය:

1 නත්ථි දින්නං - දීමෙහි අනුසස් නැත.
2 නත්ථි යිට්ඨං - විශාල දන්දීමෙහි, අනුසස් නැත.
3 නත්ථි හුතං - ඇත ඕට ගෙනවුත් පිදීමෙහි අනුසස් නැත.
4 හොඳ නොහොඳ කර්ම පල විපාක නැත.

නම් මේ රාග ද්වේෂාදී කෙලෙස්වලට හේතුවීමය. ඒ අනුව් සලකන විට නවීන නවකථා හොඳටම සම්ඵප්‍රලාපය.

නිරත්ථක කථායානි – රාග දෙසාභි වඩ්ඪනි
තං රතනසස අකාලෙන – භාසනා සම්ඵසඤ්ඤිතා

නිරර්ථක කථාවෙන් රාග දෙස් වැඩේ. එයට සැමවිටම අකල්ය. එහි ඇළුතනු විසින් අනිකකුගේ වැඩ පාලු කිරීමෙහි කීම සම්ඵප්‍රලාප නම් වේ

මෙසේ අකුසල් දැන දුරු කොට කුසල් වඩා ශාන්ත නිවන් සැප ලබත්වා.

අමෝහ වශයෙන් පච් මූල්ය. විප්ප යුත්ත නම් අද්‍වේස් එක මූලය. අලෝභය තමා තමාටම මූලක් නොවේ. අව්‍යාපාදයත් මෙසේය. සම්මා දිට්ඨිය අලෝභ අදෙ‍ස වශයෙන් ද්වි හේතුය. ප්‍රඥාව තෙමේ තමහට මූලක් නොවේ.

මූල් පාඩම් වල කර්මද්වාරය සසඳා ගලපා බැලුවෙමු. මෙහිදී කර්ම පථයන්ද සසඳා බලමු.

1 ඵස්ස දොරටු පස (චක්ඛු ඵස්සාදී) වශයෙන් උපන් අසංවරය අකුසලය මනොකර්මයම වේ. සංවරය කුසල මනොකර්මයයි. මනෝඵස්ස දොරටු වශයෙන් උපන් අසංවරය කාය-වචී- මනො කම්ම වේ.
විස්තර කරන ලදී.

කායද්වාරය සෙලවූ අකුසලය අකුසල කාය කර්මය වේ. වචිද්වාරයද එසේය.

ඒ දෙකම නොසෙල් වූ හෙවත් ක්‍රියාවට නොනැගූ අකුසල්. අකුසල මනෝකර්මයි. කුසලය. කුසල මනෝකර්මයි.

2 අසංවර දොරටු පහ වශයෙන් උපන් අකුසල අකුසල මනොකම්මය.

සංවර දොරටු පහ වශයෙන් උපන්නේ කුසල මනොකම්මය.

නොසෙලවුනු කාය අසංවර දොරටු වශයෙන් උපන්නේ අකුසල මනෝකම්මය. සංවර දොරටු පහ වශයෙන් උපන්නේ කුසල මනොකම්මය. සෙලවුනු කාය අසංවර දොරටු වශයෙන් අකුසල කාය කම්මය.

මනො අසංවර ද්වාරය වශයෙන් උපන්නේ අකුසල මනොකර්මය වේ. මනො සංවර ද්වාර වශයෙන් උපන්නේ කුසල මනොකර්මය වේ.

ත්‍රිවිධ කාය දුශ්චරිත අකුසල කායකර්මය. ත්‍රිවිධ කාය සුචරිත කුසල කායකර්මය.

# 18

## නමො සම්මාසම්බුද්ධස්ස

**දස කුසල කම්මපථ:**

දස අකුසල කම්ම පථයන් පසුගිය පාඩම්වල විස්තර කරන ලදී.

දස කුසල කම්ම පථ නම්:

1 ප්‍රාණඝාතයෙන් වැලකීම
2 අදත්තාදානයෙන් වැලකීම
3 වැරදි කාමසේවනයෙන් වැලකීම කුසල කාය කම්මපථය.
4 මුසාවාදයෙන් වැලකීම
5 පිසුවචනයෙන් ,,
6 ඵරුෂ වචනයෙන්,,
7 සම්පප්පලාපයෙන් වැලකීම කුසල වචීකම්ම පථය.
8 අනභිජ්ඣා
9 අව්‍යාපාද
10 සම්මා දිට්ඨි කුසල මනොකම්ම පථය.

පාණාතිපාතාදි හි පන විරතියො අනභිජ්ඣා අව්‍යාපාද සම්මාදිට්ඨියො චාති ඉමෙ දස කුසල කම්මපථා නාම" යනුවෙන් ප්‍රාණඝාතාදියෙන් වැලකීමත් අනභිජ්ඣා අව්‍යා පාද සම්මාදිට්ඨි යන තුණත් දස කුසල කම්ම පථ බව දක්වා ඇත.

මෙහිදී විරතිය කුසල කම්ම පථ සතක් ලෙස ක්‍රියා කෙරේ. එම සත කාය වචන දෙකට බෙදේ. මිච්ඡාජීව විරතියද කාය වචන දෙකටම අයිතිය. දිවි පැවැත්මට සතුන් මැරුවද එය කායික අකුශලයක්මය. බැඞි වශ

යෙන් ප්‍රාණඝාතාදී අකුසල් කරන්නේ දිවි පැවැත්ම සඳහාය. එහෙයින් සම්මාකම්මන්ත සම්මාවාචා නමින් එන විරති දෙකින් සම්මා ආජීව නමින් ගන්නා විරතියද ගැනෙන බව සැලකිය හැකිය.

තවද මෙහි අනභිජ්ඣා යනු අභිජ්ඣාවෙන් වැලකීමක් අව්‍යාපාද යනු ව්‍යාපාදයෙන් වැලකීමත් මිච්ඡාදිට්ඨියෙන් වැලකීමත් ලෙස නොදක්වා ඒවා වෙනමම චෛතසික ධර්ම වශයෙන් දක්වා ඇත්තේ ඒවා වෙනමම අකුසල චෛතසික නිසාය. විරතිය කුසල් වන අතර අකුශල පක්ෂයෙහි චේතනාව ගැනෙයි.

ලෝභය ඒකාන්ත අකුසල චෛතසිකයෙකි. අලෝභය ඒකාන්තත කුසල චෛතසිකයෙකි ද්වේෂය හා අද්වේෂය හෙවත් මෛත්‍රියද වෙනමම අකුසල කුසල චෛතසිකයෝය. මෝහය දිට්ඨිය දෙකම ඒකාන්ත අකුසල්ය. ඒ දෙකම වෙනුවට කුසලය සම්මාදිට්ඨි යනුවෙන් ප්‍රඥාවම ගැනේ. මෙය හොඳනැටි වටහා ගැනීමෙන් අනභිජ්ඣා අව්‍යාපාද සම්මා දිට්ඨීන් වෙනම දක්වූයේ මන් දැයි වටහාගත හැක.

**විරතිය යනු කුමකුද?**

යමකින් ප්‍රාණඝාතාදියෙන් වැලකේද? ප්‍රාණඝාතාදියෙන් තෙමේ වැලකේද වැලකීම් මාත්‍රයම හෝ වේද මේ විරතියයි.

**මේ විරතිය තුන් ආකාරය**

1 සම්පත්ත විරති
2 සමාදාන විරති
3 සමුච්ඡේද විරති යනුයි.

1 සික පද සමාදන් නොවූ කෙනෙකුත් සතුන් මැරීමාදි අකුසලයක් කරන්නට ඉඩ ලැබුණු වේලාවේ තමන්ගේ වැදගත් කම වංසින් මැඩිහිටි බව උගත් බව ආදිය සලකා එයින් වැලකීම සමසත්ත විරතියයි: චක්කන උපාසකයා

රූපාදී මේ අරමුණු නියමයක් නැති බව මෙසින් අනු දැන වදාළ සේක.

"තස්මිං සමයෙ ඵස්සො හොති (1) වෙදනා හොති (2) සඤ්ඤා හොති (3) චෙතනා හොති (4) චිත්තං හොති" එසමයෙහි හෙවත් එම සිත උපදින කොට ඵස්සය වේ. වෙදනාව වේ. සඤ්ඤාව වේ. චේතනාව වේ. සිත වේ.

**ඵස්සය**

කාමාවචර කුසල් සිත සමග උපදනා බැවින් ඒ ඵස්සයද කාමාවචරය. කුසල්ය. සොම්නස් සහගතය ආදි වශයෙන් ගත යුතුය.

ඵස්සය පළමු කොට වදාළේ ඇයි? සිත අරමුණෙහි පළමු කොට වැටීම හෙවත් අරමුණ ස්පර්ශ කෙරෙමින් සිත පහළවීම සිදුවේ.

ස්පර්ශ කරන ලද්දේ විඳියි. ස්පර්ශ කරන ලද්දේ හඳුනයි. යනාදීන් දේශනාකර වදාළ හෙයින් ඵස්සය පළමු කොට දක්වන ලදී. එසේම ගෙයකට කණු බිත්ති ආදිය මෙන් එස්සය චිත්ත චෛතසිකයන්ට බලවත් උපකාර යකි. එහෙත් මේ සියල්ල කරුණු නොවේ. සිතක ලැබෙන චෛතසිකද එම සිතද එකවර පහළ වේ. මෙය පළමුවය මෙය පසුවයයි නොකිව හැක. එහෙයින් හුදෙක් දෙශනා වගේ වශයෙන් ඵස්සය පළමු කොට වදාළ සේක.

එහෙත් චිත්ත චෛතසිකයන්ගේ කෘත්‍යයන් වශයෙන් බලන කොට ඵස්සය නිසා වේදනාව හටගන්නා බව දක්වා ඇති හෙයින් එකවර පහළ වන ධර්ම නමුදු ක්‍රියාකාරිවීම් වශයෙන් ඵස්සය පළමුව දෙසීමට යුක්තියක් ඇති බැව් පෙනේ.

එහෙත් චිත්ත චෛතසිකයන් කෘත්‍ය වශයෙනුදු පෙර පසු නොවන බව හැඟවීමට මෙහි අරමුණු ගන්නා සිත පස් වෙනුවට දක්වා ඇත. මතු විස්තර වේ. එහෙයින්

3 කාමෙ= ඓොට්ඨබ්බ වශයෙන් සංඛාර
හෝ සත්තා රම්මණය සුඛමජ්ඣත්ත
මූල් දෙකයි ලොභ - මොහ
4 මුසා=සත්ත සාඛාර. තිවෙදන. ලොභ මොහ දේ‍ෂ මොහ
5 පිසු= සත්ත සංඛාර තිවෙදන. ලොභ මොහ දේ‍ෂ මොහ
6 ඵරු= සත්තාරමමණයි දුක්ඛ දේ‍ෂ මොහ
7 සම්ඵ, සත්ව සංඛාර, තිවෙදන, ලොභ මොහ දේ‍ෂ මොහ
8 අභි= සත්ත සංඛාර, සුඛ මජ්ඣත්ත, මොහය පමණයි.
9 ව්‍යාපාද= සත්තාරම්මණය. දුක්ඛ, මොහය පමණයි.
10 මිථ්‍යාදිට්ඨි= සංඛාර. සුඛ මජ්ඣත්ත, ලොභ මොහ

මෙසේ නුවණින් අකුසල් දැන දුරු කොට කුසල් වඩා සාන්ත නිවන් සුව ලබත්වා.

චතුර්විධ වචී දුශ්චරිත අකුසල වචීකර්මය. චතුර්විධ වචී සුචරිත කුසල වචී කර්මය.

ත්‍රිවිධ මනෝ දුශ්චරිත අකුසල මනෝකර්මය. ත්‍රිවිධ මනෝ සුචරිත කුසල මනෝකර්මය.

3 අකුසල කාය කර්මය පඤ්ච ඵස්සද්වාර වශයෙන් නූපදී. (ජවන) මනෝඵස්සද්වාර වශයෙන් උපදී. කුසල කාය කර්මයද එසේය. අකුසල වචී කර්මයද එසේය. කුසල වචී කර්මයද එසේය. අකුසල මනෝකර්මය ඵස්ස දෙරටු සයේ වශයෙන් උපදී. කුසල මනෝකර්මයද එසේය. එය කාය වචන දෙදෙර සෙලවීමට පැමිණියේ අකුසල කුසල කාය වචී කර්මවේ. සෙලවීමට නොපැමිණියේ මනෝ කර්මවේ.

4 පඤ්ච අසංවර ද්වාර වශයෙන් අකුසල කායකර්මය නූපදී. පඤ්ච සංවර ද්වාර වශයෙන් ද කුසල කායකර්මය නූපදී චෝපන කාය වාචා අසංවරද්වාර වශයෙන් අකුසල කාය වචී කර්ම උපදී. මනෝ සංවරද්වාර වශයෙන් කාය වචන අකුසල නූපදී. මනෝ සංවරද්වාර වශ වශයෙන් කාය වචන කුසල් උපදී.

"යස්මිං සමයෙ කාමාවචරං කුසලං චිත්තං උප්පන්නං හොති"

(දෙවෙනි අභිධර්ම පාඨම් පත්‍රිකාව බලන්න)

1 තුන් වැදෑරුම් කර්ම දෙරටු වශයෙන් උපදී.
2 සවැදෑරුම් ඵස්ස දෙරටු වශයෙන් උපදී.
3 අට වැදෑරුම් සංවර දෙරටු වශයෙන් උපදී,
4 දස කුසල කම්ම පථ වශයෙන් උපදී.

මෙසේ කුසල් සිතක් පහළ වන සැටි මනාව ඉගෙණ අකුසල් දුරු කොට කුසල් පුරා ශාන්ත නිවන් සුව පතා ගනිත්වා.

# 19

## නමෝ සම්මාසම්බුද්ධස්ස

### සිත උපදින කොට

දෙවෙනි අභිධර්ම පාඩමෙහි කාමාවචර කුසල් සිතක් උපත්තේ වේද යන්න විස්තර කරමින් ඒ සිත කර්මද්වාර කර්ම, කර්මපථ, ආදීන්ගේ වශයෙන් බෙදා විමසා එය තුන් වැදෑරුම් කර්ම දොරටු වශයෙන්, සවැදෑරුම් ඵස්ස දොරටු වශයෙන්, අට වැදෑරුම් සංවර දොරටු වශයෙන් දස කුසල කම්මපථ වශයෙන් උපදනා බව 18 වැනි අභිධම්ම පාඩම තෙක් විස්තර කරණ ලදී,

තෙවැනි අභිධම්ම පාඩමෙහි "රූපාරම්මණංවා" යනාදී කොටස විස්තර කරණ ලදී. යම් යම් ඒ රූපාදි අරමුණක් හෙවත් එක සිතකට එක අරමුණක් ගන්නා බවය. "යං යං වා පනාරබ්භ" යන ධම්ම සංගිණී දෙශනාවෙන් එය අනුදැන වදාළ සේක. එක සිතකට කෙසේවත් අරමුණු දෙකක් නො ලැබේ. (කාමාවචර) එක චිත්ත වීථියකටද ලැබෙන්නේ එක අරමුණකි. චක්ඛුද්වාර වීථියේ ද චක්ඛු විඤ්ඤාණ සිතෙහි සිට භවාංගය දක්වා රූපාරම්මණයම ගනියි. මෙසේ සොතද්වාර චිත්ත වීථි දැයි සියල්ලම දත යුතුය.

රූපාවචර අරූපාවචර ලොකොත්තර චිත්ත වීථීන් හිදී අරමුණු වෙනස්වන බව පැහැදිලිය. ඒ කාමාවචර සිත්වලින් රූපාවචර අරූපාවචර සිත්වලටද කාමාවචර සිත්වලින් ලෝකෝත්තර සිත්වලටද පැමිණීමේදීය. අරූපා වචර යොගියා කසිණය ඉගිලූ අහස අරමුණු කරන්නේ උපෙක්ඛා සහගත කාම කුසලයකිනි. එයින් සිත අර්පනා ප්‍රාප්ත වේ. සම්පූර්ණ අහසම අරමුණ දියුණුව ලබා අරූප ධ්‍යානය ලැබේ.

මෙත් සිකපද සමාදන් වූ කෙනෙකුත් සිතෙහි එය සමාදන් වන වේලාවේත් ඉන් පසුත් තමන් සික පද සමාදන් වූ බව සැලකීමෙන් සතුන් මැරීමාදියෙන් වැලකීම. සමාදන විරතියයි

3 ආර්ය මාර්ග සිතෙහි යෙදෙන විරතිය සමුච්ඡේද විරතියයි. එය උපන්නාහාම ආර්‍ය්‍ය පුද්ගලයාට සතුන් මරමියි සිතක් නූපදි.

**පස් වැදෑරුම් විනිශ්චය**

1 කම්මතො (කර්ම ස්වභාව වශයෙන්)

මූල සිට සිතෙහි (කාය වචී කම්ම) චෙතනාවද විරතීන්ද ගනු වරී. (පටිපාටියා සතන චෙතනා විරතියෝ) අනභිජ්ඣාදී තුණ චෙතනා සම්පයුක්ත කර්මයයි.

2 කොට්ඨාසතො (කර්ම පථ සහ මූල වශයෙන්) මූල් සත කර්ම පථ මිස මූල නොවේ. අග තුණ කර්මපථද මූල්ද වේ. අනභිජ්ඣා යනු අලොභ කුසල මූලයයි. අව්‍යාපාද යනු අදෙස කුසල මූලයයි. සම්මා දිට්ඨි යනු අමොහ කුසල මූලයයි.

3 ආරම්මණතො (අරමුණු කිරීම් වශයෙන්) ඉහතින් කියන ලද ජීවිතෙන්ද්‍රියාදී සංඛාරාදී අකුසල්වලට කියන ලද අරමුණුය.

4 වේදනාතො (වේදනා වශයෙන්) සියල්ල සුඛ වේදනා හෝ මජ්ඣත්ත වේදනා (උපෙක්ඛාය) කුසලං පත්වාහි දුක්ඛ වෙදනා නාම නත්‍ථි" කුසලයෙහි දුක් වේදනාවක් නම් නැත.

5 මූලතො (මුල් හේතු වශයෙන්) මූල් සත ඤාණ සම්පයුක්ත සිතින් නම් වලක්නා හට අලොභ අදෙස අමොහ වශයෙන් ත්‍රි හේතුකය.

ඤාණ විප්ප යුත්ත සිතින් නම් අලොභ අදෙස ද්වි හේතුකය. අනභිජ්ඣා කුසලය ඤාණසම්පයුක්ත නම් අදෙෂ

එකට හටගන්නා මෙම ධර්මයන් ගේ පෙර පසුව දක්වීම් ගැන නොසොයා වචනයේ අදහස හා ලක්ෂණ කෘත්‍යාදීන් ගේ වශයෙන් ධර්මයන් පමණක් සෙවිය යුතුය.

මෙසේ ලක්ෂණ රසාදීන් වශයෙන් ධර්මයන් හඳුනා ගැණීමට පමණක් නියමකර ඇත්තේ නාම රූපයන්ගෙන් ගත යුතු වැඩ ගැණීමට ලක්ෂණ රසාදීන් ඒවා දත ගණ තිබිය යුතුමය නාම රූපයන්ගෙන් ගත යුතු වැඩය නම් ඒවා විදර්ශනාවට අරමුණු කිරීමයි. ලක්ෂණාදී වශයෙන් නාම රූපයන් එක්කෝ තමා ඉගෙණ හඳුනා ගත යුතුය එසේ නැත්නම් ගුරුවරයෙකුගෙන් දැනගතයුතුය.

ලක්ෂණ:-

"තං තං සභාවො ලක්ඛණං"

නාම රූප ධර්මයන්ගේ ඒ ඒ සවභාවය ලක්ෂණ නම් වේ. ස-භාව (සව-භාව) යන මේ වචනයෙන් "ස" (සව) යනුවෙන් තමාගේ යන තේරුමද "භාව" යනු හැටි යන තේරුමද දෙයි. (ස-භාව) යන තමාගේ හැටි යන තේරුමයි. එවිට යම් නාමයක හෝ රූපයක හැටිය සවභාවය එහි ලක්ෂණයයි. හෙවත් පුද්ගලික ලක්ෂණය යි. එනම් ස්පර්ශ කිරීම් ලක්ෂණය නාම ධර්මයන් අතික් එකකට වත් අයිති නැත. එහෙයින් ඵුසනය ඵස්ස චෛතසිකයට ම අයිති වෙනම ලක්ෂණය යි.

එහෙයින් දක්වනලදී:-

"ඵුසතීති ඵස්සො" ස්පර්ශ කෙරේනුයි ඵස්ස නම්වේ.

"ඵුසන ලක්ඛණො" හැපීම ලක්ෂණ කොට ඇත්තේ ය. මේ "සභාව" ලක්ෂණයයි. ඵස්සයේ සාමාන්‍ය ලක්ෂණයක්ද ඇත. එනම් අනිත්‍ය ලක්ෂණය. එය ඵස්සයට පමණක් නොව අනිකුත් නාම රූප සියල්ලටම පොදුය. සවභාව ලක්ෂණය අරමුණු කරන්නාහට සමාන්‍ය ලක්ෂණ ය වැට

ගේ. "සංඝට්ටනරසො" ඝර්ෂණය කෘත්‍යයයි. ඝර්ෂණය නම් වඩාත් තදෙන් ගැටීමයි. ස්පර්ශය යනු ගෑවීමය. සංඝට්ටන යන්නෙන් ගැටීමක් අදහස් කෙරේ. මේ වනාහි ස්පර්ශයේ කෘත්‍යයයි.

"කිච්ච සම්පත්තියො රසො." යනුවෙන් කෘත්‍යය හෝ සම්පත්තිය රශයයි කියනලදී. පඤ්චද්වාරික සිතෙහි පමණක් මේ සංඝට්ටන කෘත්‍යය ලැබේ. මනොද්වාරික සිත්හි ඵුසන ලක්ෂණය පමණක් ලැබේ මනොද්වාරික අරමුණු සියුම්ය. එහෙයින් ගැටීමේ කෘත්‍යයක් නැතිබව කියනලදී.

ගහ්‍යාකාරෝ ඵලංවාපි- පච්චුපට්ඨාන සඤ්ඤිතං.

වැටහෙන ආකාරය හෝ ඵලය පච්චුපට්ඨාන නම් වේ. මෙයින් එළෙඹ සිටිනා ආකාර ය කියන ලදී. "සන්නිපාත පච්චුපට්ඨානො" ඵස්සය එළඹ සිටින වැටහෙන ආකාරය නම් චුවමනා කරුණු රැස්වීමයි. "තිණ්ණං සංගති ඵස්සො" යනුවෙන් වදරා ඇත්තේ එහෙයිනි.

ඇසත් රූපයත් චක්ඛු විඤ්ඤාණයත් එක්වීම මෙහි චක්ඛුසම්ඵස්සය එළෙඹ සිටීමයි. ඉදිරිපත් වීමයි. ඵලය වශයෙන් වෙදනාව එළෙඹ සිටින අයුරුයි.

ආසන්න කාරණංයං තං- පදට්ඨානනති තං මතං"

ඉතාම කිට්ටුවෙන් තිබෙන ආධාරය පිහිට පදට්ඨාණයයි.

ආපාථ ගත විසය පදට්ඨානො

ඵස්සයාගේ පදට්ඨානය ඉදිරියට පැමිණි විෂයයි. හෙවත් රූපාදී විෂයයන් ඇතිවීමෙන්ම ඵස්සයහට ගන්නා හෙයින් ආපාථ ගත විසය ආසන්න කාරණයයි කියන ලදී.

මේ සතර අයුරින් නාම රූපයන් දැනීම විදර්ශනා යෝගියාට ප්‍රමාණය

“ධමමානං වවත්ථානාය-අලං එතෙවිබුද්ධි නො” ධර්මයන් විදර්ශනා කරන්නාවූ නුවණැත්තහුට මේ ඇතැයි දක්වූ සේක.

මෙසේ නාම රූපයන් ලක්ෂණාදී වශයෙන් දැන විදසුන් වඩා ශාන්ත අමාමහ නිවන්සුව ලබත්වා.

# 20

### නමෝ සම්මා සම්බුද්ධස්ස

## සිතෙහි උපදින ගති

සිත උපදින කොට සිතෙහි උපදින ගති හෙවත් චෛතසික වලින් ඵස්සය පසුගිය පාඩමෙහි විස්තර කරන ලදී.

**2. වේදනා.**

ජීවත් වන්නේ යම්කිසි විඳ ගැනීමකින් යුතුවය. සියුම්ව හෝ බලවත්ව මේ වේදනාවෝ සචිත්තක සෑම දෙනෙකු විසින්ම සෑමවිටම විඳිනු ලැබෙති. වේදනාව සියළු සිත්හිම ලැබෙන බැවින් තද නින්දෙහි සිත භවංග ගතවූ අවස්ථාවේ පවා නොදන්නා වේදනාවක් විඳිනු ලැබේ එහෙයින් විඳිනුයි වේදනා නම් වේ.

“වේදියතී ති වේදනා.” වේදනා වේ ලකුණු:-, වේදයිත ලක්ඛණ විඳීම ලක්ෂණ කොට ඇත්තේ වේදනාවයි. සියළු සිත්වලම වේදනාවක් ඇත. ලෝකෝත්තර මගපල සිත් වලද වේදනාව ඇත. ඒ සිත් ද සොමනස්ස හෝ උපෙක්ඛා විය යුතුය නිවන් අරමුණු කරණ හෙයින් නිවන් රස විඳ ගැනීමක් ඒ ලොකොත්තර වේදනාවෙන් සිදුවිය යුතුය. නිවන් අරමුණු කිරීම වෙනම කරුණකි නිවන නම් විඳින සුවයක් නොවේ. එයින් අදහස් කරන්නේ නිරෝධ සමවතෙහිදී හෝ අනුපාදිශෙෂ නිවන් පැමිණීමෙන් හෝ නිවන විඳින සුවයක් නොවන බවය. විඳින්නට වේදනා චෛතසිකයත් සිතත් එවිට නැත. පස්කඳ නිරුද්ධියෙන් අසංඛත නිවන ලැබේ. මග ඵල සිත සංඛතය ප්‍රත්‍ය ධර්මයන්ගෙන් හටගත්තේය. ලෝකෝත්තර නිවන අරමුණු කරණ හෙයින් ලෝකෝත්තර සිත්යයි කියනු ලැබේ. විදර්ශනා

සම්පූර්ණ කිරීමෙන් ලැබෙන හෙයින් හා මග සිත් එක වරක්ම ලැබෙන හෙයින් විදර්ශනාවට අරමුණු නොවේ. ඇති වෙමින් නැති වෙමින් දිගට පැවති චිත්ත පරම්පරාවේ මනසක් හෝ සිතක් හෝ කිසිවක් නිවන්බවට පත් නොවේ. සංඛතයක් අසංඛත නොවේ. ප්‍රත්‍යයන්ගෙන් හටගත්තක් ද නොවේ නිවන. පස් කඳෙන් කිසිවක් නිවන නොවේයයි දක්වා ඇත්තේ එහෙයිනි. පස් කඳ දුක නම් එයින් කිසිවක් නිවන බවට පත් වේ නම් නිවනත් දුකක් මය. දුක, පස්කඳ, සංඛතය, නිරුඩ වන බව කිව යුතුය. එයින්ම නිවන හැඳින් විය යුතුය. එහෙයින්

අඤ්ඤි නිබ්බුති න නිබ්බුතො පුමා

ජීවනක් ඇත පුරුෂයෙක් සත්ත්වයෙක් නිවුනේ? නොවේයයි නිගමනය කර ඇත.

අනුභවන රසා:- අරමුණු රස අනුභව කිරීම කෘත්‍ය කොට ඇත්තේ වේදනාවය සෑපවේදනාවෙහි අරමුණු රස විඳීම ඉතා ප්‍රකටය. එහෙයින් වේදනාවගේ අනුභවන කෘත්‍යය සුඛ වේදනාවෙහිම වේයයි දක්වන ලදී. එහෙත් රසය මිහිරි රසය අමිහිරි රසය හෝ මධ්‍යස්ථ රසය දැනේ නම් ඒ දැනීමම විඳීමයි. එහෙයින් සුඛ දුක්ඛාදී සෑම වේදනාවකම රස විඳීමක් ඇති බව සැලකිය යුතුය. වේදනාව සුවදුක් අරමුණු රස විඳීමෙහි ප්‍රධානය. අනික් චිත්ත චෛත සිකයන්ද අරමුණු රස බලන බව සඳහන් ය. වේදනාව විඳීමෙහි ප්‍රධානත්වය දරයි අරක්කැමියා රජ බෝජනය පිළියෙල කොට යම්තම් එහි රස බලයි. රජ සිත්සේ රස විඳිමින් වළඳයි. වේදනාව රජුමෙන් සෙසු චිත්ත චෛතසික ධර්ම අරක්කැමියා මෙනි.

(ඉට්ඨාකාර සම්භෝග රසාවා)

ප්‍රිය ආකාරයෙන් එක්වීම හෝ වේදනාවගේ කෘත්‍ය යයි. මේ කෘත්‍යය නම් සුඛ වේදනාවගේය. මක්නිසාද යත් දුක්ඛ වේදනාව කිසිවකුට ප්‍රිය නොවන හෙයිනි.

පච්චුපට්ඨානය

"චෙතසික අස්සාද පච්චුපට්ඨානා"

මිහිරි ලෙස ආස්වාදනය එළඹ සිටිනාකාරය යි. හෙවත් සිත්හි ආස්වාදයක් ඇතිවීම අස්වැසීමක් දැනීම වැටහෙන ආකාරයයි. මේ වේදනාවක් යයි වැටහීම වේදනාව එළඹ සිටින ආකාරය පච්චුපට්ඨාන යයි දත යුතුය. මේ ආස්වාදය දැනෙන්නේ සුඛ වේදනාවෙහි ය.

**පස්සද්ධි පදට්ඨානා.**

සැහැල්ලු නොබර බව සුඛ වේදනාවට පදට්ඨානය හෙවත් ආධාර කාරණය වෙයි. හෙවත් වේදනාවට ඉතා ආසන්න කාරණය වෙයි.

"පස්සද්ධ කායො සුඛං වෙදෙති" යනාදී තන්හි සුඛ වේදනාවට සැහැල්ලු බව ඉතා කිට්ටුය. දුක්ඛ වේදනාව එයට ප්‍රතිවිරුද්ධය.

**3. සඤ්ඤා**

නිල් රතු උස මිටි ආදි වශයෙන් ඒ ඒ අරමුණු හඳුනා ගන්නේ සඤ්ඤාවයි.

"නීලාදි භෙදං ආරම්මණං සඤ්ජානාතීති සඤ්ඤා"

"සඤ්ජානන ලක්ඛණං" හඳුනා ගැණීමම ලක්ෂණ කොට ඇත්තේය.

"පුන සඤ්ජාණන නිමිත්ත කරණ රසා" නැවත හඳුනා ගැණීමට සලකුණක් කරගැණීම සඤ්ඤා චෛතසිකයාගේ ලක්ෂණයයි. වඩුවන් ලී කඳක් නූල් ගැසීම් ආදියෙන් ලකුණු කර ගන්නා මෙනි.

"අභි නිවේස කරණ පච්චුපට්ඨානා"

ගන්නාලද සලකුණු වශයෙන් ඇතුලත්වීම එළඹ සිටිනාකාරයයි. ඇතුත් අතගා බැදූ අත්බයත් මෙන් ඒ තමතමන් ඇල්ලූ කොටස් වැටහීම මෙහි

වැඩිකල් නොසිටීම හෝ වැටහුණ අරමුණ ආසන්න කාරණයයි. හෙවත් ආධාරයැයි.

"උප්ටසිත විසය පදටඨානා"

4. චෙතනා

තමත් සහ අනික් චිත්ත චෛතසික අරමුණෙහි රැස් කරවීම හෙවත් අරමුණට එක්තැන්කිරීම චෙතනාවයි. එහෙයින් කියන ලදී. "චෙතය තිති චේතනා"

"සා චේතසික ලක්ඛණ" ඒ චෙතනාව රැස්කරවීම ලක්‍ෂණ කොට ඇත්තේය. "ආයුහනරසා" විපාකයන් දීමට සමත් විපාක රැස්කරවීම කෘත්‍යයය. එය කුසලා කුසල චෙතනාවන්ගේ කෘත්‍යය පමණකි. කුසල් අකුසල් කර්ම රැස්කිරීමේදී අනිත් චිත්ත චෛතසිකයන්ගේ ඇත්තේ සුළු උපකාරයයි. චෙතනාව වනාහි කර්ම ප්‍රත්‍ය ශක්තිය ලබා දීයුණුවූ උත්සාහයක් ඇත්තේ වේ.

කෙත් හිමියා අනිත් ගොවියනුත් සමග කෙතේ වැඩ කරන්නේ අනිත් අයට වැඩි උනන්දුවක් උත්සාහයක් දක්වමින් වැඩ කරන්නා මෙන් චෙතනාව වැඩි උත්සාහ-යක් ගන්නා බව සැලකිය යුතුය.

"සංවිදහන පච්චුපටඨානා" සංවිධානය කිරීම එළඹ සිටිනා ආකාරයයි. මෙහි සංවිධානය නම් බලාපොරොත්තු ක්‍රියාව සඳහා තමන් සතු වැඩෙහි යෙදෙමින් අනිත් චිත්ත

චෛතසිකයනුත් ඒ ඒ වැඩවල යෙදීමයි. ප්‍රධාන ශිෂ්‍යයා තමනුත් උගණිමින් අනිත් අයත් ඉගෙණීමෙහි යොදවන්නා මෙනි.

“සහජාත ධම්ම පදට්ඨානං” එක්ව හටගත් චිත්ත චෛතසික ධර්ම පදට්ඨානය හෙවත් ආධාර ආසන්න කාරණයයි.

මෙසේ නාම ධර්මයන් හැඳින විදර්ශනා වඩා උතුම් නිවන් සුව ලබාගනිත්වා

# 21

**නමො සම්මාසම්බුද්ධස්ස**

## සිතෙහි උපදින ගති (2)

යම් වෙලාවක කාමාවචර කුසල් සිතක් උපදීද එවේ ලෙහි සහජාත වශයෙන් උපදින ගති හෙවත් අරූප ධර්‍ම යන් ක්‍රමයෙන් දක්වනු ලබන්නේ 'ඵස්සො හොති' යනාදීන් වදාළසේක. ඵස්ස වේදනා, සඤ්ඤා, චෙතනා යන චෛත සික පසුගිය පාඩමෙහි දක්වන ලදී.

## 5. චිත්තං හොති

සිත වේ. අරමුණ සිතන්නේ සිතයි. සිතීම නම් විශෙෂ යෙන් හොඳින් දැනගැණීමයි 'විජානන ලක්ඛණං චිත්තං' දැනගැනීම ලක්ෂණ කොට ඇත්තේ සිතයි. පුබ්බංගම රසං ඉස්සරවීම කෘත්‍යයයි. සන්‍ධාන පච්චුපට්ඨානං-ගලාගෙණ ඒම එළඹසිටින ආකාරයයි. නාම රූප පදට්ඨානං- ආධාර කාරණය නාම රූපයයි.

සතර භූමියෙහි දැනීම් ලක්ෂණයෙන් තොර සිතක් නැත.

පුබ්බංගම කෘත්‍යය වනාහි ඒ ඒ චක්ඛුද්වාරාදියෙන් අරමුණු ගැනීමේදී අරමුණ ප්‍රකටව දැනගැණීමේ තේරුමෙන් පුබ්බංගමය. පළමුව හැසිරේ යයි කියන ලදී. එය එසේමය. ඇසට මුණගැසුණු රූපාරම්මණය සිතින්ම දැන ගත්තේය. කණට, නැහැයට, දිවට. සිරුරට, සිතට හමු වන අරමුණද දැනගත්තේ සිතින්මය. මෙයින් අරමුණු ගැණීම සිතින්ම සිදුකරන බව නොව අරමුණ ප්‍රකට කර ගැණීමේදී සිත පෙරටු වන බව කියන ලදී. එම අරමුණම චෛතසිකත් එකවරම ගණී. එහෙත් අරමුණ ප්‍රකටකර ගැණීමක් චෛතසිකයන්ට අයිති නැත. එහෙයින් සිතෙන්

දැනගැනීම් වශයෙන් ප්‍රකට කරගත් හෙළි කරගත් අරමුණ එකට ඉපද එකවර සිතත් සමග චෛතසිකයන් විසින්ද ගනු ලබයි.

පසුව පසුව උපදනා සිත් පළමු පළමු උපන් සිත්වලට අතරක් නොතබා ගලාගෙණ එන්නා සේ නොකඩවා සන්ධානය ගැලපීම, සම්බන්ධවීම සිතෙහි එළඹ සිටින වැටහෙන ආකාරයයි.

පඤ්චවොකාර භවයෙහි නාම රූප දෙකම සිතට ආසන්න හෙවත් ආධාර කරුණුය. පදට්ඨානය. චතුවො කාරයෙහි හෙවත් අරූප භවයෙහි නාමයම නාමය වූ සිතට ආධාරයයි.

"යස්මිං සමයෙ කාමාවචරං චිත්තං උප්පන්නං හොති" කියන ලද දෙශනාවේ යම් වේලාවක කාමාවචර සිතක් උපන්නේ වේද කියා නැවතත් "චිත්තං හොති" යනුවෙන් සිතෙහි උපදනාදේවල් දක්වන්නේ සිත වේයයි කියන ලදී.

මුලින් කියන ලද සිත නොවේද? ඒ සිතත් මේ ලක්‍ෂණ අයිති හෙයින් මෙයමය. එහෙත් එය "කාමාවචරං කුසලං" යනුවෙන් වෙන්කර පළමුව දක්වා තිබේ. මෙතන සියලු සිත්වලටම පොදුවේ 'චිත්ත" යනු දක් වන ලදී.

**සිත හඳුන්වන ධම්මසංගණිය**

යං තස්මිං සමයෙ 1 මනො, 2 මානසං, 3 හදයං, 4 පණ්ඩරං, 5 මනො මනායතනං, 6 මනින්‍ද්‍රියං 7 විඤ්ඤාණං 8 විඤ්ඤාණක්ඛන්‍ධො, 9 තජ්ජමානොවිඤ්ඤාණධාතු ඉදං තස්මිං සමයෙ චිත්තං හොති. යනුවෙන් නම් නවයක් දක්වා තිබේ.

ඒ නම් නවය ත්‍රිපිටකයෙහි නොයෙක් තැන යෙදී ඇති බව සැලකිය යුතුයි

මනො මානසං-මනො මනොයතනං යනුවෙන් මන ශබ්දය නැවත නැවත දක්වන ලදී. මන කියන්නේ අරමුණ මනිමින් දැනගන්නා හෙයිනි.

මනම මානස නම්වේ. මානස ශබ්දය එක්ව යෙදෙන ධර්මයන්ටද "අප්පත්ත මානසො-සෙඛො කාලං කයිරා ජනෙසුතා" යන දේශනාවේ අප්පත්තමානසො යනු නොපැමිණි මනසක් ඇත්තේ යනුවෙන් නොපැමිණි අරහත් මාර්ගය ඇත්තේ යනුයි. සසුනට ඇතුලත්වීමේ මහණ වීමේ අදහස හෙවත් බලාපොරොත්තුව රහත්වීමය. එයට නොපැමිණි යන තේරුම මෙයින් ගතයුතුය. කෙසේවත් තිවනට මන-මනස ආදී ශබ්දයක් ව්‍යවහාර නොවේ.

මනො-මනොයතනං යන තන්හිද මනම මනායතන යයි දැක්වීමට මන ශබ්දය යොදා ඇති බව කියනු ලැබේ.

විඤ්ඤාණං විඤ්ඤාණක්ඛන්ධො යනුද එසේය මෙසේ නොයිතුරු දේශනාවක් වූ අභිධර්මයෙහි චිත්ත ශබ්දය මෙන්ම එය විස්තර කරන තැන මන ශබ්දය නැවත නැවත යෙදීම අර්ථය වඩාත් බැබලීමට මිස ගුඪාර්ථයක් ඇතිකර ගැනීමට හේතු නොවිය යුතුය. තවද සිත චෛතසික ගොඩේලා දැක්විමෙන් චෛතසිකයන්ට මෙන්ම සිතටද එක හා සමාන ශක්තියක් දැක්වීමටයයි සිතිය හැකිය. ලොභයක් උපන්නා තරහ ඇතිවූනා මාන් නය හටගත්තා ආදී වශයෙන් ඒ ඒ චෛතසිකයන් උත් සන්න වූ විට ව්‍යවහාරයේ යෙදෙන හැටියෙන් එය වටහා ගත හැකිය. සිත එකක් ලෙස අභිධර්මයේ දැක්වෙන්නේ අරමුණු දැන ගැනීම සියලු සිතකම ශක්තිය හෙයිනි. නාම ධර්මයක් ප්‍රමුඛත්වය නාම ධර්මයන්ගේ සවභාවය එක නාම ධර්මයක් ප්‍රමුඛත්වය

ගන්නා විට අනික්වා එයට අනුකූලවීමය. සිත දැක්වීමට චෛතසික දැක්විය යුතුය. චෛතසික දැක්වීමට සිත දැක්විය යුතුය චෛතසිකයන්ගෙන් තොර සිතක් හෝ සිතින් තොර චෛතසිකයක් හෝ නැත.

කුසලො, අකුසලො, අබ්‍යාකතො – එකො ඛන්ධො, තිණ්ණන්නං ඛන්ධානං සහජාත පච්චයෙන පච්චයො කුසල්, අකුසල්, අව්‍යාකෘත, සියලු නාම ධර්මවේදනා, සඤ්ඤා සංඛාර විඤ්ඤාණ, කොටස් තුණෙන් එකක් අනික් තුණටද මෙසේ ඔවුනොවුන් සහජාතාදී ප්‍රත්‍ය ශක්තීන් ලබාම පහළ වන හෙයින් චෛතසිකයන්ගෙන් තොර සිතක් නොඋපදින බව තීරණය කට යුතුය. තවද නාමරූපයන් දක්-වන බුදුරජාණන් වහන්සේ ඒවා භාවනාවට සුදුසු පරිදි දක්වන සේක. අරූප කම්මට්ඨාන දැක්වූ තන්හි සක්ක පඤ්හ ආදී සූත්‍රවල 'ඵස්ස' වෙදනා, සඤ්ඤා, චෙතනා, චිත්ත යන පඤ්චකය පළමුව ගන්නා බව දැක්වේ. එහෙයින් මේ නාමධර්ම පහ පළමුව දැක් වූ බව සිතිය යුතුය.

**6 විතක්කො හොති**

විතක්කෙතීති විතක්කො, විතර්කය හෙවත් නැවත නැවත විශෙෂයෙන් තැකීම සලකා බැලීම කරනුයේ විතර්කයයි.

ආරම්මණෙ චිත්තස්ස අභිනිරොපණ ලක්ඛණො. සිත අරමුණේ නැංවීම ගොඩකරවීම ලක්ෂණ කොට ඇත්තේය.

ආහණන පරියාහණන රසො.

අරමුණ මිරකා පෙළා නැවතත් බැලීම කෘත්‍යය කොට ඇත්තේය.

ආනයන පච්චුපට්ඨානො, සිත නැවත නැවත ගෙණ ඒම එළඹ සිටිනා ඇකාරයයි

යො තස්මිං සමයෙ, යමක් එසමයෙහි'

1 තක්කො - තැකීම හෙවත් සලකා බැලීම,

2 විතක්කො- බලවත් ලෙස සලකා බැලීම,

3 සංකප්පො හොඳට කල්පනා කර බැලීම,

4 අප්පනා- එකඟ සිත අරමුණේ නැංවීම.

5 ව්‍යප්පනා-බලවත් ලෙස නැංවීම.

6 චෙතසො අභිනිරොපන සිත අරමුණෙහි හොඳින්ම නැංවීම.

7 සම්මා සංකප්පො-නිවන් අතට යන හොඳ කල්පනාවක් වේද, මේ විතර්කයයි. මේ වචන වලින් විතක්ක චෛතසිකය හඳුන්වා තිබේ.

## 7 විචාරො

විචරතී'ති විචාරෙ-හැසිරෙයි හෝ හැසිරවීම විචාරයයි. අරමුණෙහි සිත එසේම හසුරුවන්නේ විචාරයයි

ආරම්මණානුමජ්ජන ලක්ඛණො-අරමුණ පිරිමදින ලක්ෂණ ඇත්තේ විචාරයයි.

තත්‍ර සහජාතානු යොජනරසො-චිත්ත චෛතසික එහි යෙදවීම කෘත්‍යයයි.

චිත්තස්ස අනුප්පබන්ධ පච්චුපට්ඨානො සිත නිතර අරමුණෙහි පැවැත්ම එළඹ සිටින ආකාරයයි.

යො තස්මිං සමයෙ-යමක් එසමයෙහි.

චාරෙ-අරමුණෙහි හැසිරීමක්.

විචාරෙ-එසේම බලවත් හැසිරීමක්.

අනු විචාරො-අනුව හැසිරීමක්.

උප විචාරො-සම්පව හැසිරීමක්.

චිත්තස්ස අනු සන්ධානතා-සිත පිහිටුවීමක්.

අනුපෙක්ඛණතා අනුව බැලීමක් වේද මේ විචාරයයි.

මේ විතක්ක විචාර දෙක ඉතා කිට්ටු සම්බන්ධයක් ඇත. ධ්‍යානාංග වශයෙන් බලවත්ව යෙදෙන ධර්මය, එහෙයින් නොයෙකුත් උපමාවන්ගෙන් මේ දෙක වෙන්ව හඳුන්වා තිබේ.

ඕලාරික හෙයින් පෙරටුව යන හෙයින්, ගණ්ඨාවට ගැසීමමෙන් සිත පළමුව අරමුණෙහි නැංවීම විතර්කයයි.

සියුම් හෙයින් ශබ්දය පිරිමැද යන ස්වභාවය මෙන් ගණ්ඨා රාවය විචාරයයි.

**විතක්ක**

සිත සොළවන වෙව්ලන ගතිය, කුරුල්ලකු අහසට නැගීම මෙන්, බමරු පියුමට බැසීම මෙන්.

**විචාරය**

ශාන්ත ගතිය, අහසේ පියා දිගහැර යෑම මෙන්, පියුමෙහි සිටීම මෙන්, විතක්ක, විචාරයන් උපමා වශයෙන් බැලිය යුතුය. තවද අටුවා කතාවල අහසේ ඉගිල යන උකුසු ශ්‍රීගිණි ආදී පක්ෂීන් පියාපත් ගසා ටිකක් දුර ගොස් යළි පියාපත් දිගහැර තබාගෙණ බොහෝ වේලා කැරකෙයි. එසේ පියාපත් දිගහැර තබා ගැණීමමෙන් විතර්කය පියාපත් අතරට වාතය ගැනීමට නැවත නැවත සෙලවීම විචාරය මෙන්ද දක්වා තිබේ.

මුලින් කියනලද උපමා වලට වඩා මෙහි වෙනසක් තිබේ. මේ වනාහි අර්පණා වශයෙන් දියුණු විතර්කයයි. එසින් අරමුණෙන් බැසීමක් නැතිව එහිම තදෙන් සිත

ප්‍රතිෂ්ටුවීම එවිට විතර්කයගෙන් සිදුවේ. විචාරය එසේ පවත්නා සහජාතයන් එහිම හැසිරවීම කෙරේ.

මෙයට භාජනයක් සෝදනවිට අල්ලා සිටින අත විතර්කය ලෙසද මදින අත විචාරය ලෙස දැක්වූ උපමා- වෙන්ද වටහා ගත යුතුය. කවකටු උපමාවද මෙයට අයත්ය. කව කටුවෙන් කවයක් ගැසීමේදී මැද කටුව ස්ථිරවම තිබේ අනිත් කටුවෙන් රවුම ගැසේ මැද කටුව මෙන් විතර්කය ද රවුම ගහණ කටුව මෙන් විචාරයද දතයුතුය. මෙය වනාහි ධ්‍යාන අවස්ථාව සඳහා ගතයුතු බව කරුණාවෙන් සලකත්වා.

ශාන්ත නිවන් සැප ලැබේවා ! !

# 22

**සිතෙහි උපදින ගති 3**

8 පීතිහොතිං. ප්‍රීතියවේ. පිනවානුයි ප්‍රීති නම්වේ. "සම්පියායන ලක්ඛණ පීති" මනාකොට ප්‍රිය බව ඇති කරන ලක්‍ෂණ ඇත්තේ ප්‍රීතියයි.

"කාය චිත්ත පිණනරසා" කය සිත දෙක පිනවන කෘත්‍යය ඇත්තේය. සිතෙහි හටගැනෙන විට ප්‍රණීත චිත්තජ රූපයන්ගේ හටැනීමෙන් ශරීරයද පිණවයි. සිතද පිණවයි.

"ඵරන රසාවා" පැතිරීම හෝ කෘත්‍යවේ. මුළු සිරුරෙහි පැතිරෙන ගතියක් දැනේ. එහෙයින් පැතිරීම හෝ කෘත්‍යයයි කියන ලදී.

"ඔදග්‍ය පච්චුපට්ඨානා" ඔද වැඩි බව එළඹ සිටින ආකාරයයි ඔදවැඩි බව ඇතිවීම ශරීරයෙහි ප්‍රණීත රූප යන්ගේ පහළ වීමෙන් සිදුවේ.

මෙම ප්‍රීතිය පස්වැදෑරුම්ය.

1. ඛුද්දිකා පීති–කුඩා පීතිය හෙවත් ලොමුදැහැ ගැණීම පමණක් ඇතිකරණ සතුටයි. ප්‍රීතිය භය ආදී කරුණු බල වත්ව ඇතිවීමේදී ලෝමයන් නැගීසිටීම අප දන්නා කරුණකි. එද රූප ධර්මයන්ගේ බහුලව පහළ වීමෙනි.

2. ඛණිකා පීති–ක්‍ෂණික ප්‍රීතිය වහා ඇතිවෙමින් නැතිවෙමින් විදුලිය කොටන්නා මෙන් සිරුරට දැනී යන ප්‍රීතියයි.

3. ඔක්කන්තිකා පීති-ඉක්මවා යන ප්‍රීතිය හෙවත් උතුරා යන ප්‍රීතියයි. මුහුදු රළගසා වෙරළෙ පැතිර යන්නා සේ දැනෙන ප්‍රීතිය.

4. උබ්බේගා පීති - බලවත් ප්‍රීතියයි. ශරීරය උඩට ඔසවා ලන තරම් ප්‍රමාණ ප්‍රීතියයි. පුණ්ණවල්ලික විහාර වාසී මහා තිස්ස තෙරුන් වහන්සේට මෙන්ද, ගිරිභඩු-වෙහෙර අසල වත්තකාලගම කුල කාන්තාවට මෙන්ද, බලවත් බුද්ධාලම්බන ප්‍රීතියෙන් අහසට නැගෙන තරම් ප්‍රීතිය උබ්බේග' පීතියයි.

**ඵරණා පීති**

පැතිරෙන ප්‍රීතියයි. සුලං පිරවූ බෝතලයක් මෙන් ශරීරය ඇතුළත පිරුණු පැතිරුණු ගතිය ඇතිකරවන ප්‍රීතියයි. එවිට එක තැනක නොසිටිය හැකි ගතියකි. භාවනානුයෝගියාට මේ කියන ලද පස්වනක් ප්‍රීතිය නො-යෙක්වර ඇතිවිය හැකි ය. එහෙත් වටහා ගැනීම ඔහුට ඇතැම්විට නොහැක. ශරීරය බර නැතිව යන බව සැහැල්ලු බව ආදිය ප්‍රකාශ කරයි.

**යා තස්මිං සමයේ පීති**

එසමයෙහි යම් ප්‍රීතියක් වේද

පාමොජ්ජං – ප්‍රමුදිත බවක් වේද.

ආමොදනා – දුඃඛ ලෙස වඩාත් සතුටුවීම.

හාස – සතුට ඇති කිරීම හාසය හෙවත් සිනහව ඇති කිරීම.

පහාසය – තුටු පහටු අයුරු ඇතිකිරීමය

විත්ති – ධනය සතුට ඇති කරයි. එහෙයින් සතුටම උතුම් ධනයක් හෙයින් විත්ති යන නමද සතුටට දෙසූසේක.

ඔදග්‍ය–ඔදවැඩි බවයි. ප්‍රීතිමත් පුද්ගලයා කය සිත නැගී සිටුනා හෙයින් ඔදවැඩි ගතියක් දක්වයි.

අත්තමනා - තමාගේ සිතයයි ගැනීම හෙවත් සිත නරක්වූ පුද්ගලයාට එය තමාගේ යයි ගැණීමක් නැත. සතුටු-වක්ම තමාගේයයි ගැණීම දුඃඛවෙයි. මෙසේ සිත

ප්‍රබන්ධ ගැනීම සතුට නිසා සිදුවෙයි. මේ වචන වලින් ප්‍රීතිය ඉතුරු නොකොට වදාළ බව සලකන්න. කුසල ප්‍රීතිය පිරෙන්නේ කාය පස්සද්ධි චිත්ත පස්සද්ධින් පිරේ පස්සද්ධිය පිරෙන්නේ කායික මානසික සැපය පිරේ.

සුඛං ගබ්භං ගණ්හන්තං නිබ්බං සමාධිං පරිපූරෙති.

ඛණික සමාධිං උපචාර සමාධිං අප්පණා සමාධිං.

සැපය පිරෙන්නේ ත්‍රිවිධ සමාධිය පිරේ. එනම් ක්‍ෂණික උපචාර, අර්පණා යන සමාධියි එහි අර්පණා සමාධිය හැර ඉතිරි දෙක මේ කාමාවචර කුසල සිතෙහි වැඩෙති.

9. සුඛං හොති–සැපය වේ. සැප ඇති කෙරේනුයි සුඛ නම් වේ. යමෙකුට උපදිද ඔහු සැපවත් බවක් සුඛිතයෙක් කෙරෙනුයි සුඛ නම් වේ. කයෙහි සිතෙහි පීඩා නැති කරන හෙයින්ද සුඛ නම් වේ. මේ නම් සොම්නස්ස වේදනාවයි.

"සාත ලක්ඛණංසුඛං" මධුර ගතිය ලක්‍ෂණ කොට ඇත්තේ සැපයයි.

'සම්පයුත්තකානං උපබ්‍රූහණ රසා" එකට යෙදෙන නාම ධර්මයන් බලයට පත් කිරීම කෘත්‍යයයි.

අනුග්ගහණ පච්චුපට්ඨානං අනුග්‍රහය හෙවත් යලි යලි උපකාර කිරීම එළෙඹ සිටින ආකාරයයි. ප්‍රීතිය හා සුඛය බෙහෙවින් එක්ව යන ධර්මයෝය. හොඳ අරමුණක් ලැබීම ප්‍රීතියයි. එහි රස විඳිම සැපයයි

යම් තැනෙක ප්‍රීතිය වේද එහි සැපය වේ. යම් තැනක සැපයවේද එහි නියමයෙන්ම ප්‍රීතිය වේයයි නොකිව හැකිය. සුඛ එකග්ගතාවයෙන් යුත් ධ්‍යාන සිතෙහි ප්‍රීතිය නැත. ප්‍රීතිය සංස්කාරයන්ට අයිතිය, සැපය වේදනාවට අයිතිය. කාන්තාරයක විඩාවෙන් පිපාසයෙන් යන්නහුට වැවක් පොකුණක් වනයක් ළඟ ඇතැයි ඇසීම මෙන් ප්‍රීති

ය. එහි ගොස් දිය බී නා සෙවනෙහි සැතපීම් මෙන් සැපයයි.

යා තස්මිං සමයෙ-එසමයෙහි යම් -චෛතසිකං සාතං- සිත පිළිබඳ මධුර බවක් වේද චෛතසිකං සුඛං-සැපයක් වේද සිතින් හටගත් සැප වේදනාවක් වේද මේ එසම- යෙහි සැපයවේ.

10. චිත්තස්ස එකග්ගතා හොති.

සිතෙහි එකඟ බවක් වේද එනම් සමාධියයි. සමාධි යනුද මනාව පිහිටුවානුයි සමාධි නම් වේ. චිත්ත චෛතසිකයන් එක අරමුණක මනාව පිහිටුවීම සමාධි නම් වේ.

පාමොක්ඛ ලක්ඛණො ච සමාධි.

අවික්ඛෙප ලක්ඛණො ච අවිසාර ලක්ඛණො ච-ප්‍රමුඛ බව හෝ නොවිසි කිරීම නොවිසිරීම ලක්ෂණ කොට ඇත්තේ සමාධියයි. සතරැස් අටපට්ටම් ගෙයක තම් මුදුන් කැණි මඩල මෙන්ද සාමාන්‍ය ගෙයක මුදුන් යටලීය මෙන්ද අතික් චිත්ත චෛතසික එක් තැන් කරණ හෙයින් ප්‍රමුඛ වූයේ නොවිසිර පවත්නා ලක්ෂණයෙන්යුත් වූයේ සමාධියයි.

''සහජාත ධම්මානං සම්පිණ්ඩන රසො'' එකට හට ගත්නා ධර්මයන් පිඩුකිරීම කෘත්‍යයයි.

''උපසම පච්චුපට්ඨානො'' ''ඤාණ පච්චුපට්ඨානොවා'' සංසිඳීම හෝ නුවණ එළෙඹ සිටිනා අයුරැයි.

''සුඛ පදට්ඨානො'' සැපය ආසන්න කාරණයයි.

යා තස්මිං සමයෙ - එසමයෙහි යම් - චිත්තස්ස ඨිති- සිතේ තැත්පත් ගතියක් නොසෙල්ලී අරමුණෙහි පිහිටීමත් සණ්ඨිති- හොඳින් එක්ව පැවතීමත්,

අවට්ඨිති-බැස පැවැත්මක් අවිසාහාරෝ උධච්ච විචි-කිච්ඡාවන්ගෙන් තොරවූ නොවිසිර ගිය ගතියත්, අවික්ඛෙ-පො නොඇවිස්සුනු ගතියක් අවිසාහට මානසතා - නො සැකා නොවිසුරුනු බවක් සමථො - සිතෙහි සමතැක් සමාධින්ද්‍රියං සිත එක්තැන් කිරීමෙහි මුල් බවත්, සමාධි බලං - උද්ධච්චාදීන්ගෙන් කම්පා නොවීමක්, සම්මාසමාධි-නිවන් අතට යවන හොඳ සමාධියක් වේද මේ සමාධියයි කුසල පක්ෂයෙහි සතර දෙනෙක් අරමුණට බැස තදින් අල්ලා ගනියි.

සද්ධා, සති, සමාධි, පඤ්ඤා ශ්‍රද්ධා සිහිය, සමාධිය, ප්‍රඥව යනුයි.

අකුසල පක්ෂයෙහි තුන්දෙනෙක් අරමුණට බැස අල්ලා ගනියි.

“තණ්හා දිට්ඨි අවිජ්ජා” තෘෂ්ණා දෘෂ්ටි අවිද්‍යා යන තුණයි.

මෙසේ සදහම් දැන විදසුන් වඩා ශාන්ත නිවන් සුව ලබත්වා.

# 23

## නමො සම්මාසම්බුද්ධස්ස

### සිතෙහි උපදනා ගති 4.

11. සද්ධින්ද්‍රියං හොතිං සද්ධා ඉන්ද්‍රිය වෙයි.

මෙසින් ඇදහීම කෙරේනුයි සද්ධානම්වේ සද්ධා චෛතසිකය නිසා ඇදහීම ඇතිකර ගනී යන තේරුමයි. ඇදහීම කරන්නේ සද්ධා චෛතසිකය ම යි. එහෙයින් තෙමේම අදහානුයි සද්ධා නම්වේ.

ඇදහීම් මාත්‍රයම හෝ සද්ධා නම් වේ. ඇදහීම යනු විශ්වාසය මුල්කොට ඇති ස්ථිර පිළිගැනීමයි. මොහු කෙරෙහි මේ ගුණය ඇත. මෙය මෙසේයයි ස්ථිර වශ-යෙන් සිත පිහිටුවා අදහා විශ්වාසය තැබීමයි. බුදුරජාණන් වහන්සේ ඒකාන්තයෙන් සර්වඥය. ධර්මය නිවන් පිණිස පවත්නේ (නෛර්‍යාණික) ය, ආර්‍ය්‍ය සංඝයා මනා පිළිවෙතෙහි පිහිටියේයයි මෙසේ ඇදහීම තෙරුවන් ගුණයෙහි පිහිටීම, භක්තිමත් වීම සද්ධාය.

### ඉන්ද්‍රිය

යනු අධිපති හෙවත් ප්‍රධාන යන තේරුමයි. සද්ධාව අශ්‍රද්ධාව මැඩපැවැත්වීම්’ අශ්‍රද්ධාවට මතුවිය නොදී අභිභව නය කරන හෙයින් සද්ධා ඉන්ද්‍රිය නම් වේ. එසේම දැඩිව පිහිටීම විශ්වාසකිරීමෙහි ප්‍රධානත්වය දරණ හෙයිනුදු ඉන්ද්‍රිය නම්වේ. ශ්‍රද්ධාවම ඉන්ද්‍රිය වූයේනුයි සද්ධින්ද්‍රිය නම් වේ.

### ලක්ඛණ.

1. “සම්පසාදන ලක්ඛණාව සද්ධා.”
2. “සම්පක්ඛන්දන ලක්ඛණාව”

මනාකොට පැහැදවීම ලක්‍ෂණකොට ඇත්තේ හෝ කුශල් කරන්නට පැනීම ලක්‍ඛණ කොට ඇත්තේය. සැක කුකුස් ආදී කෙලෙස් වලින් සිත කිළිටි වේ, බොර වේ. නොපැහැදේ. ඒ අකුශල චෛතසිකයෝය. ශ්‍රද්ධාව තමාත් පැහැදුන එක්ව යෙදෙන චිත්ත චෛතසික ධර්‍මයනුත් පහදවමින් ඇතිවන කුසල චෛතසිකයකි. සිතේ ගතියකි.

සක්විති රජතුමාට පිණින් පහළවන මැණිකක් ඇත, එය ඔනෑම බොරවූ ජලයකට දැමූ විට ක්‍ෂණයකින් එම ජලය පැහැදී පිරිසුදුවී බියහැකි පැනක් වන්නේය. මෙම උදකප්පසාදක මැණික මෙන් ශ්‍රද්ධාවද සිත හා චෛතසික පහදවන්නේය.

ශ්‍රද්ධාවේ අනික් ලක්‍ෂණය සම්පක්ඛන්ඛනයයි. හෙවත් පින්දහම් කිරීමට ඉදිරියට යැවීම යි. ශ්‍රද්ධාව හොඳට නැත්නම් පිනට දහමට යැවීමක් සිදුනොවේ. එහෙයින් මේ ලක්‍ෂණය තරමක් දියුණුවුණු ශ්‍රද්ධාවගේ යැයි සිතිය යුතුය. පළමුව පැහැදීම ඇතිවී දෙවනුව ක්‍රියා කාරී වීම සිදුවන හෙයිනි. කිඹුල් ආදීන්ට බයේ ගඟෙන් එතර වීමට නොහැකි මිනිසුන් නිර්භය කරවා ගඟෙන් එතරට පිහිණන යෝධයෙකු මෙනි.

(3) "සද්දහන ලක්ඛණ සද්ධා,"

(4) "ඔකප්පන ලක්ඛණවා,"

ඇදහීම ලක්‍ෂණකොට ඇත්තේ හෝ බැසගැනීම ලක්‍ෂණකොට ඇත්තේ ශ්‍රද්ධාවයි. ඇදහීම යනු සද්දහන-සදහන-හදහන-අදහන යනුවෙන් පහසුවෙන් යෙදේ. බැසගැනීම යනු වෙන් බුද්ධාදි ගුණයෙහි කිමිදෙමින් පවත්නා ශ්‍රද්ධාව යි. මෙය ලෞකික අවස්ථායෙහි ද ඉතා බලවත්වූයේ ලෝකෝත්තර අවස්ථාවෙහි අචල ශ්‍රද්ධාවගේ ලක්‍ෂණය යි.

කෘත්‍යය.

"පසාදන රසා."

පක්ඛන්ධන රසාවා

ශ්‍රද්ධාව පහදවන කෘත්‍යයය හෝ කුසල් කිරීමට පැණීම කෘත්‍යය කොට ඇත්තේ වේ. මෙයින් ශ්‍රද්ධාවගේ ලක්ෂණයත් කෘත්‍යය හෙවත් ක්‍රියාවත් එක හා සමාන බව දක්වේ

පච්චුපට්ඨානය:

"අකාලුසිය පච්චුපට්ඨානා,
අධිමුත්ති පච්චුපට්ඨානාවා"

සිතෙහි නොකිළිටි බව හෝ දැඩිව පිහිටිබව එළෙඹ සිටින ලක්ෂණය වේ.

පදට්ඨානය.

"සද්ධෙය්‍යවත්ථු පදට්ඨානා
සොතාපත්තියංග පදට්ඨානාවා."

ඇදහිය යුතු වස්තූන් හෙවත් බුද්ධාදි වස්තූන් හෝ සතර සොතාපත්ති අංග ආසන්න කාරණය වේ. සද්ධාව ඇතිවීමට අධාර වන්නේ රත්නත්‍රය යි. සත්පුරුෂ සේවනය සද්ධර්මශ්‍රවණය යොනිසො මනසිකාරය, ධර්මානුධර්ම ප්‍රතිපත්තිය, යන කරුණු සතරද ආධාර වේ.

"යා තස්මිං සමයෙ" එසමයෙහි සිතෙහි ඇතිවන යම්

1. සද්ධා-බුද්ධාදි ගුණයන් අදහන ගතියක් වේද,
2. සද්දහනා-ඇදහීම් ආකාරයක්,
3. ඔකප්පනා-බුද්ධාදී ගුණයෙහි පිවිසීමක්,
4. අභිප්පසාදො-අතිශය පැහැදීමක්,

5. සද්ධින්ද්‍රියං - ශ්‍රද්ධාව අධිපතිවීමක්.

6. සද්ධාබලං - අශ්‍රද්ධාවෙන් කම්පා නොවීමක් වේද ඉදං තස්මිං සමයෙ සද්ධින්ද්‍රියං හොති. - මේ එසමයෙහි සද්ධින්ද්‍රිය නම් වේ.

12. විරියින්ද්‍රියං හොති. විරියින්ද්‍රිය වෙයි.

වීරයාගේ සවභාවය වීර්යයයි. වීරයාගේ කර්මය හෝ වීර්යයයි. විධිවූ පරිද්දෙන් හෙවත් ක්‍රමයෙන් උපායෙන් පැමිණවියයුතු, පැවැත්වියයුතු හෙයින් වීර්යය වෙයි කුසීත කම මැඩලන හෙයින් අධිපති බැවින් ඉන්ද්‍රිය නම් වේ. දැඩිව ගැනීම ලක්ෂණයෙහි හෝ ප්‍රධානබව කෙරේ-නුයි ඉන්ද්‍රිය නම් වේ.

ලක්ඛණාදිය.

“උපත්ථම්භන ලක්ඛණංව විරියං
පග්ගහණලක්ඛණංව”

පසු බැසීමට නොදී උපකාර කිරීම ලක්ෂණ කොට ඇත්තේ හෝ දැඩිව ගැනීම ලක්ෂණ කොට ඇත්තේ වීර්යයයි. දාන සීල, භාවනාදී කුසල කරණයෙහි පසුබැසී-මට නොදී චිත්ත චෛතසිකයන්ට උපකාර කරමින් දැඩි කරමින් උණුසුම් කරමින් වීර්යය කුසල චෛතසිකයද ඒ සමග යෙදේ.

“උස්සාහන ලක්ඛණං වා”

වීර්යයෙහි ඇති තවත් ලක්ෂණයක් උත්සාහ කරවීමයි පහත වැටෙන චිත්ත චෛතසික ඔසවන ලක්ෂණයයි.

“සහජාතානං උපත්ථම්භන රසං” එක්ව යෙදෙන චිත්ත චෛතසිකයන්ට උදව් කිරීම වීර්යයේ කෘත්‍යයයි.

“අසංසීදන භාව පච්චුපට්ඨානං” කිඳාබසින හෙවත් නොමිදෙන බව එළඹ සිටින ආකාරයයි.

"සංවේග පදට්ඨානං"
විරියාරම්භ වත්ථු පදට්ඨානංවා"

සංවේගය ආසන්න කාරණයයි. හෙවත් වීර්‍ය්‍යාරම්භ වස්තූන් ජාති ජරාදි සංවේග වස්තූන් වීර්‍ය්‍ය ඇතිවීමට හේතු වේ. ආධාර වේ.

යො තස්මිං සමයෙ- එසමයෙහි යම්,

1. චෙතසිකොවිරියාරම්භො - සිත පිළිබඳ වීර්‍ය්‍යාගේ පටන් ගැන්මක් වේද,
2. නික්කමො - කම්මැලිකමින් නික්මීමක්,
3. පරක්කමො - මතු මතු උසස් තත්වයට පත්වීමක්,
4. උය්‍යාමො - නැගීයාමක්,
5. වායාමො - වෙසෙසින් උත්සාහ ගැණීමක්,
6. උස්සාහො - උත්සාහයයක්,
7. උස්සොළ්හි - දැඩි උත්සාහයක්,
8. ථාමො - ස්ථිරභාවයෙන් යුතුවීමක්.
9 ධිති - නොසිඳ දැරීම් වශයෙන් කුසල සංතානය දැරීමක්
10. අසිථිල පරක්කමතා - නොලිහිල් පරාක්‍රම වීර්‍ය්‍යයක් හෙවත් චතුරංග වීර්‍ය්‍යයක්,
11. අනික්ඛිත්ත ඡන්දතා - පසුනොබස්නා සිතක්
12. අනික්ඛිත්ත ධුරතා - බහා නොතැබූ වීර්‍ය්‍යයක්,
13. ධුර සම්පග්ගහො - ධුරය ඉසිලීමක්,
14 විරියං 15. විරිඉන්ද්‍රියං 16. විරිය බලං
17 සම්මා වායාමො - නිවන් අතට යන කුශල වීර්‍ය්‍යයක් වේද, ඉදං තස්මිං සමයෙ විරිඉින්ද්‍රියං හොති. මේ එසමයෙහි විරියින්ද්‍රිය වේ. මෙසේ නම් 17 කින් විරියින්ද්‍රිය ත්‍රිපිටකයෙහි දක්නා ලැබේ.

18. සතින්ද්‍රියං හොති. සති ඉන්ද්‍රිය වේ.

මෙය කරණකොට සිහිකෙරෙත්නුයි සති නම් වේ. සතියම සිහිකෙරේනුයි හෝ සිහිකිරීම් මාත්‍රයම සති නම් වේ. මුළා සිහිය මැඩ පවත්වන හෙයින් අධිපති අර්ථයෙන් සතින්ද්‍රිය වේ. එළෙඹ සිටීම් ලක්‍ෂණයෙහි හෝ ප්‍රධානත්වය කෙරේනුයි සතියම ඉන්ද්‍රිය වේ.

ලක්‍ෂණාදිය.

"අපිලාපන ලක්ඛණා ච සති.

උපගණ්හන ලක්ඛණා ච."

නොපාවෙන ලක්‍ෂණ ඇත්තී හෝ ළඟට ගෙන දෙන ලක්‍ෂණ ඇත්තී සිහියයි. පිළාපන යනු පාවීමයි. පාවෙත් නට හෙවත් චිත්ත සන්තතියෙහි පිට යන්නට නොදී අරමුණ රැකදෙන්නේ සතියයි. රජුගේ භාණ්ඩාගාරිකයා මෙනි. රජුගේ පුත්‍ර රත්නය ධනය විනාශවන්නට නොදී රජු වෙත පමුණුවන්නාසේ අරමුණ රැකදෙන්නේ සතියයි.

අසම්මෝහන රසා - නුමුළා වීම කෘත්‍යයයි, "ආරක්ඛ පච්චුපට්ඨානා"

"විසයාභි මුඛභාව පච්චුපට්ඨානාවා" රැක දීම හෝ අර මුණට අභිමුඛ භාවය එළඹ සිටින ආකාර යයි.

"ථිර සඤ්ඤා පදට්ඨානා

සතිපට්ඨාන පදට්ඨානාවා" සථිර හැඟීම හෝ කායාදී සතිපට්ඨානයන් ආසන්න කාරණයයි.

ධා තුසම්ංසමයෙ 1. සති - එසමයෙහි යම් සිහියක් වේද
2. අනුස්සති - නැවත නැවත සිහිකිරීමක්
3. පටිස්සති - ඉරිදියට චිත් මතක්වීමක්,
4. සතිසරණතා - සිහිකරන ආකාරයක්,

5. ධාරණතා - දැරීමක් මතක සිටීමක්.

6. අපිලා පනතා - නොපාවී බැස ගැණීමක්

7. අපම්මුස්සනතා - පෙර කළ දෙය සිහිකිරීමක්

8. සතින්ද්‍රියං 9 සති බලං 10. සම්මාසති යක් වේද මේ එසමයෙහි සතින්ද්‍රියයි.

14. සමාධින්ද්‍රියං හොති. සමාධි ඉන්ද්‍රිය වේ.

චිත්තස්සෙකග්ගතා යන්නෙත් පසුගිය පාඩමෙහි මෙය විස්තරවිය. වික්ඛෙපය මැඩලන හෙයින් සමාධි ඉන්ද්‍රිය විය. මෙසේ දහම් දැන විදසුන් වඩා නිවන් සුව ලබත්වා.

---

# 24

## නමො සම්මා සම්බුද්ධස්ස

### 5 සිතෙහි උපදනාගති

පඤ්ඤින්ද්‍රියං හොති. පඤ්ඤා ඉන්ද්‍රිය වෙයි.

ප්‍රකාරයෙන්, නොයෙක් ආකාරයෙන් දැනගණිනුයි පඤ්ඤා නම්වේ. කුමක් දැන ගණිද? මේ දුක යයි ආදී වශයෙන් ආර්‍ය්‍ය සත්‍යයන් දැන ගනිනුයි ප්‍රඥා නම්වේ. පණවානුයි පඤ්ඤා නම්වේ කුමක් පණවාද? අනිත්‍ය දුකඛ අනාත්මයන් පණවානුයි ප්‍රඥා නම්වේ.

'පජානාතීති ඛො ආවුසො' තස්මා පඤ්ඤාති වුච්චති.

ඇවැත්නි, නානාප්‍රකාරයෙන් දැනගණිනුයි එහෙයින් ප්‍රඥායයි කියනු ලැබේ. යනුවෙන් දම්සෙනෙවි සැරියුත් මහ රහතන් වහන්සේ වදාළ සේක.

ප්‍රඥාව අවිද්‍යාව මැඩපවත්වන හෙයින් අධිපති අර්ථයෙන් ඉන්ද්‍රිය නම්වේ. එසේම දර්ශනයෙහි අධිපති බව කෙරේනුයි ඉන්ද්‍රිය නම්වේ.

### ලක්ෂණාදිය

'ඔභාසන ලකඛණව පඤ්ඤා'
'පජානන ලක්ඛණව'

බැබලීම ලක්ෂණකොට ඇත්තේ හෝ නානා අයුරින් දැනගැණීම ලක්ෂණකොට ඇත්තේ ප්‍රඥාවයි.

තවද 'යථා සභාව පටිවෙධ ලක්ඛණ පඤ්ඤා අක්ඛලිත පටිවෙධ ලක්ඛණ ච'

ඇහිසැටිය අවබොධකිරීම ලක්ෂණකොට ඇත්තේ හෝ නොපැකිල අවබෝධ කිරීම ලක්‍ෂණකොට ඇත්තේ ප්‍රඥවයි.

'විසයොභාස රසා'

අරමුණ බැබලීම හෙවත් පැහැදිලිව අවබොධ කිරීම ප්‍රඥවගේ කෘත්‍යයයි. රාත්‍රියෙහි පහනක් දල්වීමෙන් අඳුර දුරුවී තියෙන දේවල් හොඳින් පෙනේද? එසේම ප්‍රඥ නැමති ආලෝකයට දස සහස්සී ලොකධාතුවද ඒකාලෝක වෙයි. නාගසේන මහ රහතන් වහන්සේද මෙයම වදුරණ ලදී.

'මහරජ යම්සේ අන්ධකාර ගෙයකට පුරුෂයෙක් පහනක් ගෙණයයිද එවිට අන්ධකාරය දුරුවී ආලෝකය පැතිරේද රූපය ප්‍රකට කෙරේද එපරිද්දෙන් ප්‍රඥව විද්‍යව බැබලීම ඇතිකරයි. ඥණාලෝකය ඇතිකරයි. ආයසීසත්‍යයන් ප්‍රකට කරයි. මෙසේ ඔභාසන ලක්ෂණයෙන් යුක්තය' මේ ඔභාසනය ම ප්‍රඥවගේ කෘත්‍යයය වෙයි.

මෙහි නාම රූපයන් අනිත්‍යාදි වශයෙන් දකිමම ඒවා ආලෝකමත්ව පැහැදිළිව වැටහීම බැබලවීම බව වටහා ගතයුතුය.

අසම්මොහ පච්චුපට්ඨානා

නුමුළා බව එළඹ සිටින ආකාරයයි. යා තස්මිං සමයෙ පඤ්ඤා- ඒ කුසල් සිත හට ගත්තා වේලෙහි යම් ප්‍රඥවක් වේද,

1. පජානනා- දැනගත්තා ආකාරයක් වේද.
2. විචයො- අනිත්‍යාදීන් සොයා ගැනීමක් වේද,
3. පච්චයො-නොයෙක් අයුරින් සොයා ගැණීමක් වේද.

4. ධම්ම විචයො-සතර සත්‍ය ධර්මයන් සොයා ගැණීමක් වේද.

5. ලක්ඛණ- අනිත්‍යාදීන් සැලකීමක් වේද.

6. උපලක්ඛණ- අනිත්‍යාදීන්ට ලංව බැලීමක් වේද.

7. පච්චුපලක්ඛණ - නැවත නැවත ලංව බැලීමක් වේද.

8. පණ්ඩිච්චං-පණ්ඩිත බවක් වේද.

9 කොසල්ලං- දක්‍ෂ බවක් වේද.

10. නෙපුඤ්ඤං-නිපුණ බවක් වේද.

11. වෙ භව්‍යා- අනිත්‍යාදීන් ප්‍රකට කරණ බවක් වේද

12. චින්තා- අනිත්‍යාදීන් සිතන බවක් වේද.

13. උප පරික්ඛා-අනිත්‍යාදීන් මනාව පරීක්‍ෂා කරණ බවක් වේද.

14. භූරි පොළව මෙන් මෘදු පැතුරුණු ගතියක් වේද නැතහොත් ඇති අර්ථයෙහි පැවැත්මක් වේද.

15. මෙධා-කෙලෙසුන් මර්දනය හිංසනය කිරීමක් වේද, හෝ වටහා ගැණීමක් දැරීමක් වේද.

16. පරිණායිකා-තමන්ට හිත ප්‍රතිපත්තියට පැමිණවීමක් හෝ එක්ව යෙදෙන ධර්මයන්හි ඇති ලක්ෂණ ප්‍රති-වේධ කිරීමට පැමිණවීමක් (මූලික විමසා) වේද

17. විපස්සනා-අනිත්‍යාදි වශයෙන් ධර්මයන් මනාව දැකීමක් වේද.

18. සම්පජඤ්ඤං-මනා ආකාරයෙන් අනිත්‍යාදීන් දකීද.

19. පතොදො-නොමග යන ගොනුන් කෙවිටෙන් ඇන සුමගට ගන්නා කෙවිටක් මෙන් වැරදි අවබොධයෙන් හරි අවබොධයට ගැනීමක් වේද.

20. පඤ්ඤා-පඤ්ඤින්ද්‍රියං (විස්තර කරන ලදී.)

21. පඤ්ඤා බලං- අවිද්‍යාවෙන් කම්පානොවීමක් වේද.

22. පඤ්ඤා සත්ථං- කෙලෙස් සිඳින ආයුධයක් වේද.

23. පඤ්ඤා පාසාදෙ-ප්‍රාසාදයක් මෙන් උස්ව නැගීමක් වේද.

24. පඤ්ඤා ආලොකො-ප්‍රඥා ආලෝකයක් වේද.

25. පඤ්ඤා ඔභාසො-ප්‍රඥා අවභාෂයක් වේද

26. පඤ්ඤා පජ්ජොතො-ප්‍රඥා දූල්වීමක් වේද.

27. පඤ්ඤා රතනං - ප්‍රඥා රත්නයක් වේද.

28. අමොහො-නුමුලාවීමක් වේද.

29. (ධම්මවිචයො) සම්මාදිට්ඨි-නිවත් කරා පමුණු වන දූකීමක් වේද.

ඉදං තස්මිං සමයෙ පඤ්ඤින්ද්‍රියං හොති මෙ එසමයෙහි පඤ්ඤින්ද්‍රිය වේ මෙසේ පඤ්ඤා යන වචනයෙහි අර්ථ යත් ඉකිරි නොකොට වදාළසේක. මෙහි ආලොක, ඔභාස, පජ්ජොත යන වචන එකම තේරුමක් වුවද බොහෝ දෙනාගේ වැටහිමට පහසු වන අයුරු වදාළසේක.

16. මනින්ද්‍රියං හොති-මන ඉන්ද්‍රිය වෙයි.

මනතීති මනො-විජානනය හෙවත් දූනීම කෙරේනුයි මන නම්වේ. මෙහි මන ශබ්දය ඤාණයෙහි හෙවත් දූනීමෙහි වැටේ. නවද අරමුණ මනියි. දූනගණිනුයි කියාද මන නම්වේ. නැළියකින් මනින්නාක් මෙන් තරාදියකින් ගන්නාක් මෙන් අරමුණ ප්‍රමාණකොට දූනගණියි මන නම් වේ. මැන දූනීම් විෂයෙහි ප්‍රධානත්වය දරානුයි ඉන්ද්‍රිය නම් වේ. මනසම ඉන්ද්‍රියවූයේ මනින්ද්‍රිය නම් වේ.

'හෙට්ඨා වුත්ත චිත්තස්සෙ වෙතං අධිවචනං'

යට කියන ලද සිතටම මේ අනික් වචනයකි. එහෙයින් එහිදී කියන ලද ලක්‍ෂණාදිය මෙයට ගැලපේ.

17. සොමනස්සින්ද්‍රියංහොති සොම්නස් ඉන්ද්‍රිය වෙයි.

ප්‍රීති ආදියෙන් යුත් හොඳ සිතක් ඇත්තහුගේ සවභාවය සොම්නස්ස නම්වේ. මධුරතාවයෙහි අධිපති බව කෙරේනුයි ඉන්ද්‍රිය නම් වේ.

මෙද, යට කියන ලද වේදනාවමය. වේදනාවට කියන ලද ලක්ෂණ රසාදිය මැයි.

18 ජීවිතින්ද්‍රියං හොති-ජීවිත ඉන්ද්‍රිය වෙයි.

යමකින් එකට හටගන්නා ධර්මයෝ ජීවත් වෙත්නම් එය ජීවිතයයි. වෙයින් නාම ධර්මයන්ගේ ජීවත්වීම, පැවැත්වීම කියන ලදී. තමත් හා එකට හටගත් චිත්ත චෛතසික ධර්මයන් පාලනය කිරීමෙහි ප්‍රධානත්වය දරණ හෙයින් ඉන්ද්‍රිය නම් වේ.

ලක්ෂණාදිය

අත්තනා අවිනිභුත්තානං ධම්මානං අනුපාලන ලක්ඛණං ජීවිතින්ද්‍රියං

තමා හා නොවෙන්ව පවත්නා ධර්මයන් අනුපාලනය කිරීම ලක්ෂණ කොට ඇත්තේ ජීවිතෙන්ද්‍රියයි. තෙසං පවත්තන රසං-එක්ව පවත්නා චිත්ත චෛතසිකයන් පැවැත්වීම කෘත්‍යයයි.

'තෙසං යෙව ඨපන පච්චු පට්ඨානං'

එම චිත්ත චෛතසිකයන් පිහිටුවීම එළඹ සිටින ආකාරයයි.

'යාප යි තබ්බධම්ම පදට්ඨානං'

යැපෙන හෙවත් ජීවත්වන ධර්ම ආධාර හෙවත් ආසන්න කාරණයයි.

යොතෙසං අරූපිනං ධම්මානං- ඒ අරූපි ධර්මයන්ගේ යම්

1. ආයු- දිවි පවත්වන අදහසින් හෙවත් අරූපී ධර්මයන් අයනය හෙවත් ගමන් කරවන පවත්වන ගතිය වේද.
2. ඨිති- පැවැත්මද වේද
3. යපනා-යැපීමක් වේද.
4. යාපනා- යැපෙන ගතියක් වේද
5. ඉරියනා පැවැත්මක් වේද.
6. වත්තනා- වර්තනයවේද
7. පාලනා පාලනයක් වේද.
8. ජීවිතංජීවිතින්ද්‍රියං-ජීවිතයක් ජීවිතින්ද්‍රියක් වේද මේද එසමයෙහි ජීවිතින්ද්‍රිය නම්වේ. මේ ජීවිතින්ද්‍රිය චෛතසිකයයි.

මෙසේ ධර්මයන් දැන හැඳින විදර්ශනා වඩා ශාන්ත නිවන් සුව ලබත්.

# 25

## නමෝ සම්මා සම්බුද්ධස්ස

### 6 සිතෙහි උපදිනාගති

සම්මාදිට්ඨි හොති-සම්‍යක් දෘෂ්ටිය වෙයි.

දර්ශනය යන අදහසින් දිට්ඨි නම් වේ. මනා යහපත් නිවැරදි දර්ශනය යනු සම්මාදිට්ඨි යන්නෙහි තේරුමයි. සතර සත්‍ය ධර්මයන් ඇතුළත්වන මෙහි මූළ බුදු දහම පිඩුවන බව සැලකිය යුතුය. එසේම ඉහත සඳහන් පඤ්ඤින්ද්‍රිය හැඳින්වීමෙහි යොදන ලද අයුරින් මෙහි සියලු විස්තර දත යුතුය.

තෙමේම මනාකොට දකියි. එයින් හෝ මනාකොට දකින්නුයි, සම්මාදිට්ඨි නම් වේ.

20. සම්මා සංකප්පො හොති - සම්‍යක් සංකල්පය වෙයි.

අභිනිරොපනය හෙවත් හොඳින් නැංවීම යන අදහ--සින් සම්මාසංකප්ප නම්වේ. මෙහිදී අරමුණට සිත නැංවීම යනුවෙන් කරන්නේද අරමුණ විමසීමකි. තර්කනය කිරීමකි. මේ තර්කනය ප්‍රඥාවට-සම්‍යක් දෘෂ්ටියට පෙරටුව ගමන්කරන්නාක් මෙන් එහෙත් පෙරපසු නොවී ප්‍රඥා චෛතසිකයත් සමග ගමන් කරණ ප්‍රඥා කොටසෙහි ඇතුළත්වන චෛතසිකයෙකි. විතර්ක චෛතසිකයයි එහෙයින් විතර්කයට කියන ලද සියලු විස්තර මෙයටද ඇත්ය

තෙමේ (විතර්කයම) මනාකොට සංකල්පනය කෙරෙයි. එයින් (විතර්කයෙන්) මනාකොට සංකල්පනය කෙරෙත් නුයි හෝ සම්මාසංකප්ප නම් වේ.

21. සම්මා වායාමො හොති-සම්‍යක්ව්‍යායාමයක් වෙයි.

දුඃඛ අරමුණ ගැණීමේ අදහසින් සම්මාවායාමයයි කියනු ලැබේ. වායාම යනු විරිය චෛතසිකයයි. දුඃඛ ගත් අරමුණෙහි දුඃඛ පිහිටීමට දරණ උත්සාහයයි. ඉහත සඳහන් විරිය ඉන්ද්‍රිය නිර්දේශය බලන්න. මෙසේ තෙමේම වීර්‍ය්‍යය කරයි. හෙවත් යෝගීහු මෙයින් වීර්‍යය කරත් නුයි සම්මාවායාම නම් වේ.

22. සම්මා සති හොති–සම්මා සතිය වෙයි.

එළඹ සිටීම හෙවත් ඉදිරිපත්ව සිටීමය මෙයින් අදහස් කරන්නේ. අරමුණ හොඳින් අසුවී පෙනී සිටීම ලංවී පැහැදිලිව සිටීමයි. මේ සති චෛතසිකයයි එහි විස්තර ඉහත දක්වන ලදී.

23 සම්මා සමාධි හොති–සම්මා සමාධිය වෙයි.

නොවිසිවී නොවිසිරී පවත්නා අදහසින් සම්මා සමාධි නම් වේ. එනම් සිත මනාව අරමුණෙහි පිහිටීමයි. මේ ඒකග්ගතා චෛතසිකයයි. තෙමේම මනාකොට පිහිටා නුයි අරමුණෙහි සිත තබනු ලැබේනුයි සම්මා සමාධි නම් වේ. යෝගීහු මෙයින් සිත එකඟ කෙරෙත්නුයි හෝ සම්මා සමාධි නම්වේ.

24. සද්ධාබලං හොති–සද්ධා බලය වේ.

අශ්‍රද්ධාවෙන් කම්පා නොවන හෙයින් ශ්‍රද්ධා බලය නම්. විස්තර දක්වන ලදී.

25. විරිය බලං හොති වීර්‍ය්‍ය බලය වේ.

කුසිතකමින් කම්පා නොවන හෙයින් විර්යය බලයවේ.

26. සති බලං හොති–සති බලය වේ.

සිහි මුලාවෙන් කම්පා නොවන හෙයින් සති බලය වේ.

27. සමාධිබලං හොති–සමාධි බලය වේ.

උද්ධච්චයෙන් කම්පා නොවේ නුයි සමාධි බලය වේ.

28. පඤ්ඤාබලං හොති-අවිද්‍යාවෙන් කම්පා නොවේනුයි ප්‍රඥා බලය වේ,

29. හිරි බලං හොති-හිරි බලය වේ.

කාය දුශ්චරිත ආදි අහිරිකයෙන් කම්පා නොවේ නුයි හිරි නම්වේ.

30. ඔත්තප්ප බලං හොති-කාය දුශ්චරිත ආදී අනොත්-තප්පයෙහි කම්පා නොවේනුයි ඔතප්ප බල නම් වේ හිරි ඔතප් දෙක කලින් කියැවී නැත. කාය දුශ්චරිත ආදියෙන් හැකිලෙන බවට හෙවත් කාය දුශ්චරිත ආදි-යක් කිරීමට අවස්ථාව එළඹි විට එයට හැකිලෙන මැලි වෙන ගතිය ඇති කරන්නේ හිරි චෛතසික යයි. ලජ්ජා වට කියන තවත් වචනයකි. සතුන් මැරීම ආදී කාය දුශ්චරිතයෙන් තැති ගැනීමට පැමිණේනුයි ඔත්තප්පයයි පාපයෙන් ත්‍රාසයට තැති ගැනීමට කියන අනික් වචනයකි.

හටගැනීම තමා පිළිබඳ සැලකීමෙන් හටගන්නේ හිරියයි. අනුන් පිළිබඳ සැලකීමෙන් හටගන්නේ ඔත්තප් පයයි.

අධිපති, තමා අධිපති කොට හටගන්නේ හිරියයි. අනුන් අධිපති කොට ඔත්තප්පයයි තමන්ට කීකරුවීම ලක්ෂණ කොට ඇත්තේ හිරියයි. වරදෙහි භායවීම ලක්ෂණ කොට ඇත්තේ ඔත්තප්පයයි.

තමා පිළිබඳ සැලකීමෙන් හටගන්නා ලජ්ජාව හෙවත් හිරි චෛතසිකය ජාතිය, වයස, සූරභාවය බහුශ්‍රැතකම සලකා හටගනියි. පව් කිරීම නම් උසස් ජාතියක, කුලයක උපන් මා වැන්නකුට නොහොබී. වැදි, කෙවුල් ආදී පහත් අයගේ වැඩක් යයි සලකා පව් නොකරයි. තවද, මෙවැනි වැරදි වැඩ වයසින් මුහුකුරා ගිය මා වැන්නවුන්ට නොහොබී

යැයිද, මා වැනි දක්ෂයෙකුට සූරයෙකුට පව් කිරීම නොහොබීයැයිද, මා වැනි උගතෙකුට බහුශ්‍රැතයෙකුට නොහොබීයයිද, මෙසේ ජාතිය, වයස, සූරබව, උගත්කම සලකා ලජ්ජා හට ගණියි.

ඉදින් ඔබ පව් කෙරේනම් සිව් පිරිස ඔබට ගරහා නින්දා කෙරෙතියි බාහිර හෙවත් පිටතින් පැමිණෙන භය සලකා පව් නොකිරීම ඔත්තප්පයයි. නුවණැත්තවුන් ගරහන නින්දා කරන සිල් වතුන් තමා අත්හරින බියෙන් පව් නොකිරීම ඔත්තප්පයයි.

මා වැනි ශ්‍රද්ධාව ඇති බහුශ්‍රැතයෙකුට පව්කිරීම නුසුදුසු යැයි තමා අධිපතිකොට පවින් වැලකීම හිරියයි.

මේ ලෝකය විශාලය. අනුන් සිත් දන්නා උතුමෝ වෙසෙති. දෙවියෝ වෙසෙති එහෙයින් පව්කල නොහැක ඒ අය මට නින්දා අපහස කෙරෙතියි මෙසේ අනුන් අධිපති කොට පාපයෙන් වැලකීම ඔත්තප්පයයි මෙසේ ලජ්ජා භය සවභාව වශයෙන් හිරි ඔතප් හටගනී.

අපවිත්‍ර ගෑවුනු යකඩ ගුලියක් හා රත්වුනු යකඩ ගුලියක් දක, අපවිත්‍ර යකඩ ගුලිය නොඅල්ලන්නාසේ හිරිය හට ගනියි. පිච්චීමට භයෙන් රත්වුනු යකඩ ගුලිය නොගන්නා මෙන් ඔත්තප්පයයි. මෙලොව ලජ්ජාවත් පරලොව අපා භයත්, මේ හිරි ඔතප් දෙකමැයි

ජාතියේ උසස් බව ශාස්තෘත්වහන්සේගේ උසස් බව ගුණධර්ම දායාදයේ උසස් බව එකට කටයුතු කරන අයගේ උසස් බව යන සතර කාරණයෙන් හිරිය හටගනියි.

තමාම තමාට දෙස් පවරන භය, අනුන් දෙස්කියන භය රජයෙන් දඩුවම් ලැබෙන භය අපාය භය සලකා පාප යෙන් වැලකීම ඔත්තපයයි. මේ ලෝකපාලක ධර්මය ශීලයට මූලාධාරය.

මෙසේ දහම් දන විදසුන් වඩා ශාන්ත නිවන් සුව ලබත්වා.

# 26

## නමො සම්මා සම්බුද්ධස්ස

**සිතෙහි උපදනා ගති 7.**

පසුගිය පාඩමෙහි හිරි ඔතප් දෙක ගැණ ලක්‍ෂණාදිය නොදක්වූයේ එය අත්‍ථසාලිනියේ සඳහන්ව නැති හෙයිනි. **විසුද්ධිමග්ගයේ**

"පාපතො ජිගුච්ඡන ලක්ඛණා හිරි."

පාපයන් පිළිකුල් කිරීම ලක්‍ෂණකොට ඇත්තේ හිරියයි.

"ලජ්ජාකාරෙන පාපානං අකරණ රසං"

ලජ්ජාවෙන් පව් නොකිරීම කෘත්‍යයයි.

"පාපතො සංකොචන පච්චුපට්ඨානං."

පවින් හැකිලීම එළඹසිටින අයුරුයි.

"අත්තගාරව පදට්ඨානා."

ආත්ම ගෞරවය ආසන්න කාරණයයි.

**ඔතප්ප.**

"පාපතො උත්තාසන ලක්ඛණං ඔත්තප්පං"

පාපයෙහි තැතිගැනීම ලක්‍ෂණකොට ඇත්තේ ඔත්තප්පයයි.

"උත්තාසාකාරෙන පාපානං අකරණ රසං

තැති ගැනුන අයුරෙන් පාපයන් නොකිරීම කෘත්‍යයයි.

"පාපතො සංකොචන පච්චුපට්ඨානං."

පාපයෙන් හැකිලීම එළෙඹ සිටීමයි.

"පරගාරව පදට්ඨානං."

අනුන් කෙරෙහි ගෞරවය ආධාරයයි.

31. අලොභො හොති. - අලොභය වෙයි.
එය කරණකොට ලොභ නොකරත්. හෝ තෙමේම නොඇලෙයි. හෝ නොඇලීම් මාත්‍රයම ආලෝභයයි.

ලක්‍ෂණාදිය

"ආරම්මණෙ චිත්තස්ස අගෙධ ලක්ඛණො අලොභො අලග්ගභාව ලක්ඛණොවා."

අරමුණෙහි සිත නොතැවරීම හෝ නොලැගීම ලක්‍ෂණකොට ඇත්තේ අලොභයයි. නෙලුම් කොලයෙහි දිය බිඳුමෙන්.

"අපරිග්ගහ රසො"

හැම අතින්ම අල්ලා නොගැණීම කෘත්‍යයයි

අනල්ලීන භාව පච්චුපට්ඨානො."

නො ඇලෙන බව එළෙඹ සිටින අයුරුයි.

"ලොභ පහීණ පදට්ඨානො." යොනිසො මනසිකාර පදට්ඨානො වා."

ලොභය දුරුවීම හෝ නුවණින් මෙනෙහි කිරීම ආසන්න කාරණයයි.

32. අදෙසො හොති. - අද්වේෂය වෙයි.

එයින් ද්වෙෂ නොකෙරෙත් හෝ එයම අද්වෙෂ වූයේ හෝ ද්වෙෂ නොකිරීම් මාත්‍රය හෝ වේනුයි අදෙෂ නම්වේ.

ලක්‍ෂණාදිය.

"අචණ්ඩික්ක ලක්ඛණො අදොසො - අවිරොධ ලක්ඛණොවා."

නොසැඩ බව හෝ විරුඬ බව ලක්‍ෂණ කොට ඇත්තේ අදෙෂයයි. අනුකූල මිත්‍රයෙකු මෙනි.

"ආඝාත විනයන රසෝ"–පරිලාහ විනයන රසොවා."

වෛර බැඳීම දුරුකිරීම හෝ දූවීම දුරුකිරීම කෘත්‍ය කොට ඇත්තේය.

**සොම්මභාව පච්චුපට්ඨානො**

සොම්බව එළෙඹ සිටින අයුරුයි. දෙසය දුරුවීම යෝනිසෝ මනසිකාරය ආසන්න කාරණයයි.

33. අමොහ හොති. අමොහය වෙයි.

මෙය පඤ්ඤින්ද්‍රිය මෙති. සියලු කුසලයන්ට මුල්වූ මෙම තුන්වැදෑරුම් කුසල මූලයන් සසරින් නික්මීමෙදී එකට ක්‍රියාකරණ ධර්ම හෙයින් මේවා පිළිබඳ විශෙෂ දැනීමක් සෑම බෞද්ධයෙකු විසින්ම ලද යුතුය.

1 පටිපක්ඛ හෙවත් කෙලින්ම විරුද්ධ කරුණු

අලෝභය මසුරුකමට විරුද්ධයි,
අදෙසය දුස්සීල කමට විරුද්ධයි.
අමෝහය භාවනා නොවැඩීමට විරුද්ධයි.

2. හේතු හෙවත් උපකාරක.

අලෝභය දානයෙහිද,

අදෙසය සීලයෙහිද,

අමෝහය භාවනායෙහිද උපකාරකය.

3. ගහන හෙවත් ගැණීම් වශයෙන්

අලෝභයෙන් නොවැසීම ගණියි
අදෙශයෙන් නොඅඩුව ගණියි,
අමෝහයෙන් නිවැරදිව ගණියි.

4. පවත්ති හෙවත් පැවතීම් වශයෙන්

අලෝභයෙන් ඇති දෙස් දෙස වශයෙන් දකිමින් දෙසයෙහි පවතියි. මක්නිසාදයත් ලෝභියා දෙස් වසයි. අලොභියා දෙස්එලෙස පිළිගනිමින් ඉවසිලිමත්ව එයින් ඔහු නිදහස් කර ගණියි

අද්වෙෂයෙන් ඇති ගුණය ගුණ වශයෙන් දකිමින් ගුණයෙහි පවතියි. මක්නිසාදයත් දුෂ්ටයා ගුණ මකත හෙයිනි.

අමොහයෙන් ඇති සැටිය ඇති සැටියෙන් දරමින් ඇති සැටියෙහි පවතියි.

5. සහන හෙවත් ඉවසීම් වශයෙන්,

ආලොභයෙන් ප්‍රිය විප්‍රයොග දුක ඉවසයි.
අදෙසයෙන් අප්‍රිය සම්ප්‍රයෝග දුක ඉවසයි.
අමොහයෙන් කැමති දෑ නොලැබීමේ දුක ඉවසයි.

6. දුක් දුරුකිරීම වශයෙන්

අලොභයෙන් ජාති දුක දුරුකරයි.
අදෙසයෙන් ජරා දුක දුරු කරයි.
අමොහයෙන් මරණ දුක දුරු කරයි

7. සැප ඇසුරු කිරීම් වශයෙන්,

ආලොභයෙන් ගිහියන්ගේ ඇසුර සැප වේ.
අමොහයෙන් පැවිද්දන්ගේ ඇසුර සැප වේ.
අදෙසයෙන් හැම දෙනාගේම සැප ඇසුර වේ.

8. ඉපදීම් වශයෙන්,

අලොභයෙන් ප්‍රේත ලෝකයෙහි ඉපදීම නොවේ.
අද්වෙෂකයන් අපායෙහි ඉපදීම නොවේ.
අමොහයෙන් තිරිසන් යෝනියෙහි ඉපදීම නොවේ.

9. නොවීම් වශයෙන්,

අලොභයෙන් රාග වශයෙන් ළඟට එළෙඹීම නොවේ.
අද්වෙෂයන් දෙස වශයෙන් ඈතට යෑම නොවේ.
අමොහයෙන් මොහ වශයෙන් මැදහත් වීම නොවේ.

10. සඤ්ඤා හෙවත් හැඟීම වශයෙන්,

අලොභය - නෙක්ඛම්ම සඤ්ඤා අසුභ සඤ්ඤා,
අදොසය - අව්‍යාපාද හා අප්පමාණ සඤ්ඤාද,
අමොහය - අවිහිංසා හා ධාතු සඤ්ඤාද ඇතිකරයි.

11. අත්හැරීම හා පිළිපැදීම් වශයෙන්,

අලොභයෙන් කාම සුඛල්ලිකානුයෝගය දුරුකරයි.
අදෙසයෙන් අත්තකිලමථානුයෝගය දුරුකරයි
අමොහයෙන් මධ්‍යම ප්‍රතිපත්තියෙහි යෙදෙයි.

12. පහෙදන හෙවත් බිඳ දැමීම් වශයෙන්,

අලොභයෙන් අභිජ්ඣාකාය ගන්ථය බිඳෙයි.
අදෙසයෙන් ව්‍යාපාද කාය ගන්ථය බිඳෙයි
අමොහයෙන් සීලබ්බත පරමාස ඉදං සච්චාභි නිවෙස-
කාය ගන්ථයන් බිඳෙයි.

13. ඉජ්ඣනා හෙවත් සම්පූර්ණ කිරීම් වශයෙන්,

අලොභයෙන් කායානු පස්සනා සතිපට්ඨානයද,
අදෙසයෙන් වෙදනානු පස්සනා සතිපට්ඨානයද,
අමොහයෙන් චිත්ත ධම්මානු පස්සනා සතිපට්ඨාන
යන්ද,

14. උපකාර වශයෙන්,

අලොභය නිරොගි බවට උපකාරය,
අදෙසය තරුණ බවට උපකාරය,
අමොහය දීර්ඝායුෂ බවට උපකාරය.

15. සම්පත් ලැබීම් වශයෙන්,

අලොභය භොග සම්පත්තියට උපකාරය.
අදෙසය මිත්‍ර සම්පත්තියට උපකාරය.
අමොහය ආත්ම සම්පත්තියට උපකාරය.

16. විහාර හෙවත් වාසය කිරීම් වශයෙන්,

අලොභය දිව්‍ය විහාරයට
අදෙසය බ්‍රහ්ම විහාරයට
අමොහය අරිය විහාරයට උපකාරය.

17. තිවීම් වශයෙන්,

අලොභය යෙන් තමන්ගේ දෙය නැතිවීමෙහි ශෝක නොකර තිවුනේ වේ.

අදෙසයෙන් අනුන් කෙරෙහි තිවුනේ වේ.

අමොහයෙන් උදාසීන භාවයෙන් තිවුනේ වේ.

18 දර්ශනයාගේ වශයෙන්,

අලොභයෙන් අනිත්‍ය දර්ශනයද

අදෙසයෙන් දුක්ඛ දර්ශනයද,

අමොහයෙන් අනාත්ම දර්ශනයද සිදුවේ.

මෙසේ දහම් දැන අදහම් දුරුකොට විදසුන් වඩා උතුම් නිවන් සැප සාධා ගතිත්වා.

# 27

## නමො සම්මා සම්බුද්ධස්ස

### සිතෙහි උපදනා ගති, 8.

32. අනභිජ්ඣා හොති. – අනභිජ්ඣාව වෙයි. – අභිමුඛ කොට ලොභයෙන් නොබලානුයි අනභිජ්ඣාවයි. ලොභයේ බලවත් අවස්ථාව අභිජ්ඣාවයි. අනභිජ්ඣාව දසකුශල කර්මපථ කථාවේදී විස්තර කරණ ලදී.

33. අව්‍යාපාදො හොති අව්‍යාපාදය වෙයි
ව්‍යාපාදය යනු හිත සැප විනාස කරණ බලවත් ද්වේෂයයි කායික චෛතසික සැප මෙලොව පරලොව යහපත, ගුණානුභාවයෙන් ලබන ලද කීර්ති ශබ්දය ව්‍යාපජ්ජනය හෙවත් වෙනස් කිරීම නොකරන්නේ අව්‍යාපාදයයි. බද්ධ වෛරයෙන් තමත් කායික සුව දුක් හිත සැප ගුණරාවය විනාශ කරයි අව්‍යාපාදය හෙවත් මෛත්‍රියෙන් ඒ සැපයන් ලංකරයි. එහෙයින් අව්‍යාපාදය ඒ සැපයන් නැතිනොකරන බව දක්වූ සේක. මෙය අද්වේස යයි.

34. සම්මාදිට්ඨි හොති – සම්මා දිට්ඨිය වෙයි.
මනා කොට දකියි. යහපත් වූ හෝ දර්ශනය සම්මා දිට්ඨියයි, ඉහතින් මෙම අනභිජ්ඣා අව්‍යාපාද සම්මා දිට්ඨින් මූල වශයෙන් දක්වන ලදී. මෙතැන කර්මපථ වශයෙනි

"ලොභො අකුසල මූලං" යනුවෙන් වදාළ අයුරු ලොභය, ද්වේෂය මෝහය අකුසල් මූල්ය හෙවත් හේතුය. හේතු යන්නෙහි තේරුමද "මූල්" යනු ය. එසේම අලොභ අද්වේස අමෝහයන් කුසල හේතුය. සියළු කුසල් පැන නගින්නේ මේ මූල් වලිනි මූල් යනුවෙන් ප්‍රධාන යන තේරුමද ගත හැකිය.

පසු නිග පත්‍රිකාව බලන්න, මෙහිදී අනභිජ්ඣා අව්‍යා පාද සම්මා දිට්ඨි නාමයෙන් දක්වූයේ කම් පථ අවස්ථාවට පැමිණි බලවත්වූ අලෝභාදියයි.

(1) යො තස්මිං සමයෙ අලොභො, එසමයෙහි යම් අලොභ යක් වේද.

(2) අලුබ්භනා - නොඇලෙන ආකාරයක් වේද
(3) අලුබ්භිතත්තං - නොබැඳෙන ගතියක් වේද
(4) අසාරාගො - නොබැඳේද
(5) අසාරජ්ජනා - නොරැඳෙන ආකාරයක් වේද
(6) අසාරජ්ජිතත්තං - නොරැඳෙන බවක් වේද
(7) අනභිජ්ඣා - අනභිජ්ඣාවක් වේද

අලොභො කුසල මූලං අලෝභයම මූල හෙවත් හේතු ප්‍රත්‍යයෙන් මුල් වූයේ වේද මේ එසමයෙහි අලෝභයයි. මෙසේ මෙම වචන සතකින් අලෝභය හඳුන්වා ඇත.

අදෝසය.

යො තස්මිං සමයේ - එසමයෙහි යම්

(1) අදොසො - දූෂ්‍ය නොවේනුයි අදොස නම් වේ.
(2) අදුස්සනා - කිලිටි නොවන ආකාරයක් වේද
(3) අදුස්සිතත්තං = දූසිත නොවූ බවක් වේද
(4) අව්‍යාපාදො - වෙනස් නොවන බවක් වේද
(5) අබ්‍යාපජ්ඣො - ක්‍රොධ දුක දුරුකිරීමක් වේද

අදොසො කුසල මූලං - කුසලයන්ට මූල්වූ අදොසයක් වේද මේ එසමයෙහි අදොසයයි. ද්වේෂයෙන් චිත්ත චෛත සික රූප දූෂ්‍ය කරණු ලැබේ. නරක් කරණු ලැබේ. මෙසේ අදොසය හඳුන්වා අමෝහය ඉහත සඳහන් පඤ්ඤින්ද්‍රිය මෙන් හඳුන්වන ලදී.

35. හිරි හොති - හිරි - ලැජ්ජාව වෙයි.

36. ඔත්තප්පං හොති. - ඔතප් ගෙවත් භය වෙයි.

හිරි ඔතප් කලින් විස්තර කරණ ලදී. හුදෙක් එහි බල වශයෙනි මෙහි ලෝකපාලක ධර්ම වශයෙනි.

37. කාය පස්සද්ධි හොති - කායයාගේ සැහැල්ලු බව වෙයි. මෙහි කාය නම් වේදනා සඤ්ඤා සංඛාර යන තුන් කොටසයි. සමූහයයි. මෙම චෛතසිකයෙන් ඉහත සඳහන් කායයාගේ සංසිඳීමක් දුරුවූ බර ඇති බවක් සමවූ සැනසීමක් ඇතිවේ.

38. චිත්ත පස්සද්ධි හොති. - සිතෙහි සැහැල්ලු බව වෙයි.

සිතෙහි සංසිඳුනු බව සැනසුනු බව බර අඩු ගතිය චිත්ත පස්සද්ධියයි. මේ චෛතසික දෙක ඉතා කිට්ටු සම්බන්ධයක් දක්වයි. සිතෙහි ඇතිවන ගති වන වේදනා සඤ්ඤා සංඛාරයන්ගේ සැහැල්ලුව ඇතිවීම දක්වා ඇත්තේ එම කොටස් සිත හා එක්ව හටගන්නා නමුදු වෙනමම ක්‍රියාකාරී වන හෙයින් බව සිතිය හැකිය සිතෙහි ක්‍රියා කාරී බව අනිකකි පෙරටු බව සිතෙහි ක්‍රියාකාරිත්වයයි. එහෙයින් සිතෙහි සැහැල්ලු බව වෙනම චෛතසිකයක් ලෙස ගන්නා ලදැයි සිතිය හැකිය

ලක්ෂණාදිය:-

"කාය චිත්ත දරථ වූපසම ලක්ඛණා කාය චිත්ත පස්සද්ධියො."

කය සිත දෙකෙහි දරදඬු බරබව සංසිඳීම ලක්ෂණ කොට ඇත්තේ කාය චිත්ත පස්සද්ධියයි.

"කාය චිත්ත දරථ නිමද්දන රසා"

කය සිත දෙකෙහි දරඬු ගති මර්දනය කිරීම කෘත්‍යයයි.

"කාය චිත්තානං අපරිප්ඵන්දසීතිභාව පච්චුපට්ඨානා'

කය සිත දෙකෙහි නොගැහෙන සිහිල් බව එළඹ සිටීමයි.

“කාය චිත්ත පදට්ඨානා”

කය සිත දෙකම ආධාරයයි. ආසන්න කාරණයයි

කය සිත නොසන් සිඳු වීම කරණ උද්ධච්චාදි කෙලෙසුන්ට ප්‍රති පක්ෂවූ බව දත යුතුය.

“යා තස්මිං සමයෙ - එසමයෙහි යම්

වෙදනාක්ඛන්ධස්ස සඤ්ඤාක්ඛන්ධස්ස

1. සංඛාරක්ඛන්ධස්ස පස්සද්ධි,

   වෙදනා කොටස සඤ්ඤා කොටස සංඛාරා කොටස යන කොටස්හි යම් සැහැල්ලුවක්

2. පටිප්පස්සද්ධි – හොඳින් සැහැල්ලු බවක්

3. පස්සම්භනා – බැස ගිය ආකාරයක්

4. පටිප්පස්සම්භිතත්තං – මනා කොට සංසිඳුනු බවක් වේද මේ එසමයෙහි කාය පස්සද්ධියයි මෙසේම චිත්ත පස්සද්ධියද දක්වා තිබේ.

මෙසේ දහම් දැන විදසුන් වඩා ශාන්ත නිවන් සුව ලබත්වා.

# 28

**නමො සම්මා සම්බුද්ධස්ස**

**සිතෙහි උපදින ගති 9.**

39. කාය ලහුතා හොති. – කයෙහි සැහැල්ලු බවක් වේද,

40. චිත්ත ලහුතා හොති – සිතෙහි සැහැල්ලු බවක් වේද.

මෙහි කය නම් ඉහත පාඨමෙහි විස්තර කළ අයුරු වේදනා සඤ්ඤා සංඛාර යයි. සිතනම් විඤ්ඤාණස්ඛන්ධයයි මෙහි සැහැල්ලු බව නම් බර අඩු හෙවත් පහසු බවයි. බර පතල දෙයකින් පහසුවෙන් යමක් කළ නොහැක. එහෙයින් සිතත් චෛතසිකත් බර පතල ගතියකින් යුක්ත නම් දාන සීල භාවනාදී කුසල් වල යෙදීම අපහසුය. චිත්ත චෛතසික ථද්ධ බද්ධ (තද්ද බද්ද) කරන්නේ ථීන මිද්ධ මානාහංකාරාදි කෙලෙස්ය. එහෙයින් එම කෙලෙසුන්ට විරුද්ධවූයේ මේ ලහුතාවයයි මෙය සිතෙහි ගතියක් මෙන්ම චෛතසිකයන්ගේද ගතියකි. පසුගිය පත්‍රිකාවේ කාය පස්සද්ධියේ සිට මෙම පත්‍රිකාවෙන් අවසන් කරණු ලබන චිත්තුජ්ජුතාවය අවසන් කොට ඇති යුගල චෛතසික 14 සිතෙහි ගති පමණක් නොව චෛතසිකයන්ගේද හෙවත් සිතෙහි ඇතිවන ගතිවලත් ගතිය. ලබන පත්‍රිකාවේදී මේ ගැන විමසීමක් කරමු.

**ලක්‍ෂණාදිය.**

"කාය චිත්ත ගරුභාව වූපසම ලක්ඛණා." කය සිත දෙකෙහි බරබව සංසිඳවීම ලක්‍ෂණ කොට ඇත්තේය "කාය චිත්ත ගරුභාව නිම්මද්දනරසා" චිත්ත චෛතසිකයන්ගේ බරබව මර්දනය කිරීම කෘත්‍ය කොට ඇත්තේය "කාය චිත්තානං අදන්ධතා පච්චුපට්ඨානා" කාය චිත්තයන්ගේ

ද්‍රව්‍ය හෙවත් මෝඩ නැති බව එළෙඹ සිටින ආකාරයයි. කාය චිත්ත පදට්ඨානා,

කය සිත දෙක ආධාර හෙවත් ආසන්න කාරණයයි.

යා තස්මිං සමයෙ වෙදනාක්ඛන්ධස්ස - එසමයෙහි වේද නාස්කන්ධයාගේ සංස්කාරස්කන්ධයාගේ යම් ලහුතා-ලඝු බවක්

ලහු පරිණාමතා - ඉක්මණින් පැවැත්වීමෙහි සමත්

අදන්ධතා - නොබර බවක්

අථද්ධතා - මානාදියෙන් නොතද බවත් වේද

අයං තස්මිං සමයේ කාය ලහුතා - මේ සමයෙහි කාය ලහුතාවයි. චිත්ත ලහුතාවයද මෙසේය.

41. කාය මුදුතා හොති-කයෙහි මෘදුබව වේද

42. චිත්ත මුදුතා හොති-සිතෙහි මෘදු බව වේද

ලක්‍ෂණාදිය.

කාය චිත්ත ථද්ධභාව වූපසම ලක්ඛණා, කය සිත දෙකෙහි තද බව සංසිඳීම ලක්‍ෂණ කොට ඇත්තේය." කාය චිත්ත ථද්ධභාව නිමමද්දන රසා" කය සිතෙහි තද බව මැඩීම කෘත්‍යයයි

අප්පටිඝාත පච්චුපට්ඨානා - අරමුණට විරුද්ධව නො— හැපෙන බව එළෙඹ සිටින ආකාරයයි,

කර්කශ බව නොමැති හෙයිනි, එක්ව යෙදෙන ධර්මයන් නොගටන බවයි,

කාය චිත්ත පදට්ඨානා කය සිත දෙකම ආසන්න කාරණයයි, චිත්ත චෛතසිකයන්ගේ කර්කශ තද බව ඇති කරණ දිට්ඨි මානාදීන්ට විරුද්ධය

යා තස්මිං සමයෙ වේදනාක්ඛන්ධස්ස - එසමයෙහි වේදනා ස්කන්ධයාගේ සංඥා, සංස්කාරස් කන්ධයනගේ යම්

මුදුතා – මුදු බවක් වේද

මද්දවතා - සිනිඳු බවක් වේද

අකක්ඛලතා – අකර්කශ බවක් වේද

අකඨින තා – නොතද බවක් වේද

අයං තස්මිං සමයේ කාය මුදුතා – මේ එසමයෙහි කාය මුදු බවයි.

43. කාය කම්මඤ්ඤතා හොති - කය ක්‍රියාවෙහි සුදුසු බවක් වේද

44. චිත්ත කම්මඤ්ඤතා හොති - සිතෙහි ක්‍රියාවට සුදුසු බවක් වේද. කය සිත හෙවත් නාමස්කන්ධය පිත් දහම්හි නොසුදුසු කරණ නීවරණයන්ට විරුද්ධවූ ගතියයි.

ලක්ෂණාදිය.

කාය චිත්තානං අකම්මඤ්ඤභාව වූප සම ලක්ඛණා;- කය සිත දෙකේ අකර්මන්‍ය බව සංසිඳවීම ලක්ෂණ කොට ඇත්තේය.

කාය චිත්තානං අකම්මඤ්ඤ භාව නිම්මද්දන රසා- කය සිතෙහි අකර්මන්‍ය භාවය මැඩලීම කෘත්‍ය යයි.

කාය චිත්තානං ආරම්මණ කරණ පච්චුපට්ඨානා— කාය චිත්තයන් අරමුණු ගැණීමෙහි යෙදවීම එළෙඹ සිටින ආකාරයයි.

අකර්මන්‍ය බව මැඩ පැවැත්වීමෙන් චිත්ත චෛතසික අරමුණු ගැණීමෙහි සුහුවෙයි.

කාය චිත්ත පදට්ඨානා - සතර නාමස්කන්ධය ආසන්න කාරණයයි.

යා තස්මිං සමයෙ වෙදනාක්ඛන්ධස්ස - එසමයෙහි වේදනා සඤ්ඤා සංඛාරයන්ගේ කම්මඤ්ඤතා

ක්‍රියාවෙහි සුදුසු බවක් කම්මඤ්ඤතත්තං - කම්මඤ්ඤ භාවො - ක්‍රියාවෙන් හෝ නොවෙන්වන බවක් වේද මේ කාය කම්මඤ්ඤතාව යයි. චිත්ත කම්මඤ්ඤතාවද මෙසේය.

පැහැදියයුතු තන්හි පැහැදීම හිත වැඩෙහි යෙදීමට සුදුසු බව ඇතිකරන්නේ කාය චිත්ත කර්මන්‍ය තාවයයි.

45 කාය පාගුඤ්ඤතා හොති. - කයෙහි ප්‍රගුණ බව වේ.

46. චිත්ත පාගුඤ්ඤතා හොති, - සිත ප්‍රගුණ බව වේ.

**ලක්‍ෂණාදිය.**

කාය චිත්තානං අගෙලඤ්ඤභාව ලක්ඛණා

චිත්ත චෛතසිකයන්ගේ නොගිලන් බව ලක්‍ෂණකොට ඇත්තේය.

කාය චිත්ත ගෙලඤ්ඤ නිම්මද්දන රසා - කය සිත ගිලන් බව මැඩීම කෘත්‍යයයි.

නිරාදීනව පච්චුපට්ඨානා - කය සිත දෙකෙහි දොසයක් ලෙඩක් වරදක් නැති බව එළෙඹ සිටීමයි. චිත්ත චෛතසික ලෙඩ කරණ අශ්‍රද්ධාදී කෙලෙසුන්ට විරුද්ධ බවයි.

යා තස්මිං සමයෙ වෙදනාක්ඛන්ධස්ස - එසමයෙහි වේදනාදී කඳු තුණෙහි යම් පගුණතා ප්‍රගුණ බවක්

පගුණත්තං = පගුණ භාවො, ආතුර නොවන බවක්, නොගිලන් බවක්, වේද මේ කාය ප්‍රාගුණ්‍ය තාවයයි.

47. කායුජ්ජු කතා හොති - කයෙහි ඇද නැති බවක් වේද

48. චිත්තුජ්ජුකතා හොති - සිතෙහි නො ඇද බවක් වේද

සකර නාමස්කන්ධයන් ඇද කරණ වකුටු කරණ මායා සාඨෙය්‍ය ආදීන්ට විරුද්ධ ගතියයි,

ලක්‍ෂණාදිය.

තා කාය චිත්තානං අජ්ජව ලකඛණ - කාය චිත්ත-යන්ගේ ඍජු බව ලක්‍ෂණ කොට ඇත්තේය.

කාය චිත්ත කුටිල භාව නිම්මද්දන රසා - කය සිතෙහි කුටිල හෙවත් වක් බව මැඩීම කෘත්‍ය කොට ඇත්තේය.

අජිම්හතා පච්චුපට්ඨානා"-නොවකුටු බව එළෙඹ සිටින අයුරුයි.

කාය චිත්ත පදට්ඨානා - කය සිත දෙකම ආසන්න කාරණයයි.

යා තසම්ං සමයේ වෙදනාක්ඛන්ධස්ස - එසමයෙහි යම් වෙදනාදී ස්කන්ධයන්ගේ

උජුතා - උජුකතා - ඇද නැති බවක්

අජිම්හතා—නොනැමුණු වංක භාවය නැති බවක්

අවංකතා - ඇඳ රේඛා මෙන් නැමීම නැති බවක්

අකුටිල තා—නගුල් කෙළවර මෙන් නොනැමුනු බවක් වේද මේ එසමයෙහි කායුජ්ජුකතාවයි.

චිත්තුජ්ජුකතාවයද මෙසේය.

ගොමූත්‍ර වංක භාවය,

යමෙක් පව් කම් කොට නොකෙළෙමියි කියාද, කාය වචන තුනෙන්ම පව් කරද එය සඟවාද, ඔහු සම්පූර්ණ වංක පුද්ගලයෙක්. ගැල අදින ගොනුගේ සුලු දිය පාර රවුම් රවුම්ව දම්වැලක් මෙන් පාරෙහි ඇදී තිබෙනු දක්ක හැකිය. මෙසේ සම්පූර්ණයෙන් වංක බැවිනුත් වංක බව ගොමූත්‍ර වංකයයි.

### චන්ද්‍ර ලේඛා වංකය

පෑලවිය දියවක ආදී දිනවල බාගෙටත් වඩා නැමුණු සඳ රේඛාව දැක්ක හැකිය. එසේම යමෙක් පව් කරමින්ම තමා පවට බිය බවක් අඟවාද තුන් දොරින් දෙකකින් පව් කෙරේද ඔහු වැනි තරමක් වංක හෙයින් සඳ රේඛා වංකයයි.

### නංගල කෝටි වංකය.

නගුලෙහි දෙකෙලවර වකුටුය. යමෙක් පව් කරමින් පවට භය නොවන්නේ කවුදැයි යනාදීන් කියාද තුන් දොරින් එක දොරකින් හෝ පව් කෙරේද මේ නගුල වංක යයි. මේ තුන් ආකාර වංක භාවයෙන් තොර වූයේ කාය චිත්ත උජුකතාවයයි.

මෙසේ දහම් දැන නුවණ දියුණු කොට විදර්ශනා වඩා උතුම් නිවන් සැප පතා ගණිත්වා.

# 29

### නමො සම්මාසම්බුද්ධස්ස

**සිහෙහි උපදනා ගති 10**

51. සතිහොති - සිහිය වෙයි.

52. සම්පජඤ්ඤං හොති = සම්ප ජඤ්ඤය වෙයි

සරතීති සති. සිහිකෙරේනුයි, මතක්කෙරේනුයි සති නම් වේ. විස්තර කරණලදී. හැම අනිත්‍ය දැනගන්නා නුවණ සම්පජඤ්ඤයයි.

එය 1. සාත්‍ථක සම්පජඤ්ඤය.
2 සප්පාය ,,
3. ගෝචර ,,
4. අසම්මොහ ,, කියා සතර වැදැරුම්ය.

මේ ගමන බිමන ක්‍රියාව සාර්‍ථකද වැඩක් සහිතද කියා වටහාදෙන නුවණ සාත්‍ථක සම්පජඤ්ඤයයි.

මේ වේලාවේ මේමේ කටයුතු කිරීම සුදුසු ද කියා වටහාදෙන නුවණ සප්පාය සම්පජඤ්ඤයයි.

ගෝචර යනු කර්‍මස්ථානයයි. භාවනාවයි. මේ ක්‍රියා කර්‍මස්ථාන ගොචර යෙහි භාවනාවට ඇතුල්වේදැයි වටහා දෙන නුවණය.

අසම්මෝහ යනු නාම රූපයන් පිළිබඳ නුමුලා බව ඇති කරන විපස්සනා භාවනාවයි. මෙම සතියත් නුවණත් කලින් දක්වන ලද නමුදු මෙහිදී උපකාරක ධර්‍ම වශයෙන් නැවත දක්වන ලදී.

53. සමථොහොති. - සමථය වෙයි.

54. විපස්සනා හොති. – විදර්ශනාව වෙයි.

කාමච්ඡන්දාදි විරුද්ධ ධර්මයන් සමනය කරන හෙයින් සමථ නම් වේ. මේ එකග්ගතා චෛතසිකයයි. සමාධින්ද්‍රියයි.

අනිච්චාදී වසෙන විවිධෙහි ආකාරේහි ධම්මෙ පස්සතීති විපස්සනා”

අනිච්චාදී ත්‍රිවිධ අනුපස්සනා නව අනුපස්සනාවන්ගේ ආකාරයෙන් විවිධ වශයෙන් නාමරූපයන් බලානුයි විපස්සනා නම් වේ.

විපස්සනා නම් ප්‍රඥාවයි. ප්‍රඥා ඉන්ද්‍රියයි.

මෙසේ කලින් දක්වන ලද සමාධි ප්‍රඥාවන් නැවත දක්වන ලද්දේ යුගනද්ධ ධර්ම වශයෙන් බව දක්වන ලදී. යුගය නම් මෙහි කරත්තයෙහි වියගහයි. කෙලින් ගමන් කරයි. එසේම කුසල් සිතෙහි සමථ යනුවෙන් එකග්ගතා චෛතසිකයත් විපස්සනා යනුවෙන් ප්‍රඥා චෛතසිකයත් යෙදී එක කරට සිටීමෙන් කෙලෙසුන් දුරුකිරීම නැසීම සිදුවෙයි. මෙහි දක්වන ලද්දේ කාමාවචර මහකුසල් සිතයි. ඤාණ සම්පයුත්ත මහා කුසල් සිතයි.

විදර්ශනා වඩන යෝගියාගේ විපස්සනා සිත්හිද මේ සමථ විදර්ශනාවන් යුගනද්ධව සිටියි. සංඛාරුපේක්ඛාදී විපස්සනා ඤාණ සිත්හිද සම්පූර්ණ වන්නේ මෙම සමථ විපස්සනාවන් යුගනද්ධව යෙදෙන අවස්ථාවේය. එසේම අනුලෝමාදි විපස්සනා සිත්හිද ලොකොත්තර මාර්ග සිත්හිද සමථ විපස්සනාවන් යුගනද්ධව යෙදෙයි. එසේ යෙදීමෙන් කෙලෙස් නැතිකර දමයි. ‘සමථ විපස්සකයාත් සුද්ධවිපස්සකයාත් දෙදෙනාගේම විදර්ශනා සිත්හි හා මාර්ග සිත්හිද මෙහි දක්වන ලද සමාධි ප්‍රඥාවන් යුගනද්ධව සිටියි. කාමාවචර කුසල සිත්හි මෙන්ම රූපාවචර අරූපාවචර ලෝකෝත්තර සිත්හිද මේ යුගනද්ධ ධර්මයන් යෙදෙන හෙයින් අර්පනා ධ්‍යාන නොලබා මගඵල ඉපදවිය නොහැකි යයි කීම ප්‍රලාපයකි.

විනය වරදවා ගැණීමෙන් දුස්සීල වෙයි. සූත්‍රාන්තය වරදවා ගැණීමෙන් උම්මත්තක වෙයි. අභිධර්මය වරදවා මිථ්‍යාදෘෂ්ටික වෙයි.

55. පග්ගහො හොති – වීර්‍ය්‍යයවෙයි.

56. අවික්ඛෙපො හොති – නොවිසිරීම වෙයි.

එකට යෙදෙන චිත්ත චෛතසික ධර්මයන් ක්‍රියාවෙහි යෙදීමෙහි දැඩිවන්නේ පග්ගහයයි. වීර්‍ය්‍යයයි. උද්ධච්චයයි කියන ලද විසිරීයෑමෙන් වික්ෂෙපයට ප්‍රත්‍යක්ෂවූයේ අවික්ෂෙපයයි. සමාධියයි. කලින් දක්වන ලද නමුදු මේ ධර්මයන් නැවත දක්වූයේ වීර්‍ය සමාධීන්ගේ සමව යෙදීම දක්ම පිණිසය වීර්‍ය වැඩිවී සමාධි අඩුවූව හොත් උද්ධච්චයෙහි වැටේ. සමාධිය වැඩිවී වීර්‍ය අඩුවූව හොත් ථින මිද්ධයෙහි වැටේ.

මෙසේ ඤාණයුක්ත කාමාවචර කුසල් සිත යනු සපණස් කුසල ධර්මකෙනෙකි. දන්දීමට පින්කිරීමට කය වචනයන් මෙහෙයවීම ආදී සෑම අවස්ථාවකදීම මෙම සපණස් කුසල ධර්මයන් ඇතිවන බව නුවණින් සලකා කුසල් වඩා නිවන් සුව ලබාගණිත්වා.

# 30

## නමො සම්මාසම්බුද්ධස්ස

### සිතෙහි උපදනා ගති 11.

"යෙවාපන තස්මිං සමයෙ අඤ්ඤෙපි අත්ථි පටිච්ච සමුප්පන්නා අරූපිනො ධම්මා ඉමේ ධම්මා කුසලා"

යමක් හෝ වනාහි එසමයෙහි (කාමාවචර කුසල් සිතක් උපදින සමයෙහි) අනික් අරූපීවූ පටිච්චසමුප්පන්න ධර්මයෝ වෙත්ද මේ ධර්මයෝ කුසල්ය.

මෙහි යෙ වා පන යනුවෙන් ඉහත සඳහන් කාමාවචර කුසල් සිත පහළ වන විට දක්වන ලද සපණස් ධර්මයන්ට වඩා තවත් සිතෙහි ගති පහළ විය හැකිය. ඒවා "යෙවා පන" නාමයෙන් යමෙක් හෝ වනාහි ඇති වෙත් නම් කියා යනු කී හෙයින් දක්වා ඇත. සියල්ල දත් බුදුරජාණන් වහන්සේ නො ඉතුරු දෙශනාවක්වූ අභිධර්මයේදී මෙසේ කොටසක් නියම වශයෙන් චෛතසිකයන් වඳුරා තවත් එම මොහොතෙහි පහළ වෙතොත් ඒවාත් ගතයුතු යයි දැක්වීමෙන් සර්වඥතාවයම ඔප්පුකර තිබේ. සියුම් නාම ධර්මයන්ගේ සීමාවක් නැති හෙයින් තවත් සියුම්ව බෙදීමෙන් විදග්ධතාවට වැඩි වැඩක් නොවන හෙයින් හා දක්වන ධර්මයන්ට ඒවාත් බැඳෙන හෙයින් සූත්‍රාන්තය අනුව තවත් නාම ධර්ම දැක්වෙන හෙයින් මෙසේ "යෙවා පනක" වශයෙන් එම නාම ධර්මයන් ප්‍රකාශ කළ බව සැලකිය හැකිය.

මෙසේ චිත්තාංග වශයෙන් දැක්වූ සපණස් ධර්මයන්ට අතිරේකව ඒ ඒ සූත්‍රයන්හි ඡන්ද, අධිමොක්ඛ, මනසිකාර, තත්‍ර මජ්ඣත්තතා කරුණා, මුදිතා, කාය දුච්චරිත විරති, වචී දුච්චරිත විරති, මිච්ඡාජීව විරති යැයි නව ධර්ම කෙනෙක් ධර්මරාජයන් වහන්සේ දැන්වූ බව අටුවාව ප්‍රකාශ කරයි.

අභිධම්මාවතාරයෙහි:- යස්මා අනියතා කෙචි - යස්මා රුසි භජන්ති න

යස්මාච දුබ්බලාකෙචි - තස්මා වුත්තා නපාළියා''

මේ යෙ වා පන'' ධර්මයන් සමහරක් අනියතය. සමහරක් ඵස්ස පඤ්චමකරාසිය'' ආදී රාශියකට නොවැටෙත්. සමහරක් දුර්වලය. එහෙයින් පෙළෙහි නොවදාරණ ලදහ.

1. ඡන්‍දො - මෙම කුසල් සිතෙහි කත්තු කම්‍යතා කුසල ඡන්දය වෙයි. මෙහි ඡන්දය නම් කරණු කැමති බවට කියන නමකි.

'ඡන්දනං ඡන්දො, ආරම්මණෙන අත්‍ථි කතා'' ඡන්දය හෙවත් කැමති වීම ඡන්දයයි. අරමුණ උවමනා බවයි.

ලක්ඛණාදිය.

''කත්තු කම්‍යතා ලක්ඛණෝ ඡන්දො.'' කරණු කැමැත්ත ලක්ෂණ කොට ඇත්තේ ඡන්දයයි.

''ආරම්මන පරියෙසන රසො,'' අරමුණු සෙවීම කෘත්‍යයයි.

''ආරම්මණෙන අත්‍ථි කතා පච්චු පට්ඨානො.'' අරමුණ උවමනා බව එළෙඹ සිටින අයුරුයි.

''තදෙවස්ස පදට්ඨානං.'' අරමුණම පදට්ඨානයයි. ආසන්න කාරණයයි.

2. අධිමොක්ඛො- අධිමොක්ඛයද එම සිතෙහි යෙදෙයි.

හොඳින් යෙදී පැවතීම (අධිමුච්චනං) අධිමෝක්ෂයයි.

''සන්නිට්ඨාන ලක්ඛණෝ අධිමොක්ඛො.'' අධි මෝක්ෂය සනිටුහන් කිරීම ලක්ෂණයයි.

''අසං සප්පන රසො.'' නොසෙලවන එහාට මෙහාට නොයන ගතියයි.

"නිච්ඡය පච්චුපට්ඨානො." නිශ්චය එළෙඹ සිටීමයි.

"සහජාතධාතබබ ධම්ම පදට්ඨානො."- සහිටුහත් කරණ ලබන ධර්ම ආධාර කාරණයයි.

මෙහි සහිටුහන් කරණු ලබන ධර්ම නම් අරමුණු ධර්මයයි. අරමුණෙහි නිසලව සිටි බැවින් මෙය ඉන්ද්‍රියය මෙනැයි කියන ලදී.

3. මනසිකාරෝ - කාර නම් මෙනෙහි කිරීමයි. මනසෙහි කිරීම මනසිකාරයයි. මෙහිදී පළමු ගත් අරමුණම නැවත ගැණීම ගත හැකිය.

"පුරිම මනතො විසදිසං මනං කරොතීති මනසිකාරො."

පළමු සිතින් වෙනස් සිතක් කෙරේනුයි මනසිකාර නම්වේ. මනසිකාරය තුන් වැදෑරුම්ය.

ආරම්මණ පටිපාදක- අරමුණ ප්‍රතිපාදනය හෙවත් පිළියෙල කරණ හෙවත් නිපදවන. ජවන පටිපාදක-ජවන් සිත් මතුකරවන හෝ පිළියෙල කරණ වීථි පටිපාදක හෙවත් වීථිය පිළියෙල කරණ. එයින් මෙහි ගැනෙන්නේ අරමුනු සිත්හි කරවන ආරම්මන පටි පාදක මනසිකාරයයි.

ලක්ෂණාදිය.

"සො සාරම්මන ලක්ඛණෙ"

සම්පයුක්තයන් අරමුණට අභිමුඛ කොට හැසිරවීම එය ලක්ෂණ කොට ඇත්තේ.

"සම්පයුත්තානං ආරම්මණෙ සම්පයොජන රසො." එක්ව යෙදෙන්නවුන් අරමුනේ මනාව යෙදවීම කෘත්‍ය කොට ඇත්තේය.

"ආරම්මණාභිමුඛ භාව පච්චුපට්ඨානා." අරමුණට අභිමුඛ බව එළෙඹ සිටීමයි. අරමුණම පදට්ඨානයයි. විථි පටිපාදක මනසිකාරය යනු පඤ්චද්වාරාවජ්ජන සිතයි

ජවන පටිපාදක යනු මනොද්වාරා වජ්ජනයයි

4 තත්‍රමජ්ඣත්තතා ඒ ඒ ධර්මයන්හි මධ්‍යස්ථභාවය මෙයි.

"සා චිත්ත චෙතසිකානං සමවාහිත ලක්ඛණා" ඕ චිත්ත චෛතසිකයන් සමව උසුලන ලක්ෂණ ඇත්තේය.

ඌනාධික නිවාරණ රසා" අඩුවැඩි බව වැලැක්ීම කෘත්‍ය යයි පක්ෂපාත බව නැතිකිරීම හෝ කෘත්‍යයයි.

"මජ්ඣත්ත භාව පච්චුපට්ඨානා," මධ්‍යස්ථ භාවය එළෙඹ සිටින අයුරැයි.

5, 6. කරුණා මුදිතා දෙක මතු බ්‍රහ්මවිහරණයන් විස්තර වන විට දක්වනු ලැබේ.

7 කායදුච්චරිත විරති.

8. වචී දුච්චරිත විරති.

9. මිච්ඡාජීව දුච්චරිත විරති.

**ලක්ෂණාදිය.**

"කාය දුච්චරිතාදිනං වත්‍ථූනං අවීතික්කම ලක්ඛණා" කාය දුශචරිතාදීන් නොකිරීම ලක්ෂණ කොට ඇත්තේය.

සංකොචන රසා එම දුශචරිතාදීන්ගෙන් හැකිලීම ලක්ෂණ කොට ඇත්තේය.

අකිරිය පච්චුපට්ඨානා. – නොකිරීම එළෙඹ සිටින ආකාරයයි.

සද්ධා හිරි, ඔතප්, අල්පෙච්ඡ ආදී ගුණයන් පදට්ඨා නයයි.

මෙසේ මේ නවයත් සමග සියල්ල පන්සැටක් ධර්මයෝය. මෙකියන ලද චිත්ත චෛතසිකයන්ගේ විශේෂ විභාගයන් මතු දක්වේ.

මෙසේ දහම් දැන විදසුන් වඩා උතුම් නිවන් සුව ලබත්වා.

---

# 31

### නමෝ සම්මා සම්බුද්ධස්ස

**සමෝධානය**

සිතත් සිතෙහි උපදනා ගතිත් සියල්ල එක්තැන් කොට සලකා බැලීම මෙයින් කරණු ලැබේ.

එහි එස්සාදී පණස් (56) නාමයන් හා යෙවාපනක වශයෙන් නවයකුත් මෙසේ කාමාවචර ඤාණ සම්පයුත්ත සිතක් අතිවන විට හටගන්නා ධර්මපදයෝ සැට පහක් දක්වන ලදී.

ඒවා අතුරෙන් සමහර විටක එක් සැටක්ද එක්විට යෙදෙති. ඒ මෙසේය. මිච්ඡා වචනයෙන් වලකින වේලෙහි එම විරති චෛතසිකයන් ඡන්ද අධිමොක්ඛ මනසිකාර තත්‍රමජ්ඣත්තතා යන සතරත් ඉහත සඳහන් සපණසත් සැට එකක් එකවර ලැබෙති. එසේම මිච්ඡා කම්මන්ත විරති ආජීව විරති වශයෙන්ද සැට එක බැගින් යෙදෙති. මෙසේම කරුණා මුදිතා දෙක සමගත් යෙදී මෙත් සැට එකක් නාම ධර්ම යෙදෙන කාමාවචර කුසල අවසථා සියල්ල පහකි. යෙවාපනක නවයෙහි අපණ්ණක නාමයෙන් හඳුන්වන විරුද්ධ නැති එකට යෙදෙන ඡන්ද අධිමොක්ඛ මනසිකාර තත්‍රමජ්ඣත්තතා යන සතර සහ සපනස් ධර්මයන්ගේ යෙදීමෙන් සම සැටක්ද එකවර ඇති විය හැකිය. එහෙත් පෙළෙහි කියන ලද අයුරු යෙවා-පණකයන් හැර ගැණීමෙන් සපනසක් නාම ධර්මකොණෙක් පමණී.

මේ යෙවාපනකයන් පෙළෙහි නොවදුලේ මේවා අනික් චෛතසිකයන්හි ඇතුළත්විය හැකි හෙයිනැයිද එකවර නොලැබෙන නිසා යයිද සැලකිය හැකිය. මෙහි

ඡන්ද අකුසල පක්ෂයෙහි ලෝභයෙහිද කුසල පක්ෂයෙහි වීර්යයෙහිද ලා සැලකිය හැකිය. අධිමොක්ඛය ශ්‍රද්ධාවෙහිද මනසිකාරය සිතෙහිද තත්‍රමජ්ඣත්තතාවය සැපයෙහි හෝ සමාධියෙහිද අතික් පස එකවර නොයේවත් නොලැබෙන හෙයින්ද යැයි ගතයුතුය.

කරුණා මුදිතාවන් මෛත්‍රියෙහි ඇතුළත් කළහැකි වුවද විරතිය මාර්ගාංගයක් වශයෙන්ද ලැබෙන හෙයින් ලෞකික සිත්හි විරති තුණෙන් එකක්ම එකවර ලැබෙන හෙයින් එය වෙශෙසින් සීල සමාධානයෙහි දක්ක යුතු හෙයින් මෙහි නොගත් සැටියෙකි.

කලින් කියන ලද දෙය නොගැණීමේ නීතිය යටතේ එනම් අගනිත ගහණ න්‍යායෙන් නම් කාමාවචර කුසල් සිතක් කියන කොට ඔක්කොම එකට හැදෙන නාම ධර්ම තිහකි.

එනම්:-

ඵස්ස වේදනා සඤ්ඤා චේතනා චිත්ත යන ඵස්ස පඤ්චකයද

විතක්ක විචාර පීති චිත්තෙකග්ගතා පඤ්ඤින්ද්‍රිය හිරිබල ඔත්තප්පබල අලෝභ අදෝස යන 13 ද කාය පස්සද්ධි ආදී 12-තිහයි.

මෙයින් 18 ක් කෘත්‍ය වශයෙන් නොබෙදේ. 12 ක් කෘත්‍ය වශයෙන් බෙදේ.

අවිභත්තික (නොබෙදෙන්නෝ)

ඵස්ස සඤ්ඤා චේතනා විචාර පීති ජීවිතින්ද්‍රිය සයත් කාය පස්සද්ධි ආදී දොළසත් යන 18 යි.

සවිභත්තික (බෙදෙන්නෝ)

1. චිත්ත = ඵස්ස පඤ්චකයෙහි චිත්ත නාමයෙන්ද ඉන්ද්‍රිය කොටසෙහි මනින්ද්‍රිය නාමයෙන්ද

2. විතක්ක = ඣානාංග කොටසෙහි විතක්ක නාමයෙන්ද මාර්ගාංග කොටසෙහි සංකප්ප නාමයෙන්ද

3. සද්ධා = ඉන්ද්‍රිය කොටසෙහි සද්ධින්ද්‍රිය බල කොටසෙහි සද්ධා බල නාමයෙන්ද

4. හිරි = බල ,, හිරි බල නාමයෙන්ද
= ලෝකපාල ,, හිරි ,,

5. ඔත්තප්ප = බල ,, ඔත්තප්ප බල ,,
= ලෝකපාල ,, ඔත්තප්ප ,,

6. අලෝභ = මූල ,, අලෝභ ,,
= කම්ම පථ ,, අනභිජ්ඣා ,,

7. අදෝස = මූල ,, අදෝස ,,
කම්ම පථ ,, අව්‍යාපාද ,,

මෙසේ දෙකට බෙදෙන නාමයෝ සත්දෙනෙකි.

1. වේදනා= ඵස්ස පඤ්චකයෙහි වේදනා නමින්ද, ඣානාංග කොටසෙහි සුඛ නමින්ද, ඉන්ද්‍රිය කොටසෙහි සෝමනස්සින්ද්‍රිය නමින්ද, මෙසේ වේදනා තුනට බෙදේ.

2. විරිය = ඉන්ද්‍රිය කොටසෙහි විරියඉන්ද්‍රිය නමින්ද
මග්ගංග .. සම්මාවායාම ,,
බල ,, විරිය බල ,,
පිට්ඨිදුක ,, පග්ගාහො ,,

3. සති = ඉන්ද්‍රිය ,, සතින්ද්‍රිය ,,
මග්ගංග ,, සම්මාසති ,,
බල ,, සතිබල ,,
පිට්ඨිදුක ,, සති ,,

4. සමාධි = ඣානාංග ,, චිත්තේකග්ගතා - සතියද
ඉන්ද්‍රිය ,, සමාධින්ද්‍රිය ,,
මග්ගංග ,, සම්මා සමාධි ,,
බල ,, සමාධි බල ,,

පිට්ඨිදුක   සමථ   නමින්ද මෙසේ සමාධිය 6 ට බෙදේ

5. පඤ්ඤා – ඉන්ද්‍රිය කොටසෙහි පඤ්ඤින්ද්‍රිය නමින්ද
මග්ග – ,, සම්මා දිට්ඨි නමින්ද
බල ,, පඤ්ඤාබල ,,
මූල ,, අමෝහ ,,
කම්මපථ ,, සම්මා දිට්ඨි ,,
පිට්ඨි දුක ,, සම්පජඤ්ඤ ,,
,, , විපස්සනා ,,

මෙසේ ප්‍රඥාව සතට බෙදී ඇත. මේ ඤාණ යුක්ත කාම කුශලයෙකැයි කියන විට ඉතාම කෙටිකර ගත්තත් මේ තිහත් අපණ්ණකාංග සතරවූ ඡන්ද අධිමොක්ඛ මනසිකාර තත්‍රමජ්ඣත්තතාවයත් කරුණා මුදිතා හා එක විරතියකුත් සමග සත් තිසක් කුසල ධර්ම ලැබෙති.

මෙසේ මෙහි නාම ධර්ම රාශි 17 කම යෙදෙති.

1. ඵස්සපඤ්චක වශයෙන්
2. ඣානාංග 3. ඉන්ද්‍රිය 4 මග්ග 5. බල 6 මූල
7. කම්මපථ 8. ලෝකපාල 9. පස්සද්ධි 10. ලහුතා
11. මුදුතා 12. කම්මඤ්ඤතා 13. පාගුඤ්ඤතා
14. උජ්ජුකතා 15 සතිසම්පජඤ්ඤ 16. සමථ විපස්සනා 17. පග්ගහ විපස්සනා වශයෙනි.

මෙසේ දහම් දැන විදසුන් වඩා ශාන්ත උතුම් නිවන් සුව ලබා ගණිත්වා

# 32

## නමො සම්මා සම්බුද්ධස්ස

**සංග්‍රහ වාරය.**

1. තස්මිං ඛොපන සමයෙ චත්තාරො ඛන්ධා හොන්ති.
2. ද්වායතනානි හොන්ති.
3. ද්වෙ ධාතුයො හොන්ති
4. තයො ආහාරා හොන්ති.

යම් වේලාවක කාමාවචර කුසල් සිතක් පහළ වේද එවේලෙහි සිතෙහි පහළ වන ගති බෙද දැක්වීම් වශයෙන් මෙතෙක් පුච්ඡා හෙවත් විමසීම් සමය නිර්දේශය (දැක්වීම) එසෙසාහොති. යනාදීන් ධර්මයෙන් දැක්වීමය. යං තස්මිං සමයෙ එස්සො ඵුසනා යනාදීන් අප්පණා, හෙවත් පමුණුවා දැක්වීමයයි. උද්දේස වාරය සතර කොටසකින්ද, පුච්ඡා සමය නිද්දෙස ධම්ම නිද්දෙස අප්පණා යනුවෙන් නිද්දෙස වාරය දැයි මෙසේ අට කොටසකින් හෙවත් පරිච්ඡෙද අටකින් ධම්ම වවත්ථාන වාරය හෙවත් ධර්මයෙන් වෙන් වෙන්ව තීරණය කිරීම දක්වා 'තස්මිං ඛොපන සමයෙ චත්තාරෙ ඛන්ධා'' යනුවෙන් සංග්‍රහ වාරය දක්වනලදී. එනම් මෙම කාමාවචර සිතෙහි සකන්ධ, ආයතන, ධාතු ආහාරාදීන් එක්කොට දැක්වීමයි. එයද උද්දේස වාරය නිද්දේස පටිනිද්දේස වාරය යන් මෙහි විස්තර වේ.

1. එසමයෙහි ස්කන්ධයෝ සතරදෙනෙක් වෙත්.
2. ආයතන දෙකක් වෙත්.
3. ධාතු දෙකක් වෙත්.
4. ආහාර තුණක් වෙත්. මේ උද්දේසයයි. හෙවත් මාතෘකාවයි.

"කතමෙ තස්මිං සමයෙ චත්තාරො ඛන්ධා හොන්ති" එසමයෙහි කවර නම් සතර ස්කන්ධයෝ කෙනෙක් වෙත්ද.

මේ නිද්දේස වාරයයි. මේසතර ස්කන්ධයෝ නම් වේදනා සඤ්ඤා සංඛාර විඤ්ඤාණ යන කොටසයි.

මෙසේ කාමාවචර පළමු මහා කුසල් සිත උපදනා ඇසිල්ලෙහි යෙවාපනක හැර චිත්තාංග වශයෙන් දක්වන ලද සපණස් ධර්මයන් සංග්‍රහ කරණ සේක්.

"රාසිය" යන අර්ථයෙන් ස්කන්ධයෝ සතර දෙනෙක් වෙතැයි වදාළසේක. ස්කන්ධ කියන්නේද එකට වැටෙන කොටසයි. රාසිය යනුද එම තේරුමයි. එම සපණස් නාම ධර්මයන් වෙනම කැපී පෙනෙන ලක්ෂණ කෘත්‍යාදිය අනුව ගොඩවල් සතරකට වෙන්කළ හැකිය.

1. වේදනා 2. සඤ්ඤා 3. සංඛාර 4. විඤ්ඤාණ

"කතමො තස්මිං සමයේ වෙදනාක්ඛන්ධො හොති." යනුවෙන් එය පටි නිද්දේස නැවත විස්තර කොට දැක්වීම් වශයෙන්

"යා තස්මිං සමයෙ චෙතසිකං සාතං "එසමයෙහි යම් සිත පිළිබඳ මධුරවූ යනාදීන් මේ කාමාවචර මහා කුසල සිතෙහි ලැබෙන සුඛ වේදනාව දක්වා වදාළසේක. එම වේදනා සඤ්ඤා සංඛාර විඤ්ඤාණයන්ගේ ලක්ෂණ රසාදි විස්තරයන් පසුගිය පාඩම්වල දක්වන ලදී.

"ද්වායතනානි හොන්ති" ආයතන දෙකකට මෙම සපණස් නාම ධර්ම අයිතිවෙති. එනම් මනායතනය ධම්මායතනයයි.

මෙහි මනායතනය නම් කාමාවචර මහා කුසල සිතයි. එය චිත්තං මනො මානසං යනුමෙන් විස්තර කර ඇත.

ධම්මායතනය නම් වේදනා සඤ්ඤා සංඛාරක්ඛන්ධයයි. මෙයින් ගැනෙන්නේ චෛතසික ධම්මායතන කොටසයි.

ද්වේ ධාතුයො හොනති.

සභාව, සුඤ්ඤත, නිස්සත්ත යන තේරුමෙන් ධාතු දෙකක් වෙත්. එනම් මනො විඤ්ඤාණ ධාතු ධම්ම ධාතු දෙකයි. මෙහි මනො විඤ්ඤාණ ධාතුව නම් ඉහත කියන ලද කාමාවචර සිතයි. ධම්ම ධාතුවද වේදනා සඤ්ඤා සංඛාරයි.

තයො ආහාරා හොනති.

ආහාර තුනෙක් වෙත්. එනම් ඵස්සා හාරය, චෙතනා හාරය, විඤ්ඤාණාහාරය. යන තුනයි. ආහරණාර්ථයෙන් ආහාර නම්වේ. ආහරණය හෙවත් ගෙණර්ම කරන්නේ ආහාරප්‍රත්‍ය ශක්තියයි. එහෙයින් ආහාර ප්‍රත්‍යශක්තිය ආහාරයයි.

මේ ඵස්ස, චෙතනා විඤ්ඤාණයන් සහජාතාදී වශයෙන් ලැබේ. එහෙත් විශෙෂයෙන් අතිරේක වශයෙන් ඵස්සාදි තුණ පමණක් නාමාහාර ශක්තිය ලබයි. ඵස්සාහාරය තුන් වැදෑරුම් වෙදනාව ගෙන එයි. චෙතනාහාරය කාම රූප අරූප තුන් භවය ගෙන එයි.

විඤ්ඤාණාහාරය ප්‍රතිසන්ධි නාම රූප ගෙනඑයි. එය විපාක ප්‍රතිශක්තියද වෙයි. එහෙත් මෙහි අජ්ඣත්ත නාම රූප සන්තතියට විශෙෂ හෙයින් කබලිංකාහාරයද මෙම නාමාහාරයන්ද ආහාරයයි කියනලදී.

වඳුළසේක. මහණෙනි, මේ කය ආහාරයෙන් සිටුනේ වෙයි. ආහාර නැත්නම් නොසිටියි. එසේම ඵස්ස ප්‍රත්‍යයෙන් වේදනාවද සංඛාර (චෙතනා) ප්‍රත්‍යයෙන් තුන්භව යෙහි විඤ්ඤාණයද, විඤ්ඤාණ ප්‍රත්‍යයෙන් නාම රූපද වෙයි. යනුයි. මෙසේ දහම් අසා දැන විදසුන් වඩා උතුම් නිවන් සැප ලබාගනිත්වා.

# 33

## නමො සම්මා සම්බුද්ධස්ස

5. අට්ඨින්ද්‍රියානි හොන්ති.

6. පඤ්චංගිකං ඣානං හොති

7. පඤ්චංගිකො මග්ගො හොති

ඉහත සඳහන් කාමාවචර මහා කුසල් සිත පහළ වන කොට එයට අයත් ධර්මයන් කොටස් වශයෙන් බෙදා වදාරණ බුදුරජාණන් වහන්සේ "තස්මිං ඛො පන සමයෙ චත්තාරො ඛන්ධා හොන්ති" යනාදීන් වදාළ සතර ස්කන්ධ, දෙවැදෑරුම් ආයතන ධාතු සහ තුන් වැදෑරුම් ආහාරයන් පසු ගිය පාඩමෙහි විස්තර කරණලදී. එසේම

5. අට්ඨින්ද්‍රියානි හොන්ති ඉන්ද්‍රියෝ අටක් වෙත්.

එම සිතෙහි අධිපති බැවින් යෙදෙන ධර්මයන් හෙවත් ඉන්ද්‍රිය ධර්මයන් අටක් බව දක්වා වදාළ සේක.

එම අධිපති කෘත්‍ය කරණ හෙවත් ප්‍රධානත්වය දරණ ඉන්ද්‍රිය ධර්ම අටනම්:- කතමානි තස්මිං සමයෙ අට්ඨින්ද්‍රියානි හොන්ති සද්ධින්ද්‍රියං, විරියින්ද්‍රියං, සතින්ද්‍රියං, සමාධින්ද්‍රියං, පඤ්ඤින්ද්‍රියං, මනින්ද්‍රියං, සොමනස්සින්ද්‍රියං ජීවිතින්ද්‍රියං. එසමයෙහි කවර ඉන්ද්‍රියයො අටදෙනෙක් වෙත්ද ?

1. සද්ධා ඉන්ද්‍රිය
2. විරිය ඉන්ද්‍රිය
3. සති ඉන්ද්‍රිය
4. සමාධි ඉන්ද්‍රිය
5. පඤ්ඤා ඉන්ද්‍රිය
6. මන ඉන්ද්‍රිය
7. සොමනස්ස ඉන්ද්‍රිය
8. ජීවිතින්ද්‍රිය යන ඉන්ද්‍රියයෝ අටදෙනයි.

මෙයින් කාමාවචර මහා කුසල සිතෙහි යෙදිය හැකි නාම ඉන්ද්‍රියයෝ අට දෙන දක්වන ලදහ. එම කාමාවචර කුසලය හා එකට එක්ව උපදනා මෙම නාම ධර්මයන් පසුගිය පාඩම් විස්තරව දක්වා ඇත. (පට්ඨාන දේසනා සාරය ඉන්ද්‍රිය ප්‍රත්‍යය බලන්න.)

6. පඤ්චඞ්ගිකං ඣානං හොති. අංග පසක් ඇති ධ්‍යානය වේ. මෙයින් උගන්වන ලද්දේ මේ කාමාවචර කුසල සිත්හිද අංග පසකින් යුක්තවූ ධ්‍යානයක් හෙවත් ධ්‍යාන චෛතසික පහද කාමාවචර වශයෙන් ලැබෙන බවයි.

එනම්:- "කතමං තස්මිං සමයෙ පඤ්චංගිකං ඣානං හොති "විතක්කො, විචාරො, පීතී සුඛං චිත්තස්සෙකග්ගතා" එසමයෙහි කිනම් පඤ්චාංගික ධ්‍යානයක් වේද? විතර්කය විචාරය, ප්‍රීතිය සුඛය එකාග්‍රතාවය යනුයි. උපනිඣායනය හෙවත් එකඟව කිට්ටුව සිතන අර්ථයෙන් මෙම චෛතසික ධ්‍යාන නාමය ලබති. මෙහිදී කල්පනාවට ගතයුතු කරුණක් නම් මේ ධ්‍යානාංග කුසල චෛතසිකයන් කුමන සිතක යෙදුනත් එවා ධ්‍යානාංගම බවය. කාමාවචර සිත්හි යෙදෙන කල කාමාවචරය රූපාරූපාවචර සිත්හි යෙදෙන කල රූපාරූපාවචරය. ලොකොත්තර සිත්හි යෙදෙන කල ලොකොත්තර ධ්‍යානය බව දතයුතුය. මේ ධ්‍යානාංග ඉහත විස්තර කරණලදී.

7. පංචංගිකො මග්ගො හොති. අංග පසකින් යුතු මාර්ගය වේ.

"නිය්‍යානට්ඨෙන හෙතුට්ඨෙන පඤ්චව ධම්මා මග්ගංගාති හොන්ති." පැමිණවීම හා හේතුය යන අර්ථයෙන් ධර්මයෝ පස්දෙනෙක් මාර්ගාංග වෙති. මාර්ගකෘත්‍යය කරණු ලබන ධර්ම මෙම කාමාවචර මහා කුසල සිතෙහි යෙදෙන්නේ මෙපමණය.

මෙහිදී පැමිණවීම (නියයානය) හෝ හේතුවීම මාර්ගී කෘත්‍යය බව ඉගත සඳහන්ය.

එනම්:- 'කතමො තස්මිං සමයෙ පඤ්චංගිකො මග්ගො හොති." සම්මාදිට්ඨි, සම්මා සංකප්පො, සම්මා වායාමො, සම්මා සති, සම්මා සමාධි.

එසමයෙහි කවර නම් පසඟක් ඇති මාර්ගීයක් වේද?, සම්මා දිට්ඨිය, සම්මා සංකප්පය, සම්මා වායාමය, සම්මා සතිය, සම්මා සමාධිය යනුයි.

මාර්ගී මෙන් පසක් පමණක් මෙහි දක්වා ඇත. සීලය පිළිබඳ වූ විරති තුණ දක්වා නැත. විරති තුණම ලෞකික සිත්හි එකවර නොයෙදෙන හෙයින් කුමන විරතිය යෙදේ දැයි නොකිවහැකි හෙයින් මෙහි තුණම නොදක්-වන ලදැයි ගත යුතුය. එහෙත් එක විරතියක් යෙදිය යුතු බව පෙනේ. මෙම මහා කාමාවචර සිත්හි අටතිස් චෛත සිකයන් යෙදෙන්නේ විරතීන්ද සමගය. එක විරතියක් යෙදිය යුතුය. එහෙයින් මෙහි නියමින් මාර්ගී පසක් හා අනියමින් විරති චෛතසිකයද ගෙන මාර්ගීංග සයක් ගතයුතුය. මේ ලෞකික හෙවත් කාමාවචර මාර්ගීංගයෝය.

ලොකෝත්තර සිත්හි මාර්ගීංගයෝ අට දෙනම එකවරම යෙදෙති එහෙත් "යථා ගත මග්ගොතිබො භික්ඛු අරියසෙසතං අට්ඨංගිකස්ස මග්ගස්ස අධිවචනං" මේ සූත්‍ර පාඨයෙහි ලෝකෝත්තර මාර්ගී සිත යම්සේ අංග අටකින් යුක්තවේද පූර්ව භාග විදර්ශනා මාර්ගීයද එසේම අට්ඨංගිකය යනුවෙන් "යථාගත මග්ග" යන වචනයෙන් මෙම තේරුම දෙන බැවින් ලෞකික සිතෙහි යෙදෙන මාර්ගීංගයන්ද අට්ඨංගිකයයි ගතයුතුය එහෙත් එසේ නොගත යුතුය

මේ සූත්‍රාන්ත දේශනානම් පරියාය දේශනාවෝය. එහෙයින් නොගතයුතුයයි ධම්ම සංගණී අටුවාව කියයි

“සො ඉමිනාව අරියෙන සීලක්ඛන්ධෙන සමන්නාගතො” යන වාක්‍යයෙන් කියැවෙන්නේ භාවනාව වත් පටන් නොගත් සීල විසුද්ධියෙන් පමණක් යුත් තැනැත්තෙකු ගැණය. එහෙයින් එම අට්ඨුවාව අරියෙනාති නිද්දොසෙන යනුවෙන් අරියෙන යනු නිදෙස් බැවින් යුතු යන තේරුම දෙයි. එහෙයින් සූත්‍රාන්තයෙහි අරිය ශබ්දය යෙදෙනු තරමින් එයින් ලෝකෝත්තර අදහසක් කියැවේ යැයි නොගත යුතුය.

එහෙයින් මෙහිද පූර්වභාග විදර්ශනා මාර්ග (යථාගත මග්ග) ආර්යයයි දක්වන ලද්දේ නිර්දෙෂ නිසායයි ගත හැකිය.

එහෙයින් එම විදර්ශනා සිත්හිද මාර්ගාංග සයක්ම ගත යුතුය.

මෙම ධ්‍යාන මාර්ගයන් කුසල සිත්හි කුසල්ය. අකුසල සිත්හි අකුසල්ය. අබ්‍යාකත සිත්හි අබ්‍යා කතය. කාමාවචරාදී සිත්හි ඒ ඒ භූමිවලට අයත්ය.

මෙසේ දහම් දැන විදසුන් වඩා ශාන්ත නිවන් සුව ලබත්වා.

# 34

## නමො සම්මා සම්බුද්ධස්ස

8. සත්ත බලානි හොන්ති
9. තයො හෙතූ ,,
10. එකො ඵස්සො හොති
11. එකා වෙදනා ,,
12. එකා සඤ්ඤා ,,
13. එකා චෙතනා ,,
14. එකං චිත්තං ,,
15 එකො වෙදනාක්ඛන්ධො
16. එකො සඤ්ඤාක්ඛන්ධො ,,
17. එකො සංඛාරක්ඛන්ධො ,,
18. එකො විඤ්ඤාණක්ඛන්ධො
19. එකං මනායතනං ,,
20. එකං මනින්ද්‍රියං ,,
21. එකා මනොවිඤ්ඤාණ ධාතු ,,
22. එකං ධම්මායතනං ,,
23. එකා ධම්ම ධාතු ,,

කුසල් දහම් කවරහුද? යම් වේලාවක කාමාවචර කුසල් සිතක් උපන්නේ වේද, සොම්නස් සහගත ඥාණයෙන් එක්ව යෙදුන රූපාදි අරමුණක එල්ලුණ යනාදීන් පළමු මහා කුසල් සිත එහි යෙදෙන සියලු චෛතසික ධර්මයන් සමග දක්වා අවසන් කරණ සේක් සත්ත බලානි හොන්ති යනාදීන් වදාළහ.

8. සත්ත බලානි හොන්ති - බල ධර්මයෝ සත් දෙනෙක් වෙත්. "අකම්පියට්ඨෙන" කම්පා නොවන නොසැලෙන තේරුමෙන් ධර්මයෝ (ස්වභාවයෝ) සත් දෙනෙක් "බල" නම් වෙති.

එනම් සද්ධා බලය, විරිය, සති, සමාධි, පඤ්ඤා හිරි, ඔත්තප්ප, යන බල සතයි. සද්ධා අසද්ධාව ඉදිරියේ කම්පා නොවී නොසැලී බලවත්ව සිටින අවස්ථාව මෙයින් ගැනේ. මෙසේ විරිය කුසීත කම මැලිකම ඉදිරියේද සතිය සිහි මුලාබව ඉදිරියේද සමාධිය වික්ෂෙපයද ප්‍රඥාව මෝහයද හිරිය අහිරිකයද ඔත්තප්පය අනොත්තප්පයද ඉදිරියේ කම්පා නොවේ. තුයි බල නම්වේ.

9. තයො හේතු හොනති. හේතු තුණක් වෙත්. 'මූලට්ඨෙන' මූලාර්ථයෙන් හෙවත් කුසල් බවට පත්වීමට මුල්වීමෙන් ධර්මයෝ තුන්දෙනෙක්හේතු නම් වෙත්. එනම් අලෝභ අදෙස අමෝහ යන තුණයි. මේ කාමාවචර ත්‍රිහේතුක පළමු සිත හෙයින් අලෝභාදී හේතු තුණ යෙදෙන බව දක්වූ සේක. කලින් විස්තර කර ඇත. (පට්ඨාන දේශනා සාරය හේතු ප්‍රත්‍යයය බලන්න.) මෙහිදී මෙසේ මේ ධර්මයෝ කොටස් කොට දක්වන ලදහ.

10. එකො ඵස්සො හොති. එක ඵස්ස චෛතසිකයක් වේ. ඵුසනට්ඨෙන ස්පර්ශ කිරීම යන තේරුමෙන් එක ඵස්ස චෛතසිකයක් වේ.

11. එකා වෙදනා හොති විඳීම කරණ එකම වේදනාවක්වේ.

12. එකා සඤ්ඤා හොති. හැඳිනීම් අර්ථයෙන් එකම සඤ්ඤා -වක් වේ.

13. මනා කොට සිතවන හෙවත් චිත්ත චෛතසික එක අදහසකට එක්කරණ තේරුමෙන් එකම චේතනා-වක් වේ.

14. එකං චිත්තං හොති, චිත්‍ර විචිත්‍රාර්ථයෙන් එකම සිතක්වේ.

15. එකො වෙදනාක්ඛන්ධො හොති. එකම වෙදනාක්ඛන්ධ-යක්වේ. රූසය යන අර්ථයෙන් හා විඳවීම යන අර්ථ යෙන් එකම ධර්මයක් වේදනාක්ඛන්ධය වේ.

16. එකො සඤ්ඤක්ඛන්ධො. රැසය යන අර්ථයෙන්ද එකක්ම සඤ්ඤක්ඛන්ධ නම් වේ.

17. එකො සංඛාරක්ඛන්ධො හොති. එකම සංස්කාරස්කන්ධයක් - සමූහාර්ථයෙන් හා සකස් කරණ අර්ථයෙන් වේ.

18. එකො විඤ්ඤාණක්ඛන්ධො හොති. දැන ගැනීම් අර්ථයෙන් හා සිතන විචිත්‍ර යන අර්ථයන් ගෙන් එකම විඤ්ඤාණක්ඛන්ධයක් වේ.

20. එකං මනින්ද්‍රියං හොති. දැන ගැනීම් අර්ථයෙන් හා අධිපති අර්ථයෙන්ද එකම මනින්ද්‍රියක් වේ.

21. එකා මනොවිඤ්ඤාණ ධාතු හොති. දැන ගැනීම් අර්ථයෙන් හා සවභාව සුන්‍ය වූද සත්වයෙක් නොවන්නාවූද යන අර්ථයෙන් එකම මනොවිඤ්ඤාණ ධාතුවක් වේ.

22 එකං ධම්මායතනං හොති. සිත හැර අනික් සියල්ල කියන ලද එක ධම්මායතනයක් වේ.

වෙදනාක්ඛන්ධො, සඤ්ඤාක්ඛන්ධො, සංඛාරක්ඛන්ධො ඉදං තස්මිං සමයෙ ධම්මායතනං හොති. වේදනාස්කන්ධය, සඤ්ඤාස්කන්ධය සංස්කාරස්කන්ධය යන තුණ ධම්මායතනය බව දක්වා වදාළ හෙයින් සිත හැරයයි ගන්නාලදී.

23. එකා ධම්ම ධාතු හොති. එසේම එකම ධර්ම ධාතුවක් වේ. ධර්ම ධාතු යනුද වේදනාදී තුණ බව දක්වන ලදී.

මේ සියල්ලම නැවතත් සුඤ්ඤත වාර වශයෙන්ද ධම්ම සංගිණියේ දැක්වේ. මෙසේ සියල්ල දක්නාවූ තථාගත සම්මා සම්බුද්ධයන් වහන්සේ පළමු සිත සවිකාරයෙන් දක්වා වදාළසේක.

පළමු මහා කුසල් සිත පහළවීම යනු කුසල ධර්ම පණස්හයක් (56) පහළ වීමකි. යෙවාපණක වශයෙන්

දක්වන ලද ඡන්ද අධිමොක්ඛ, මනසිකාර තත්‍රමජ්ඣත්තතා කරුණා මුදිතා කාය දුච්චරිත විරති වචී දුච්චරිත විරති මිච්ඡාජීව විරති යන නවයක් සමග (65) ක් ධර්මයෝ පහළ වෙති මේවා පිළිබඳ විස්තරයක් 30 වැනි පාඩමෙහි ඇත.

ඒ ඒ නාම ධර්මයන්ගේ කෘත්‍යයයන් අනුව එකක් නොයෙක් වර දැක්වීමෙන් මෙසේ 65 ක් වන නමුදු පළමු මහා කාමාවචර සිතෙහි යෙදෙන චෛතසික 38 ක් බව අභිධම්මත්ථ සංගහ අභිධම්මාවතාර ආදී පොත්වල දක්වා ඇත.

ධම්මසංගිණියෙන් සංග්‍රහ කරණ ලද එම චෛතසික 38 හා සිතත් සමග මෙම 65 ක්වූ ධර්මයන් එක්කොට බැලීමෙන් ධර්මඥානය දියුණු කරගත හැක.

**සැට පහක් නාම ධර්ම**

1. ඵස්සො
2. වේදනා
3. සඤ්ඤා
4. චේතනා
5. චිත්ත
6. විතක්ක
7. විචාර
8. පීති
9. සුඛ
10. එකග්ගතා
11. සද්ධින්ද්‍රිය
12. විරියින්ද්‍රිය
13. සතින්ද්‍රිය
14. සමාධින්ද්‍රිය
15. පඤ්ඤින්ද්‍රිය
16. මනින්ද්‍රිය

**අටතිස් චෛතසික.**

1. ඵස්සො
(1)
2. වේදනා
(9-17 යන අංකද වේදනාවේ ඇතුළත්.)
3. සඤ්ඤා
(3)
4. චේතනා
(4)
5. එකග්ගතා
(10-14-23-27-53-56)
6. ජීවිතින්ද්‍රිය
(18)
7. මනසිකාරය
(59)
8. විතක්ක
(6-20)

17. සොමනස්සින්ද්‍රිය
18. ජීවිතින්ද්‍රිය
19 සම්මාදිට්ඨි
20. සම්මා සංකප්ප
21. සම්මා වායාම
22. සම්මා සති
23. සම්මා සමාධි
24. සද්ධා බල
25. විරිය
26. සති
27. සමාධි බල
28. පඤ්ඤා
29. හිරි
30. ඔත්තප්ප
31. අලොභො
32. අදොසො
33. අමොහො
34. අනභිජ්ඣා
35. අව්‍යාපාද
36. සම්මාදිට්ඨි
37. හිරි
38. ඔත්තප්ප
39. කාය පස්සද්ධි
40. චිත්ත ,,
41. කාය ලහුතා
42. චිත්ත ,,
43. කාය මුදුතා
44. චිත්ත ,,
45. කාය කම්මඤ්ඤතා
46. චිත්ත ,,
47. කාය පාගුඤ්ඤතා
48. චිත්ත ,,

9. විචාර
(7)
10. අධිමොක්ඛ
(58)
11. විරිය
(12 21-25-55)
12. පීති
(8)
13. ඡන්ද (57)
14. සද්ධා
(11-24)
15. සති (13-22-26-51)
16. හිරි (29-37)
17 ඔත්තප්ප (30-38)
18 අලොභ
(31-34)
19. අදොස
(32-35)
20. තත්‍රමජ්ඣත්තතා (60)
21. කායපස්සද්ධි (39)
22. චිත්තපස්සද්ධි (40)
23. කාය ලහුතා (41)
24. චිත්ත ලහුතා (42)
25. කායමුදුතා (43)
26. චිත්ත මුදුතා (44)
27. කාය කම්මඤ්ඤතා (45)
28. චිත්ත කම්මඤ්ඤතා (46)

49. කායුජ්ජුකතා
50. චිත්තුජ්ජුකතා
51. සති
52. සම්පජඤ්ඤ
53. සමථ
54. විපස්සනා
55. පග්ගහ
56. අවික්ඛෙප
57. ඡන්ද
58. අධිමොක්ඛ
59. මනසිකාර
60. තත්‍රමජ්ඣත්තතා

61. කරුණා
62. මුදිතා
63. කායදුච්චරිත විරති
64 වචීදුච්චරිත ,,
65. මිච්ඡාජීව විරති.

29. කායපාගුඤ්ඤතා (47)
30. චිත්ත ,, (48)
31. කායුජ්ජුකතා (49)
32. චිත්තුජ්ජුකතා (50)
33. සම්මාවාචා (64)
34 සම්මාකම්මන්ත (53)
35. සම්මා ආජීව (65)

36. කරුණා (61)
37. මුදිතා (62)

38. පඤ්ඤා
(15-19-28-33-36-52-54)

39. චිත්ත
(5-16)

සැට පස් මැදෑරුම් නාම ධර්මයන් අටතිස් හෙවත් සිතක් සමග 39 වැදෑරුම් වන සැටි මෙසින් පැහැදිලිව උගත යුතුය.

සම්මාසම්බුද්ධ ශාන්තිනායකයන් වහන්සේ මෙසේ පළමුවන කාමාවචර මහා කුසල සිත සර්වාකාරයෙන් වදාළසේක.

මෙසේ දහම් දැන විදසුන් වඩා ශාන්ත නිවන් සුව ලබත්වා.

# 35

## නමො සම්මා සම්බුද්ධස්ස

### දෙවෙනි සිත.

"කතමෙ ධම්මා කුසලා."

යස්මිං සමයේ කාමාවචරං කුසලං චිත්තං උප්පන්නං හොති, සොමනස්ස සහගතං ඤාණ සම්පයුත්තං සසංඛාරෙන රූපාරම්මණංවා සද්දාරම්මණංවා . . ... යං යං වා පනාරබ්භ යස්මිං සමයෙ එසෙසා හොති ..... අවික්ඛෙපො හොති." ශාන්ති නායක සම්මා සම්බුදුරජාණන් වහන්සේ දෙවෙනි කාමාවචර මහා කුසල් සිත දක්වා වදාරණ සේක් කතමෙධම්මා කුසලා යනාදීන් වදාළහ.

පළමු කාමාවචර කුසලය මැනි තවත් සිත් බෙද දක්වීමට කරුණු ඇති බව එයින් නිගමනය කෙරිණ. සිත එකක්මය. ඒ එක තේරුමකිනි තවත් ඒ සිතේම ප්‍රභේද යන් නිසා එය නන්වැදෑරුම් විය හැකිවා මෙන්ම දෙසිතක් එකවර එක සන්තානයක එක සතකු පිළිබඳ පහළ නොවන්නේය. කුසල් අකුසල් විපාක කිරිය නාමයෙන් දිවෙන චිත්ත සන්තානය සංකීර්ණ ප්‍රත්‍ය ශක්තින් නිසා වඩාත් සංකීර්ණ ලෙස ගලා බස්නා දිය ඇල්ලක් මෙන් නොසිඳ පවත්නේය. කුසල සිත කුසලයට මෙන්ම විපාක කිරිය සිත්වලටද අනන්තර සමනන්තරාදී ප්‍රත්‍ය ශක්තිය දෙන්නේය. අකුසලය අකුසලයට මෙන්ම විපාක කිරිය සිත්වලටද විපා කිරිය සිත් කුසල අකුසල හා විපාක කිරිය සිත්වලටද අනන්තර සමනන්තරාදි ප්‍රත්‍යශක්තීන් උපකාර ලබා පහළවන ඒ චිත්ත නියමය ඉතා පුදුමාකාරය. එකකට අනතුරුව එකක්ම පහළ වනවා මිස දෙකක් එකවර හෝ එකක් එකක් කොටසක් වශයෙන් පහළනොවේ. චිත්ත වේගය උපමා නැති එකකි.

එම නිසා එකවර මෙන් නොයෙක් ක්‍රියා සිදුවනු දක්න විට සිත් රැසක් එකවර පහළවෙනවායයි සිතීමට ඉඩ තිබේ. එහෙත් එක සිතක් බිඳී තවත් සිතක් පහළවන බව බුදු දහමෙන් මනාව ඔප්පුවේ. තවද කුසල ජවන යක් ළඟට අකුසල ජවනයක් පහළවීමට අනන්තර ප්‍රත්‍ය ශක්තියක් නැත. කුසල් ජවන් බිඳී විපාක සිත් පහළවී ඉන්පසු අකුසල ජවන් ඇතිවිය හැක. කරණලද කුසලා කුසලයන්ගේ විපාක පසු කලෙක ලැබෙන්නේ කම්මසමඟිතාවය හා විපාක සමංගිතාවය බලපැවැත්වීමෙනි. තණ්හාදී අනුශය ධර්මයන්ගේද සම්බන්ධතාවයක් එයට ඇත. අනුශය සිඳලූ රහතන් වහන්සේගේ කිරිය සිත්-වලට විපාකයක් නැත්තේ එහෙයිනි.

බලසම්පන්න හෙයින් ඒවා ජවන් නාමයෙන් හඳුන්වනු ලැබේ. ජවයක් චිත්ත සන්තතියට එක්කරණ නිසාද ජවන් යයි හඳුන්වන බව සිතිය හැකිය. සසර සත්වයා ගමන් කරවන හෙයින්ද එසේ කිවහැකිය. බලවත් හෙයින් ඒවායේ එක්තරා ශක්ති විශෙෂයක් චිත්ත සන්තතියත් සමග ඉදිරියට ගමින්ගණී. මේ කර්ම සමංගිතාවයයි. අවශ්‍ය කරුණු ඉදිරිපත් කිරීමේදී එම ගතිය විපාක වශයෙන් සිතක් පහළ වීමට උපකාර වේ.

පිළිසිඳගත් විපාක සිත භවංග වශයෙන් නැවත නැවත පහළවේ. භවංග විපාක සිත සමගද කරණ ලද කුසලා කුසලයන්ගේ එම ශක්තිය ගමන් කෙරේ.

පසුව ඇතිවන කුසලාකුශලයන් සමගද ගමන් කෙරේ

මෙම තත්වය තේරුම් නොගත්මනොවිඥානයන් යටි සිතක් ඇති බවත් යටි සිතේ පවතින අදහස් ඇතැම් විට මතු වන බවක් ප්‍රකාශ කරන්නේ යටිනුත් උඩිනුත් සිත් පහළවන බවක් එකවර චිත්ත සන්තති කීපයක් පහළ වන බවක් හැඟෙන අවිචාර ලෙසකිනි. ඇතැම්මු

යටි යටි සිතකුත් ඇති බව කියති. එය අතීත භවංගය ලෙස සලකති. අතීත භවංගය බිඳෙයි. භවංග සන්තතිය සැලෙමින් මෙන් උපදනා භවංගය ද බිඳෙයි. දොරටුව අව දනා සිතද බිඳෙයි. එවිට යටි සිතක් නැත. මෙසේ විථාන වීථියක් ගමන් කොට යළි භවංග සිත් ඇතිවේ.

ඒ කලින් ඇතිවුනු භවංග සිතමය. ඒ ආත්මයේ උපත් සිතෙහි චෛතසිකම ය එහි යෙදෙන්නේ. එය අමුතු නොවෙයි. එහෙයින් එහි අමුතු ක්‍රියාකාරිත්වය කුත් නැත. එහෙත් කුසලා කුසලකම් සමංගිය ඇත. ඉදිරියට කරන්නට තිබෙන දේ ගැණ බලවත් ලෙස ජවන් පහළකරගත් කෙනෙකුට ඒ සිත් නැවත නැවත පහලවන හෙයින් සිත දිගට භවංගයට වැටී නොපවතින හෙයින් නින්ද යන්නේ නැත. ඒ ජවන ශක්තියමය. ඒ යටිසිත් නොවේ. උඩුසිත්මය.

මෙසේ අභිධම්ය අනුව විමසන විට උඩු යටි වශයෙන් සිත් බෙදීම මනොවිඥාවක් නොව මනො විකාරයකි.

මෙහි දක්වන ලද දෙවෙනි කුසල් සිත පළමුවෙනි කුසල් සිතමය. අනුන්ගේ වෙහෙසීමකින් හෝ තමන් පසුබෑස බැස කිරීමෙන් හෝ ඇතිවන හෙයින් සසංඛාරික වීම පමණක් වෙනසයි. එහෙයින් මෙහි විස්තර කරන්-නට තිබෙන්නේ සසංඛාරික යන්න පමණකි.

**සසංඛාරික.**

සහ සංඛාරෙනාති සසංඛාරො සකස්වීමක් හා එක්වූයේ සසංඛාරය.

**සළසසාගෙන**

සළපායෙන පවචංසනගෙනාති අතේථා

නැවත උත්සාහයෙන් හෙවත් උත්සාහයයක් උපා-යක් උපකාරයක් සහිත වීමෙන් යන තේරුමයි. බණ අසන්නට ආදී පිනක් කරන්නට යන්නට සිතුනද ඈත නිසා නොයමියි සිතා යලි අනුසස් සිතා යයි. එක්කෝ මිතුරකු පැමිණ කැඳවූ නිසා යයි. මෙසේ තමන්ම විසින් හෝ අනුන් නිසා හෝ එම කුසලය කරන්නට අමුතු උත්සාහයයක් උපකාරයක් මෙහෙයීමක් ලැබුණු හෙයින් එම සිත සකස් විය එයය සසංඛාරික යනුවෙන් දැක්වූයේ.

මෙසේ දහම් දැන විදසුන් වඩා නිවන් සුව ලබත්වා.

# 36

## නමො සම්මා සම්බුද්ධස්ස

## තුන්වෙනි සිත

කතමේ ධම්මා කුසලා?

යස්මිං සමයෙ කාමාවචරං කුසලං චිත්තං උප්පන්නං හොති සොමනස්ස සහගතං ඤාණ විප්පයුත්තං රූපාරම්මණංවා... .. . ......

පළමුවෙනි කාමාවචර මහා කුසල් සිත් දෙක දක්වා වදාළ සම්බුදු හාමුදුරුවන් වහන්සේ තුන්වෙනි කාමාවචර මහා කුසලය දක්වන සේක් ''කතමෙ'' යනාදී ප්‍රශ්නය නැගූ සේක.

පළමුවැනි මහා කුසල් සිත් දෙකෙහි වෙනස ඉතා සුළුය. දෙවෙනි සිත සිතේ හැටියෙන්ම සවභාවයෙන්ම තියුණු නොවීම ලැසිවීම පසු බැසීම එහි දුර්වල භාවයට හේතුය. චෛතසිකවල කිසිම අඩුවක් නැත. එහෙත් පසු බැස්මක් ලැබෙන්නේ සියලු චෛතසිකයන් එක හා සමාන බලයකින් ක්‍රියා නොකරණ හෙයිනි. විශේෂයෙන් විරිය චෛතසිකය දුර්වලවීමෙන් බව සිතිය යුතුය. අභිධම්මත්ථ සංග්‍රහයෙහි ද පළමු සිතෙහි මෙන් දෙවෙනි සිතෙහිද චෛතසික 38 ක්ම යෙදෙන බවද ධම්මසංගණියෙහිද සපණස් නාමධර්‍ම හා යෙවාපනක නවයන් සමග 65 ක් නාමධර්‍ම දක්වෙති. මෙයින් තේරුම්ගත යුත්තේ පින්දහම් කිරීමේදී එයට නතුවම එක සිතින්ම එය කිරීම මෙම පළමු කුසල සිතින් සිදුවිය හැකි බවය. කරම්ද නොකරම් දැයි සිතන විට එබිතර නොවූ සිතින් බාහිර විචිකිච්ඡාදියෙන් ශ්‍රද්ධාවීයසීාදිය දුර්වල වී පින සිදුවේ. පිනක් කරන්නට පසුබසින්නෙකු කෙණෙකු උනන්දු කරවීම මෙහි අනිකෙකුගේ උනන්දු කරවීම බව සිතිය යුතුය.

මුලින්ම කෙනෙක් යම් පිණක් කරන්නට යැයි, ඉල්ලීමක් කළ විට සවභාවයෙන්ම තියුණුව හෙවත් එකවරම ඉදිරිපත්වී එය කරණ නැනැත්තාට පසු බැසීමක් හෙවත් සසංඛාරවීමක් නොලැබේ. ඇතැම් අය අනුන්ගේ යෙදවීමෙන් කරණ කුසල් සසංඛාරයැයි සිතති. එය නොමැනවි. කොපමණ උනන්දුවකින් පිණක් කරනත් එම පිණ පිළිබඳව අසංඛාරික චිත්ත වීථින් සමග අනතුරුව සසංඛාරික ජවන වීථින්ද ඇති විය හැකිය. එහෙයින් මෙය ඉතා සියුම් වෙනස්වීමක් වශයෙන් ගෙන ඉතාමත් සියුම් ලෙස දෙසිතක් ලෙස බෙදා වදාළ බව සිතිය යුතුය. එසේම තුන්වෙනි කුසල් සිත වදාරණ සේක් කුසල් දහම් කවරහුද? යම් වේලාවක කාමාවචර කුසල් සිතක් පහළ වේද සොම්නස් සහගත ඤාණයෙන් තොර රූපාදී අරමුණක් ගත් යනුවෙන් මුල් සිත් (1-2) දෙකට වඩා මෙහි ඇති වෙනස ඤාණ විපප යුක්තවීම බව දක්වන ලදී.

ඒ සිතට ලැබුණු අරමුණෙහි සතුටු වෙයි. එහෙත් එය පිරිසිඳ දන්නා නුවණක් නැත. මෙම නුවණ හෙවත් දැනීම කුමක් විය යුතුද? මෙම අරමුණ ස්ථිර වූ, නිත්‍ය වූ, නොවෙනස් වන දෙයක් ලෙස අරමුණෙහි මෝහය ඇතිවෙයි. මෙබඳු කුසලයක් කිරීමෙන් සැප විපාකයක් පිළිබඳ දැනීමක් අවබෝධයක් නැති හෙයින් එම සිත පිළිබඳවම මූලාවක් වෙයි. එය කර්මය පිළිබඳ නොදැනීම හෝ නොපිළිගැනීමයි. මුලින් කියන ලද්දේ විදර්ශනා වශයෙන් දියුණු ප්‍රඥවයි,

ළදරුවකු හාමුදුරු නමක් දැක මේ මගේ හාමුදුරුවෝ යැයි වඳින කල එසේම බණ දහම් නොදත්තෙකු එසේ වඳින පුදන කල බෙහෙවින් මෙම සිත පහළ වෙයි. අරමුණ හා සිත පිළිබඳ වූද සිත පමණක් පිළිබඳ වූ විදර්ශනා හා කම්මස්සකතා ඤාණයන් නොයෙදී උපදනා සිත ඤාණවිපපයුත්ත බව සිතිය යුතුය.

පළමුවන දෙවන කාමාවචර සිත්හි යෙදුණ ප්‍රඥාව පමණක් අඩුවීමෙහි චෛතසික 37 ක් පමණක් වේ. ධම්ම සංගණියේ 65, නාම ධර්‍මයන්ගෙන් සතක් (පළමු වැනි සිතෙහි සත් පළක ප්‍රඥාව යෙදී ඇත.) අඩුවී පණස් අටක් නාම ධර්‍ම ලැබේ.

ධම්ම සංගණියේ ප්‍රඥාව සෑම තැනකම "යාපඤ්ඤා පජානනා විචයො" යනාදීන් එකලෙසම දක්වා ඇත. එහි කර්‍මඵල පිළිබඳ දැනීම මූලික ප්‍රඥාවයි. නාම රූපයන් ගේ ඇති සැටිය පිළිබඳ දැනීම හෙවත් යථාභූත ඥාණය උසස් දැනීමයි. මෙසේ බුදු දහමෙහි ප්‍රඥාව යනුවෙන් හඳුන්වන්නේ නිවන් දැකීමට අවශ්‍ය නුවණටය. බුදු බණෙහි සෑම දහම් පදයක්ම නෛර්‍යාණිකය.

**සතර වැනි සිත.**

"කතමෙ ධම්මා කුසලා"? කුසල් කවරහුද ? යනුවෙන් සතර වෙති සිතද දැක්වූ සේක. එහි සසංඛාරවීම පමණක් වෙනසයි. බුදුනුවණින් කළ මෙම අසිරිමත් සිත් බෙදීම අනිකෙකුට කළ නොහැකිය. සසංඛාරය 35 වැනි පාඩමෙහි විස්තර කොට ඇත.

මෙසේ දහම් දැන විදසුන් වඩා නිවන් සුව ලබත්වා.

# 37

## නමො සම්මා සම්බුද්ධස්ස

### පස්වෙනි සත.

**කතමෙ ධම්මා කුසලා?**

යස්මිං සමයෙ කාමාවචරං කුසලං චිත්තං උප්පන්නං හොති, උපෙක්ඛා සහගතං ඤාණ සම්ප යුත්තං රූපාරම්මණංවා ... ... ... ... යංයං වා පනාරබ්භ.

**කුසල් දහම් කවරහු ද?**

යම් වේලාවක රූපයක් අරමුණුකොට හෝ ශබ්දයක් ගන්ධයක් රසයක් ඵොට්ඨබ්බයක් ස්වභාවයක් යමක් අරමුණු කොටගෙන උපෙක්ෂාවෙන් යුතු ඤාණයෙන් යුතු කාමාවචර කුසල් සිත දක්වා වදාළ සේක.

මෙහි උපෙක්ෂා සහගත වීම පමණක් වෙනසයි. උපෙක්ෂා වේදනාව එන හෙයින් ප්‍රීති චෛතසිකය නොලැබේ. එහෙයින් අටතිස් චෛතසිකයෙන් මෙහිද සත්තිසක්ම ලැබේ. ධම්මසංගණියේ දක්වූ සපණස් ධම් යන්ගෙන් 55 ක්ම ලැබෙන අතර යෙවාපනකයන් ද සමග 64 ක් නාම ධම් වෙති. මෙහි උපෙක්ෂාව හා එකට එකතුවීම වෙනසයි. උපෙක්ෂාව නම් උපෙක්ෂා වේදනාවයි. වේදනාව ඇති වන්නේ අරමුණ ගැණ සැලකීම අනුවයි අරමුණ ප්‍රියමනාප නම් සෞමනස්සයද අප්‍රිය අමනාපනම් දෞමනස්සයද මධ්‍යස්ථ නම් හෙවත් ප්‍රිය අප්‍රිය නොවේනම් උපෙක්ෂාවද වේදනා වශයෙන් හට ගන්නා බව දක්වේ. ඇතැමෙකුට ප්‍රිය අරමුණ ඇතැමෙකුට අප්‍රිය විය හැකි ය. එම නිසා අරමුණ ගැණ සැලකීම අනුව එය ප්‍රිය අප්‍රිය වෙන බව සිතිය යුතුයි.

මෙසේ අරමුණෙහි මධ්‍යස්ථ ස්වභාවයෙන් යුතුව පිරිසිඳ දක්නා නුවණ යෙදෙයි. ප්‍රීතිය ගිලිහෙයි. ගැඹුරු මැදහත් බවක් ඇතිවීමෙන් මෙසේ උපෙක්ෂාව බලවත් බවට අධිපති බවට පත්වීමෙන් එය ඉන්ද්‍රියයක්ද වෙයි.

සවෙනි කුසල් සිත.

යස්මිං සමයෙ කාමාවචරං කුසලං චිත්තං උප්පන්නං හොති, උපෙක්ඛා සහගතං ඤාණ සම්පයුත්තං සසංඛාරෙන රූපාරම්මණංවා .........

යම් වේලාවක කාමාවචර කුසල සිතක් උපදීද උපෙක්ෂා සහගත ඤාණ සම්ප්‍රයුක්ත සකස්වීමෙන් යුතු රූපාදී අරමුණු ඇති යනාදීන් සවෙනි කාමාවචර කුසල සිත දක්වා වදාළ සේක. එහි සසංඛාර වීම පමණක් වෙනසයි අනිත් සියල්ල පස්වැනි සිත හා සමයි.

සත්වෙනි කුසල් සිත

යස්මිං සමයෙ කාමාවචරං කුසලං චිත්තං උප්පන්නං හොති උපෙක්ඛා සහගතං ඤාණවිප්පයුත්තං

යම් වේලාවක කාමාවචර කුශලයක් උපන්නේවේද උපෙක්ෂාවෙන් යුතු ඤාණයෙන් තොර යනාදී වශයෙන් සත්වෙනි කුශල සිත වදාළ සේක, ඤාණයත් ප්‍රීතියත් දෙකම මෙහි නොලැබෙන බැවින් මෙහි චෛතසික තිස් හයකි. ධම්ම සංගණියේ දක්වූ අයුරු නාම ධර්ම 48 කි. යෙවාපනකයන්ත් සම 57 කි.

අටවෙනි කාමාවචර කුසල් සිත.

"යස්මිං සමයෙ කාමාවචරං කුසලං චිත්තං උප්පන්නං- හොති."

යම් වේලාවක කාමාවචර කුසල් සිතක් උපත්තේ වේද උපෙක්ෂාවෙන් යුත් ඤාණ විපපයුතතා සසංඛාර යනු වෙන් 8 වෙනි කාමාවචර කුශල් සිත දක්වා වදාළසේක.

දානාදී අනේකාකාර පින්කම් කෙරෙත්තේ මෙම කුසල් අටෙනි. මෙහිදී කාමාවචර කුසල් සිත සිත් 8 කට ඉතා සියුම් ලෙස බෙදා දක්වා තිබෙන්නේ කුමන කරුණු උඩදැයි විමසිය යුතු ය.

"පළමු කාමාවචර කුසල් සිත"

ධම්මං සංගණියේ වදාළ අසුරු අංග හෙවත් කරුණු දෙකකින් වෙන්කළ හැකිය.

එනම්:- (1) සොමනස්ස සහගත ඤාණසම්පයුත්ත කාමාවචර සිත යනුයි. ධම්ම සංගණියේදී මේ පළමු මහා කාමාවචර සිතට අසංඛාරික ශබ්දයක් යොදා නැත. දෙවෙනි සිත සසංඛාරිකය. එම දෙවෙනි සිත සසංඛාරික හෙයින් මෙය බුදුරදුන් නොවදාළත් අසංඛාරික විය යුතු ය. එසේම සැලකූ හෙයින් අභිධම්මත්ථ සංගහ අභිධම්මාව -තාරාදී පොත්වල

"සොමනසස සහගත ඤාණ සමපයුතතා අසංඛාරික යැයි අංග තුණක් පෙන්නුම් කොට ඇත.

ධම්ම සංගණි පෙළෙහි පළමුවැනි කාමාවචර සිතට අසංඛාරික යන්න නොදෙසූ සේක. එය සවයංසිද්ධ බව එයින්ම අවබෝධ වන හෙයිනි. එහෙයින් එහි අසංඛාරික යන්න යෙදීම නිෂ්ඵලය, නිෂ්ඵල වචනයක් බුදුරදුන් නොදක්වන සේක. එම සකස් වීමකින් දෙවෙනි සිතක් වශයෙන් පෙන්විය හැකි හෙයින්, දෙවෙනි සිතෙහි සසං ඛාර යනුවෙන් දක්වා වදාල සේක. තුන්වන සිත ඤාණ විප්පයුත්ත වීම නිසාද වෙනම සිතක් වශයෙන් ගන්නා ලදී.

සතරවෙනි සිත තුන්වෙනි සිතෙහි සකස්වීම ඇතිව පහළ වූ හෙයින් වෙනම ගන්නා ලදී. 5, 6, 7, 8 සිත් උපෙක්ෂා වේදනාවෙන් ඉහත සඳහන් කුසල් සතරමය. සිත අටකට බෙදී ඒ ඒ අවස්ථාවන්හි පහළවීම මෙසේ වටහා ගත යුතු ය. ධම්ම සංගණියේ දක්වූ අයුරු කාමාවචර කුශල් සිත් මෙසේ දක්විය හැකි ය.

1. සොමනස්ස සහගත ඤාණ සම්පයුත්ත සිත
2. සොමනස්ස සහගත ඤාණ සම්පයුත්ත සසංඛාරික සිත,
3. සොමනස්ස සහගත ඤාණ විප්පයුත්ත සිත,
4. සොමනස්ස සහගත ඤාණ විප්පයුත්ත සසංඛාරික සිත,
5. උපෙක්ඛා සහගත ඤාණ සම්පයුත්ත සිත,
6. උපෙක්ඛා සහගත ඤාණ සම්පයුත්ත සසංඛාරික සිත,
7. උපෙක්ඛා සහගත ඤාණ විප්පයුත්ත සිත,
8. උපෙක්ඛා සහගත ඤාණ විප්පයුත්ත සසංඛාරික සිත...

සංස්කාරික වීමෙන් පළමු එකම සිත දෙකක් වූ සැටි පැහැදිලි ය. ඊළඟට ඤාණ විප්පයුක්ත වීමෙන් එම දෙක සතරක් වූ සැටි පැහැදිලි ය. එසේම උපෙක්ෂාවගේ යෙදීමෙන් එම සතර අටක් වූ සැටි පැහැදිලි ය.

සදෙව්ලොව මිනිස්ලොව සැරි සරණ අනන්ත සත්නට ප්‍රතිසන්ධි ප්‍රවෘත්ති විපාක ලබා දෙන මහා කාමාවචර කුසල සිත් අට මෙසේ අසා දැන විදසුන් වඩා ශාන්ත නිවන් සැප ලබත්වා.

# 38

## නමො සම්මා සම්බුද්ධස්ස

## කුසල භූමි.

"තානිසබ්බානිපි දසහි පුඤ්ඤ කිරිය වත්ථුහිදීපෙතබ්බානි"

ඉහත සඳහන් සියලු කුසල් සිත් හෙවත් කාමාවචර සිත් අට දස පින් කිරිය වතින් දක්විය යුතු ය. මෙයින් අදහස් කරන්නේ එම කුසල් සිත් අට ඉපදීමට පහළ වීමට උපකාර වන පුණ්‍ය ක්‍රියා තමැයි සකස් කළ ඉඩම්ය. එම නිසා ඒවාට පින් කිරිය වත් හෝ කුසල භූමි යැයි නම් කළ හැකි ය. පින් කිරිය වත් දහයෙකි.

| | | | | |
|---|---|---|---|---|
| 1. | දානමය පින් කිරිය වත | | | දන්දීම |
| 2. | සීලමය | ,, | ,, | සිල් රැකීම |
| 3. | භාවනාමය | ,, | ,, | භාවනා කිරීම |
| 4. | අපචිති | ,, | ,, | ගරු කිරීම |
| 5. | වෙය්‍යා වච්ච | ,, | ,, | වත්‍යාවත් කිරීම |
| 6. | පත්තානුප්පදාන පින් කිරිය වත | | | පින්දීම. |
| 7. | අබ්භනුමොදනා | ,, | ,, | පින් අනුමෝදන් වීම |
| 8. | දෙසනා මය | | ,, | දම් දෙසීම |
| 9. | සවන මය | ,, | ,, | දම් ඇසීම |
| 10. | දිට්ඨිජ්ජු කම්ම | ,, | ,, | නිවණට සිත නැමීම. |

හෙවත් සම්මා දිට්ඨිය ඇතිකර ගැණීම යනු මෙම දස පින්-කිරිය වත යි.

### (1) දානමය පින්කිරිය වත.

සිවුරු, පිණ්ඩපාත, සෙනසුන්, ගිලන්පස යන සිව් පසයෙන් යමක් හෝ රූප, ශබ්ද ගන්ධ, රස, ඵොට්ඨබ්බ

ධම්ම යන සවැදෑරුම් අරමුණු වලින් යමක් හෝ ආහාර පාන ගේදොර වතුපිටි යාන – වාහණ, මල් සුවඳ විලවුන් සුවඳ වර්ග, ඇඳ පුටු ආසන පහන් යන දස දාන වස්තූන්ගෙන් යමක් හෝ දෙන තැනැත්තාට ඒවා සකස් කිරීමේ පටන් පූර්වභාග යෙහි ද, පරිත්‍යාග කරණ වේලෙහි හෙවත් දන්දෙන මධ්‍ය අවස්ථාවෙහිද, පසුව සතුටු සිතින් මෙනෙහි කරණ කල්හි ද, යන තුන් කල්හි පරිත්‍යාග චේතනාව දානමය පුණ්‍ය කිරිය වත්ථු නම් වේ

මනුෂ්‍යයකුට නැතිවම බැරි කරුණු සිව් පසය යි. භික්ෂූන් වහන්සේ පිළිබඳව එය චීවරාදී නාමයෙන් දැක්වූ නමුදු හැම දෙනාටම ඇඳීමත්, ආහාරයත්, ඉන්නතැනත් ලෙඩට බෙහෙතුත් අවශ්‍යම ය. ඇතැම් තවුසන් වස්ත්‍රය නොමැතිව තවුස්දම් පුරන්නේ නමුදු බුදු දහමෙහි එය අන්ත කිළමථයට වැටෙනවා පමණක් නොව විලි නොවැසීමෙන් විලිබිය නැතිව යන හෙයින් ස්වාඛ්‍යාත බුදු දහමෙහි චීවර නාමයෙන් මනාව ශරීරය වැසෙන පරිදි බාහිර අලංකාර-යට නොවැටෙන පරිදි බුදුරදුන් සිවුරු අනුදැන වදාළසේක. සිව්පසයට සියල්ල ඇතුළත් වන නමුදු අභිධර්මානුකූලව සාරමුණු වශයෙන් ද, දැක් වූ සේක.

දන්දෙන අවස්ථාවෙහි ඒ ඒ දානවස්තූන් අරමුණුව සිත් පහළ වෙයි. චීවරාදී රූපාරම්මණ දානයක් ද වෙයි. කැප සරුප් පරිදි විහාර බිතු සිතුවම් කරවීමාදිය ද රූපාරම්මණ දාන යෙහි ගැනේ. සර්ණ්ධාර ශබ්ද බෙර, දවුල් ආදී ශබ්දයන් තෙරුවනට ගෞරව උපහාර පිණිස පැවැත්වීමේදී ශබ්දාරම්මණ දානයයි. සුවඳ පූජාව සුවඳ වස්තු පිදීම ගන්ධාරම්මණ දානයයි. රසයෙන් මිහිරි

ආහාර පානාදිය පිදීම රස දානයයි. මෘදු මොළොක් කොට්ට මෙට්ට ආදිය පිදීම ඓාටස්ඨබ්බ දානයයි මරණයට කැප වූ සතෙකු නිදහස් කිරීම ගිලන් උවටැන් බෙහෙත් හේත් පිදීම උකුණු - මකුණු මදුරු ආදී සතුන්ගෙන් වන ගැහැට දුරු කිරීම ද, ජීවිත දානයෙහි ඇතුළත් වන හෙයින් ජීවිතින්ද්‍රිය ධර්මාරම්මණයෙහි ඇතුළත් වන හෙයින් ධර්මාරම්මණ දාන ය යි.

ආහාර පානාදී දස දානවස්තූන් ද සිව්පසයෙහිම ඇතුළත් වෙයි. මෙසේ දානයක් දෙමියි සිතන්නාහු මේ කුසල් සිත් අටෙන් එකකින් සිතිය යුතු හෙයින් එය දානමය කුශලයකි. දෙන වේලෙහිද දෙන්නේ මෙම කුසල් සිත් අටෙන් එකකිනි. දන්දී පසුව සිහි කරණ විට ප්‍රත්‍යවෙක්ෂා කරන්නේ ද මේ කුසල් සිත් අටෙන් එකකිනි. එහෙයින් දානය පින් කමකි.පුණ්‍ය ක්‍රියා වස්තුවකි.

2. සීලමය පින් කිරිය වත.

පන්සිල් අටසිල් දසසිල් සමාදන් වන්නහුට ද පැවිදි වෙමියි විහාරයට යන්නහුටද පැවිදි වන්නහුටද ඉතා හොඳයි මගේ මහණ කම සැපයි යනාදීන් මෙනෙහි කරන්නා ට ද, බුදුරදුන් පැණ වූ විනය නීතීන් රකින කැමවිට ද, චීවරාදී සිව්පසය ප්‍රයෝජන සලකා ප්‍රත්‍ය-වෙක්ෂා කරණ විට ද, හමු වූ රූපාදී අරමුණු වල නැවත නැවතත් ඉන්ද්‍රිය අසන්වරයෙන් බැලීම් ආදියෙන් වෙන්ව ඇස ආදී ඉන්ද්‍රියයන් රක්නා හට ද වෙද හෙදකම් කිරීම ආදී අධාර්මික ජීවිතයෙන් තොරව දැහැමි දිවි පැවැත්මෙහි යෙදෙන්නාහටද පැවැති චේතනා සීලමය පුඤ්ඤකිරිය වත්ථු නම් වේ.

මෙහි දී සිල් පුරන්නට සිතන්නේද අටමහා කාමාවචර කුසල් සිත් වලින් එකකිනි. සිල් රක්නේද එම අටෙන්

එක සිතකිනි. සිල් රැක-මවිසින් සිල් රක්නා ලදැයි තම සීලය මෙනෙහි කරන්නහුට ද ලැබෙන්නේ ඉහත සඳහන් කාමාවචර කුසලයන්ගෙන් එකකි.

සීලය නම් විරති චෛතසිකයයි. විරති චෛතසිකය යෙදෙන සිත්හි චේතනාව සීලමය කුශල කර්මයයි. පුණ්‍ය ක්‍රියාවයි. එහෙයින් මෙහි චේතනාව ප්‍රධානකොට ශීලමය පුණ්‍ය ක්‍රියා වස්තු දක්වන ලදී.

මෙසේ දහම් දැන විදසුන් වඩා ශාන්ත නිවන් සුව
ලබා ගනිත්වා.

---

# 39

නමො සම්මා සම්බුද්ධස්ස.

## භාවනාමය පින් කිරිය වත.

පටි සම්භිදාමග්ගෙන වුත්තෙනන විපස්සනා මග්ගෙන චක්ඛුං අනිච්චතො දුක්ඛතො අනත්තතො භාවෙන්තස්ස -පෙ- ජරාමරණං අ .... දු .....අ ........

පටි සම්භිදා ක්‍රමයෙන් කියන ලද විපස්සනා භාවනා මාර්ගයෙන් ඇස අනිත්‍ය දුක්ඛ අනාත්ම වශයෙන් වඩන්නහුට යනාදීන් භාවනාමය පුණ්‍ය ක්‍රියාව දක්වන ලදී.

ඉහත විස්තර කරණ ලද කාමාවචර මහා කුසල් අට විදශීනාදී භාවනා කිරීමේදී ලැබෙන අයුරු පැහැදිලි කරණු සඳහා පටිසම්පදා මග්ග පාලියෙහි දැක්වූ විදශීනා භාවනාව ධම්ම සංගණී අටුවාවේ නිර්දේශ කළහ.

මෙහි ඇස අනිත්‍ය වශයෙන් දුක්වශයෙන් අනාත්ම වශයෙන් හා කණ නාසය දිව ශරීරය, සිත රූප, ශබ්ද, ගන්ධ, රස පොට්ඨබ්බ, ධම්ම, චක්ඛු විඤ්ඤාණ, සොත, ඝාන, පිව්හා කාය මනොවිඤ්ඤාණයන්ද මෙසේ චක්ඛු සම්ඵස්සාදීන් ද රූපසඤ්ඤාදීන්ද ජරා මරණ අවසන් කොට අනිත්‍ය දුක්ඛ, අනාත්ම වශයෙන් භාවනා කරන්නහුට ලැබෙන චෙතනාද,

අටතිස් අරමුණු වල අර්පණාවට නොපැමිණි සියලු චෙතනාද භාවනාමය පුඤ්ඤ කිරිය වත්ථු නම් වේ.

කාමාවචර කුසල් සිත් අට විපස්සනා සහ සමථ භාවනා කිරීමේදී ලැබෙන අයුරු මෙයින් දක්වන ලදී.

පටිසම්භිදා මග්ග පාලියේ සම්මසන ඤාණ නිද්දේශයේ-

"සංඛිඤ්චිරූපං අතීතානාගත පච්චුප්පන්නං" යනු-වෙන් අතීත අනාගත වර්තමාන යම්කිසි රූපයක් වේද-නාවක් සඤ්ඤාවක් සංඛාරයක් විඤ්ඤාණයක් අනිත්‍යාදි වශයෙන් වවත්ථානය හෙවත් මෙනෙහි කිරීම දක්වා එය විස්තර කිරීම් වශයෙන් "චක්ඛුං අනිච්චතො" යනා-දීන් මෙහි මූල සඳහන් පරිදි විදර්ශනා භාවනාව දක්වූ සේක.

පටි සම්භිදා මග්ග පාළියේ–

"චක්ඛුං – පෙ – ජරාමරණං අතීතානාගත පච්චුප්ප--න්නං" යනුවෙන් ඇසේ සිට ජරාමරණ අවසන්කොට නාම රූපයන් හතලිස් අටක් විදශීනා භාවනාවට පහසු වන පරිදි දක්වා ඇත.

එනම්, ඇස, කණ, නාසය, දිව, ශරීරය, සිත (6)

රූප, ශබ්ද, ගන් ධ, රස, ඵොට්ඨබ්බ, ධම්ම, (6)

චක්ඛු විඤ්ඤාණ, සොත, ඝාණ, ජිව්හා, කාය, මනො විඤ්ඤාණ, (6)

චක්ඛු සම්ඵස්ස, සොත, ඝාණ, ජිව්හා, කාය, මනො සම්ඵස්ස (6)

චක්ඛු සම්ඵස්සජා වෙදනා, සොත, ඝාණ, ජිව්හා, කාය මනොසම්ඵස්සජා වෙදනා (6)

රූප සඤ්ඤා, සද්ද, ගන්ධ,' රස, ඵොට්ඨබ්බ, ධම්ම, සඤ්ඤා, (6) අවිජ්ජා, සංඛාර, විඤ්ඤාණ, නාමරූප, සළා-යතන, ඵස්ස, වෙදනා තණ්හා, උපාදාන, භව, ජාති, ජරාමරණ, (12) මේ සතළිස් අට මැදූරුම් නාමරූපයන් අතීතාදී වශයෙන් එකක් එකක් පාසා අනිත්‍යාදී වශයෙන් සම්මර්ශනය කිරීමේදී මේ විපස්සනා කුශල සිත් අට-වැදූරුම් කාමාවචර සිත්මය, සම්මර්ශනය හෙවත් මෙනෙහි කිරීම කරන්නේ අටවැදූරුම් කාමාවචර සිතකින්මය.

අනිච්චතො වවත්ථපෙති, යනුවෙන් උගන්වන්නේ අනිච්චං අනිච්චං යනුවෙන් කිය කියා හෝ සිත සිතා ඉදීම නොවේ. වවත්ථපෙති යනු ව්‍යවස්ථාපනය කෙරේ. හෙවත් සනිටුහන් කෙරේ. මෙසේ මෙසේ යැයි වටහා ගණී. අවබෝධ කෙරේ යන තේරුමයි. එසේ අවබෝ-ධය ලැබෙන්නේ මුල සිට විදර්ශනා භාවනාව කරණ අයටය. එසේ විදර්ශනාව පටන්ගැණීම විසුද්ධි මග්ගයේ දක්වා තිබෙන්නේ නාමරූපයන් ඔවුන්ගේ සභාවලක්ෂණ රස, පච්චුපට්ඨාන පදට්ඨාන වශයෙන් මෙනෙහි කිරීමෙන් ය.

"තෙසං තෙසං ධම්මානං පච්චත්ත ලක්ඛණ සල්-ලක්ඛණ වසෙන පවත්තා පඤ්ඤා ඤාත පරිඤ්ඤා නාම."

ඒ ඒ නාමරූපධර්මයන්ගේ තම තමන්ට වෙන වෙනම අයිති ලක්‍ෂණ සැලකීම වශයෙන් හෙවත් මෙනෙහි කිරීම් වශයෙන් පැවති ප්‍රඥාව ඤාත පරිඤ්ඤා නම් වේ.

"රුප්පන ලක්ඛණං රූපං"

මුළු මහත් රූපස්කන්ධයම පොදුවේ රුප්පන ලක්‍ෂ-ණය සවභාව කොට ඇත්තේය එහෙත් එසේ මුළු මහත් රූපස්කන්ධයම අරමුණුකොට විදර්ශනාව බුද්ධාදී උතුමන්ට හැර අනිත් අයට නොලැබේ,

එහෙයින් චක්ඛුං අනිච්චතො ආදී වශයෙන් විදර්ශනාව දක්වන ලද බව සැලකිය යුතු ය. ඇස අනිත්‍යාදීන් වවත්-ථානය හෙවත් සලකා බැලීම කෙරෙන්නේ ඇසෙහි ලක්‍ෂණ රසාදී යම්කිසි අයුරකින් පවත්නා හෙවත් වර්තමාන ඇස අරමුණු කිරීමෙනි. පවත්නා ඇස නම් එවෙලෙහි හටගත් චක්ඛු ප්‍රසාදයයි හෙවත් සිතියට පැමිණී චක්ඛු රූපයයි.

ඇසෙහි ලක්ෂණ නම්:-

"රූපාභි ඝාතාරහ භූතප්පසාද ලක්ඛණං" රූපය වැද ගැණීම ඇසතුළ රූපය වැටීම හෙවත් ඡායාව වැද ගැණීම වශයෙන් දැනීමයි. එය "පෙනීම හෝ ඇසෙහි දැකීමයි. එහෙයින් එසේ පෙනීම හෝ දැකීම ආදී වශයෙන් ඇස මෙනෙහි කිරීම සිදු වෙයි.

ඒ වර්තමාන චක්ඛුප්පසාද රූපයයි, රූපාරම්මණයක් ගණිමින් පවත්නා බව නිසා එය වර්තමාන බව වැටහෙයි. එවිටම චක්ඛුවිඤ්ඤාණ සිතද පහළ වෙයි.

මෙසේ එකෙණෙහි මෙන් පහළවන මේ නාමරූපයන් සියල්ලම "දැකීම්" පෙනීම් ලක්ෂණයෙන් අරමුණු කිරීම විදර්ශනාවේ පටන්ගැන්මයි. එසේ අරමුණු කරණ මෙනෙහි කරණ යෝගියාට රූපයාගේ නොපෙනීයාමෙන් - ශබ්දයාගේ නොඇසීයෑමෙන් ආදී වශයෙන් මේ චක්ඛුපසාද රූපාදිය බිඳියන බව ඇතිව නැතිව යනබව සැලකෙන නුවණක් පහළ වේ. එයයි වවත්ථාන නාමයෙන් දැක්වූයේ, සම්මසන නාමයෙන් දැක්වූයේ. අනිච්චං දුක්ඛං අනත්තා ආදී වශයෙන් මෙනෙහි කළ යුතු නම් සතනානුපස්සනා වශයෙන් නිබ්බිදා, විරාග නිරෝධා පටිනිස්සග්ගා ආදී ආකාරයෙන් හෝ සතළිස් ආකාරයෙහි රෝගතො ගණ්ඩතො ආදී වශයෙන් සිතිය යුතු හා කියයුතු වන්නේය.

එහෙත් අනිච්චාදිය මෙන්ම ඒවාද වැටහීම මිස කියා සිතා කිරීම නොවේ. මෙසේ මෙයින් විදර්ශනාවට පටිච්ච සමුප්පාදයත් සමග ඒ හැම එකක්ම ක්‍රමයෙන් දියුණුවන විදර්ශනාවට ලැබෙන බව දක්වන ලදී.

සම සතළිස් කමටහන් භාවනාවක් සමථ වශයෙන් දක්වා ඇත. මෙහි ආලෝක අවකාශ කසිණයෙන් හැර ඉතිරි අටතිස් අරමුණු ගන්නා ලදී. ආලෝක කසිණය තෙජො කසිණ යෙහිත් අවකාශ කසිණය ඕදාත කසිණයෙහිත් පහසුවෙන් ඇතුළත් වේ. එහෙයින් අටතිස් අරමුණු යැයි කියන ලද නමුදු සමසතළිස් කමටහණම ගැනේ.

මුල සිට උපචාරය තෙක්ම මෙම සමථ භාවනා කෙරෙත්තේද කාමාවචර කුසල සිත් අටෙනි විදර්ශනා-වෙහි ගොත්‍රභූ සිතතෙක් කාමාවචර ය

මෙසේ භාවනාමය පින් කිරිය වන දැන විදර්ශනා වඩ ශාන්ත නිවන් සුව ලබත්වා.

# 40

## නමො සම්මා සම්බුද්ධස්ස

### 4. අපචිති සහගත පින්කිරිය වත.

පිදිය යුත්තන් පිදීම අපචායන හෙවත් අපචිති නම් වේ. වයසින් වැඩිමහලු නම් වෘද්ධ අපචායනය යනුවෙන් වයසින් වැඩිහිටියන්ට ගරු කිරීම වැඳීම පිදීම සිදු කරන් නේ ද අටවැදෑරුම කාමාවචර කුසල් සිතකිනි. සීලාදී ගුණ සම්පත්තියෙන් තමන්ට වැඩි නම් වයසෙන් අඩු වුවද වැඳුම් පිදුම් ගරු බුහුමන් කළ යුතුය. ශීලාදී ප්‍රතිපත්තීන් එක හා සම නම් වයසින් වැඩිහිටියාට වැදීම් පිදීම් ගරු බුහුමන් කළ යුතු ය. මේ අනුව පන්සිල් රක්නා අය තමන්ට වඩා කෙතරම් ලාබාල වුවද අටසිල් දසසිල් පැවිදි සිල් රක්නා අයට ගරු කළ යුතු ය. මෙසේ ගුණ-යෙන් හා වයසින් වැඩිහිටියනට වැඳුම් පිදුම් ගරු බුහුමන් පෙර ගමන් පා සිවුරු පිළිගැනීම් ආදිය කිරීම අටමහා කාමාවචර කුශලයන් රැස්කර ගැණීමයි.

### 5 වෙය්‍යාවච්චසහගත පින්කිරිය වත.

මේ වනාහි වතාවත් කිරීමේ පින්කම යි. වෙහෙර විහාරයන්හි වත් පිළිවෙත් කිරීමයි. බුදු පියාණන් වහන්සේ ගිහි පැවිදි විනයෙහි මෙම වත් පිළිවෙත් විශේෂයෙන් සඳහන් කොට ඇත. ගුරුවරයාට පැවිදි ශිෂ්‍යයා මත් සියයක් පමණ කළ යුතු ය. එම ශිෂ්‍යයා ඉතා හික්මුණු දමුණු ඉවසීමක් ඇති උගත් උතුමකු බවට පත් වන්නේ ගුරුන් ඇසුරෙහි සවකීය යුතුකම් කොටස ඉටු කිරීමෙනි. ගිහි හෝ පැවිදි හෝ යමෙක් වත් පිළිවෙත් නොකරයි. නම් නොහික්මුණු අශික්ෂිතයෙක් වේ. විශේෂයෙන් බුදු දහමෙන් හැඩ ගැසුණු බෞද්ධ සමාජයක් දක්නට

ලැබෙන්නේ මේ වත් පිළිවෙත් ඉටු කරණ බෞද්ධයන්ගෙනි. එසේම වත් පිළිවෙත් ඉටු කිරීම් ද, මෙම කාමාවචර කුසල සිතින් කළ යුතු ය.

### 6. පත්තානුමෝදන පින් කිරිය වත

පත්ති යනු පැමිණ වීමයි. පත්ති අනුප්පදාන යනුවෙන් පින් පැමිණවීම ප්‍රාප්ති දානය ගැණේ. දන්දී පූජා කොට අසවලාට මේ පින් පමුණුවමියි හෝ සියලු සතුන්ට මේ පින් අනුමෝදන් කරවමියි හෝ පින්දීම පත්තානුප්පදාන පින්කිරීය වත යි. මෙය ඇත අතීතයේ සිට එන තමන්ගේ සිතෙහි තමන් කළ කුශලය අරමුණු කොට ද, අනුන් කෙරෙහි කරුණා මෛත්‍රිය ඇති කර ගණිමින් ද සිදු කරණ වටිනා පින්කමකි. පින්දීමෙන් තමන් කළ කුශලය දියුණු වනවා මිස අඩු නොවේ. අනින් තැනැත්තා අනුමෝදන් වූවද නොවූවද තමන්ට පින් සිදු වේ.

### 7. අබ්භනුමෝදනා පින් කිරිය වත.

අභි හෙවත් විශේෂයෙන් අනුමෝදන් වීමේ පින්කමයි. අනුන් විසින් අනුමෝදන් කළ පින තමන්ද අනුමෝදන්වීම හෝ අනුන් පිණක් කරණවා දැක සාධු යහපතියි කියා වෙසෙසින් අනුමෝදන් වීමයි. තමන්ගේ සිත්හි ඊර්ෂ්‍යා කුහක අකුශලයන් දුරුකොට ගෙන පින් කරන්නහුගේ කුශලයට අනුව සතුටු වීමෙන් තමන්ට ද, එවැනි කුසල් සිත් පහළ කර ගැණීම මෙයින් අදහස් කෙරේ. මෙසේ පින් අනුමෝදන් වන්නේද කාමාවචර කුසල් සිත් අටෙන් එකකිනි.

### 8. ධම්මදෙසනා පින් කිරිය වත

තමන් ප්‍රගුණ කළ ධර්මය ලාභ කීර්ති ආදියෙන් බලාපොරොත්තු නොවී හිතවත් සඳහා අනුන්ට දේශනා කිරීම ධම්ම දේශනා පින් කිරිය වත යි.

## 9. සවණමය පින්කිරිය වත.

තමන් සැදැහැවතෙක්ය යනාදීන් හැඟවීමක් නැතිව මෙසේ ධම්ශ්‍රවණය මහත් ඵලය මහානිසංසයැයි සලකා මෘදු වූ හිත වැඩ සලකා ගන්නා සිතින් බණ ඇසීම සවණ මය පින් කිරිය වත යි.

## 10. දිට්ඨිජ්ජුකම්ම පින්කිරිය වත.

දිට්ඨිය හෙවත් සම්මාදිට්ඨිය සෘජු කර ගැණීම දිට්ඨි ජ්ජුකම්මයයි. මෙහි උජුකම්ම යනුවෙන් හැඳින්වෙන්නේ නිවණට එල්ල කොට කුසල් සිත තබා ගැණීමයි. සියලු කුසල්ම නිවන් සඳහා කිරීමෙන් දිට්ඨිය සෘජු කිරීම සියලු කුසලය කම ලැබේ. එයින් අදහස් කරන්නේ නිවන් තකා කරණ කුශල්, ඤාණ සම්පයුත්ත වන බවයි. ඤාණ විප්ප යුත්ත කුසල් සිත්වල දිට්ඨිය උජු කිරීමක් නොලැබේ. එහෙයින් ඤාණ සම්පයුත්ත සිත් වලින් කෙරෙණ දාන සීලාදී සියලු කුසල් මේහි දී ගත යුතු ය.

මෙම දශ කුශල වස්තූන් ප්‍රධාන වශයෙන් දාන සීල භාවනා කුසල් වත් තුණෙහි ඇතුලත් වේ.

1. පින්දීම, පින් අනුමෝදන්වීම දානමයකුසල යෙහි ය.
2. වැඩිහිටියන් පිදීම, වතාවත් කිරීම, සීලමය කුශල යෙහි ය.
3. ධම්මදෙසනා, සවණදිට්ඨිජ්ජුකම්ම භාවනාමය කුශල යෙහි ද වැටේ.

මෙම පින් කිරියවත් දහයට තව දෙකක් එක්කොට දොළොස් පින්කිරිය වතක් ද, දක්වා ඇත. එනම් අනුස්සති ප්‍රසංසා යනුවෙනි. අනුස්සති යනු භාවනා කිරීමෙහි වැටේ. කළ පින් මෙනෙහි කිරීමද දිට්ඨිය සෘජු කිරීමෙහි භාවනා යෙහි වැටේ. තෙරුවන්ට ප්‍රසංසා කිරීම එසේම ගුණවතු

නට ප්‍රසංසා කිරීම ද, එසේම භාවනා කිරීමෙහි වැටේ. මේ සියලු කුසලයන් කරණවිට ඤාණසම්පයුත්ත කුශල යන්ම දිට්ඨිජ්ජු කම්ම වේ. විශේෂයෙන් විදර්ශනා භාවනා කිරීමේදී ඤාණසම්පයුත්ත කුශලයන් වඩාත්ම ලැබෙන හෙයින් දිට්ඨිජ්ජු කම්ම ය භාවනාවෙහි ප්‍රධාන වශයෙන් ඇතුළත් වේ.

අහස අනන්තය.

සක්වල අනන්ත ය.

සත්වනිකාය අනන්ත ය.

බුදුණුවන අනන්ත ය.

ඇතැම් නූගත් බෞඩයෝ අනන්ත වූ සත්වයන් අන්ත කරන්නට බලති. කෙසේ හෝ කවදා හෝ නිවන් දැක සත්වයන් අන්තයට පැමිණෙතැයි ඇතැම් අය සිතති අනන්ත වූ දෙයක් අන්තයක් නැති දෙයක් අන්තයකට පත්වේයැයි සිතීම ධර්මය නොදැනීමක් අනවබෝධයක් මිස අනිකක් නොවේ. අනන්ත වූ බුදුනුවණින් අනන්ත වූ සත්වයන්ගේ සිත්හි පහළ වන කාමාවචර කුශලයන් මෙසේ දක්වා වදාළ සේක.

මේ කුශල් රැස්වීම සය ආකාරයට සිදු වන බවද දක්වා තිබේ.

1. සයංකාර හෙවත් තමාම සිතා කිරීමෙන්,
2. පරංකාර-අනුන්කරණු දැක අසා කිරීමෙන්,
3. සාහත්ථික-තමා අතින් කිරීමෙන්,
4. ආණත්තික-අණකොට කරවීමෙන්,
5. සම්පජාන-කර්මය ඵලය අදහා කිරීමෙන්,
6. අසම්පජාන-කර්මය ඵල නොදැන කිරීමෙන්.

මෙහිසින් සම්පජාන කුසලය ඤාණසම්පයුත්ත ය. අසම්පජානය ඤාණ විප්පයුත්තය. ඉතිරිවා දෙකම විය හැකි ය.

**දක්ෂිණා විශුද්ධි සතරකි.**

1. ප්‍රත්‍යයාගේ දැහැමි බව ධාර්මික වස්තුවක් වීම.
2. චේතනා මහත් බව හෙවත් ශ්‍රද්ධාවෙන් නුවණින් යුක්ත බව,
3. වස්තුසම්පත්ති හෙවත් රහතන් වහන්සේ කෙනෙකු දානය පිළිගැණීම,
4. ගුණාතිරේකතා හෙවත් රහතන් වහන්සේ නිරෝධ සමාපත්තියෙන් නැගී සිටීම,

මේ කරුණු සතර එක්කොට දන්දීමාදී වශයෙන් උපදවන කාමාවචර කුශලය එම අත්බවම විපාක දෙන්නේය

මෙසේ කුසල් දන අකුසල් දුරුකොට විදසුන් වඩා ශාන්ත නිවන් සැප ලබත්වා.

# 41

## නමො සම්මා සම්බුද්ධස්ස

**විසි වැදෑරුම් කාමාවචර කුසලනය.**

කතමෙ ධම්මා කුසලා ?

යස්මිං සමයෙ කාමාවචරං කුසලං චිත්තං උප්පන්නං හොති සොමනස්ස සහගතං ඤාණ සම්පයුත්තං.

1. හීනං
2. මජ්ඣිමං
3. පණීතං
4. ඡන්දාධිපතෙය්‍යං
5. විරියාධි පතෙය්‍යං
6. චිත්තාධි පතෙය්‍යං
7. විමංසාධි පතෙය්‍යං
8. ඡන්දාධි පතෙය්‍යං හීනං
9. ඡන්දාධි පතෙය්‍යං මජ්ඣිමං
10. ඡන්දාධි පතෙය්‍යං පණීතං
11. විරියාධි පතෙය්‍යං හීනං
12. විරියාධි පතෙය්‍යං මජ්ඣිමං
13. විරියාධි පතෙය්‍යං පණීතං
14. චිත්තාධි පතෙය්‍යං හීනං
15. චිත්තාධි පතෙය්‍යං මජ්ඣිමං
16. චිත්තාධි පතෙය්‍යං පණීතං
17. විමංසාධි පතෙය්‍යං හීනං
18. විමංසාධි පතෙය්‍යං මජ්ඣිමං
19. විමංසාධි පතෙය්‍යං පණීතං

කුසල ධර්ම මොනවාද ? යම් වේලාවක කාමාවචර කුසල සිතක් උපන්නේ වේ ද ? සොම්නස් සහගත නුවණ හා යෙදෙන

1. හීන
2. මධ්‍යම,
3. ප්‍රණීත,
4. ඡන්දය අධිපතිකොට,
5. විර්ය අධිපතිකොට,
6. සිත අධිපතිකොට,
7. විමසුම අධිපතිකොට,
8. ඡන්දය අධිපති හීන වූ,
9. ඡන්දය අධිපති මධ්‍යමවූ,
10. ඡන්දය අධිපති ප්‍රණීත වූ,
11. විරිය අධිපති හීන වූ.
12. විරිය අධිපති මධ්‍යම වූ,
13. ,, , ප්‍රණීත වූ,
14. සිත අධිපති හීන වූ,
15. ,, ,, මධ්‍යම වූ,
16. සිත අධිපති ප්‍රණීත වූ,
17. විමසුම අධිපති හීන වූ,
18. ,, ,, මධ්‍යම වූ,
19. ,, ,, ප්‍රණීත වූ,

එසමයෙහි ඵස්සය මුල්කොට අවික්ඛෙපය අවසන් කොට සපනස් චෛතසිකයක් යෙදේ.

කාමාවචර කුසල් සිතත් එහි චෛතසිකත් ඒ සිත් ඇතිවන දස පින් කිරියවත් ද දක්වා සියලු ලෞකික කුසලයන් අවසානයෙහි බෙදා වදාළ තැන එක කාමාවචර කුසල සිතක් පිළිබඳ විසි වැදෑරුම් න්‍යායයක් දක්වා වදාළ සේක. ධම්ම සංගණියේ මුලින් ම දක්වූ සුද්ධික නයක් සමග විස්සක් වන බව සැලකිය යුතු ය. හීන කුසලය නම් ලාමකවූ කුසලයයි. හීන උත්තම දෙකට අතරවූයේ මධ්‍යම කුශල යයි. ප්‍රධාන බවට පත්වූයේ ප්‍රණීත හෙවත් උත්තම කුශලයයි. කුසල් රැස්කරණ වේලෙහි හීන වූ ඡන්ද, චිත්ත, විරිය, විමංසාවත් යෙදුණේ හීන කුශලයයි. මධ්‍යම වූ ප්‍රණීතවූ ඡන්දාදීන් යෙදුණේ මධ්‍යම වූ ප්‍රණීත කුසල් ය.

මෙහිදී ධම්ම සංගණියේ පළමුව දක්වන ලද සොමනස්ස සහගත ඤාණසම්පයුත්ත සිත හීන මධ්‍යම ප්‍රණීත වශයෙන් ද ඡන්ද චිත්ත විරිය විමංසාවන් අධිපති කොට සතරක් වශයෙන්ද ඡන්දාධිපති හීන මධ්‍යම ප්‍රණීත විරියාධිපති හීන මධ්‍යම ප්‍රණීත චිත්තාධිපති හීන මධ්‍යම ප්‍රණීත, විමංසාධිපති හීන මධ්‍යම ප්‍රණීත වශයෙන් ද විසිවැදෑරුම් මහානය දක්වන ලද බව සැලකිය යුතුය.

ධම්මසංගණියේ පළමු කොට ම කාමාවචර සිත දක්වා වදාළ නයද, හීන වශයෙන් එකක් ද, මධ්‍යම වශයෙන් එකක් ද, ප්‍රණීත වශයෙන් එකක් ද, ඡන්දාධිපති වශයෙන් එකක් ද මෙසේ ඡන්දාධිපතිය අවසන් කොට පහක්ද විරිය චිත්ත විමංසාධිපතීන් අවසන් කොට මෙසේම පහ පහ ගැණීමෙන් විසිවැදෑරුම් නය පෙන්වා නැවත,

පළමු දැක් වූ සුද්ධික නයද
හීන මධම ප්‍රණීත තුණද
ඡන්දාධිපති විරිය චිත්ත විමංසාධි සතරද
ඡන්දාධිපති හීන මධ්‍යම ප්‍රණීත
විරියාධිපති හීන මධ්‍ය ප්‍රණීත
චිත්තාධිපති හීන මධ්‍යම ප්‍රණීත
විමංසාධිපති හීන මධ්‍යම ප්‍රණීත දොළොස් නයද

ගෙණ විසිමහානය දක්වන ලදී. මේ පසුව දැක්වූ ක්‍රමය දේශනා පාළිය සමග ගැළපේ.

හීන මධ්‍යම ප්‍රණීත වත්තේද ඡන්දාදීන් සමඟ යෙදී මෙන් හෙයින් අධිපති සතර සහ සුද්ධික නය වෙනම ගත්විට මේ විසිනය තේරුම් ගැණීමට මූල් ක්‍රමයද උපකාරී වේ. මෙසේ පට්ඨාන මහා ප්‍රකරණයෙහි හීන ත්‍රිකයෙහි බෙදා දක්වන ලදී.

මෙහිදී හීන මධ්‍යම ප්‍රණීත තුණෙහි මධ්‍යම කොටස ගෙණ එය නැවත හීන මධ්‍යම ප්‍රණීත වශයෙන් බෙදා ගෙණ එයින් මධ්‍යම කොටස හැර හීන ප්‍රණීත දෙකගෙන කොටස් නවය නවය කොට 18 වැදෑරුම් කර්ම ද්වාරයෙන් දැක්විය යුතු බව කියන ලදී.

හීන මධ්‍යම ප්‍රණීත

හීන මධ්‍යම ප්‍රණීත

| | |
|---|---|
| 1. හීන හීනයෙහි හීනය | 1. ප්‍රණීත හීනයෙහි හීනය |
| 2. ,, ,, මධ්‍යම | 2. , ,, මධ්‍යමය |
| 3. ,, ,, ප්‍රණීත | 3. ,, ,, ප්‍රණීතය |
| 4. ,, මධ්‍යමයෙහි හීනය | 4. ,, මධ්‍යමයෙහි හීනය |
| 5. ,, ,, මධ්‍යම | 5. ,, ,, මධ්‍යමය |
| 6. ,, ,, ප්‍රණීතය | 6. ,, ,, ප්‍රණීතය |
| 7. ,, ප්‍රණීතයෙහි හීනය | 7. ප්‍රණීත ප්‍රණීතයෙහි හීනය |
| 8. ,, ,, මධ්‍යමය | 8. ,, ,, මධ්‍යමය |
| 9. ,, ,, ප්‍රණීතය | 9. ,, ,, ප්‍රණීතය. |

මෙය පැහැදිලි කර ගැණීමට මෙසේ ද සලකා බලමු.

පළමු කාමාවචර කුසල් සිත ඇතැම්විට හීන වශයෙන්ද මධ්‍යම වශයෙන්ද ප්‍රණීත වශයෙන් ද ඇති වේ.

එම මධ්‍යම සිත් කොටස නැවත හීන මධ්‍යම ප්‍රණීත වශයෙන් ඇති විය හැකි ය.

එහි හීන ප්‍රණීත දෙකෙහි හීන මධ්‍යම ප්‍රණීත සිත් 18 කර්ම ද්වාර වශයෙන් ගෙණ ක්ෂත්‍රියයන් දහඅටක් බ්‍රාහ්මණයන් දහ අටක්ද වෛශ්‍යයන් දහ අටක්ද ශුද්‍රයන් දහ අටක්දැයි මෙසේ අනේකාකාර සිත් නිසා සත්වයාගේ ප්‍රති සන්ධිය සිදුවන අයුරු හා භාරද්වාජාදී සතලිස් අටක් ගොත්‍රයන්ද පහළ විය හැකි බව ධම්ම සංගණියේ දක් වේ.

ලෝකයෙහි හැමදම මනුෂ්‍ය වර්ගයා නොයෙක් ජාති ගොත්‍ර වශයෙන් බෙදී වෙන් වී වෙනස් වී දක්නා ලැබේ.

එක මවු කුස එකට උපන් නිවුන්නන් පවා අසමාන රූප යෙන් සිතුම් පැතුම් ගති සිරිතින් යුක්තය. එසේ වීමට හේතුව ඔවුනොවුන් ප්‍රතිසන්ධි ගන්නා සිත්හි (කර්මයන්හි) අසමාන තාවයයි.

"කම්මං සත්තෙ විභජති යදිදං හීනප්පණීත තාය"

කර්මය සත්වයා හීන ප්‍රණීතාදී වශයෙන් බෙදන බව සූත්‍රාන්තයන්හි දක්වා ඇත.

ඉහත සඳහන් හීන මධ්‍යම ප්‍රණීත කුසල රාශී තුණෙන් මධ්‍යම කුශල රාශිය – මධ්‍යම හීනයෙහි හීන කුශලය ආදී වශයෙන් නොබෙදුයේ ඒවා අහොසි කර්ම ගොඩට ඇතුලත් කිරීමෙනැයි ටීකාවන්හි දක්වා ඇත.

මෙහි විසිවැදෑරුම් මහානය ක්‍රමය බෙදූ අයුරින් තව තවත් බෙදී යෑමෙන් හා ඒවා දස පින් කිරිය විසින් ගුණ වීමෙන් අනන්ත කුශල සිත් පරම්පරාවක් ලැබෙන බව සැලකිය හැකි ය. එසේම සාමාන්‍යයෙන් ටීකාවන්හි කාමාවචර කුසල් අට දස පින් කිරිය වතින් වැඩිකොට 80 ක් ද, එය අරමුණු සයින් වැඩකොට 480 ක් ද, එය අධිපති සතරෙන් වැඩි කොට 1920 ක් ද, කායාදී කර්ම තුණෙන් වැඩි කොට 5760 ක් ද, හීන මධ්‍යම ප්‍රණීත තුණෙන් වැඩි-කොට 17280 ක් කාමාවචර කුශලයන් දක්වන ලදී.

මෙසේ අනේකාකාර චිත්ත විභාගය දූත සියල්ලම වහ වහා ඇති වෙමින් නැතිවන මේ සියලු සංස්කාරයන් අනිත්‍යාදී වශයෙන් විදශීනා කොට ශාන්ත නිවන් සැප ලබා ගණිත්වා.

සිත සිරුර සහ නිවණ ප්‍රථම භාගය නිමි.

591

# සිත සිරුර සහ නිවන

හෙවත්

# ධම්මසංගණී

ද්විතීය භාගය

ආභිධර්මික වාගීශ්වර උපාධි ප්‍රදානයෙන්
සම්මතයි.

ආභිධර්මික වාගීශ්වර පූජ්‍ය වනවාසී
සාගොඩ ධම්මප්‍රභ ස්වාමීන් වහන්සේ විසින්
සම්පාදිතයි.

ආර්. හෙට්ටිආරච්චි මහතා විසින්
ප්‍රකාශිතයි.

591

# සිත සිරුර සහ නිවණ

හෙවත්

# ධම්මසංගණී

සිරිසඟබෝ භාවනා මධ්‍යස්ථානය
කුරුණෑගල පාර
අනුරාධපුරය

## ද්විතීය භාගය

අභිධර්ම පාඩම් 37 කින් යුතුය.

අතිගරු මහානායක අනුනායක ස්වාමීන්ද්‍රවර ප්‍රමුඛ
මහනුවර මල්වතු මහා විහාරීය කාරක මහා සංඝ
සභාවෙන්

"ආභිධර්මික වාගීස්වර"

උපාධි ප්‍රදානයෙන් ප්‍රතිගෘහිතයි.

ආභිධර්මික වාගීශ්වර පූජ්‍ය වනවාසී යාගොඩ ධර්මප්‍රභ
ස්වාමීන් වහන්සේ විසින් සම්පාදිතයි.

ආර්. හෙට්ටිආරච්චි මහතා විසින් ප්‍රකාශිතයි

# සඳහන

---

මේ ධම්ම සංගණියේ විතිය භාගයයි අසනීපාදි නොයෙක් හේතූන් නිසා බලාපොරොත්තු රහිත ලෙස කාලය ගෙවී ගියේය. එහෙත් අබිදහම් ඉගෙනීමෙහි රුචිය නුවණ මේරූ පිරිස අතර බෙහෙවින් දියුණුය. ලංකාවේ බොහෝ උගතුන් පවා අභිධර්මය පිළිබඳ හසල දැනුමක් නොලැබීමෙන් ධර්ම විනිශ්චයෙහි පැකිලෙනු දක්නා ලැබේ. එබැවින් සියල්ලෝම පරමාර්ථ ධර්ම විමංශනයෙහි බැසගත් නුවණ ඇත්තෝ වෙත්වා!

මෙම ගැඹුරු දහම් පොත් පෙළ සැකසීමෙහි අප උනන්දු සහ ආධාර කළ කොළඹ පට්ඨාන ධර්ම මහා සභාවේ ගරු සභාපතිනියවූ සාමවිනිසුරු එච්. ඒ. කල්දේරා මැතිනිය ඇතුළු සියලු නිලධාරීන් සහිත සෑම සාමාජික සාමාජිකාවන්ද ප්‍රථම භාගය පිළිගෙණ ආභිධර්මික වාගීශ්වර උපාධි ප්‍රදානයෙන් අප සසුන් සේවය පැසසූ මහනුවර මල්වතු මහා විහාරීය අතිගරු මහා නායක අනුනායක ස්වාමීන්ද්‍ර ප්‍රමුඛ මහා සංඝ සභාවද ආචාර්‍ය්‍ය උපාධ්‍යාය ධර්මාචාර්‍ය්‍ය සහ දායක කාරකාදී සගෞරව පුණ්‍යානු මෝදනයෙන් සිහිපත් කරමි. ඉතිරි කාණ්ඩ දෙකද හැකිතාක් ඉක්මණින් ඔබ අතට පත් කිරීමට මහත්සි ගණිමු.

**සබ්බෙ සත්තා සුමිතා අභිධම්මිකා හොන්තු**

**යාගොඩ ධර්මප්‍රභ ස්ථවිර.**

විපස්සනා භාවනා මධ්‍යස්ථානය,
අළුත්ගම බෝගමුව,
යක්කල.
ශ්‍රී බුද්ධ වර්ෂ 2511 මැදින් පුර 15.

සිත පිළිබඳ අවශ්‍යයෙන් සෑම බෞද්ධයෙකු විසින්ම දත යුතුවූ මූලික කරුණු දැනගැනීය. මෙතැන් සිට රූපාවචර සිත් ගැන විස්තර කරනු ලැබේ.

## රූපූපපත්තියා

මෙයින් උගන්වන්නේ රූපලෝකයෙහි ඉපදීම පිණිස යන තෝරුමයි. රූප ලෝකය නම් බ්‍රහ්මපාරිසජ්ජාදී රූපාව වර බ්‍රහ්මලෝකයන්ය. එහෙත් "යස්මිං සමයෙ කාමාවචරං කුසලං" යනාදීන් මෙහි මුලදී වදාළ පරිදි "රූපාවචරං" කියා නොදක්වා "රූපූපපත්තියා මග්ගං භාවෙති" යනුවෙන් දක්වා වදාළේ මන්දැයි විමසිය යුතුය. කාමාවචරව සිට එම කාමාවචර භූමින්හි හැසිරීමට උත්පත්ති වශයෙන් පැමිණීමට පුළුවන් සිත් ඉපදවීමද කාමලෝකයෙහි හැසිරීමකි. මෙයින් අදහස් කරන්නේ කාමාවචර සිත්වලින්ම කාම ලෝකයෙහි කුශලාකුශල විපාක වශයෙන් හැසිරීමය.

රූපී බඹලොව ඉපදීමට එයට වඩා උසස් කුශල ශක්තියක් අවශ්‍යය. එය භාවනා කිරීමෙන්ම ලබාගත යුතුය. එබැවින් එය "රූපූපපත්තියා මග්ගං භාවෙති" යනුවෙන් වදාළේක රූප භවයෙහි ඉපදීමට වුවමනා ප්‍රතිපත්ති මාර්ගය හෙවත් උපාය මාර්ගය මෙයින් දක්වන ලදී.

මෙයින් නියම වශයෙන් රූප භවයෙහි ඉපදීම පමණක් සිදුවේදැ? නොවේයි.

"සමාධිං භික්ඛවෙ භාවෙථ, සමාහිතො යථාභූතං ජානාති පස්සති"

මහණෙනි, සමාධිය වඩව්, සමාහිතවූ හෙවත් එකඟවූ සිත් ඇත්තේ ඇතිවූ ආකාරයෙන් දැනගනියි, නුවණින් දකියි.

යනාදී දේශනාවලින් නිබ්බෙධභාගිය හෙවත් විදර්ශනාව සමග නිය සමාධිය රූපභවය ඉක්මවා යෑමට හෙවත් රූපාවචර කුශල්වලින් ලෝකෝත්තර කුසල් ලබා ශාන්ත අජරාමර නිවන් සැප ලබාගැනීමට ද උපකාරවේ.

# 43

## නමෝ සම්මා සම්බුද්ධස්ස

## බඹලොව යන මග.

"යස්මිං සමයෙ රූපූපපත්තියා මග්ගං භාවෙති"

යම් වේලාවක රූපාවචර බ්‍රහ්ම ලෝකයෙහි ඉපදීමට මාර්ගය වඩාද?

ශාන්තිඤාණස සම්බුදුහාමුදුරුවන් වහන්සේ ධම්මසංගණී ප්‍රකරණයෙහි 'රූපූපපත්තියා' යනුවෙන් රූප භවයෙහි උත්පත්තිය ලබාදෙන කුසල් දැක්වූ සේක. රූපභව යනු වෙන් කාම භවයෙන් වෙන්වූ එසේම රූපයෙන් වෙන් නොවූ භවයයි. උත්පත්තියයි. කාමභවයෙනුත් රූප භව යෙනුත් හෙවත් කාමරූප දෙකින්ම වෙන්වූ අරූප භවය කුත් ඇති හෙයින් මෙසේ භවයන්ගේ ඉතා ප්‍රසිද්ධ බෙදීම අනුව ලෞකික කුසල් සිත් බෙදා වදාළ අයුරු සිහිකට යුතුය.

මග්ගං භාවෙති.

මාර්ගය භාවනා කෙරේ ද හෙවත් වඩාද?

''මග්ගොති උපායො'' යනුවෙන් අත්ථසාලිනියේ මාර්ගය නම් උපායයයි දක්වා ඇත. මෙහි අදහස නම් එම රූප උත්පත්තිය පමුණුවයි, සොයයි, උපදවයි, නිෂ්පාදනය කරයි යන තේරුමයි. යම් මාර්ගයෙකින් රූපභවයෙහි උත්පත්තිය ගෙණදෙයිද ඒ මාර්ගය භාවනා කරයි, වඩයි. එය රූපභව යෙහි ඉපදීමට සියලුම භවයන් ඉක්මවා යෑමටත් උපකාරවේ.

මාර්ගය යනුවෙන් චේතනාවටද චේතනාව හා එක්ම යෙදෙන ධර්මයන්ටද ඒ දෙකටමද මාර්ගය යැයි කියනු ලැබේ.

**අපාය මාර්ගය.**

“නිරයං චාහං සාරිපුත්ත පජානාමි, නිරයගාමිංච මග්ගං”

සාරිපුත්ත, මම නිරයත් දනිමි. නිරයට යන මාර්ගයත් දනිමි යන දෙසුමෙහි මාර්ගයැයි වදළේ චේතනාවයි.

මෙහි චේතනාව මාර්ගයැයි නියමකළේ “නානාක්ඛණිකා අකුසලා චේතනා විපාකානං ඛන්ධානං කටත්තා ච රූපානං කම්මපච්චයෙන පච්චයො.”

නානාක්ෂණික අකුසල චේතනාව (ප්‍රතිසන්ධි) විපාක සිත්වලට හා කර්මජ රූපයන්ට කර්මප්‍රත්‍යශක්තියෙන් උප කාරවන බව පට්ඨාන ප්‍රකරණයේ දක්වා වදාළ අයුරු චේතනාවම කර්මය වන හෙයින් මේ දේශනාව අනුව එයම නිරයගාමී මාර්ගය ලෙස ගැණේමෙනි. එහෙත් “මිච්ඡාදිට්ඨි, මිච්ඡා සංකප්ප, මිච්ඡා වායාම, මිච්ඡා සමාධි යන සතර අකුසල මාර්ග අඞ්ගයෝය. (පට්ඨාන දේශනා සාරය 276) යනුවෙන් මාර්ග ප්‍රත්‍යශක්තිය ලබන්නේ නම් චේතනාව නොවන බව පැහැදිලියි.

**දිව්‍ය මාර්ගය.**

“සද්ධා හිරියං කුසලාංච දානං
ධම්මා එතෙ සප්පුරිසානුයාතා
එතංහි මග්ගං දිවියං වදන්ති
එතෙහි ගච්ඡති දෙවලොකං”

ශ්‍රද්ධාව ලජ්ජාව හා කුසල දානයද යන මේ ධර්මයෝ සත්පුරුෂයන්ට අනුකූල වූවාහුය. මේ දිව්‍ය මාර්ගයැයි කියත්. මේ මගින් දෙව්ලොව යත්. මේ ගාථා දේශනාවෙහි චේතනාව හා සෙසුණු සද්ධා ආදී ධර්මයෝ දිව්‍ය මාර්ග ලෙස වදළ හෙයින් චේතනා සම්ප්‍රයුක්ත ධර්මයන්ට මෙහි මාර්ගයැයි වෙන් වශයෙන් දක්වා වදළ සේක.

මෙහිද කුසලචේතනාවම කර්‍ම ප්‍රත්‍යශක්තිය වීමෙන් දිව්‍යලෝකයෙහි ඉපදෙන නමුදු සද්ධා ආදී කුශල චෛතසික ධර්‍මයන් චෙතනමම මාර්ගීය ලෙස දක්වා වදාළේ ඒ ශ්‍රද්ධා ආදීන්ගේ මහත් උපකාරය සලකා සම්බුද්ධ දේශනාඥානයේ මහිමයෙනි.

“අයං භික්ඛවෙ මග්ගො, අයං පටිපදා”

මහණෙනි, ඒ මාර්ගය මේ ප්‍රතිපදාව යැයි මේ සංඛාරූපපත්ති සූත්‍රදේශනාවේ චේතනාවත් එය හා යෙදෙන අනික් චිත්තචෛතසිකයනුත් මාර්ගී යැයි දක්වන ලදී. මෙහිත් අදහස් කරන්නේ චේතනාව ගැන පමණක් හෝ චෛතසික ගැන වෙන් කිරීමක් නැතිව සියල්ල එකට ගෙන (මාර්ගී) කුසල් සිතම මාර්ගීයැයි වදාළ අයුරුයි.

මෙහි ධම්මසංගණියේ රූපූපපත්තියා මග්ගං යන තැන මග්ග ශබ්දයෙන් ගැණෙන්නේ චේතනා සම්පයුත්ත ධර්‍මයකි. ධ්‍යාන හෙවත් ඒකග්ගතා චෛතසිකය එයින් ගැණෙන හෙයිනි. එහෙත් ධ්‍යාන කුසල් සිත්වලද එකග්ගතා චෛතසිකයම බලපවත්වා නමුදු කර්‍ම ප්‍රත්‍යශක්තියෙන් ප්‍රතිසන්ධි විපාක වශයෙන් රූප ලෝකයෙහි ඉපදීම ලබාදෙන්නේ චේතනාවගේම බලයෙනි. එහෙයින් චේතනාවත් චේතනා සම්පයුක්තයනුත්, යන දෙකටම මෙහි මග්ග ශබ්දය සුදුසු බවද අත්ථසාලිනියේ නිගමනය කර තිබේ. සූත්‍රාන්ත දේශනාවන්හි ඒ ඒ අවස්ථාවන්ට සුදුසු අන්දමට දේශනා කර වදාරා ඇතත් මග්ග යන වචනය චේතනා හා චේතනාසම්පයුක්ත යන්ටම යෙදෙන බව සැලකිය හැකිය.

භාවෙති.

වඩයි. භාවනාමය කාමාවචර කුසල්ද ඇත. එබඳු කාමාවචර කුසල් දානාදී අනික් කුශලයන්ගෙන්ද ලබන හැකිය. එහෙත් ධ්‍යාන කුශලයන් භාවනා නොකර කෙසේවත් නොලැබිය හැකිය. එහෙයින් “භාවෙති” යනු

වෙන් දක්වන ලදී. නමුදු ධ්‍යාන කුශලය ඒකාකාරව දාන ශීලාදීන්ගෙන් මෙන් නොලැබිය හැකිය. චිත්තසන්තතිය දියුණු කිරීමෙන් හෙවත් කාමාවචර වශයෙන්ද දියුණු කොට වඩා ඒ දියුණුවූ කාමාවචර ගෝත්‍රභූ සිතෙහි ආසෙවන ප්‍රත්‍යශක්තිය ලබමින් පහළවන හෙයින් සිතෙහි උසස් වැඩීමක් භාවනාවක් හෙයින්ද "භාවෙති" යනුවෙන් දේශනාකරන ලදී.

භාවෙතීති භාවනා යනුවෙන් භාවනා ශබ්දය පාලි ත්‍රිපිටකයේ බොහෙවින් යෙදී ඇති වචනයකි. එසේ බෞද්ධයන් අතරද භාවනා වචනය බහුලව ව්‍යවහාර වේ. කම්ස්ථානයන්ට හා කම්ස්ථාන වැඩීමටද භාවනා යන වචනය යෙදේ.

"මෙසේ දහම් දැන විදසුන් වඩා ශාන්ත නිවන් සුව ලබත්වා!"

'පමාදං භයතො දිස්වා – අප්පමාදංච ඛෙමතො
භාවෙථට්ඨඞ්ගිකං මග්ගං = එසා බුද්ධාන සාසනී''

ප්‍රමාදය භය වශයෙන් දැක අප්‍රමාදය ක්ෂෙම වශයෙන් දැක අෂ්ටාංගික මාර්ගය වඩව්! මේ බුදුවරයන්ගේ අනුශාසනාවයි.

## 44

### නමෝ සම්මා සම්බුද්ධස්ස

"යස්මිං සමයෙ රූපූපපත්තියා මග්ගං භාවෙති, විවිච්චෙව කාමෙහි විවිච්ච අකුසලෙහි ධම්මෙහි"

යම් වේලාවක රූපී බ්‍රහ්මලෝකයෙහි ඉපදීම සඳහා මාර්ගය භාවනා කෙරේද, කාමයන්ගෙන් වෙන්ව අකුශල ධර්මයන්ගෙන් වෙන්ව.

මග්ගං භාවෙති යන්නෙහි මග්ග යනු විස්තරකර පසු ගිය පාඩමෙහි ඇත.

භාවෙති.

මෙයින් අදහස් කරන්නේ භාවනාකිරීම බවද එය බුද්ධධර්මයේ බෙහෙවින් සඳහන් වචනයක් බවත් දක්වන ලදී.

කාමාවචර කුසල නිර්දේශයෙහි "කාමාවචරං කුසලං චිත්තං උප්පන්නං හොති" යනුවෙන් කාමාවචර කුසල් සිතක් උපන්නේවේද කියා දක්වන ලද්දේ දාන සීලාදී පින්කම් වලින්ද කාමාවචර කුශල් සිත් උපදින හෙයිනි භාවනා කිරීමේද ගෝත්‍රභූ සිත තෙක් කාමාවචර කුශල්ය.

පට්ඨානයේ "අනුලොමං ගොත්‍රභුස්ස ගොත්‍රභු මග්ගස්ස අනන්තර පච්චයෙන පච්චයො" යනුවෙන් කාමාවචරවූ අනුලෝම සිත ගෝත්‍රභූ සිතටද කාමාවචරවූ ගෝත්‍රභූ සිත මාර්ග සිතටද අනන්තර ප්‍රත්‍යශක්තියෙන් උපකාර කරණ බව දක්වා වදාළ සේක. අවිශේෂයෙන් මෙහි ධ්‍යාන සිත්ද සෝවාන් ආදී මාර්ග සිත්ද මාර්ග නාමයෙන් දක්වා වදාළ හෙයින් "රූපූපපත්තියා මග්ගං භාවෙති" යනුවෙන් ධම්ම සංගණියේදී රූපාවචර සිත්ද මාර්ග නාමයෙන් දැක්වීම

දේශනානුකූල බව පිළිගත යුතුය. බුද්ධධර්මයෙහි භාවනා ශබ්දය තවත් ශබ්ද සමග එකතුව "සම්භාවනා, පරිභාවනා, විභාවනා" ආදී වශයෙන්ද දක්නා ලැබේ.

සම්භාවනා නම් ගරු වශයෙන් සැලකීමයි. නොහොත් ගෞරව සැලකිල්ලක් ඇතිවීමයි

"සීලපරිභාවිතො සමාධි මහප්ඵලො හොති මහානිසංසො"

සීලයෙන් පරිභාවිත හෙවත් පුරුදු කොට වඩනලද සමාධිය මහත්ඵල වේ මහානිසංස වේ.

"සමාධිපරිභාවිතා පඤ්ඤා මහප්ඵලා හොති මහානිසංසා"

සමාධියෙන් පරිභාවිත හෙවත් පුරුදුකොට වඩනලද ප්‍රඥාව මහත්ඵල මහානිසංස වේ.

මෙම තන්හි කලක් වඩා පුරුදුකරණලද සීලසමාධීන් ඇතිව භාවනා කොට වඩනලද යන තේරුම ගතයුතුය.

"ඉංස රූපං විභාවෙති, වේදනං සඤ්ඤං සංඛාරෙ, විඤ්ඤාණං විභාවෙති" එසේ නම් රූපය විභාවනා කළ යුතුය. වේදනා සඤ්ඤා සංඛාර විඤ්ඤාණයන් විභාවනා කළයුතුයි යන තන්හි විභාවනා නම් අන්තර්ධාන කිරීමයි එනම් විදර්ශක යෝගියාවී භංගඤාණ අවස්ථාවේදී රූප වේදනාදීන් නැතිව යන සැටි දැකීමද සෝවාන් මාර්ගාවස්ථා වේදී රූපාදී සියලු ධර්මයන් අරමුණු නොවී යෑමද ගතහැකිය.

"චත්තාරො සතිපට්ඨානෙ භාවෙන්ති" සතර සතිපට්ඨාන යන් වඩත් යන තන්හි භාවනා නම් වැඩීමයි. ඉපදවීමයි "රූපූපපත්තියා මග්ගං භාවෙති" යන මෙතන්හිද භාවනා කිරීම ගත යුතුයි. මෙසේ බුද්ධ දහමෙහි භාවනාකිරීම කර්මස්ථාන වැඩීම, භාවනා නාමයෙන් දක්වනලද බව සැලකිය යුතුය.

පුද්ගලයෙකු විසින් භාවනා කිරීමෙන්ම ලැබිය යුතු හෙයින් මෙහි භාවෙති- වඩයි, කියා කතෘ කෙනෙකු හෙවත් පුද්ගලයෙකු ගන්නා ලදී.

විවිච්චෙව කාමෙහි.

කාමයන්ගෙන් වෙන්ව, බැහැරව යන තේරුමයි. පළමුවැනි ධ්‍යානයට පැමිණ වාසය කරණ කල්හි කාම සිත් නැත. පළමුවැනි ධ්‍යානයට ප්‍රතිපක්ෂ හෙවත් විරුද්ධ හෙයින් කාමයන්ගේ තාවකාලික දුරුකිරීමෙන් ප්‍රථම ධ්‍යානයට පැමිණීම දක්වයි.

මෙහි ප්‍රථම ධ්‍යානයාගේ අධිගමය සමගම කාමයන්ගේ ප්‍රහාණය දතයුතුය. ප්‍රථම ධ්‍යානය සමගම වස්තුකාමයෙන් දුරුවීමත් ක්ලේශ කාමයවූ කාමච්ඡන්දයාගෙන් විෂ්කම්භණ වශයෙන් ඈත්වීමත් සිදුවෙයි. මෙහි "විවිච්ච එව කාමෙහි" යන තැන එව ශබ්දයෙන් කාමයන්ගෙන් ඈත්නොවී කෙසේවත් ධ්‍යානයක් උපදවිය නොහැකි හෙයින්ම එසේ දක්වන ලද්දේ එය කෙළින්ම විරුද්ධ ධර්මය හෙයිනි.

"විවිච්ච අකුසලෙහි ධම්මෙහි" කියනලද පාඨයෙහිද එව ශබ්දය නිරායාසයෙන් වැටේ. එවිට ඉතිරි නීවරණ අකුශල යන්නෙන්ද වෙන්වම යන තේරුම ගෙණදෙයි.

මෙම පද දෙකින් කාය විවේක චිත්ත විවේක විෂ්කම්භණ විවේකයන් ගන්නාලද බව අට්ඨසාලිනියේ සඳහන්ය. කෙලෙසුන් විෂ්කම්භනය කිරීමෙන් ධ්‍යාන ලැබීම චිත්ත විවේකයමයි.

කාමයන් නම් මෙහි වස්තුකාම ක්ලේශකාමයි.

වස්තුකාම නම් මනාපවූ රූප ශබ්දාදියයි. ක්ලේශකාම නම් කාම තණ්හාවයි. කාම තණ්හාව දුරුකිරීමට වස්තුකාම යන්ද දුරුකළ යුතුයි. වස්තුකාමයෙන් දුරුවීම කාය විවේකයයි. එයට ශීලය උපකාරිය —

විවිච්ච අකුසලෙහි ධම්මෙහි. අකුශල ධර්මයන්ගෙන් වෙන්ව, මෙහිදී ක්ලේශකාම නාමයෙන් ගැණෙන ලෝභ

යද අකුශලයක් හෙයින් එයෙන් සමසම අකුසලයක්ගෙන් මෙන්ම යති ගතයුතුය. මෙයින් විපාක විවේකය සම්පූර්ණ කොට කියැවේ.

විවිච්චෙව කාමෙහි යන මෙයින් වස්තුකාමයද ගන්නා හෙයින් කාම සුඛ පරිත්‍යාගය කියැවේ.

විවිච්ච අකුසලෙහි ධම්මෙහි යන මෙයින් නෙක්ඛම්ම සැපය ලංකාරගැණීම කියැවේ මෙසේ මේ දෙකින් කිලුටු වන වස්තූන්ද කිලුටද ලෝලභාවය හා බාල භාවයද ප්‍රයෝගශුද්ධිය හා සිතෙහි සුද්ධියද ගන්නා ලදී.

අකුසලයන් දක්වන බොහෝ තන්හි (විභංගය ආදී) කාමච්ඡන්දාදී නීවරණයන් දක්වන ලදී ඒ ධ්‍යානාංගයන්ට කෙළින්ම විරුද්ධවන හෙයිනි.

එනම්:- "සමාධි කාමච්ඡන්දස්ස පටිපක්ඛො" සමාධිය කාමච්ඡන්දයට විරුද්ධය.

"පීති බ්‍යාපාදස්ස"- ප්‍රීතිය ව්‍යාපාදයටද,

"විතක්කො ථිනමිද්ධස්ස" විතර්කය ථිනමිද්ධයටද,

"සුඛං උද්ධච්ච කුක්කුච්චස්ස" සැපය උද්ධච්චකුක්කුච්චයටද "විචාරො විචිකිච්ඡාය" විචාරය විචිකිච්ඡාවටද හරි කෙළින්ම විරුද්ධය.

මෙසේ මෙයින් නීවරණ පහම ගැණෙන බව හා පළමු පදයෙන් කාමච්ඡන්දයද දෙවෙනි පදයෙන් සෙසු නීවරණයන්ද පළමු පදයෙන් ලෝභයද දෙවෙනි පදයෙන් ද්වේෂ මෝහයන්ද මේ ආදී වශයෙන් ගත් බවද පළමු පදයෙන් ලෝභයුක්ත අකුසල් සිත් අටද දෙවෙනි පදයෙන් අනිත් අකුසල්ද ගත් බව සලකා කුසල් පුරා ශාන්ත නිවන් සැප සිද්ධ කටයුතුය.

# 45

## නමෝ සම්මා සම්බුද්ධස්ස

"යස්මිං සමයෙ රූපූපපත්තියා මග්ගං භාවෙති, විවිච්චෙව කාමෙහි විවිච්ච අකුසලෙහි ධම්මෙහි, සවිතක්කං සවිචාරං විවෙකජං පීතිසුඛං පඨමජ්ඣානං උපසම්පජ්ජ විහරති පඨවිකසිණං."

යම් වේලාවක රූපී බ්‍රහ්මලෝකයෙහි ඉපදීම සඳහා භාවනා කෙරේද? කාමයන්ගෙන් වෙන්ව, අකුශල ධර්මයන් ගෙන් වෙන්ව, විතර්ක සහිතවූ විවේකයෙන් උපන් ප්‍රීතිය හා සැපය ඇති පඨවිකසිණ පළමුවැනි ධ්‍යානයට පැමිණ වෙයේ.

ශාන්තිනායක සම්බුදුපියාණන් වහන්සේ වදාළ රූපාවචර පළමුවැනි ධ්‍යාන සිත මෙයින් දක්වූ සේක.

මෙයින් අද විස්තරවන්නේ සවිතක්ක යන වචනයේ සිටය.

**දෙවැදෑරුම් අංග**

මෙම ධ්‍යාන සිත ඇතිවන වේලෙහි දුරුවන්න කොටස් (ප්‍රහාණාංග) එක්වෙන කොටස් යැයි අංග දෙකකට බෙදිය හැකිය. එක්වෙන කොටස්වලට සම්ප්‍රයෝග අංග යැයි කියනු ලැබේ.

විවිච්චෙව කාමෙහි විවිච්ච අකුසලෙහි ධම්මෙහි යන පදවලින් දුරුවෙන අංගයන් දක්වන ලදී. එනම් නීවරණ ධර්ම පහයි. පසුගිය පාඩමෙහි ඒවා විස්තර කරණ ලදී.

**සවිතක්ක.**

සම්ප්‍රයෝග හෙවත් එක්වෙන අංගවලින් පළමුකොට දක්වා වදාළේ විතර්කයයි මේ පළමුවැනි ධ්‍යාන සිත විතර්කය සහිත වේ.

සිතෙහි යෙදෙන බොහෝ ස්වභාව හෙයි ඒ ඒ සිත්හි ඒ ඒ ස්වභාවයන් වඩා මතුව පෙනෙන ක්‍රියාකාරත්වයකින් යුතු බව කිවහැකිය.- ඒ ඒ ස්වභාව යන්වලට අනුව සිත් බෙදීම බුද්ධදහමෙහි නියමිතය. ලෝභය අධික ක්‍රියා ශක්තිය කින් ක්‍රියාකරණ සිත් ලෝභ මූලිකය. ද්වේෂය අධික ශක්තියකින් ක්‍රියාකරණ සිත් ද්වේෂ මූලිකය. ප්‍රඥව ක්‍රියා කරණ සිත් ඥාන යුක්තය. මේ ආදී වශයෙනි.

ඒ ඒ චෛතසිකයන් අධිකව ක්‍රියාකිරීමේදී ලෝභාදී යන් එයම ගෙන කථාකරණ බවද කිවයුතුය. මට ලෝභ යක් ඇතිවුණා, තරහගියා, ආදී ව්‍යවහාරයන් අනුව සැලකී මේදී සිතට වඩා ප්‍රධානව සිතෙහි යෙදෙන ගතිය ඉදිරියට එන බව පෙනේ.

කුසල් පැත්තෙහිද මෙසේය. තවද සිතෙහි බලපවත් වන යම් යම් දේ-නිතර මතක්වෙමින් එන ගතියක් තිබේ ඒ වනාහි සති චෛතසිකයයි. එය වැඩක් කරණවිට කලින් අතපසුවූ හෝ මතුවිට කරන්නට තිබෙන දෙයක් ගැන නිතර මතකයට නැගෙයි. මෙය යටිසිතෙහි බලපැවැත් මක් හෝ ක්‍රියාකාරිත්වයක් යැයි සැලකූ මනොවිද්‍යාඥයෝ කොහොමවත් නූපදින යටිසිතක් ගැනද සඳහන් කරති සිතෙහි බලපවත්නා චෛතසිකයන් පිළිබඳ මනා අවබෝධ යක් නැතිකමින් බුද්ධදහමට අනුව කෙසේවත් ඔප්පුනොකළ හැකි යටිසිතක් ගැන බොහෝදෙනා කථාකරන්නේ යම් දෙයක් ගැන බලවත්ව සතිය යෙදුණු සිත අනික් කටයුත් තක් කරද්දීද අනික් චිත්තවීථීන් අතරට ඒ සතිය යෙදුණු සිත්ද විටි වශයෙන් දුවන බව සැලකීමට තරම් අභිධර්මය පිළිබඳ දැනීමක් නැතිකමින් විය යුතුය.

ධ්‍යාන සිත්හි බලපවත්වන චෛතසික අතර විතක්ක විචාර ප්‍රීතිසුඛ ඒකග්ගතා යන පස වඩාත් බලපවත්වයි එක අරමුණක්ම ගෙන ධ්‍යාන සිත දියුණුවන හෙයින් එම අරමුණෙහි සිත යොමුකරවීමට ඉතාම උපකාරවන්නේ

විතර්ක චෛතසිකයයි. එයින් එම අරමුණම තැකීම බලාපොරොත්තුවීම සිදුවෙයි. එහෙයින් විතර්කය අරමුණෙහි සිත නැංවීම ලක්ෂණකොට ඇත්තේය. මෙසේ අරමුණෙහි සිත නැංවීම සම්පූර්ණ කෙරෙමින් පවත්නා විතර්කය සහිත වූයේ ප්‍රථම ධ්‍යාන සිතයි. එහෙයින් සවිතක්කං යැයි දෙසූ සේක.

සවිචාරං.

අරමුණෙහි නංවනලද සිත එයින් බැහැරවීමට නොදී එහිම හසුරුවන ගතිය විචාරයයි. අරමුණ පිරිමදිමින් මෙන් එහිම හැසිරවීම විචාරයෙන් කෙරෙයි. සිතත් අනිකුත් චෛතසිකයත් අල්ලාගන්නා ගතිය හෙවත් අරමුණෙහි නතර කරගන්නා ගතිය විචාරය බව සැලකිය යුතුයි. අර්පණ සිතෙහි ඉතා බලවත්ව යෙදෙන හෙයින් ප්‍රථම ධ්‍යාන සිත විචාරය සහිත වූයේ යැයි ධ්‍යානයාගේ අංගයක් ලෙස වෙනම මතුකොට දක්වන ලදී.

විවේකජං පීතිසුඛං.

කාමච්ඡන්දයෙන් සියලු අකුශලයන්ගෙන් වෙන්වීම මෙහිදී විවේකයයි. වෙන්වීමයි නීවරණයන්ගෙන් ඈත්වූ ධ්‍යාන සිත හා එක්ව යෙදෙන ගති මෙහි විවේකය නම් වේ. එම ගති නිසා හටගත් ප්‍රීතිය හා සැපය එම විවේකයාගේ බලපැවැත්මෙන් හටගත් හෙයින් විවේකජ නම් වේ. මෙහි ප්‍රීතිය නම් පස්වැදෑරුම් ප්‍රීතිය අතුරෙන් ඵරණ නමවත් පැතිරීයන ප්‍රීතියයි. මේ ප්‍රීතිය බලවත්නාවිට ඉතා සියුම් ප්‍රණීත රූපයන්ගේ හටගැනීම කොරෝසු දරදඬු රූපයන් අඩුවීම සිදුවන හෙයින් සිරුර පුරා මූළුමනින් පැතිරී යන්නාක් මෙන් යෝගියාට දැනෙයි.

ප්‍රීතිය සමග සැපයද දැනෙයි. සිතෙහි පහළවන සෞමනස්ස වේදනාව මෙසේ මෙම ධ්‍යානයාගේ සම්ප්‍රයෝග අංගයකි. මේ ප්‍රීතිය බලවත් වනවිට ශරීරයටද චිත්තජ රූප නිසා ප්‍රීතිය දැනෙන්නාසේ සෞමනස්ස ධ්‍යාන සිතෙහි

බලවත් වනවිට ශරීරයටද සැපයක් දැනෙන්නේය. මෙසේ පළමුවැනි ධ්‍යාන-අර්පණ සිතෙහි බලවත්වන ප්‍රීතිය හා සැපය යන චෛතසිකයන්ද වැඩි බලයකින් ක්‍රියාකාරණ හෙයින් ධ්‍යානාංග ලෙස මතුකොට දක්වනලද බව පිළිගත යුතුය.

**පඨමජ්ඣානං උපසම්පජ්ජ.**

පළමුවැනි ධ්‍යානයට පැමිණ හෝ පළමු ධ්‍යාන සිතෙහි සම්පාදනය මෙසේ යැයි දක්වන ලදී. පළමුව ඉපදවියයුතු හෙයින් පඨමජ්ඣාන නම් වෙයි. මේ පළමුවැනි ධ්‍යාන සිත නො උපදවා දෙවෙනි තුන්වෙනි ආදී ධ්‍යාන සිත් ඉපදවිය නොහැකිය. එහෙයින් ගණන් වශයෙන් මෙය පළමුවැනි ධ්‍යානයයි. මෙහි විතක්ක විචාර ප්‍රීති සුඛ යන අංග සමග බලවත්වන එසේම ප්‍රධාන වන ඒකග්ගතා චෛතසිකය ගත යුතුය. චිත්තංගාවෙහි යන තැන ප්‍රධාන වශයෙන් දියුණුවන ඒකාග්ගතා චෛතසිකයද වඩන බව දතයුතුය.

ධ්‍යාන යනුවෙන් පඨවිකසිණ අරමුණ උපනිජ්ඣායනය හෙවත් එයම බලා ලබනලද හෙයින් මෙය පඨවිකසිණ ප්‍රථම ධ්‍යාන යැයිද ආරම්මණ උපනිජ්ඣායනය කාරණ හෙයින්ද විරුද්ධ පාක්ෂිකයන් හෙවත් කාමච්ඡන්දාදී නීවරණ යන් දවන හෙයින්ද මෙය ධ්‍යාන නම් වේ.

මෙසේ උසස්වූ චිත්තවිවේකය ලබා විදර්ශනා වාඩ ශාන්ත නිවන් සැප ලබත්වා!

# 46

### නමො සම්මා සම්බුද්ධස්ස

### දෙවැනි ධ්‍යාන සිත.

කතමෙ ධම්මා කුසලා,

යස්මිං සමයෙ රූපූපපත්තියා මග්ගං භාවෙති, විතක්ක විචාරානං වූපසමා, අජ්ඣත්තං සම්පසාදනං, චෙතසො එකොදිභාවං, අවිතක්කං අවිචාරං සමාධිජං පීතිසුඛං දුතියජ්ඣානං උපසම්පජ්ජ විහරති පඨවිකසිණං.

ශාස්තෘනායක සම්මා සම්බුදුරජාණන් වහන්සේ, දෙවෙනි ධ්‍යාන කුසල් සිත මෙසේ වදාරණ සේක. කුසල් දහම් කවරහුද? යම් වේලාවෙක රූපී බඹලොව ඉපදීම සඳහා මාර්ගය භාවනා කෙරේද? විතක්ක විචාරයන් සංසිඳවා, චිත්ත සන්තානයෙහි පැහැදීම හා එකඟ බව ඇති විතර්ක විචාර නැති සමාධියෙන් හටගත් ප්‍රීතිය හා සැපය ඇති පඨවි කසින දෙවැනි ධ්‍යානයට පැමිණ වෙසේ.

42, 43, 44, 45 යන ධර්ම පාඩම්වලින් පළමුවැනි ධ්‍යාන සිත විස්තර කරන ලදී. එහි ධ්‍යාන අංග හා ඒවාට විරුද්ධවූ ධර්මයන්ද (කාමච්ඡන්දාදීන්ද) දක්වන ලදී.

චිත්ත අංග වශයෙන් කාමාවචර මහා කුසල සිතක ලැබෙන පණස්සසක් ධර්මයන් ලැබේ. භූමි වශයෙන් ඒවායේ තත්වය උසස්ය.

1. ඡන්ද, 2. අධිමොක්ඛ, 3. මනසිකාර, 4. තත්‍රමජ්ඣත්තතා, 5. කරුණා, 6. මුදිතා 7. කායදුච්චරිත විරති, 8. වචී දුච්චරිතා විරති, 9. මිච්ඡා ආජීව විරති යන යෙවාපන ධර්මයන්ගෙන් පළමුවැනි ධ්‍යාන සිතෙහි යෙදෙන්නේ ඡන්දය, අධිමොක්ඛය, මනසිකාරය, තත්‍රමජ්ඣත්තතාවය යන චෛතසික පමණකි.

කරුණාමුදිතා වෙන් වෙනමම භාවනා-අරමුණුය. එහෙ හිත් මෙහි නොයෙදීම ස්වාභාවිකය.

"විවිච්චෙව කාමෙහි විවිච්ච අකුසලෙහි ධම්මෙහි" යනු වෙන් ප්‍රථම ධ්‍යාන සිතෙහි වැළැක්මක් විරතියක් ගැණ සඳහන් වේ. ඒ වනාහි ක්‍රියාවට නැගෙණ කායදුච්චරිත වචීදුච්චරිත මිච්ඡා ආජීව වශයෙන් විඥප්ති රූප උපද වන අකුසලයන්ගෙන් විරතිය නොවේ. එම විරතිය ශීල යෙන් සම්පූර්ණවී තිබෙන ධ්‍යාන සිත් ඉපදවිය හැකි හෙයිනි. තවද විවිච්ච එව කාමේහි යනාදීන් විරතිය යෙදෙන බවක් නොව විරතිය සම්පූර්ණ කෙරෙමින් එයද අස්වෙමින් ඒ වෙනුවට ධ්‍යානාංගයන්ගේ බලපැවැත්ම ගත යුතුය. මෙසේ හෙයින් විරති චෛතසිකය මෙම ධ්‍යාන සිත්හි නොයෙ දෙන බව පැහැදිලිය. එසේ හෙයින් මේ ප්‍රථම ධ්‍යාන කුශල සිතෙහි සපණස් ධර්ම හා යෙවාපනක චෛතසික සතරක් දුසි විතානාංගයන් සිතත් සමගම වන බව සැල කිය යුතුය.

දුතියජ්ඣාන සිත.

එසේ කසිණාදී දෙවෙනි ධ්‍යානය ලැබෙන භාවනාවක් කරණ කල්හි පළමුවැනි ධ්‍යානයෙන් විතර්කවිචාරයෙන් මනාව සම්පූර්ණවී දියුණුව තිබෙන හෙයින් විරතියෙන් කටයුත්තක් ප්‍රථම ධ්‍යාන සිතට නොතිබුණාක් මෙන්ම විතක්ක විචාරයන්ගේ කටයුත්තක්ද දෙවෙනි ධ්‍යාන සිතට නැත. එහෙයින් විතර්ක විචාරයන්ගේ සංසිඳීම දක්වන ලදී. කසිණ ධ්‍යාන ආලම්බනයෙහි සිත නැංවීම සඳහා හෝ සිත එහි පවත්වා ගැනීම සඳහා අමුතුවෙන් කෙනෙකුගේ සහායය දෙවෙනි ධ්‍යාන සිතට වුවමනා නොකෙරේ. එහෙයින් දෙවෙනි ධ්‍යාන සිතෙහි විතක්ක විචාරයන් නො යෙදේ.

මෙසේ විතක්ක විචාරයන් හැර පළමුවැනි ධ්‍යාන සිතෙහි යෙදුණු ඵස්සාදී අනිකුත් විතානාංගයන් දියුණුවී

උසස්වී බලවත්වී දෙවෙනි ධ්‍යාන සිතෙහි යෙදෙන බව සැලකිය යුතුය.

“අජ්ඣත්තං සම්පසාදනං” යනුවෙන් එම ධ්‍යාන සිතෙහිම බලවත් පැහැදීමක් ශ්‍රද්ධාවක් යෙදේ ‘සම්පසාදනං වුච්චති සද්ධා” යනුවෙන් මෙහි පැහැදීම නම් ශ්‍රද්ධාවයි දෙවෙනි ධ්‍යාන සිත විතර්ක විචාරයන්ගෙන් නො කැළඹුනු හෙයින් එහි යෙදෙන ශ්‍රද්ධා ආදී කුශල ධර්මයන් බලවත්ය. කුශල ධර්මයන් බලවත් වන විට ශ්‍රද්ධාව වඩාත් ප්‍රකටව පෙනෙන්නේය එහෙයින් තමාගේ ධ්‍යාන සිතෙහි පිටට පෙනෙන තරමේ ප්‍රසාදයක් දක්නා ලැබේ.

එකෝදි.

විතක්ක විචාරයන් නැති නිසා ඉතා හොඳින් එකඟකම දියුණුව හටගත් උසස්වූ හෙයින් එකෝදි නම් වේ. පළමුවැනි ධ්‍යාන සිතම අසහායව ශ්‍රේෂ්ඨව හටගත් හෙයින් එකෝදි නම් වේ. මෙහි මෙසේ උසස් සමාධිගත බවටද උපකාරවත්වන් විතක්ක විචාරයන්ගේ නොපහළ වීමයි දෙවෙනි ධ්‍යාන සිත වනාහි උපචාර ධ්‍යානය මෙන් නීවරණ ප්‍රහාණයද ප්‍රථම ධ්‍යාන සිත මෙන් අංග පහළ වීමද පමණක් නොවන බවද එයට වඩා උසස් සමාධියක් බවද මෙයින් කියැවේ.

අවිතක්කං අවිචාරං.

ප්‍රථම ධ්‍යානයක් ලබාගැනීමට විතක්ක විචාරයන් ඉතා උපකාරිය. එය ලැබුවාට පසු ඒවාට එයින් උසස් තත්වයට පැමිණෙන යෝගියාට විතක්ක විචාරයන්ද කලබල නොසන්සුන් ධර්ම බව වැටහී ඒවායින්ද තුරන්ව වඩාත් ශාන්තවූ ධ්‍යානය ලැබූ බව විතර්ක විචාරයන් නොමැතිවීම ගුණයක් බව දක්වීමට මෙසේ අවිතක්කං අවිචාරං කියා යලින් දක්වන ලදී.

සමාධියෙන් හටගත් ප්‍රීති සැපයත් ඇති බව ආදිය පළමු කළ විස්තරය මෙනි. දෙවෙනි ධ්‍යානය යනු දෙවෙනි වරට පහළවන ධ්‍යාන සිතයි. පළමුවැනි ධ්‍යාන සිත නොලබා කෙසේවත් දෙවැනි ධ්‍යාන සිත නොලැබිය හැකිය. ඒ වනාහි පළමුවැනි ධ්‍යානයාගේ උපනිශ්‍රය ශක්තිය විශෙෂයෙන් බලපවත්නා හෙයිනි. එහෙයින් වදාළහ පට්ඨානයෙහි.

“පඨමජ්ඣානං දුතියස්ස ඣානස්ස උපනිස්සය පච්චයෙන පච්චයො”.

මෙසේ කුසල් දැන කුසල් වඩා විදර්ශනා කොට උතුම් නිවන් සැප ලබාගනිත්වා!

# 47

## නමො සම්මා සම්බුද්ධස්ස.

## තුන්වැනි ධ්‍යාන සිත උපෙක්ෂාවගේ විස්තරය.

කතමෙ ධම්මා කුසලා? යස්මිං සමයෙ රූපූපපත්තියා මග්ගං භාවෙති පීතියාච විරාගා උපෙක්ඛකොච විහරති."

කුසල් දහම් කවරහුද? යම් වේලාවක රූපී බඹලොව ඉපදීම පිණිස මාර්ග වඩයිද ප්‍රීතියෙන්ද වෙන්ව උපෙක්ෂකව වාසය කරයි.

මෙසේ තුන්වැනි ධ්‍යාන කුසල් සිත දක්වන ශාන්ති නායකයන් වහන්සේ ප්‍රීතියෙන් තොරවූ උපෙක්ෂාදී ගුණ විලින් යුක්තවූ මේ තතියජ්ඣාන සිත විස්තරකළ සේක

**පීතියාච විරාගා**

ප්‍රීතිය දුරුකිරීමෙන් ධ්‍යාන අවස්ථාවේදී ලැබෙන ප්‍රීතිය කුමක්දැයි පසුගිය පාඩමේ සඳහන්ය. එම නාමරූපකාය යන් පුරා පැතිරයන බව දැනෙන ස්ඵරණ ප්‍රීතියෙහි නො ඇල්මෙන් එය අත්හැරීමෙන් මෙම ධ්‍යාන සිත ලැබේ.

විරාගය නම් නො ඇල්මයි. නො ඇල්මට එක්කෝ එම දෙය පිළිකුල් කටයුතුය. නැත්නම් දුරුකළ යුතුය. දෙවැනි ධ්‍යාන සිතේදී විතර්ක විචාරයන් පසුකළ හැටි ඉක්මවාගිය බව පැහැදිලිකොට එසේම මෙහිදී ප්‍රීතිය ඉක්මවා ගිය බව මෙයින් පිඩුකොට දක්වන ලදී.

ධ්‍යාන සිතෙහි ප්‍රීතිය බලපැවැත්වීමද ධ්‍යාන සිත දුර්වල බවට ලකුණකි. එහෙයින් ප්‍රීතියෙන්ද තොරව උසස් ධ්‍යාන සිතක් නිපදවීම යෝගියාගේ අදහස හෙයින් ඔහු දූත් ප්‍රීතියෙහිද නො ඇලේ. එය දුරුකිරීමට එය උසස්

ලෙස නොහෙන පහත් ලෙස පිළිකුල් ලෙස සැලකියයුතු බවට පත්වේ. මේ ප්‍රීතිය ඉතා සියුම් ඇල්මක් ඇතිකරවන සුළුය. සිත කය දෙකම පිණවයි. එහෙත් දෙවෙනි ධ්‍යානය ඉතා හොඳින් ප්‍රගුණ කළ තැනැත්තාට තම ඉදිරියේ මේ ප්‍රීතියටත් වඩා උතුම් සැපයක් ඇති බවට හෝඩුවාවක් දනෙයි. එහෙයින් මේ ප්‍රීතිය ඔහුට ගණන කට නොවැටෙයි. ඔහු ප්‍රීතිය පහත්කොට සලකා එය දුරුකිරීම සඳහා භාවනා කරයි. එහෙයින් මෙම තුන්වැනි ධ්‍යාන සිත උපදිනවිට ඔහු ප්‍රීතියෙන් මිදී සිටියි. තුන්වැනි ධ්‍යාන සිතෙහි ප්‍රීතිය නොයෙදීම මෙයින් කියන ලදී.

උපෙක්ඛකො ච විහරති.

සැප දුක් වේදනා දෙකට සමව සම්පව පවත්නා හෙයින් උපෙක්ඛාය. උප යනුවෙන් සමීප යන තේරුම දෙයි. ඉක්ඛ යනු බැලීම සලකුණු කිරීම යන අදහසය. මෙසේ උපෙක්ඛ යනුවෙන් සැප දුක් දෙකට මැදින් ඒ දෙකටම සමව සමීපව සිටින සිතෙහි ගතිය උපෙක්ෂාවයි.

## දසවැදෑරුම් උපෙක්ඛා.

ඡළංග උපෙක්ඛා.

1 ඡළංගුපෙක්ඛා යනුවෙන් රහතන් වහන්සේ තම සදෙරට හමුවන සෑම අරමුණකම මැදහත්වූ බැලීම පවත් වන හෙයින් මේ ඡළංග - අංග සයක් ඇති උපෙක්ෂාව රහතන් වහන්සේටය.

බ්‍රහ්මවිහාර උපෙක්ඛා.

2. සතර බ්‍රහම විහරණයෙන් උපෙක්ඛා බ්‍රහමවිහාර භාවනාව පුරුදුකළ යෝගියාට මෛත්‍රී තුන්වැනි ධ්‍යානය දියුණුකිරීමෙන් පසු උපෙක්ඛා චතුර්විධ ධ්‍යානයට පැමිණේ. එම ධ්‍යානයෙන් සියලු සතුන් කෙරෙහි උපෙක්ෂාවෙන් වෙසේ. මේ බ්‍රහමවිහාර උපෙක්ෂාවයි.

3 බොජ්ඣංග උපෙක්ඛා.

උපෙක්ඛා සම්බොජ්ඣඞ්ගං භාවෙති යනාදී තන්හි එක්ව හටගත්තා චිත්තචෛතසිකයන්ගේ මැදහත්ව පවත්වාගන්නා ආකාරය බොජ්ඣඞ්ග උපෙක්ෂාවයි.

4 විරිය උපෙක්ඛා.

කාලින්කාල භාවනානුයෝගියා උපෙක්ඛා නිමිත්ත මෙනෙහිකරයි" ආදි තන්හි විරිය සමතාවය යොදාගැනීමට සිත මධ්‍යස්ථකර ගැනීම මෙහි විරියුපෙක්ඛා නම්ය.

5 සංඛාර උපෙක්ඛා

සංස්කාරයන් මධ්‍යස්ථව බැලීම පිළිබඳ උපෙක්ෂාව සංඛාරුපෙක්ඛාවයි. මේ වනාහි විදර්ශනා භාවනා කරණ යෝගියාට ලැබෙන උසස් විපස්සනා ඤාණයකි. එයින් සංස්කාරයන් හෙවත් නාමරූප මැදහත් සිතින් හෙවත් ප්‍රිය රූපාදිය කෙරෙහි නො ඇල්මත් අප්‍රිය රූපාදිය කෙරෙහි විරුද්ධනොවීමත් නොගැටිමත් සිදුවේ. මෙයින් සංස්කාරයන් අත්හැරීමට වුවමනා කරණ මහත් බලයක් විපස්සනා භාවනානුයෝගියාට ලැබේ. එසේම නීවරණාදී කෙලෙසුන්ද නුවණින් දුන මනාව යටපත් කරණ ශක්ති යක් මෙම සංඛාරු උපෙක්ඛාවේ ඇත. අටවැදෑරුම් සමාධින්ගේ වශයෙන් හා දශවිදර්ශනා ඥානයන්ගේ වශයෙනුත් මෙම සංඛාරු උපෙක්ඛා ඤාණයාගේ ප්‍රභේද සලකති.

6 වේදනා උපෙක්ඛා.

මේ වනාහි යම් වේලාවෙක කාමාවචර කුසල් සිතක් උපන්නේ වේද එහි අතිකුත් චෛතසික සමග උපෙක්ඛා ද්වේදනාවත් යෙදේදැයි මෙසේ දක්වන ලද්දේ වේදනානු පෙක්ඛාවය.

7 විපස්සනා උපෙක්ඛා.

විදර්ශනා වඩන යෝගියාට නාමරූපයෙන් යමක් යමක් මැටහේද ඒවා ඇත්ත වශයෙන් නිත්‍යද සැපද, ආත්මදැයි

සැලකෙමින් සොයමින් පවත්නා විපස්සනා සිත් හා යෙදෙන මැදහත් ආකාරය විපස්සනුපෙක්ඛාවය.

**8 තත්‍රමජ්ඣත්ත උපෙක්ඛා.**

ඡන්දාදී යේවාපනක ධර්මයන් සමග ධම්මසංගණියේ දක්වනලද එකට යෙදෙන ධර්මයන්ගේ මැදහත් බව රකින ගතිය තත්‍රමජ්ඣත්තුපෙක්ඛාවයි.

**9 ඣාන උපෙක්ඛා.**

මෙම ධ්‍යාන සිත හා යෙදෙන උපෙක්ඛා හෙවත් මැදහත් ගතිය ඣානුපෙක්ඛාවයි.

**10 පාරිසුද්ධි උපෙක්ඛා.**

පාරිසුද්ධි උපෙක්ඛා නම් සතරවැනි ධ්‍යානය හා යෙදෙන ඉතා පිරිසිදු විරුද්ධ ධර්මයන් නැති හෙයින් විරුද්ධ ධර්මයන් සංසිඳවීමෙහි පවා කිසිම උත්සාහයක් නැති පිරිසිදු ශාන්ත උපෙක්ෂාව පාරිසුද්ධිඋපෙක්ඛා නම් වේ.

මෙම දස උපෙක්ඛාවන්ගෙන් ඡළංග, බ්‍රහ්මවිහාර, බොජ්ඣඞ්ග තත්‍රමජ්ඣත්ත, ඣාන, පාරිශුද්ධි යන උපෙක්ෂාවන් තත්‍රමජ්ඣත්ත උපෙක්ඛාවමය. ඒ ඒ අවස්ථාවන් සලකා මෙසේ වෙන් වෙන්ව දක්වන ලදී. ළදරුවා තරුණයා ආදී එක්කෙනෙකුට ව්‍යවහාරකරන්නාක් මෙනි

සංඛාර, විපස්සනා උපෙක්ඛාවන්ද එසේම ප්‍රඥාවමය. කෘත්‍ය වශයෙන් බෙද දක්වීන ලදී. විරිය හා වේදනා උපෙක්ඛාවන් වෙන වෙනම ගතයුතුය.

# 48

## නමො සම්මා සම්බුද්ධස්ස

## උපෙක්ෂාවගේ තවත් විස්තර:

**කතමෙ ධම්මා කුසලා?**

යස්මිං සමයෙ රූපූපපත්තියා මග්ගං භාවෙති, පීතියාච විරාගා උපෙක්ඛකො ච විහරති. (පසුගිය පාඩම බලන්න)

බුද්ධධර්මයෙහි දක්වෙන තේරුම් ගැනීම් අපහසු කරුණු අතර මේ උපෙක්ෂාවද එකකි. "උපපත්තිතො ඉක්ඛතීති උපෙක්ඛා" සමීපයට පැමිණීම් වශයෙන් බලාතුයි උපෙක්ෂා නම් වේ.

මෙහි උපපත්තිතො යනුවෙන් අදහස්කරන්නේ සමව ඉසිලීමෙන් යුදුසු ලෙස පවත්වා ගැනීමය. "සමවාහිත භාවෙන පතිරූපතො" යනුවෙන් එය ටීකාවේ විස්තරකර ඇත. සමව ඉසිලීම නම් එක අතකින් සැප වේදනාවත් අනික් අතින් දුක් වේදනාවත් අතර මැද ඒ දෙකටම සමව පැවතීමයි. එසේ සමව පවතිමින් එක පැත්තකටවත් නොවැටී ඒ දෙකම උසුලන මැදහත් ගතිය මෙයින් කියැවේ.

මෙය මෙසේද තේරුම්ගත හැකිය. සැපය සියුම් සියුම්ව ගොස් අනන්තයට ගියකල දුක සියුම් වශයෙන්වත් පටන් නොගන්කල නැතහොත් දුක සියුම් සියුම්ව ගොස් අනන්තයට ගියකල සැපය සියුම් වශයෙන් වත් පටන් නොගත්කල මෙසේ සැප දුක් දෙක අතර සමව පවත්නා සැප දුක් දෙකට එක සමාන දුරින් පවත්නා වේදනාව උපේක්ෂා වේදනාවයි. එසේම මෙය නොදැනෙන ශාන්ත වේදනාවෙකි. වේදනාව පමණක් නොව යම්කිසි ධර්ම දෙක කට අතර දෙකටම සමව පැවැත්මක් ඇති ආකාරය උපෙක්ඛා බව දස උපෙක්ෂාවන් විමසාබැලීමේදී විශේෂයෙන් ඡළඟුපෙක්ෂාව විමසීමෙන් වැටහීයයි.

දස උපෙක්ෂාවක් ප්‍රශ්ගිත පාඨමෙහි දක්වන ලදී. මෙහිදී උපෙක්ෂාව දස වැදෑරුම් වන සැටි හා ලැබෙන අරමුණු විමසා බලමු.

1. ෂළංග උපෙක්ඛා: අංග සයක් ඇති උපෙක්ඛාවයි. රහතන් වහන්සේ සදොරින් රූපාදී අරමුණු සය ගැණීමෙදී සොම්නස් දොම්නස් දෙකට නොපැමිණි මධ්‍යස්ථ වෙයි. මෙහිදී උපෙක්ඛාව අරමුණු සය අරමුණු කරයි. එක එක අරමුණෙහි මැදහත්ව පැවතීම් වශයෙන් අංග සංදතයුතුය.

2. බ්‍රහ්මවිහාර උපෙක්ඛා: සත්වයන් කෙරෙහි මධ්‍යස්ථව පැවතීම බ්‍රහමවිහාර උපෙක්ෂාවයි. එහෙයින් එය සත්වාරම්මණය. සත්වයන් කෙරෙහි ඇලීමට හෝ ගැනීමට නොපැමිණ මධ්‍යස්ථව සිටීමයි.

3. බොජ්ඣඞ්ග උපෙක්ඛා: උපෙක්ඛා සම්බොජ්ඣඞ්ගය දියුණු වන සිතෙහි එකට පහළවන චිත්තචෛතසිකයන්ගේ මැදහත් ආකාරය හෙවත් ඔවුනොවුන් සමව පැවැත්ම ඇතිකරවන්නේ බොජ්ඣඞ්ග උපෙක්ඛාවයි. එයට අරමුණු වන්නේ ද අභිකූත් එම සිත හා චෛතසික අරමුණු කරණ නාමරූප ධර්මයකි

4. විරිය උපෙක්ඛා: වීර්‍ය්‍ය පිළිබඳ මධ්‍යස්ථතාවයයි. අධික වීර්‍ය්‍යයටත් ලිහිල් වීර්‍ය්‍යයටත් නොවැටී ඒ දෙකට අතර මධ්‍යම ප්‍රමාණයෙන් වීර්‍ය්‍ය පවත්වා ගැනීම, වීර්‍ය්‍යයෙහි මැදහත්වීම වීර්‍ය්‍ය උපෙක්ෂාවයි. මෙය වේදනාව නොවන බවද වීර්‍ය්‍ය චෛතසිකය සමව පවත්වා ගැනීම බවද ඉතා පැහැදිලිය. (අනච්චාරද්ධ නාති සිථිල විරිය සංඛාතා උපෙක්ඛා).

5. සංඛාර උපෙක්ඛා: කොපමණ සංඛාර උපෙක්ඛා සමාධි වශයෙන් උපදීත්ද? කොපමණ සංඛාර උපෙක්ඛා විපස්සනා වශයෙන් උපදිත්දැයි මෙසේ දක්වන ලද්දේ සංඛාරුපෙක්ඛාවයි.

සමාධි වශයෙන් උපදින සංඛාරුපෙක්ඛාවන් 8 කි.

1. පළමුවැනි ධ්‍යානය (ප්‍රථමධ්‍යානය) ලැබීමට ප්‍රහාණය කළයුතු නීවරණ සංස්කාරයන් මනාව සලකා බලා ගැන බලා එහෙත් ඔවුන් ප්‍රහාණය කිරීමෙහිද උත්සාහයක් නැති මධ්‍යස්ථව සිටින ප්‍රඥාවයි.

2. මෙසේ දෙවැනි ධ්‍යානය ලැබීමෙහිදී විතක්ක විචාර සංස්කාරයන්ද

3. තුන්වැනි ධ්‍යානය ලැබීමෙහිදී ප්‍රීතිසංස්කාරයද,

4. සතරවන ධ්‍යානය ලැබීමෙහිදී සුඛ දුක්ඛ සංස්කාරයන්ද,

5. ආකාසානඤ්චායතන සමාපත්තිය ලැබීමෙහිදී රූප සඤ්ඤා නානත්ත සඤ්ඤා සංස්කාරයන්ද,

6. විඤ්ඤාණඤ්චායතන සමාපත්තිය ලැබීමෙහිදී ආකාසානඤ්චායතන සංස්කාරයද,

7. ආකිඤ්චඤ්ඤායතන සමාපත්තිය ලැබීමෙහිදී විඤ්ඤාණඤ්චායතන සංස්කාරයද,

8. නෙවසඤ්ඤානාසඤ්ඤායතනය ලැබීමෙහිදී ආකිඤ්චඤ්ඤායතන සංස්කාරයද මනාව සලකාබලා ප්‍රහාණය කට යුතු යැයි පිහිටි ප්‍රඥාව අටවැදෑරුම් සමාධි සංඛාර උපෙක්ඛාය, මෙහිදී නීවරණාදී ඒ ඒ සංස්කාරයන් සලකා බැලීම සිදුකරණ ධ්‍යාන සිතෙහි පහළවන පඤ්ඤාව ගතයුතුය. විපස්සනා වශයෙන් සංඛාරුපෙක්ඛා දසයක් දක්වන ලදී.

1. සෝවාන් මාර්ගය ලැබීම සඳහා සංස්කාරයන්ගේ ඇතිවීම, පැවතීම, බිඳීම ආදී වශයෙන් විදර්ශනාවෙන් සංස්කාරයන් මනාව සලකාබලා පිහිටි ප්‍රඥාවද,

2. සෝවාන්ඵලයට සමවැදීම සඳහා ඵලසමාපත්ති විදර්ශනා වශයෙන් පිහිටි නුවණද,

3. සකදාගාමි මාර්ගයට,
4. එම ඵලයට,
5. අනාගාමි මාර්ගයට,
6. එම ඵලයට,
7. අර්හත් මාර්ගය,
8. එම ඵලයට පැමිණීමට සමවැදීමට, විදර්ශනා වශයෙන් පිහිටි ප්‍රඥාවත්ද,
9. සුඤ්ඤතවිහාර සමාපත්තියට සමවැදීම් වශයෙන් විදර්ශනාවෙන් සංස්කාරයන් මනාව සලකා බැලූ ප්‍රඥාවද,
10. අනිමිත්තවිහාර සමාපත්තියට සම වැදීම් වශයෙන් විදර්ශනාවෙන් සංස්කාරයන් මනාව සලකා බැලූ ප්‍රඥාවද දස විදර්ශනා සංස්කාර උපෙක්ෂාය.

මෙහි සුඤ්ඤතානුපස්සනාවෙන්- අනාත්ම විපස්සනාවෙන් මඟපල ලැබූ රහතන් වහන්සේ සුඤ්ඤත විහාර සමාපත්තියට සමවදිති. එසේම අනිච්චානුපස්සනාවෙන් මඟපල ලැබූ රහතන් වහන්සේ අනිමිත්තවිහාර සමාපත්තියට සමවදිති.

මෙසේ අටවැදෑරුම් සමාධි සංඛාර උපෙක්ඛාවත්ද දස වැදෑරුම් විපස්සනා සංඛාර උපෙක්ඛාවත්ද ධ්‍යාන සිත්හි හා විපස්සනා සිත්හි යෙදෙන ප්‍රඥාව බව දතයුතුය.

7. **විපස්සනා උපෙක්ඛා:** සංස්කාරයන්ගේ අනිච්චතාදිය සෙවීමෙහි (හෙවත් අරමුණු කිරීමෙහි) මැදහත්වූ ප්‍රඥාවයි.

මෙසේ විදර්ශනා උපෙක්ෂාවෙන් සංස්කාරයන්ගේ අනිත්‍යාදී ලක්ෂණ තුණ දුටුකල්හි තුන් භවය ගිනිගත් වළක්මෙන් දුටුවහුට සංස්කාරයන් සිතින් අල්වාගැනීමෙහි මැදහත් බව සංඛාර උපෙක්ඛාවයි. සෙවීම හා ගැනීම වශයෙන් කෘත්‍යයෙන් දෙවැදෑරුම් ප්‍රඥාවම මෙහිලා දතයුතුය.

නාගයෙක් ගෙට වැදුණු කල සොයා බලා මුල්ලක හුන් නාගයා දැක ඔහුගේ පෙණය දැක මේ නාගයාමයැයි නිසැකව දැනගැනීම මෙන් විපස්සනා උපෙක්ඛාවද ඔහුටත් තමාටත් හරිහැරයක් නොවන පරිදි නාගයා ඉවතදැමීමට අල්ලා ගැනීම මෙන් සංඛාරුපෙක්ඛාවද දතයුතු යැයි අත්ථසාලිනී අටුවාවේ කියන ලදී.

8. මජ්ඣත්තුපෙක්ඛා: ඡන්දාදී යේවාපනකයන්ට අයිති වූ එක්ව යෙදෙන චිත්තචෛතසික සමව උසුලන උපෙක්ෂාව තත්‍රමජ්ඣත්තුපෙක්ඛාය. අනිත් චිත්තචෛතසික යන් ගන්නා අරමුණම ගණියි.

9. ඣානුපෙක්ඛා: ධම්මසංගණියේ උපෙක්ඛකොච විහරති යනුවෙන් මෙහි මුලින් සඳහන්වූයේ ධ්‍යාන උපෙක්ෂාවය. ධ්‍යාන සිත අරමුණු කරණ නිමිත්තම අරමුණු කරයි.

10. පාරිසුද්ධිපෙක්ඛා: චතුත්ථජ්ඣාන සිතෙහි යෙදෙන ඉතාම පිරිසිදුවූ උපේක්ඛාවයි.

1. ඡළඞ්ගුපෙක්ඛා,
2. බ්‍රහ්මවිහාරුපෙක්ඛා,
3. බොජ්ඣඞ්ගුපෙක්ඛා,
4. තත්‍රමජ්ඣත්තුපෙක්ඛා,
5. ඣානුපෙක්ඛා,
6. පාරිසුද්ධිපෙක්ඛා,

මේවා අර්ථ වශයෙන් තත්‍රමජ්ඣත්ත උපෙක්ඛාවය. අවස්ථා භේද වශයෙන් මෙනම් දක්වනලදී. සංඛාරුපෙක්ඛා විපස්සනුපෙක්ඛා ප්‍රඥාවය.

විරියුපෙකඛා, වේදනුපෙකඛා- දෙක වෙන වෙනම වූවාහුය. අනික් උපෙක්ෂාවන්ටද සම්බන්ධ නැත,

මෙසේ මෙහි දස ආකාරය සලකා බැලීමේදී මධ්‍යස්ථතාවය වීර්‍ය්‍යය, වේදනාව ප්‍රඥාව යන කරුණුවලට උපෙක්ෂා නාමය යෙදී ඇති බව සලකා දහම් දැන විදර්ශනා වඩා ශාන්ත නිවන් සැප පතාගනිත්වා.

# 49

නමො සම්මා සම්බුද්ධස්ස

## තුන්වැනි ධ්‍යාන සිත අවසන් කොඨාසය.

කතමෙ ධම්මා කුසලා?

යස්මිං සමයෙ රූපූපපත්තියා මග්ගං භාවෙති, පීතියාච විරාගා උපෙක්ඛකොච විහරති, සතොච සම්පජානො සුඛංච කායෙන පටිසංවෙදෙති, යංතං අරියා ආචික්ඛන්ති උපෙක්ඛකො සතිමා සුඛවිහාරීති, තතියජ්ඣානං උපසම්පජ්ජ විහරති. පඨවිකසිණං.

කුසල දහම් කවරහුද?

යම් වේලාවක රූපී බඹලොව ඉපදීම පිණිස මාර්ග වඩයිද, ප්‍රීතියෙන්ද වෙන්ව උපෙක්ෂකව වාසය කරයි. සිහි ඇත්තේ මනා නුවණැත්තේ සැපයද කයින් යලි යලි හොඳින් විඳියි. යම් බඳුවූ ඔහුට ආර්යයන් වහන්සේලා උපෙක්ෂා ඇත්තෙක සිහි ඇත්තෙක සුවයේ වසන්නෙකැයි කියත්ද? ඒ පඨවිකසිණ තුන්වැනි ධ්‍යානයට පැමිණ වාසය කරයි.

ශාන්තිනායක සම්බුදුපියාණන් වහන්සේ මේ තුන්වැනි ධ්‍යාන සිත සම්පූර්ණයෙන් වදාළ අයුරුයි. පසුගිය ධර්මපත්‍රිකා වෙත් උපෙක්ෂාව තෙක් විස්තරකරණ ලදී තවද තුන්වැනි (තෘතීය) ධ්‍යාන සිතෙහි විශෙෂ ආනිසංස දක්වන සේක්

"සතොච" යනාදිය වදාළ සේක. සිහි ඇත්තේද වෙයි. තෘතීය ධ්‍යානලාභී පුද්ගලයා සිහි ඇත්තෙක් බව මෙයින් උගන්වයි. ප්‍රථම ධ්‍යාන සිතට වඩා ද්විතීය (දෙවෙනි) ධ්‍යාන සිතෙහිද එයට වැඩා තෘතීය ධ්‍යාන සිතෙහිද ශ්‍රද්ධා සති විරිය ආදී චෛතසිකයෝ සියල්ලම ක්‍රමක්‍රමයෙන් දියුණු වූවාහු වෙති. එයින් කැපී පෙණෙන ගුණ

කිවයුතු චෛතසිකයෝ පළමුවැනි සිතට වඩා දෙවෙනි ධ්‍යාන සිතෙහිද (සද්ධාව) දෙවෙනි ධ්‍යාන සිතට වඩා තුන්වැනි ධ්‍යාන සිතෙහිද මතුවී ප්‍රකටවී ඇත.

දෙවෙනි ධ්‍යාන සිතෙහි ප්‍රීතියෙන් කැළඹුනු හෙයින් "සති" චෛතසිකය මතුවී පෙණෙන තරම් දියුණුවක් නොවීය. තුන්වැනි ධ්‍යාන සිතේද ප්‍රීතියද සම්පූර්ණයෙන් දුරුව යන හෙයින් සතිය මතුවී පෙණෙන පරිදි ක්‍රියාකාරී වේ. මෙම සති ආදී චෛතසික ධර්මයන් ප්‍රථම භාගයේදී විස්තර කරණලද නමුදු මෙහිදීද දක්වන්නේ සුවසේ ගැනීමටය.

**සරණ ලක්ඛණා සති:** සිහිකිරීම හෙවත් සමරණය ලක්ෂණ කොට ඇත්තේ සතියයි. සිහිකිරීම නම් සිතට ඇවිත් හෙවත් එළඹ සිටීමයි උපට්ඨානයයි.

**අසම්මුස්සන රසා:** අමතක නොවීම කෘත්‍යයයි "සති" චෛතසිකය ක්‍රියාකරන්නේ සිතට ආ දෙය ඉක්මණින් අමතක නොවන ලෙසටය. යමක් අමතකවූ විට මට සිහි නැතිඋනා යැයි බොහෝදෙනා කියනු අපට ඇසේ. ඒ සතියගේ ක්‍රියාකිරීම අඩුවීමයි.

**ආරක්ඛ පච්චුපට්ඨානා:** සිත කෙලෙසුන්ගෙන් ආරක්ෂා කරගැනීම සතිය එළඹ සිටි බවට හෙවත් ඉදිරිපත්වූ බවට ලකුණයි. සතිය ඒකාන්ත කුසල චෛතසිකයෙකි. මිච්ඡා සති යැයි සූත්‍රාන්තයන්හි දක්වෙතත් වොහාර දේශනා වශයෙන් සම්මාසතියට විරුද්ධ මිච්ඡාසතියක් ඇතැයි ලෝකයාගේ පිළිගැනීමත් සමග මෙසේ අකුසල සිත්වල ක්‍රියාකරණ මෝහය හා මනසිකාරය සෙන එසේ වදාළ බවත් සිතිය හැකිය. විඤ්ඤාණය හෙවත් සිත සතියට මෙන්ම අනිකුත් චෛතසික වලටද පදට්ඨානයයි.

**සම්පජානො:** මනාකොට ප්‍රජානනය දැනගැනීම හෙවත් ප්‍රඥාවෙන්ද යුක්තවූයේ වෙයි. සතිය මෙන්ම ප්‍රඥා

වද මෙහිදී මතුවී පෙණේ. යම් සිතක සතිය ක්‍රියාකාරී නම් ප්‍රඥාවත් එහි ක්‍රියාකරණු නියතය. සතිපට්ඨානාදී සූත්‍රාන්තයන්හිද "සතොසම්පජානො" යනුවෙන් එකට යෙදීමෙන් ඒ බව පැහැදිලිය.

"අසම්මොහලක්ඛණං සම්පජඤ්ඤං"

නුමුලා බව ලක්ෂණ කොට ඇත්තේ සම්පජඤ්ඤයයි, නුමුලා බව නම් වැටහීමය. තීරණ රසං අරමුණ තීරණය කිරීම කෘත්‍යයයි මෙහිලා තීරණය නම් අනිත්‍යාදි වශයෙන් තීරණය ප්‍රධානය.

**පවිචය පච්චුපට්ඨානං:** පවිචය හෙවත් විමසීම එළඹ සිටීමයි. ප්‍රඥාව ඉදිරිපත්වූ බව දැනගත හැක්කේ විමසිලිමත් ගතිය සිතෙහි ඇතිවීමෙනි.

මෙම සතිසම්පජඤ්ඤයන් පළමු ධ්‍යානයන්හිද ඇත. සිහිමුලාවූ නුවණ නැති අයට අර්පිණ ධ්‍යානයක් තබා උපචාර ධ්‍යානයක්වත් නොලැබේ. ඉහත සඳහන්කළ පරිදි ඒවා ඒ සිත්හි අප්‍රකටය.

පිට්ටනියක ඇවිදින මිනිසා ඒ තරම්ම කල්පනාවෙන් ඇවිදින්නේ නැත. ඒදඬු කඳු බෑවුම් ආදියට යනවිට හොඳ පරිස්සමෙන් ගමන් කරයි. මෙහි තුන්වැනි ධ්‍යානයාගේ සියුම් බව හෙයින් දැලිපිහි මුව අතක කඩු මුනතක ඇවිදීම මෙන් ඉතා හොඳ සිහියකින් ක්‍රියාකිරීම දක්නා ලැබේ. එහෙයින් තතියජ්ඣාන සිතෙහි ඉතා ප්‍රකටව සතිසම්පජඤ්ඤයන් යෙදෙන බව පැහැදිලිය.

**සුඛංච කායෙන පටිසංවෙදෙති:** තුන්වැනි ධ්‍යාන සිත සුඛසහගතය. ප්‍රීතියෙන් මිදුණු එහෙයින් ප්‍රණීතවූ සුඛයකි. සතිසම්පජඤ්ඤයන්ගේ ඒ සුඛය ප්‍රීතියට ලංවිය නොදී රක්නේය. සුඛයෙහි සත්වයෝ ඇලෙති එහෙත් මෙහි එකට ඇතිවන සුඛයෙහි නොඇලී උපෙක්ෂාවට බරව සිටීමට සතිසම්පජඤ්ඤයන් උපකාරී වෙයි. එහෙයින්ද තුන්වැනි ධ්‍යාන සිතෙහි සතිය හා සම්පජඤ්ඤය විශෙෂයෙන් දක්වනලද බව අටුවාව කියයි,

මෙහි තුන්වන ධ්‍යාන සිත සමඟ සුඛය යෙදුණද සුඛ වේදනාව පිළිබඳ හැඟීමක් හෙවත් ආභෝගයක් මෙසේ සැපයක් විඳිමියි ගැනීමක් එම ධ්‍යාන සිතෙහි නැත එම සිත හා අනිකුත් චෛතසික සමඟ යෙදෙන සෞමනස්‍ය (සුඛය) විසින් ඉතා ප්‍රණීත චිත්තජරූප කලාපයන් පහළ කරන්නේය. මෙසේ නාම කයෙන් හටගන්නා ප්‍රණීත රූප කලාප නිසා ධ්‍යානයෙන් නැගීසිටි පසුද ශරීරයට ප්‍රණීත සුඛයක් දැනෙන්නේය. එහෙයින් තුන්වැනි ධ්‍යානලාභියා කයෙනුදු සැප විඳින්නේයයි කියන ලදී.

යන්තං අරියා ආචික්ඛන්ති: ඔහුට මෙසේ බුද්ධාදි ආර්‍ය්‍යයන් වහන්සේලා උපෙක්ෂා ඇති සිහි ඇති සැපසේ වසන්නෙකැයි කියති. පඨවිකසිණයෙන් ලත් මේ තුන්වැනි ධ්‍යානයට පැමිණ වෙසෙත්.

චෛතසික වශයෙන් උපෙක්ෂාවත් සුඛයත් එක සිතක යෙදිය නොහැකිය. මේ ධ්‍යානුපෙක්ෂාවයි. වේදනා උපෙක්ෂාව නොවෙයි මේ වනාහි සුඛවේදනාවෙහි නො ඇලී මධ්‍යස්ථ වීමයි. සුව දුක් දෙක අතර විඳිනා වේදනාවක් නොවේ. මෙහි වේදනාව නම් සැපයමය. සිහි නො ඇලීම් වශයෙන් මැදහත් බවයි. මෙසේ සියුම්වූ දහම් දැන විදසුන් වඩා ශාන්ත නිවන් සුව ලබත්වා!

# 50

## සතරවැනි ධ්‍යාන සිත.

“කතමෙ ධම්මා කුසලා?

යස්මිං සමයෙ රූපූපපත්තියා මග්ගං භාවෙති, සුඛස්සච පහාණා දුක්ඛස්සච පහාණා, පුබ්බෙව සොමනස්ස දොමනස්සානං අත්ථඞ්ගමා, අදුක්ඛමසුඛං, උපෙක්ඛා සතිපාරිසුද්ධිං, චතුත්ථජ්ඣානං උපසම්පජ්ජ විහරති පඨවීකසිණං.”

**කුසල් දහම් කවරහුද?**

යම් වේලාවක රූපී බඹලොව, ඉපදීම පිණිස මාර්ගය වඩයිද, සැපය දුරුකිරීමෙන්ද (පහාණය කිරීමෙන්) දුක දුරුකිරීමෙන්ද, මුලින්ම සොම්නස් දොම්නසුන් පහකිරීමෙන්ද, නොදුක් නොසුව උපෙක්‍ෂා සිහි පිරිසිදු බව ඇති චතුර්ථධ්‍යානයට හෙවත් සතරවැනි ධ්‍යානයට (පඨවිකසිණං) පැමිණ වෙසේ.

ශාන්තිනායක සම්බුදුපියාණන් වහන්සේ සතරවැනි (චතුර්) ධ්‍යාන සිත විස්තරකර වදාරණසේක් එහි ලැබෙන නොදතහැකි වේදනාව එනම් උපෙක්ඛාව පැහැදිලිකරදීම සඳහා සුඛස්සච පහාණා යනාදීන් වදාළසේක

ධ්‍යාන සතර සමස්තයක් වශයෙන් ගත්කල එහෙම පිටින් සැප වේදනාවකි එහෙත් එම සැපය ක්‍රමයෙන් සියුම් වන අයුරු ඕලාරික සැපයෙන්ද දුරුව සැපයෙහිත් සියුම් ශාන්ත සුවයකට පත්කරණ අයුරු විමසා දතහැකිය.

සතරවැනි ධ්‍යානය විස්තරකරණ අයුරින් - සුඛස්සච පහාණා - සැපය පහකිරීමෙන් යනුවෙන් කායික සුවය ගතයුතුය. එසේම දුක පහකිරීමෙන් යනුවෙන් කායික දුක දතයුතුය.

කායික සුඛදුක්ඛ වේදනාවෝ නම් කය ඇසුරු කොට උපදනා සිතෙහි ලැබෙන වේදනාවය.

චක්ඛු (ඇස) ඇසුරුකොට උපදනා කණ, නාසය, දිව ඇසුරුකොට උපදනා සිත්හි වේදනා උපෙක්ඛා සහිතය.

කය ඇසුරුකොට උපදනාවූද අනික් පසිඳුරන් ඇසුරු කොට උපදනාවූද චිත්ත වීථීන්හි ජවනයන් සොමනස්ස දෞමනස්ස වේදනාවන් ගෙන්ද යුතුය.

කායික සැපදුක්ද නාමධම්මය, චෛතසිකමය, සුවදුක් දැනෙන්නේද සිතටය. එහෙයින් කයේ උපකාරය ලබා එය අරමුණම උපදින සිතෙහි දැනෙන වේදනාවට කායික සුඛය හෝ දුක්ඛ යැයි කියනු ලැබේ

"පුබ්බෙව සොමනස්ස දෞමනස්ස අත්ථඞ්ගමා" යනුවෙන් පළමුකොටම සොම්නස් දොම්නසුත් දුරුකළ බව කියන ලදී.

මෙහි සොමනස්ස යනුවෙන් චෛතසික සුවයද දෞමනස්ස යනුවෙන් චෛතසික දුකද ගන්නා ලදී. සුවදුක් වේදනාවෙහි දියුණු හෙවත් සියුම්වූ කුසලාකුසල ජවන යන් පිළිබඳ අවස්ථාව මෙයින් චෛතසික වශයෙන් වෙන් වූසේ සිතිය හැකිය.

අපේ ශරීරයට කඩු ආදියකින් බරපතල පහරක් ලැබේ. එවිට කායද්වාරික චිත්තවීථියක් පහළවේ. එහි කායවිඤ්ඤාණ සිත විපාක සිතකි. එය දුක්ඛ විපාකයකි.

ඊළඟට උපෙක්ඛා සහගත සම්පටිච්ඡන, සන්තීරණ, විපාක සිත්ද, උපෙක්ඛා සහගත වොට්ඨපන කිරිය සිතද, පහළවී දෞමනස්ස සහගත පටිඝ සිතක් ජවන් වශයෙන් පහළවේ.

අපි මළගිය ඥාතියකු පිළිබඳ සිතමු එම මනොද්වාරික චිත්තවීථියෙහි උපෙක්ඛා සහගත මනොද්වාරාවජ්ජන සිත බිඳීගිය පසු දෞමනස්ස සහගත පටිඝ සිතක් ජවන් වශ යෙන් ක්‍රියාකරමින් හැඬීම්, වැළපීම් ආදිය පවා ඇති කරන්නේය. මේ අකුසල් පිළිබඳවය.

කුසල් ගැනද මෙසේය:

මෙසේ මෙයින් විපාක සිත සමග පවත්නා වේදනාව කායික දුක්ඛ හෝ සුඛ බවත් ජවනයන් සමග පවත්නා වේදනා චෛතසිකය සෞමනස්ස හෝ දෞමනස්ස බවත් පැහැදිලිය. එහෙයින් එය ජවන් මනස හා බැඳෙන බැවිනුත් මානසික හෙවත් චෛතසික සුඛ දුක්ඛ නාමයෙන් දක්වන ලදැයි සිතිය යුතුය.

සතරවැනි ධ්‍යාන සිතට පෙරතුව එන උපචාර ධ්‍යාන යේදී සෞමනස්ස වේදනාව ප්‍රහීන වේ. එහෙයින් පුබ්බෙව සොමනස්ස දොමනස්සානං අත්ථඞ්ගමා යනුවෙන් දක්වන ලදී. එහෙත් දුක්ඛ දෞමනස්සයන් නිරුද්ධවත්තේ එයට බොහෝ කලින්ය. පළමුවැනි ධ්‍යාන උපචාරයේදී දුක්ඛයද දෙවැනි ධ්‍යාන උපචාරයේදී දෞමනස්සද තුන්වැනි ධ්‍යාන උපචාරයේදී සුඛයද සතරවැනි ධ්‍යාන උපචාරයේදී සෞමනස්සයද ගතයුතු සේ පෙනේ.

"සොමනස්සංහි චතුත්ථජ්ඣානස්ස උපචාරක්ඛණෙ පහීයති."

දුක්ඛදොමනස්ස සුඛානි පඨම දුතිය තතියජ්ඣානානං උපචාරක්ඛණෙසු. (අත්ථසාලිනී 168)

එහෙත් ධ්‍යාන සිත් දක්වා වදාළ අයුරින් නම් දුක්ඛ දෞමනස්සයන් ප්‍රථමධ්‍යාන උපචාරයෙන්ද දුරුවන බව පිළිගත යුතුසේ පෙනේ. මෙහි අර්පණා ධ්‍යාන සිත්වලින් ප්‍රහාණය වන බව දැක්වූයේ අතිශයින්ම නිරුද්ධ වන බව හෙවත් අර්පණා චිත්තවීථියට කලින් ඇතිවන උපචාරයන් හිදී මැසි මදුරු විසම ආසනාදිය නිසා යළිත් දුක් වේදනා ඇතිවිය හැකිය. එහෙත් ප්‍රථම ධ්‍යානයට පැමිණි පසු අර්පණාව ඇතුළතදී නම් කෙසේවත් දුක්ඛ වේදනාවක් දෞමනසක් ඇති නොවේ. එහෙයින්ම අතිශයෙන්ම නිරුද්ධ භාවය සලකා අර්පණා සිත්ම ගන්නා ලදී.

ප්‍රථම ධ්‍යානය සුඛ සොමනස්ස සහගතය. එයට වඩා සියුම්වූ සැපයක් සෞම්නස්‍යක් දෙවෙනි ධ්‍යානයේද එයටත් වඩා සියුම් සුඛයක් තුන්වැනි ධ්‍යානයේද එම ඉතා ප්‍රණීත සුවයක් නොදැනී යන තරමේ සුවයක් හෙවත් සුවයෙහි කෙළවරක්- දුකටද කිව්වූ නොවීමක් උපෙක්‍ෂා නාමයෙන් සතරවැනි ධ්‍යානයේදී ලැබේ.

උපෙක්‍ෂාව ඉතා ශාන්තය. ශාන්ත බවම සැපය වේ. එහෙයින් "උපෙක්ඛාපන සන්තත්තා සුඛම් සුඛම්ච්චවෙව භාසිතා"

උපෙක්‍ෂාව ශාන්ත බැවින් සැපයක් යැයි කියාම කියන ලදී.

මේ සතරවැනි ධ්‍යාන සිතට කොහොමවත් කිව්වූ නැති දුක්ඛ වේදනාදිය මෙහිදී දක්වූයේ උපෙක්‍ෂාව තනි කර වටහාගැණීමේ දුෂ්කරතාවය හෙයිනි.

දුක්ඛ දොමනස්ස සුඛ සොමනස්සයන් දක්වීමෙන් උපෙක්ඛාව අල්ලාගත යුතුය. එය වනාහි නොදැනෙන වේදනාවක් හෙයිනි. ඇල්ලීමට අපහසු ගවයෙකු අතික් ගවයින් සමග කොටුකර එක එක ගවයාට පමණක් යන්ට කඩුල්ල යොදා එතනදී අමාරු ගවයා අල්ලාගන්නා මෙනි.

උපෙක්‍ෂාවෙන් පිරිසිදුවූ සිහියක් ඇති යනුවෙන් නොකැලැඹුනු ශාන්ත උපෙක්‍ෂාවෙන් සිත යුතුවන විට සති ආදී සියලු චෛතසිකයෙන්ම ඉතාම පිරිසිදුය. සතිය නිතරම සිත එක අරමුණෙහි තැබීමට උපකාරවන හෙයින් මෙම සතරවන ධ්‍යාන සිත උපෙක්‍ෂාවෙන් පිරිසිදුවූ සිහියෙන් යුක්තයැයි කියන ලදී. මෙසේ පඨවිකසිණයෙන් උපදවනලද සතරවැනි ධ්‍යාන සිතට පැමිණ වාසය කෙරේ.

මෙසේ දහම් දැන විදසුන් වඩා ශාන්ත නිවන් සුව ලබත්වා!

# 51

## පඤ්චකනය හෙවත් ධ්‍යාන පස බෙදෙන හැටි.

"කතමෙ ධම්මා කුසලා?

යස්මිං සමයෙ රූපූපපත්තියා මග්ගං භාවෙති. අවිතක්කං විචාරමත්තං සමාධිජං පීතිසුඛං දුතියජ්ඣානං උපසම්පජ්ජ විහරති, පඨවිකසිණං"

ශාන්තිනායක සම්මාසම්බුද්ධ රජාණන් වහන්සේ සූත්‍රාන්තයෙහි හා අභිධර්මයෙහිද බෙහෙවින් ධ්‍යාන සතරක්ම දක්වා වදාළසේක. නවානුපූර්ව සමාධි ආදි ප්‍රකට දේශනාවන්හි හා පට්ඨාන උපනිස්සය විභඞ්ගයෙහි "පඨමස්ස ඣානස්ස පරිකම්මං පඨමස්ස ඣානස්ස උපනිස්සය පච්චයෙන පච්චයො"

දුතියස්ස ඣානස්ස පරිකම්මං -පෙ-
තතියස්ස ඣානස්ස පරිකම්මං -පෙ-
චතුත්ථස්ස ඣානස්ස පරිකම්මං -පෙ-

යනාදී වශයෙන් පළමුවැනි ධ්‍යානයාගේ පරිකර්ම භාවනාව පළමුවැනි ධ්‍යානයට උපනිස්සය ශක්තියෙන් උපකාරවේ. මෙසේ දෙවෙනි තුන්වැනි සතරවැනි ධ්‍යානයන්ගේ පරිකර්මය එම ධ්‍යානයන්ට උපනිස්සය ශක්තියෙන් උපකාර වේ යනුවෙන්ද නොයෙක් තැන රූප ධ්‍යාන සතරක්ම දක්වා ඇත.

එහෙත් රූපාවචර ධ්‍යාන කුසල් පහක් පඤ්චක නය වශයෙන් ධම්මසඞ්ගණියෙහි වදාළසේක. ධ්‍යාන සිත් සතර චතුර්ධ්‍යානය චතුක්ක නය පසුගිය අභිධර්ම පාඩම්වල දක්වා ඇත. එයින් ඒ සතරට අයත් නොවන පස්වැනි ධ්‍යානයේ හෙවත් පඤ්චකනයේ දෙවෙනි ධ්‍යාන සිත වශයෙන් දෙසූ ධ්‍යාන කුශලය මෙහි දක්වා ඇත.

එනම් කුසල් දහම් කවරහුද?

යම් වේලාවක රූපී බඹලොව ඉපදීම පිණිස මාර්ගය වඩාද විතර්කයෙන් තොරවූ විචාරමාත්‍රයක් ඇති සමාධියෙන් හටගත් ප්‍රීතිය හා සැපය ඇති දෙවෙනි ධ්‍යානයට (පඨවි කසිණයෙන් ලද) පැමිණ වෙසේ යැයි දෙසූසේක.

චතුක්කනය වශයෙන් දෙසූ 2, 3, 4 සිත් මෙම පඤ්චක නයෙහි 3, 4, 5 වශයෙන් ගත යුතුය.

පළමුවැනි ධ්‍යාන කුසල සිත නය දෙකෙහිම එකය.

ධම්මසඞ්ගණීගෙහි දැක්වූ අයුරු ධ්‍යාන සිත් සතර මෙසේය.

1. සවිතක්ක සවිචාර පීතිසුඛ පඨමජ්ඣාන සිත.
2. අවිතක්ක අවිචාර පීතිසුඛ දුතියජ්ඣාන සිත.
3. ප්‍රීතියෙන්ද දුරුවූ උපෙක්ෂාව හා සැපයෙන් යුතු තතියජ්ඣාන සිත.
4. සැපයෙන්ද දුරුවූ උපෙක්ෂා සිහි පිරිසිදු ඇති තතියජ්ඣාන සිත.

ධ්‍යාන සිත් පහ හෙවත් පඤ්චකනය මෙසේය.

1. සවිතක්ක සවිචාර පීතිසුඛ පඨමජ්ඣාන සිත.
2. අවිතක්ක විචාරමත්ත පීතිසුඛ දුතියජ්ඣාන සිත. (මෙම් පාඩමේ මුලින් දැක්වූ සිත)
3. අවිතක්ක අවිචාර පීතිසුඛ තතියජ්ඣාන සිත.
4. ප්‍රීතියෙන්ද දුරුවූ උපෙක්ෂාව හා සැපයෙන්ද යුතු චතුත්ථජ්ඣාන සිත.
5. සැපයෙන්ද දුරුවූ උපෙක්ෂා සිහි පිරිසිදු ඇති පඤ්චමජ්ඣාන සිත යනුවෙනි.

ඒකාග්‍රතාවය මේ පසෙහිම අනිවාර්යය.

මෙසේ ධ්‍යානාංග පස අනුව ධ්‍යාන පසක් ගැනී
පහසු නිරවුල් බවක් නැහෙතත් මෙම ධම්මසඞ්ගණියේ සහ
සූත්‍රාන්තයේ

තයො මෙ භික්ඛවෙ සමාධී, මහණෙති සමාධි තුණෙක.

1. සවිතක්ක සවිචාරෙ සමාධි, විතර්ක විචාර සහිත
සමාධිය.

2. අවිතක්ක විචාර මත්තො සමාධි, අවිතර්ක විචාර මාත්‍ර
සමාධිය.

3. අවිතක්ක අවිචාරෙ සමාධි, අවිතර්ක අවිචාර සමාධිය
යනාදි දෙසුම්වල ඉතා කලාතුරෙකින් දෙවෙනි ධ්‍යානය
අවිතර්ක විචාර මාත්‍රකොට දක්වා ඇත.

ධ්‍යාන සතර නැවත පහක්කොට දෙසුයේක් පුද්ගල
ධ්‍යානය හා දේශනාවිලාසය වශයෙන් යැයි අත්‍ථසාලිනිය
කියයි.

අභිධර්මය අසන සමහර දෙව්වරුන් විතර්කයම ඖලාරික
වශයෙන් වැටහී විචාර, ප්‍රීති, සුඛ, ඒකාග්‍රතාවන් ශාන්ත
වශයෙන් වැටහිනිය හෙයින් එම දෙව්වරුන්ට සත්ප්‍රාය
වශයෙන් අවිතක්ක විචාර මාත්‍ර දෙවෙනි ධ්‍යාන සිත බෙද
දක්වූ බව එහි අඞ්ග සතරක් බවද කියැවේ. ශාන්තිනායක
සම්බුද්ධරජාණන් වහන්සේ ධර්මධාතුව මනාව අවබෝධකළ
හෙයින් ඒ ඒ ධර්මාඞ්ගයන්ගේ වශයෙන් ධ්‍යාන සිත් පසක්
මෙසේ බෙදා වදාළ බවද දැක්වේ.

කෙසේ නමුදු සූත්‍ර දේශනාවෙහිත් අභිධර්මයෙහිත් අටුවා
කථාවන්හිත් මෙසේ ධ්‍යාන සිත් සතරක් හා පහක් දක්වේ.
මෙහිදී විමසිය යුත්තේ මෙම ධ්‍යාන සිත් භාවනානුයෝගී
යාට ලැබෙන්නේ කෙසේද කියායි.

විශුද්ධිමාර්ගය ඇතුළු සියළු විස්තර කථාවක්හි හා
දේශනා පෙළෙහිද දක්වෙන්නේ පළමු ධ්‍යානය ලැබී

යෝගියා එය පුහුණුකොට විතර්ක විචාරයන්ගේ ඖදාරික බව සලකා ඒවා දුරකිරීම් වශයෙන් නැවත භාවනා වඩා ද්විතියජ්ඣාන සිත ලබන බවය.

ධ්‍යාන සිත් පහක් ලැබෙන්නටනම් පළමුවැනි ධ්‍යානය ලැබූ යොගියා විතර්කයේ පමණක් ඖදාරික බව සලකා භාවනා වඩා විචාරය ප්‍රීතිය සුඛය සහිතවූ දෙවෙනි ධ්‍යාන යට පැමිණිය යුතුය. එහෙත් එසේ භාවනා කරන්නට විශුද්ධිමාර්ගීය ඇතුළු කිසිම භාවනා පොතක උපදෙස් දී නැත.

එයට හේතුව වශයෙන් සැලකිය යුතුව තිබෙන්නේ විතර්ක විචාර දෙකම එක සිතකිනුත් දුරුකොට දෙවෙනි ධ්‍යාන කුශලය ලැබියහැකි හෙයින් එක සිතෙන් කළහැකි දෙය දෙසිතකින් කිරීම කාලය මිඩංගු කිරීමක් පමණක් හෙයින් විය යුතුය.

තවත් මෙයින් වැටහෙන කාරණයක් නම් විතර්ක විචාර යන් ඉතා සියුම් සම්බන්ධයක් ඇති එක හා සමාන චෛත සික ධර්ම වීමය. අරමුණෙහි නැංවීම හා එහි පැවැත්ම මේ දෙකින් කෙරෙණ කටයුතුය. කල්පනාව හා විචාරය මෙයින් ගතයුතුය. එහෙයින් මේ ධර්මයන් එකක් ප්‍රහාණය වනවිට අනිකත් ප්‍රහාණයවූවා හා සමානය. එහෙයින් දෙකම එකවර එක සිතකින් ප්‍රහාණය කරන්නට ඡන්දය යෙදුණොත් දෙකම ප්‍රහාණය අපහසු නොවේ.

එසේම සිතෙහි තත්වය පමණක් නොව පඤ්චවිධ ඥෙය මණ්ඩලයම මනාව අවබෝධකර වදාළ සම්බුද්ධ හාමුදුරු වන් වහන්සේ විතර්කය එක සිතකිනුත් විචාරය එක සිතකිනුත් ප්‍රහාණය කළහැකි බවද දක්වූ බව පිළිගත යුතුය. මෙසේ දහම් දැන උතුම් නිවන් සැප පසක් කෙරෙත්වා!

# 52

## පටිපදා භේදය

'කතමෙ ධම්මා කුසලා;

යස්මිං සමයෙ රූපූපපත්තියා මග්ගං භාවෙති, සවිතක්කං සවිචාරං, විවේකජං පීතිසුඛං පඨමජ්ඣානං උපසම්පජ්ජ විහරති දුක්ඛා පටිපදං දන්ධාභිඤ්ඤං පඨවිකසිණං''

කුසල් දහම් කවරහුද?

යම් වේලාවක රූපී බඹලොව ඉපදීම පිණිස මාර්ගය වඩයිද? විතර්කය සහිතවූ විචාරය සහිතවූ විවේකයෙන් හටගත්තාවූ ප්‍රීතිය හා සැපය ඇති දුක්වූ මග (ප්‍රතිපදාව) හා ලැසිවූ අවබෝධය (අභිඤ්ඤා) ඇති පඨවිකසිණ ප්‍රථම ධ්‍යානයට පැමිණ වෙසේ.

ශාන්තිනායක සම්බුද්ධපියාණන් වහන්සේ රූපාවචර කුසල් චතුක්ක සහ පඤ්චක නය භේදයෙන් හෙවත් සතර පස් ක්‍රමවලින් දක්වා සුද්ධික නවය හෙවත් මූලික ධ්‍යාන සිත් නවය දක්වා ඒ හැම සිතක්ම සතර ප්‍රතිපදාවන්ට අනුව ලැබෙන බව දැක්වීම සඳහා කතමෙ ධම්මා කුසලා' යනාදීන් නැවත දේශනා කළ සේක.

එහි පළමුවැනි රූපාවචර කුශල සිත:

1 දුක්ඛා පටිපදා දන්ධාභිඤ්ඤා

2 දුක්ඛා පටිපදා ඛිප්පාභිඤ්ඤා

3 සුඛා පටිපදා දන්ධාභිඤ්ඤා

4 සුඛා පටිපදා ඛිප්පාභිඤ්ඤා

යන ප්‍රතිපදා සතරෙන් එකකින් පහළවියහැකි හෙයින් මෙම ධ්‍යාන කුසල් සිත් ගුණවියයි. පටිපදා නම්: ප්‍රතිපත්ති මාර්ගයයි.

මෙසේ යෝගාවචරයා යම් වේලාවක පඨවි-පඨවි යැයි භාවනා කරන්නට පටන්ගණිිද එතැන් සිට උපචාරය දක්වා පවත්නා භාවනා මාර්ගය, කාලය පටිපදා නම් වේ.

අභිඤ්ඤා= උපචාරයේ සිට අර්පණාව දක්වා පවත්නා ධ්‍යාන ප්‍රඥාව අභිඤ්ඤා නම් වේ.

මෙසේ මේ සතර ප්‍රතිපදාව:

1 දුක්වූ භාවනා මාර්ගය සෙමින් අවබෝධය,

2 දුක්වූ මාර්ගය ඉක්මන් අවබෝධය,

3 සැපවූ මාර්ගය සෙමින් අවබෝධය,

4 සැපවූ මාර්ගය ඉක්මන් අවබෝධය කියා දක්විය හැකිය.

ඇතැමෙකුට මෙම ප්‍රතිපදාව භාවනා මාර්ගය (මූලසිට උපචාරයට) දුකසේ යායුතු වේ. නීවරණාදී විරුද්ධ ධර්ම යන්ගේ සිත්හි බලපෑමෙන් අපහසුවෙන් යායුතු වේ එසේ නැති ඇතැමෙකුම සුවසේ කටගැකි වේ. මූලසිට උපචාර යට භාවනා සුවසේ කළහැකි වේ. ඔහුට සුඛා පටිපදාය.

උපචාරයේ සිට අර්පණාව දක්වා අවබෝධ කාලයක් මදව හෙමින් සිදුවේ. ඔහුට දන්ධාභිඤ්ඤාය. ඉක්මණින් සීඝ්‍රයෙන් සමහරෙකුට අවබෝධය ලැබේ. ඔහුට ඛිප්පාභිඤ්ඤාය. යමෙක් කෙලෙසුන් විෂ්කම්භණය කොට අර්පණ පිරිවෙස් වසන්නේ හෙවත් ධ්‍යානය ලැබීම බලාපොරොත්තු වෙන් සිටින්නේ කලක් ගතවී ධ්‍යානාංගයන් පහළවීම සිදුවේද ඔහු දන්ධාභිඤ්ඤා නම් වේ. යමෙකුට ධ්‍යානාඞ්ගයන් ඉක්මණින් පහළවේද ඔහුට ඛිප්පාභිඤ්ඤාය. යමෙක් කෙලෙසුන් විෂ්කම්භණය කරන්නේ සුවසේ නොවෙහෙසී විෂ්කම්භණය කෙරේද ඔහුගේ ප්‍රතිපදාව හෙවත් භාවනා මාර්ගය සැපවේ.

භාවනාවට නොපැසවූ අවාසය ගොදුරුගම හෙවත් පිඩුසිගායන ප්‍රවේශය, කථා පුද්ගලයන්, භෝජන, සෘතු ගුණය, ඉරියව්ව සහ සත්වැදෑරුම් අසප්පාය කරුණු සේවනයෙන් දුක්වූ භාවනා මාර්ගය හා ලැසිවූ අවබෝධ යෙන් යුත් පළමු ධ්‍යාන සිත ලැබේ.

භාවනාවට සැපවූ ආවාසය, ගොදුරුගම, කථා, පුද්ගල යන්, භෝජන, ඍතුගුණය, ඉරියව්ව යන සත්වැදෑරුම් සප්පාය කරුණු සේවනයෙන් සැපවූ භාවනා මාර්ගයෙන් හා ඉක්මන් අවබෝධයෙන් යුතුවූ පළමු ධ්‍යාන සිත ලැබේ.

මුල් කාලයේ (මුලසිට උපචාරයට අසප්පාය සේවනයෙන් හා උපචාරයේ සිට අර්පණාවට සප්පාය සේවනයෙන් දුක්ඛා පටිපදා (දුක්වූ භාවනා මාර්ග) වූ පළමුවැනි ධ්‍යාන සිත ලැබේ.

මුලදී සප්පාය සේවනයෙන් හා අගදී අසප්පාය සේවනයෙන් සුඛා පටිපදා දන්ධාභිඤ්ඤා පළමුවැනි ධ්‍යාන සිත ලැබේ.

පූර්වකෘත්‍යයන් (මෙහි හිසකෙස් බෑම ආදී සුළු සුළු කටයුතු) නොකොට භාවනාවට බැසීමෙන් දුක්ඛා පටිපදා හා ශ්‍රද්ධාදී ඉන්ද්‍රියයන් සමව පවත්වා ගැනීමෙන් තොරව භාවනා කිරීමෙන් දන්ධාභිඤ්ඤා වේ. පූර්ව කෘත්‍යයන් හා අර්පණා කෞශල්‍යය ඇතිකර ගැනීමෙන් සුඛා පටිපදා ඛිප්පාභිඤ්ඤා වේ.

තවද, තණ්හාවෙන් මැඩපැවැත්වුණු සිතැත්තහුට දුක්ඛාපටිපදාය,

අවිද්‍යාවෙන් මැඩපැවැත්වුණු හට දන්ධාභිඤ්ඤාය.

පෙර සමථ භාවනා නොකළ තැනැත්තාට දුක්ඛා පටිපදාය. පෙර විපස්සනා භාවනා නොකළ තැනැත්තාට දන්ධාභිඤ්ඤාය.

බහල කෙලෙස් හා මාඳුවූ ශ්‍රද්ධාදි ඉන්ද්‍රිය ඇති තැනැත්තාට දුක්ඛාපටිපදා දන්ධාභිඤ්ඤාය. මඳ කෙලෙස් හා තියුණු ඉන්ද්‍රිය ඇති තැනැත්තාට සුඛා පටිපදා ඛිප්පාභිඤ්ඤාය.

මෙසේ මෙම ධ්‍යාන සිත් සතර හෝ පස පටිපදා භේදයෙන් 16 ක් හා 20 ක් වන සැටි දැන විදසුන් වඩා නිවන් සැප ලබත්වා.

# 53

## ආරම්මණ භෙදය සහ පටිපදා ආරම්මණ භෙදය (16)

"කතමෙ ධම්මා කුසලා?

යස්මිං සමයෙ රූපූපපත්තියා මග්ගං භාවෙති විවිච්චෙව කාමෙහි විවිච්ච අකුසලෙහි ධම්මෙහි සවිතක්කං සවිචාරං විවෙකජං පීතිසුඛං පඨමජ්ඣානං උපසම්පජ්ජ විහරති පරිත්තං පරිත්තාරම්මණං පඨවිකසිණං.

කුසල් දහම් කවරහුද?

යම් වේලාවක රූපී බඹලොව ඉපදීම සඳහා මාර්ගය වඩාද කාමයන්ගෙන් දුරුව අකුසලයන්ගෙන් දුරුව විතර්ක සහිතවූ විවේකයෙන් හටගත් ප්‍රීතිය හා සැපය ඇති දුබල වූද, කුඩාවූ අරමුණක් ඇත්තාවූද පඨවිකසිණ ප්‍රථම ධ්‍යාන යට පැමිණ වෙසේ.

ශාන්තිනායක සම්මා සම්බුද්ධරජාණන් වහන්සේ පටිපදා භේදයට අනුව රූපාවචර ධ්‍යාන සිත් දේශනා කොට ආරම්මණ භේදයටද අනුව දක්වනසේක් කතමෙ ධම්මා කුසලා? යනාදීන් වදාළ සේක.

කුසල් දහම් කවරහුද?

යම් වේලාවක රූපී බඹලොව ඉපදීමට භාවනා වඩාද? මෙසේ පළමුවැනි ධ්‍යානය.

1. පරිත්ත (වසී නොකළ දුබල ධ්‍යානය)

   පරිත්තාරම්මණ (විශාල කොට නොපැතුරුවූ කසිණ නිමිත්ත ඇති) ධ්‍යාන සිතයි.

2. පරිත්ත (වසී නොකළ)

   අප්පමාණාරම්මණ (විශාල ලෙස පැතුරුවූ හෙවත් වැඩූ ධ්‍යාන නිමිත්ත ඇති ප්‍රථම ධ්‍යානයද,

3. අප්පමාණං (වසීකළ හෙවත් ප්‍රබල)

පරිත්තාරම්මණං (අරමුණ හෙවත් නිමිත්ත විශාල වශයෙන් නොවැඩූ ප්‍රථම ධ්‍යානය)

4. අප්පමාණං (වසීකළ)

අප්පමාණාරම්මණං (නිමිත්ත විශාල වශයෙන් වැඩූ ප්‍රථම ධ්‍යාන සිතයයි අරමුණක් වශයෙන් මෙසේ සෑම රූපාවචර ධ්‍යාන සිතක්ම සතරට බෙදේ.

මෙහිදී වටහාගත යුත්තේ ධ්‍යාන සිතත් ධ්‍යානාරම්මණයත් දෙකම වැඩීම- දියුණුකිරීම වශයෙන් මෙම ආරම්මණ භේදය ලැබෙන බවයි. පඨවිකසිණාදී යම්කිසි අරමුණක් ගෙන භාවනාකරණ යෝගියා උපචාර ධ්‍යානයට පැමිණි මේදී එම අරමුණ ප්‍රතිභාග නිමිත්ත වශයෙන් දියුණුවේ. නැවත භාවනාකිරීමේදී ප්‍රථම ධ්‍යාන අර්පණ සිත එම ප්‍රතිභාග නිමිත්තද වඩවඩාත් දියුණුවී එය අරමුණු කොට පහළවේ.

එම ධ්‍යාන සිත පස් ආකාරයකින් වසීකළ යුතුය.

1. ආවජ්ජනා වසී, පළමුවැනි ධ්‍යානය ඕනෑ තැනක ඕනෑම වේලාවක ඕනෑතරම් මෙනෙහිකළ හැකිද විතක්කාදී ධ්‍යානාංගයන් වෙන වෙනමද ආවර්ජනා කළහැකිද ආවර්ජනා කිරීමෙහි කිසි පැකිලීමක් නැද්ද? මේ ආවජ්ජන වසියයි.

2. සමාපජ්ජන වසී, කැමති ධ්‍යානයක් කැමති වේලාවක සමවැදීමෙහි පැකිළීමක් බාධාවක් නැද්ද? මේ සමාපජ්ජන වසියයි. මහ මුගලන් මහරහතුන් වහන්සේ නන්දෝපනන්ද දමනයේදී මේ සමාපජ්ජන වසියෙහි දියුණු අවස්ථාව දැක්වේ.

3. අධිට්ඨාන වසී, ඉතා සුළු වේලාවක් හෝ වැඩි වේලාවක් අධිට්ඨානයට අනුව ධ්‍යානයෙන් සිටියහැකි බව අධිට්ඨාන වසියයි.

4. වුට්ඨාන වසී, ඉතා ඉක්මණින් ධ්‍යානයෙන් නැගී සිටීමට හැකි ලෙස දියුණුකළ ධ්‍යානය වුට්ඨාන වසී නම් වේ. අඹතලාවෙහි මහා රෝහණ ගුප්ත තෙරුන්ට උපස්ථාන යට පැමිණි නාරජු බේරාගත් බුද්ධරක්ඛිත හිමියන් මෙහි

5. පච්චවෙක්ඛණ වසී, ආවජ්ජනයට අනතුරුව ප්‍රත්‍ය වෙක්ෂා ජවනයන්ගේ නොපැකිල පැවැත්ම මෙයින් දක්වේ. ආවජ්ජන වසියෙහිම පච්චවෙක්ඛණ වසියද එක්වේ.

මෙම පස්වැදෑරුම් වසිතාවයන්ගෙන් නුපුරුදු කරණ ලද ධ්‍යාන සිත පරිත්ත නම් වේ. පරිත්ත නම් සුළු කුඩා දුබල යන තේරුමයි. නීවරණයන් වහා නැගීසිට ධ්‍යාන යෙන් පිරිහෙලිය හැකි හෙයින් හා දෙවෙනි ධ්‍යානයට උපකාර නොවන හෙයින් වසී නොකළ ධ්‍යානය බෙහෙවින් දුබලය.

අරමුණද ප්‍රතිභාග අවස්ථාවේදීද වැඩිය හැකිය. මුළු මහත් ලෝකය තරම්ම විශාල වශයෙන් හෝ පඨවිකසිණා රම්මණය ආදී අරමුණු විශාලකළ හැකිය. එසේ විශාල කොට වැඩියහැකි අරමුණු එසේ විශාලකොට පතුරුවා නොවඩන ලද්දේ පරිත්තාරම්මණය. කුල්ලක් වට්ටියක් පමණ වඩන ලද්දේ පරිත්තාරම්මණය. මෙසේ වසී නොකළ - නොවැඩූ අරමුණු ඇති හෙයින්

1. පරිත්ත පරිත්තාරම්මණ පළමුවැනි ධ්‍යාන සිතය. මෙසේ
2. පරිත්ත-අප්පමාණාරම්මණ " " "
3. අප්පමාණ පරිත්තාරම්මණ " " "
4. අප්පමාණ-අප්පමාණාරම්මණ " " " යයි

පළමුවැනි ධ්‍යාන සිත අරමුණු භේදයෙන් සතරට බෙදේ. මෙසේ දෙවෙනි ධ්‍යාන සිත දුසි චතුක්කනය වශ යෙන් ධ්‍යාන සිත් 16 ක්ද, පඤ්චක නය වශයෙන් 20 ක්ද වෙති.

**පටිපදා ආරම්මණ භේදය.**

52 වැනි අභිධම්ම පාඩමෙහි දක්වනලද පටිපදා භේදය හා මෙම ආරම්මණ භේදයද ගෙණ සොළොස් වැදෑරුම් ආකාරයකින් ධ්‍යානයන්ගේ හීණ ප්‍රණීත බව දක්වන ලදී.

1. ඉතාම හීණ ප්‍රථම ධ්‍යානය.

දුක්ඛා පටිපදා - දන්ධාභිඤ්ඤා - පරිත්ත - පරිත්තාරම්මණ ධ්‍යානයයි.

16. ඉතාම ප්‍රණීත ප්‍රථමධ්‍යානය.

සුඛාපටිපදා - ඛිප්පාභිඤ්ඤා - අප්පමාණා - අප්පමාණා රම්මණ ධ්‍යානයයි. ඉතිරි 14 මෙම ප්‍රතිපදා ආරම්මණ යන්ගේ ක්‍රමයෙන් ප්‍රභේද වේ.

**දැන් මෙම 16 ආකාරය මෙසේ තේරුම්ගන්න.**

1. දුක්ඛා පටිපදා-දන්ධාභිඤ්ඤා-පරිත්ත-පරිත්තාරම්මණ ප්‍ර: ධ්‍යාන සිත
2. දුක්ඛා පටිපදා-දන්ධාභිඤ්ඤා-පරිත්ත-අප්පමාණාරම්මණ ප්‍රථම ධ්‍යාන සිත.
3. දුක්ඛා පටිපදා-දන්ධාභිඤ්ඤා-අප්පමාණ- පරිත්තාරම්මණ ප්‍රථම ධ්‍යාන සිත.
4. දුක්ඛා පටිපදා-දන්ධාභිඤ්ඤා-අප්පමාණ- අප්පමාණාරම්මණ ප්‍රථම ධ්‍යාන සිත.
5. දුක්ඛා පටිපදා-ඛිප්පාභිඤ්ඤා-පරිත්ත- පරිත්තාරම්මණ ප්‍රථම ධ්‍යාන සිත.
6. දුක්ඛා පටිපදා-ඛිප්පාභිඤ්ඤා-පරිත්ත- අප්පමාණාරම්මණ ප්‍රථම ධ්‍යාන සිත.
7. දුක්ඛා පටිපදා-ඛිප්පාභිඤ්ඤා-අප්පමාණ- පරිත්තාරම්මණ ප්‍රථම ධ්‍යාන සිත.
8. දුක්ඛා පටිපදා-ඛිප්පාභිඤ්ඤා-අප්පමාණ- අප්පමාණාරම්මණ ප්‍රථම ධ්‍යාන සිත.

9. සුඛා පටිපදා දන්ධාභිඤ්ඤා-පරිත්ත-
පරිත්තාරම්මණ ප්‍රථම ධ්‍යාන සිත.

10. සුඛා පටිපදා-දන්ධාභිඤ්ඤා-පරිත්ත-
අප්පමාණාරම්මණ ප්‍රථම ධ්‍යාන සිත.

11. සුඛා පටිපදා-දන්ධාභිඤ්ඤා-අප්පමාණ-
පරිත්තාරම්මණ ප්‍රථම ධ්‍යාන සිත.

12. සුඛා පටිපදා-දන්ධාභිඤ්ඤා-අප්පමාණ-
අප්පමාණාරම්මණ ප්‍රථම ධ්‍යාන සිත.

13. සුඛා පටිපදා-ඛිප්පාභිඤ්ඤා-පරිත්ත-
පරිත්තාරම්මණ ප්‍රථම ධ්‍යාන සිත

14. සුඛා පටිපදා-ඛිප්පාභිඤ්ඤා-පරිත්ත-
අප්පමාණාරම්මණ ප්‍රථම ධ්‍යාන සිත.

15. සුඛා පටිපදා-ඛිප්පාභිඤ්ඤා අප්පමාණ-
පරිත්තාරම්මණ ප්‍රථම ධ්‍යාන සිත.

16. සුඛා පටිපදා-ඛිප්පාභිඤ්ඤා-අප්පමාණ-
අප්පමාණාරම්මණ ප්‍රථම ධ්‍යාන සිත

ප්‍රථම ධ්‍යාන සතදැයි මෙසේ රූප ධ්‍යාන සිත් එක එකක් 16 ආකාරයට බෙදී යැමෙන් පංචකනයෙහි ධ්‍යාන සිත් 80 ක් වේ. චතුක්කනයද ඒහිම ඇතුළත්වේ.

මේ කියනලද ප්‍රතිපදා ආරම්මණ භේදයෙන් තොරව කිසිම රූපී ධ්‍යාන සිතක් නොලැබේ. එහෙයින් සියල්ල දත් බුදුරජාණන් වහන්සේ මෙසේ දෙසූ සේක. මෙතෙක් දක්වනලද ක්‍රමයෙන් චතුක්කනය පංචකනය දෙකම ගෙන සුද්ධික නවනයද පටිපදා නවක සතරද, ආරම්මණ පටිපදා නවක 16 දැයි නවයේ කොටස් 25 දක්වන ලදී. මෙම නය 25 චතුක්ක පඤ්චක වශයෙන් දෙකට බෙදී පණස්නයයක් වෙයි පණ්ණාසි නවකයෙහි චතුක්කනය විසින් ධ්‍යාන සිත් සියයකි. පඤ්චකනය විසින් 125 කි. මෙසේ දහම් දත කුසල් පුරා උතුම් නිවන් සැප පතාගත මැනවි.

# 54

## සෙසු කසිණ ධ්‍යාන සහ අභිඥා නිපැදවීම.

"කතමෙ ධම්මා කුසලා?

යස්මිං සමයෙ රූපූපපත්තියා මග්ගං භාවෙති, විවිච්චෙව, කාමෙහි-පෙ පඨමජ්ඣානං උපසම්පජ්ජ විහරති ආපො කසිණං, තෙජො කසිණං, වායො කසිණං, නීල කසිණං, පීත කසිණං, ලොහිත කසිණං, ඕදාත කසිණං"

කුසල් දහම් කවරහුද?

යම් වේලාවක රූපී බඹලොව ඉපදීම සඳහා මාර්ගය වඩාද, කාමයන්ගෙන් වෙන්ව අකුශලයන්ගෙන් වෙන්ව විතර්කය සහිතවූ විචාර සහිතවූ විවේකයෙන් හටගත් ප්‍රීතිය හා සැපය ඇති

2 ආපොකසිණ පළමුවැනි ධ්‍යානයට
3 තෙජෝ කසිණ ,, ,,
4 වායෝ කසිණ ,, ,,
5 නීල කසිණ ,, ,
6 පීත කසිණ ,, ,,
7 ලෝහිත කසිණ ,, ,,
8 ඕදාත කසිණ ,, ,, පැමිණ වෙසේ.

ශාන්තිනායක සම්බුදුහාමුදුරුවන් වහන්සේ යම්සේ මෙම රූපාවචර කුසල් සිත් පඨවිකසිණයෙන් ලද අයුරු මෙතෙක් දක්වා පඨවි කසිණයෙන් පමණක් නොව ආපෝ කසිණාදියෙන්ද ලැබෙන බව දක්වීමට නැවත "කතමෙ ධම්මා කුසලා? යනාදීන් වදාළ සේක.

මෙතෙක් පඨවිකසිණයෙන් ලද පළමුවැනි ධ්‍යාන සිත දෙවැනි ධ්‍යාන සිත ආදි වශයෙන් කියනලද සියලු සිත්ද තේරුම්ද සපණස් ධර්මාදීන්ගේ භේදීමද ආරම්මණ ප්‍රතිපද

හේදයද මේ ආපෝ කසිණාදියෙන් ලැබෙන පළමුවැනි ඇදී ධ්‍යාන සිත් හා සමය.

සම්මා සම්බුද්ධරජාණන් වහන්සේ ධම්මසඞ්ගණියෙහි මහාභූත කසිණ සතරක් වර්ණ කසිණ සතරත් පමණක් වදාළ සේක. මැදුම් සඟියෙහි මහා සකුලුදායි සූත්‍රයෙහි විඤ්ඤාණ කසිණය, ආකාශ කසිණය යන දෙකත් සමග කසිණ දහයක් දක්වා වදාළහ. එම දෙකෙන් විඤ්ඤාණ කසිණය අරූපාවචර දෙවෙනි විඤ්ඤානඤ්චායතන සිතට අරමුණුවන අහස පැවැති මහගගත විඤ්ඤානඤ්චායතන සිතට අරමුණුවන අහස පැවැති මහගගත විඤ්ඤානයද එය අරමුණු කොට ඉපදවූ විඤ්ඤාණඤ්චායතන ධ්‍යාන සිතද ගැනේ. එහෙයින් විඤ්ඤාණ කසිණය අරූපාවචරය. ආකාශ කසිණය නම්:

(1) කසිණ නිමිත්ත ඉගිලූ අහසද එය අරමුණු කොට ඉපදවූ ආකාසානඤ්චායතන ධ්‍යානයද,

(2) භිත්ති සිදුරු ආදියෙන් අහස අරමුණු කොට උපන් සතර පස් ධ්‍යාන සිත්ද ගතයුතුය.

මෙහි (1) අරූපාවචරය.

(2) රූපාවචරය.

එහෙයින් දෙවෙන් රූපාවචර පරිච්ඡේදාකාස කසිණය ගතයුතුය. රූප අරූප දෙකින්ම මිශ්‍ර හෙයින් හා මුලින් කියනලද විඤ්ඤාණ කසිණය අරූපාවචරම හෙයින් මෙහි රූපාවචර ධ්‍යාන කොට්ඨාශෙහි නොදක්වන ලදී.

අඞ්ගුත්තර සඟියෙහි,

“පඨවිකසිණං භාවෙති, ආපො, තෙජො, වායො, නීල, පීත, ලෝහිත, ඕදාත, ආකාස, විඤ්ඤාණ, ආලෝක කසිණං භාවෙති” යනුවෙන් කසිණ (11) එකොළසක් දෙසූ සේක.”

“දිබ්බස්ස චක්ඛුස්ස පරිකම්මං දිබ්බස්ස චක්ඛුස්ස උප නිස්සය පච්චයෙන පච්චයො” යන පට්ඨාන දේශනාවේ දිව ඇස අභිඥා නුවණ ලැබීමට කරණු ලබන පරිකර්ම භාවනාව දිබ්බ චක්ඛුඥාණයට උපනිස්සය ප්‍රත්‍යයෙන් උපකාරවන බව දක්වූ සේක.

මෙහි දිවැසට පරිකර්ම භාවනාව නම් ආලෝක කසිණ ප්‍රතිභාග නිමිත්ත උවමනා ප්‍රමාණයට පැතිරවීමයි. එහෙයින් ආලෝක කසිණය ගතයුතුමය. එහෙයින් ඕදාත කසිණයෙහි ආලෝක කසිණයද ඇතුළත් කොට ගතහැකි හෙයින් ධම්මසඞ්ගණියෙහි මූලික කසිණ (8) අටක් දැක්වීම පරිපූර්ණ දේශනාවකි. විසුද්ධිමග්ග අභිධම්මත්ථ සඞ්ගහ ආදී පොත්හි මෙම කසිණ දසයම දක්වා ඇත.

මෙම කසිණයන්ගෙන් උපදවනලද ධ්‍යානයන් මෙලොව සැප විහරණය සඳහාද, අභිඥා පාදකද විදර්ශනා පාදකද වන බව දක්වා ඇත. නිරෝධ පාදක හෙවත් නිරෝධ සමවතට පාදක නොවේ. අනුපුබ්බ නිරෝධය හෙවත් පිළිවෙළින් ධ්‍යානයන්ගේ නිරුද්ධියට පඤ්චම ධ්‍යානය තෙක් ලැබේ. මෙම සියලුම ධ්‍යානයන් වට්ටපාදකය. හෙවත් සසර ගමනට උපකාරීය.

අභිඥා නිපැදවීම.

“එකොපි හුත්වා බහුධා හොති” යනාදීන් වදාල එකෙක්ව බොහෝ දෙනෙක් වීම ආදී ඍද්ධි විකුර්වණය බලාපොරොත්තුවන තැනැත්තා විසින් මෙම කසිණ නිමිති අටෙන් අට සමවත් උපදවා එම අටසමවත දසසතර ආකාරයකට පුරුදුකොට සිත හැම අයුරෙන්ම දමනයකල යුතුය.

1. කසිණානුලෝමතො - පඨවිකසිණයේ සිට පිළිවෙළින් සියලු කසිණයන්ගෙන් සිය දහස්වර ධ්‍යානයට සමවැදීම,

2. කසිණ පටිලෝමතො- ඕදාත කසිණයේ සිට පිළිවෙළින් (ආපසු) සමවැදීම.

3. කසිණානුලෝම පටිලෝමතො- පඨවි කසිණයේ සිට ඕදාත කසිණටත් ඕදාතයේ සිට පඨවිය ටත් නිරතුරු සමවැදීම.

4. ඣානානුලෝමතො- පළමු ධ්‍යානයේ සිට පිළිවෙළින් නෙවසඤ්ඤානාසඤ්ඤායතනය තෙක් නිර තුරු සමවැදීම.

5. ඣාන පටිලෝමතො- නෙව- යතනයේ සිට පළමු ධ්‍යානයට නිරතුරු සමවැදීම.

6. ඣානානුලෝම පටිලෝමතො- මුල සිට සහ අග සිට ධ්‍යානයන්ට සමවැදීම.

7. ඣානුක්කන්තිකතො- පඨවිකසිණ පළමු ධ්‍යානයට සම වැද එම තුන්වැනි ධ්‍යානයටද එම පඨවි කසිණ නිමිත්ත උගළුවාහැර ආකාසා නඤ්චායතනයටද එයින් ආකිඤ්චඤ්ඤ යතනයටද මෙසේ එකම කසිණයෙන් ධ්‍යානයන් ඉක්මවා යැමයි.

8. කසිණුක්කන්තිකතො-පඨවිකසිණ පළමු ධ්‍යානයට සම වැද නැවත තෙජෝ කසිණ පළමු ධ්‍යානය ටද එයින් නීල කසිණ පළමු ධ්‍යානයටද මෙසේ ධ්‍යානය වෙනස් නොකර කසිණා රම්මණය වෙනස්කිරීමයි

9. ඣානකසිනුක්කන්තිකතො- පඨවිකසිණයෙහි පළමු ධ්‍යානයට සමවැද එයින් නැගී තෙජෝ කසිණයහි තුන්වැනි ධ්‍යානයටද එයින් නැගී නීල කසිණයද උගුළුවා ආකාසා නඤ්චායතනයටද මෙසේ ධ්‍යානයත් කසිණයත් දෙකම ඉක්මවමින් සමවැදී මයි.

10. අඞ්ගසඞ්කන්තිකතො - පඨවි කසිණයෙහි පළමු ධ්‍යාන යට සමවැද එහිම ඉතුරු ධ්‍යානයන්ට සමවැදීම අඞ්ගයන් සංක්‍රමණය කිරීමයි. මෙය ඣානානුලොමය හා සමබව පෙනේ.

11. ආරම්මණ සඞ්කන්තිකතො- පඨවි කසිණයෙහි පළමු ධ්‍යානයට සමවැද ආපොකසිණාදියෙහිද පළමු ධ්‍යානයට සමවැදීමයි. මෙය කසිණුක්කන්තකය හා සමයි.

12. අඞ්ගාරම්මණ සඞ්කන්තිකතො - පඨවිකසිණයෙහි පළමු ධ්‍යානයට සමවැද ආපො කසිණයෙහි දෙවැනි ධ්‍යානයටද මෙසේ තෙජො, වායො, නීල, පීත, ලෝහිත, ඕදාත කසිණයන්ගෙන් ක්‍රමයෙන් තුන්වැනි සතරවැනි, ආකාසානඤ්චායතනාදී – ආ- නෙව යන ධ්‍යානයන් ඉපදවීමයි.

13. අඞ්ගවවත්ථානතො - පඨමජ්ඣානය අඞ්ග පසක් යැයි මෙනෙහිකොට දෙවැනි ධ්‍යානයේ අඞ්ග තුණක් යැයි තුන්වැනි ධ්‍යානය අඞ්ග දෙකක් යැයි මෙසේ සියලු ධ්‍යානයන් සමවදීමින් මෙනෙහි කිරීමයි.

14. ආරම්මණ වවත්ථානතො- පඨවිකසිණයට සමවැද මේ පඨවිකසිණයැයි මෙනෙහි කොට මෙසේ සියලු කසිණයන්ට සමවැදෙමින් මෙනෙහිකිරීමයි.

කසිණ භාවනාකිරීම ඉතා බැරෑරුම්ය. සියයකින් දහසකින් එක්කෙණෙකු එයට බසියි නිමිත්ත ඉපදවීමත් බැරෑරුම්ය. සියදහසකින් කෙණෙක් නිමිති උපදවයි. නිමිති වඩා අර්පණ ඉපදවීම බැරෑරුම්ය. සියදහසකින් කෙණෙක් අර්පණ උපදවයි. අර්පණ උපදවා මේ දසසතර ආකාරයෙන් සිත දමනය කිරීමත් බැරෑරුම්ය. සියදහසකින් කෙනෙකුට හැකිවෙයි. එසේ සිත දමනයකොට සෘර්ධි බැරෑරුම්ය. සියයකින් දහසකින් කෙනෙකි සෘර්ධි උපදවා බිප්පතිසනාහි හෙවත් වහා කටයුතු කිරීමත් සියදහසකින් කෙනෙකුට හැකිවෙයි. මිහින්තලයේදී රක්ඛිත තෙරුන්ට මෙනි.

මෙසේ දහම් දූත විදසුන් වා නිවන් සැප ලබත්වා!

# 55

## නමෝ සම්මා සම්බුද්ධස්ස

## අභිභායතන (සිඝ්‍ර ධ්‍යාන)

"කතමෙ ධම්මා කුසලා"

(1) යස්මිං සමයෙ රූපූපපත්තියා මග්ගං භාවෙති අජ්ඣත්තං අරූපසඤ්ඤී බහිද්ධා රූපානි පස්සති පරිත්තානි තානි අභිභුය්‍ය ජානාමි පස්සාමීති විවිච්චෙව කාමෙහි විවිච්ච අකුසලෙහි ධම්මෙහි සවිතක්කං සවිචාරං විවෙකජං පීතිසුඛං පඨමජ්ඣානං උපසම්පජ්ජ විහරති

කුසල් දහම් කවරහුද?

යම් ශ්‍රාවක රූපී බඹලොව ඉපදීම සඳහා මාර්ගය වඩාද? තමා පිළිබඳ රූපයෙහි (ආධ්‍යාත්ම පරිකර්මාදී භාවනා නිමිත්තක) සංඥාවක් නැතිව බාහිර අටවැදෑරුම් කසිණ යන්හි පරිකර්ම අපීණ වශයෙන් භාවනාකොට ලබනලද නො වඩනලද (විශාල නොකළ) කසිණ නිමිති දකියි. ඒවා මැඩපවත්වා (ධ්‍යානයට පැමිණීම) දනිමියි දකිමියි කාමයන් ගෙන් අකුශලයන්ගෙන් වෙන්ව විතර්ක විචාර සහිතවූ විවේකයෙන් හටගත් ප්‍රීතිය හා සැපය ඇති ප්‍රථම ධ්‍යාන යට පැමිණ වෙසේ.

ශාන්තිනායක සම්මාසම්බුද්ධරජාණන් වහන්සේ රූපාවචර කුශලයන් අනේකාකාරයෙන් විස්තරකොට එම රූපාවචර කුසල්ම අරමුණු සමාන වුවත් භාවනාවෙහි අසමාන භාවයෙන් අභිභායතන නාමයෙන්ද දේශනාකර වදාළ සේක.

අභිභායතන

ආයතන යනු මෙහි ධ්‍යානය ලබාගැනීමට උපකාරවූ කසිණනිමිත්තය. එම කසිණ නිමිති නැමැති අරමුණු අභිභව

නය කරමින් මැඩපවත්වමින් ප්‍රතිභාග නිමිත්ත ඉපදවූ කෙණෙහි අර්පණාවට හෙවත් ප්‍රථම ධ්‍යානාදියට පැමිණීම සිදුවේ නම් එම ධ්‍යාන සිත් අභිභායතන වශයෙන් ගන්නා ලද බව මෙයින් වටහාගත යුතුය.

යම්සේ හොඳට බඩගිනි ඇති මිනිසකු බත් හැන්දක් ලැබ එක කටකට අනුභව කරයිද එසේම ප්‍රකට පිරිසිදු ගැඹුරු නුවණක් ඇති ඤාණුත්තරික පුද්ගලයා මෙම නිමිත්තයෙහි ධ්‍යානයට සමවැදීම එතරම් වැඩක්දැයි එම බාහිර රූපය නැමැති නිමිත්ත අභිභවනය කරමින් මෙන් ධ්‍යානයට සම්වදියි. නිමිත්ත උපදවනවාත් සමගම ධ්‍යානයට හෙවත් අර්පණාවට පැමිණෙයි යනු තේරුමයි. මෙහි නිමිත්ත නම් ප්‍රතිභාග නිමිත්තයි. ප්‍රතිභාග නිමිත්ත උපචාර ධ්‍යානයත් සමග උපදියි උපචාර ධ්‍යානය ඉපදෙනවාත් සමගම යන මෙයින් අර්පණ ධ්‍යානය ඉතා සීඝ්‍රයෙන් ඉක්මණින් ලැබෙන බව දක්වයි. උපචාර ධ්‍යාන චිත්තවීථිය ඇතිවී චිත්තවීථින් පහක් යන්නට පෙර ප්‍රථම ධ්‍යානය ඉපදීම එතරම් ඉක්මණින් පැවති ධ්‍යානය මෙයින් අභිභායතන වශයෙන් ගන්නා ලදී.

**අජ්ඣත්තං අරූපසඤ්ඤී.**

අභිභායතන නාමයෙන් ගන්නාලද මෙම ප්‍රථමධ්‍යානාදී රූපාවචර කුශලයන් දුස්විමෙදී තමා පිළිබඳ රූපයෙහි සඤ්ඤාවක් නැතිව යන මෙයින් නොලැබූ හෙයින් හෝ නොකැමැති හෙයින් තමාගේ රූපයෙහි කසිණ පරිකර්ම අර්පණා භාවනා නොවැඩූ හෙයින් අධ්‍යාත්ම නිමිත්තක් නැති තැනැත්තා ගතයුතුය. සිරුරෙන් තමාගේම සිරුරෙන් නීල කසිණ නිමිත්තක් ලබාගැනීමට කෙස් හෝ පිත හෝ ඇස් තාරකා හෝ අරමුණුකළ යුතුය. පිත (රත්වත්) කසිණය සඳහා මේදය හෝ රත්වත් සමක් ඇත්නම් එබඳු ජීවියක් ඇත්තනු එය හෝ ඇසෙහි රත්වත් තැනක් හෝ අරමුණ කළයුතුය. ලෝහිත කසිණය සඳහා මස් ලේ දිව

අතුල් පතුල් ඇසෙහි රත් තැනක් හෝ අරමුණු කරයි. ඕදාත-දත්, ඇට, ඇසෙහි සුදුපාට කොටස අරමුණුකළ යුතුය. මෙසේ තමාගේ ශරීරය අරමුණු කොටද වර්ණ කසිණ භාවනා කළහැකි බව අට්ඨකථාවන්හි දක්වන ලදී. ඇතැම්විට කේශාදි දෙතිස් කොටස් වර්ණ සංස්ථාන ආදී වශයෙන් වර්ණය මෙනෙහි කිරීමේදී පෙර කසිණ භාවනා වඩා පළපුරුදුකම් ඇති අයට කෙසෙහි නීල කසිණ නිමිත්ත වැටහිය හැකිය. එසේම නොමැතිව සිය සිරුරම වර්ණ කසිණ නිමිති සඳහා භාවනාවට ගන්නාසේ උපදෙස් දීමක් පෙළ අටුවාවන්හි හා ආචාර්ය පරම්පරාවන්හි දක්නා නොලැබේ. බහිද්ධා රූපානි පස්සති. බාහිර රූප නම් පඨවි කසිණයන්ගෙන් ලබනලද උග්ගහ පටිභාගාදී නිමිතිය. මෙසේ බාහිරවූ ප්‍රතිභාග නිමිත්ත නොවඩන ලද්දේ නො පතුරුවන ලද්දේ එය මැඩපවත්වා ප්‍රථම ධ්‍යානයට පැමිණීම එක අභිභායතනයකි.

(2) අජ්ඣත්තං අරූපසඤ්ඤී බහිද්ධා රූපානි පස්සති පරිත්තානි සුවණ්ණ දුබ්බණ්ණානි තානි අභිභුය්‍ය ජානාමි පස්සාමීති.

තමාගේ සිරුරෙන් කසිණ නිමිත්තක් නූපදවා බාහිර හෙවත් අටකසිණයෙන් නිමිති ලබා පිරිසිදු පැහැය හෝ අපිරිසිදු පැහැය ඇතිනොවූ කසිණ නිමිත්ත මැඩපවත්වමින් මෙන් ප්‍රථම ධ්‍යානයට පැමිණ වාසය කෙරේ. මේ දෙවෙනි අභිභායතනය වශයෙන් ලබනලද ප්‍රථම ධ්‍යානයයි ''සුවණ්ණ දුබ්බණ්ණ'' පිරිසිදු පැහැය හෝ අපිරිසිදු පැහැය ඇතිවීම පමණක් වෙනසකි.

(3) අජ්ඣත්තං අරූපසඤ්ඤී බහිද්ධා රූපානි පස්සති අප්පමාණානි තානි අභිභුය්‍ය ජානාමි පස්සාමීති තමාගේ සිරුරෙන් නූපදවනලද කසිණ ඇත්තේ බාහිර වශයෙන් ලබනලද අප්‍රමාණවූ විශාලලෙස වඩනලද කසිණ නිමිත්ත අභිභවනය කොට පළමුවැනි ධ්‍යානයට පැමිණ වෙසේ. මේ තුන්වැනි අභිභායතනය වශයෙන් දක්වනලද ප්‍රථම ධ්‍යාන සිතයි.

(4) අජ්ඣත්තං අරූපසඤ්ඤී බහිද්ධා රූපානි පස්සති අප්පමාණානි සුවණ්ණ දුබ්බණ්ණානි තානි අභිභුය්‍ය ජානාමි පස්සාමීති. තමාගේ සිරුරෙහි නූපදවනලද නිමිති ඇති බාහිර අප්‍රමාණවූ සුවණී හෝ දුවණී කසිණ නිමිත්ත මැඩපවත්වා පළමුවැනි ධ්‍යානයට පැමිණ වෙසෙ.

මේ සතරවැනි අභිභායතන යයි. අප්‍රමාණවීම හා සුවණී දුර්වණී වීම පමණක් මෙහි වෙනසයි.

(5) අජ්ඣත්තං අරූපසඤ්ඤී බහිද්ධා රූපානි පස්සති නීලානි නීලවණ්ණානි නීලදස්සනානි, නීල නිභාසනානි තානි අභිභුය්‍ය ජානාමි පස්සාමීති, විවිච්චෙව-පඨමජ්ඣානං උපසම්පජ්ජ විහරති.

අධ්‍යාත්ම කසිණ නිමිති නොලැබ බාහිර කසිණ නිමිති දකියි. නිල්වූ නීලවණීවූ, නොකැලැල් නිල්වූ ඕභාස හෙවත් ආලෝක ඇති කසිණයෙන් ලබනලද ප්‍රථමධ්‍යානය පස්වැනි අභිභායතනයයි.

(6) අජ්ඣත්තං අරූපසඤ්ඤී බහිද්ධා රූපානි පස්සති පෙ- මෙසේම පීතකසිණයෙන් ලබනලද ප්‍රථම ධ්‍යානය සවැනි අභිභායතනයයි.

(7) අජ්ඣත්තං අරූපසඤ්ඤී බහිද්ධා රූපානි පස්සති ලෝහිතකානි- මෙසේම ලෝහිත (රතු) කසිණයෙන් ලබනලද ප්‍රථම ධ්‍යානය සත්වැනි අභිභායතනයයි.

(8) අජ්ඣත්තං අරූපසඤ්ඤී බහිද්ධා රූපානි පස්සති ඕදාතානි- මෙසේම ඕදාත කසිණයෙන් ලබනලද ප්‍රථම

ධ්‍යානය අටවැනි අභිභායතනයයි. මෙසේ දෙවෙනි ධ්‍යානයද අභිභායතන අටට බෙදේ. චතුක්ක පඤ්චකනය වශයෙන් ධ්‍යානයන් මෙම අභිභායතන අටට වශයෙන් බෙදෙන බවද ආරම්මණ දෙකට හා ප්‍රතිපදාවන්ටද පඨවි කසිණය මෙන් බෙදෙන බවද දක්වන ලදී.

අඞ්ගුත්තරනිකාය අට්ඨක නිපාතයෙහිද නාමා පිළිබඳව උපදවාගත් කසිණ නිමිති ඇති යෝගියා ගැනද සඳහන් වෙයි. එහි මෙම ධම්ම සඞ්ගණියට වඩා සුවණ්ණ දුබ්බණ්ණාදි පද මාරුකොට දක්වා ඇත. සීඝ්‍රයෙන් ලැබෙන හෝ සම වදින ධ්‍යානයන්ට අභිභායතන නම යොදා දෙසූ බව පිළිගත යුතුය. දහම් දැන නිවන් සුව ලබත්වා!

# 56

## නමො සම්මා සම්බුද්ධස්ස

## විමොක්ඛ ඣාන.

"කතමෙ ධම්මා කුසලා?

යස්මිං සමයෙ රූපූපපත්තියා මග්ගං භාවෙති, රූපී රූපානි පස්සති විවිච්චෙව කාමෙහි, විවිච්ච අකුසලෙහි ධම්මෙහි සවිතක්කං සවිචාරං විවේකජං පීතිසුඛං පඨමජ් ඣානං උපසම්පජ්ජ විහරති."

කුසල් දහම් කවරහුද?

යම් වේලාවක රූපී බඹලොව ඉපදීම සඳහා මාර්ගය වඩාද, තමාගෙන් උපදවාගත් කසිණ නිමිති ඇත්තේ බාහිර නීලකසිණාදී නිමිති දකියිද කාමයන්ගෙන් වෙන්ව අකුසල ධර්මයන්ගෙන් වෙන්ව විතක්ක විචාර සහිතවූ විවේකයෙන් හටගත් ප්‍රීතිය හා සැපය ඇති ප්‍රථමධ්‍යාන හට පැමිණ වෙසේ.

ශාන්තිනායක සම්මා සම්බුදුරජාණන් වහන්සේ රූපාව චර කුසල් අරමුණු (කසිණ නිමිති) නැමති ආයතනයන් අභිභවනය කරමින් පහවීම අභිභායතන නාමයෙන් දක්වා ඒවා විමොක්ෂ නාමයෙන්ද උපදින බව මෙසේ වදාළසේක.

විමොක්ඛ - විශෙෂයෙන් මිදුණු යන තේරුම විමොක්ඛ ශබ්දයෙන් ලැබෙන්වයි. කිරෙන් මිදීම සසරෙන් මිදීම යනාදී තන්හි ගැලවීම හෙවත් වෙන්වීම ගතයුතුය.

කිරිමිදීම වතුර මිදීම ආදී තැන්වල තැන්පත්වීම ගත යුතුය. එහෙයින් අත්සැලිතියෙහි දක්වන ලදී.

"පච්චනීක ධම්මෙහිච සුට්ඨු විමුච්චනතො,

ආරම්මණෙව අභිරති වසෙන සුට්ඨු අභිමුච්චනතොති."

විරුද්ධ ධර්මයන් (නීවරණ ආදීන්) ගෙන් මනාව මිදුනු හෙයින්ද,

අරමුණෙහිද ඇලීම් වශයෙන් මනාකොට තැන්පත්වූ, මිදුණු හෙයින්ද, විමොක්ඛ නම් වේ. එනම් මෙහි රූපාවචර කුසල් සිතයි. ඉතාම උසස් ලෙස පහසුවෙන් පළමු වැනි ධ්‍යානාදී අර්පණා සිත් ඉපදවීම නිසා එම සිත්වලට විමොක්ඛ යන නාමයද සූත්‍රාන්තයේ යෙදී ඇති බව මෙයින් දක්වනලදී. ප්‍රථම ධ්‍යාන කුසල් සිතට රූපී රූපානි පස්සති යන්න එකතුකොට එම විශෙෂය පැහැදිලි කොට ඇත. පියාගේ ඇකයෙහි කිසිම බියක් සැකක් නැතිව කුඩා දරුවකු නිදන්නා මෙන් අරමුණෙහි සිත ඉතා පහසුවෙන් එක්තැන් වෙයි. ධ්‍යානගත වෙයි.

රූපී මෙයින් අධ්‍යාත්මයෙහි කසිණ අරමුණු නිපදවා ඇත්තේ හෙවත් තමාගේ ශරීරයෙහි කෙස් ආදී නිල් අරමුණු කොට නීල කසිණ ආදී නිමිති උග්ගහ පටිභාග වශයෙන් උපදවා ඇති ධ්‍යානලාභියා ගැණේ. පසුගිය පාඨ මෙහි අභිභායතන විස්තර කිරීමේදී එසේ තමන්ගේ ශරීරයෙහි සතර වර්ණකසිණයන් නිපදවීම දක්වන ලදී.

රූපානි පස්සති බාහිරවූ නීලකසිණාදී රූපයන් ධ්‍යාන ඇසින් බලයි මෙයින් තමාගේ ශරීරයෙන් හා බාහිර කසිණ නිමිතිවලින් ධ්‍යාන ලබනලද බව කියැවේ. එවිට එම ධ්‍යානලාභියා ඉතා පළපුරුදු දියුණුවට පත් පුද්ගලයෙකි. මක්නිසාදයත් බොහෝ සෙයින් කසිණ භාවනා නීලාදී බාහිර කසිණයන්ගෙන් වඩා දියුණුකොට තමන්ගේ ශරීරයේ නිල් තැන්ද අරමුණුව ඒමායින්ද වර්ණ කසිණ නිමිති ලැබීමට සිත ධ්‍යාන ගතවීමේ කිසිම අපහසුවක් නැති කරමට දියුණුවිය යුතුය.

කසිණ භාවනා කිරීමේ අදහසින් හිසකෙස් ආදී ශරීරයේ නිල් (කෘෂ්ණ) කොටස් අරමුණු කිරීමට උපදෙස්

ආචාර්‍ය පරම්පරාවන්හි විසුද්ධිමාර්ගාදී භාවනා පොත පතෙහිද ඇත. එහෙත් කේසාදී දෙතිස් කොටස් අසුභ වශයෙන් භාවනා කිරීමේදීද වර්‍ණ හෙවත් පැහැය, සටහන, ගඳ, ආසය ආසය හෙවත් මායිම, ඔකාස හෙවත් පිහිටි තැන වශයෙන් මෙයේ පිළිකුල් ලෙස මෙනෙහි කිරීමට උපදෙස් දී තිබේ.

මේ අත්බැව වර්‍ණ කසිණ පුරුදුකළ හෝ ඉහත ආත්මයන්හි බොහෝසේ වර්‍ණ කසිණ පුරුදුකළ කෙණෙකුට පළමු කී පරිදි අසුභ භාවනා සඳහා පළමුකොටම වර්‍ණ අනුව ශරීරයේ කේශාදී අසුභ කොටස් අරමුණු කිරීමේදී ඉබේම උග්ගහ පටිග්ගහ නිමිති ඇතිවිය හැකිය.

මෙසේ අභ්‍යන්තර බාහිර අරමුණුවල කිසිම අපහසුවක් නැතිව සිත එකඟවීම හෙවත් රූපාවචර පළමු, දෙවැනි, තුන්වැනි, සතරවැනි, පස්වැනි සිත් පහළවීම එක විමෝක්ෂයකි.

දෙවැනි විමෝක්ෂය.

යම් වේලාවක රූපී බඹලොව ඉපදීම සඳහා භාවනා කෙරේද තමාගේ සිරුරෙන් උපදවාගත් කසිණ නිමිති නැත්තේ බාහිර කසිණ නිමිති ලබා ඉතා පහසුවෙන් පළමුවැනි ධ්‍යානය, දෙවෙනි ධ්‍යානය ආදී රූපාවචර කුසල් සිත් පස උපදවයි. මේ දෙවැනි විමොක්ෂයයි.

මෙහි "අජ්ඣත්තං අරූපසඤ්ඤී බහිද්ධා රූපානි පස්සති" යනුවෙන් පළමු සිත මෙන් මෙහි වෙනස දත යුතුයි. ඉතා ඉක්මනින් ඉතා පහසුවෙන් සිත ධ්‍යානගත වන හෙයින් විමොක්ෂ නම්වේ.

තුන්වැනි විමෝක්ෂය.

යම් වේලාවක රූපී බඹලොව ඉපදීම සඳහා භාවනා කෙරේද? සුභයැයි දැඩිව සිත පිහිටියේ වේද කාමයෙන්

වෙත්ව පළමුවැනි දෙමෙති ආදී ධ්‍යාන සිත් පහළවේ. මෙසේ පහළවන ධ්‍යාන සිත් තුන්වැනි අධිමෝක්ෂයයි.

බාහිර කසිණ අරමුණෙහි සුභයයි සිත බැසගැනීමට එම කසිණ අරමුණ සුවිසුද්ධ නීලාදී වර්ණයක් වියයුතුයි. ඉතා පිරිසිදු නීලාදී වර්ණ කසිණයන්ගෙන් ලද නිමිත්ත ඇතිව ඉතා පහසුවෙන් ධ්‍යාන ගතවීමට හැකි යෝගියාගේ රූපාවචර කුසල් මේ තුන්වැනි විමෝක්ෂයෙන් ගැණේ. සතර, පහ, හය, හත, විමෝක්ෂයෙන් ආකාසානඤ්චායතනාදී අරූප කුසල්ය. අරූප කුසල්හි සිත අමුතු වෙසෙසි මක් නැතිවම ඉතාම හොඳින් සිත මිදීමට එකඟ බවට පත්වේ. එහෙයින් ඒවාද විමෝක්ෂය. අටවැනි විමෝක්ෂය නම් නිරෝධ සමාපත්තියයි. ධ්‍යානලාභී අනාගාමී හෝ රහත් උතුමන් විසින් ලබන ඉතා උතුම් සැපයයි.

මෙහි දක්වන ලද්දේ රූපාවචර විමොක්ෂ තුණ පමණයි. මෙසේ කසිණ කියා හෝ අභිභායතන කියා හෝ විමොක්ෂ කියා කියනලද්දේ රූපාවචර ධ්‍යාන බව දතයුතුය.

රූපාවචර ධ්‍යානයම, ආරම්මණයාගේ සියල්ල බැවින් කසිණයැයිද, අරමුණ අභිභවනයකරණ හෙයින් අභිභායතන යැයිද දූඹිව පිහිටන හෙයින් හා විරුද්ධ ධර්මයන්ගෙන් මිදෙන හෙයින් විමොක්ෂයැයිද දතයුතුය.

මෙම විමෝක්ෂ තුණ චතුක්කපඤ්චක ණය, ආරම්මණ පටිපදා ආදී භේදයන්ගේ නවක සැත්තැපසක් වේ. පසුහිර පාඨම් බලනු. මෙසේ දහම් දැන භාවනා වඩා නිවන් සැප ලබත්වා!

# 57

## නමො සම්මා සම්බුද්ධස්ස

## බ්‍රහ්මවිහාරඣාන

"කතමෙ ධම්මා කුසලා?

යස්මිං සමයෙ රූපූපපත්තියා මග්ගං භාවෙති විවිච්චෙව කාමෙහි විවිච්ච අකුසලෙහි ධම්මෙහි සවිතක්කං සවිචාරං විවෙකජං පීතිසුඛං පඨමජ්ඣානං උපසම්පජ්ජ විහරති මෙත්තා සහගතං"

**කුසල් දහම් කවරහුද?**

යම් වේලාවක රූපී බඹලොව ඉපදීම සඳහා මාර්ගය වඩාද, කාමයන්ගෙන් වෙන්ව අකුසල ධර්මයන්ගෙන් වෙන්ව විතර්ක විචාර සහිතවූ විවේකයෙන් හටගත් ප්‍රීතිය හා සැපය ඇති මෛත්‍රී සහගත පළමුවැනි ධ්‍යානයට පැමිණ වාසය කරයි.

ශාන්තිනායක සම්බුදුරජාණන් වහන්සේ රූපාවචර කුසල් පහසුවෙන් පැවතීම් වශයෙන් විමොක්ඛඣාන වශයෙන් දක්වා බ්‍රහ්මවිහාර වශයෙන්ද දෙසනු කැමතිසේක් මෛත්‍රී සහගත ප්‍රථම ධ්‍යානයට පැමිණ වෙසෙස් යනාදීන් වදාළසේක.

**බ්‍රහ්මවිහාර.**

මෙත්තා, කරුණා, මුදිතා, උපෙක්ඛා යන සතර භාවනා වෙන් සුකානව ඉදීම ඉතාම ශ්‍රේෂ්ඨය. එහෙයින් ශ්‍රේෂ්ඨ විහරණය හෙවත් ඉතා උතුම් ලෙස වාසයකිරීම යන තේරුමෙන් බ්‍රහ්මවිහාර නම්වේ. මෙම මෛත්‍රී කරුණා මුදිතා උපෙක්ෂා ගුණ ඉතා උසස් ප්‍රතිපත්ති බව යහපත් ගුණාඞ්ග බව ලෝකයෙහි කවදත් ප්‍රකටය. එහෙයින් බ්‍රහ්ම හෙවත් උතුම් මහා පිළිවෙත් නිසා ශ්‍රේෂ්ඨය'

එසේම රූපාවචර ධ්‍යාන උපදවා නීවරණයන් ඔබා, බඹලොව උපන් බ්‍රහ්මයින් නිර්දෝෂ සිතෙන් ජීවත්වෙති සත්වයින් කෙරෙහි මෙම මෛත්‍රී කරුණා මුදිතා උපෙක්ෂා වෙත් යුතුව වාසයකරති. මෙම සතර භාවනාවන් වඩන යෝගී පුද්ගලයාද එම බඹුන් මෙන් නිදොස් සිතින් වසන හෙයින් මෙම සතර භාවනාවන් බ්‍රහ්මවිහාර භාවනා නාම යෙන් දක්වන ලදී. බ්‍රහ්ම හෙවත් උත්තමවූ බුදුරජාණන් වහන්සේ විසින් දෙසූ නිසාද බ්‍රහ්මවිහාර නම් වේ.

**1.** මෛත්‍රී: රළු බව දුරුකොට සිනිඳු බවට පැමිණීම මෛත්‍රියයි. "මෙජ්ජතීති මෙත්තා, සිනියහතීති අත්ථො" යනු වෙන් ඒ බව කියන ලදී. නොරළු නො තද සිතක් ඉතා හොඳින් මිතුරන් කෙරෙහි පවත්වමු.

එම නිසා මිතුරු බව මෛත්‍රිය යයි කියාද කියනු ලැබේ. තමා කෙරෙහි හා අනුන් කෙරෙහි තමාගේ සිතෙහි රළු බවක් නොමැතිව මිත්‍රත්වයෙන් යුක්තවීම මෛත්‍රියයි.

භාවනා: මෛත්‍රී භාවනාව ඉතා නිරවුල්ව ඉතා පැහැදිලිව විසුද්ධිමග්ගයේ දක්වා ඇත. ධම්මසඞ්ගණී අට්ඨකථාවේද විසුද්ධිමග්ගය බලන ලෙස කියා තිබේ.

"සබ්බපඨමං පන අහං සුඛිතොහොමි නිද්දුක්ඛොතිවා අවෙරො, අව්‍යාපජ්ජො, අනීඝො, සුඛී අත්තානං පරිහරාමීති එවං පුනප්පුනං අත්තනියෙව භාවෙතබ්බා" සියල්ලට පළමුකොට මම සුවපත්වෙමි කියා හෝ නිදුක්වෙමි කියා හෝ වෛර නැත්තෙක් වෙමියි කියා හෝ දොම්නස් නැත්තෙක් වෙමියි කියා හෝ සුවසේ ජීවත්වෙමියි කියා හෝ මෙසේ නැවත නැවත තමා කෙරෙහි මෛත්‍රීභාවනා කළ යුතුයි.

මේසේ තමා අරමුණු කොට පළමුව මෛත්‍රී භාවනාව පටන්ගත යුතුය. ඒ සඳහා

1. මම සුවපත්වෙමි, සුවපත්වෙමි යනුවෙන් හෝ
2. මම නිදුක්වෙමි, නිදුක්වෙමි යනුවෙන් හෝ

3. මම වෛර නැත්තෙක් වෙමි, වෛර නැත්තෙක්වෙමි යනුවෙත් හෝ

4. මම දෙම්නස් නැත්තෙක් වෙමි, දෙම්නස් නැත්තෙක් වෙමි යනුවෙත් හෝ

5. මම දුක් නැත්තෙක් වෙමි, දුක් නැත්තෙක් වෙමි යනුවෙත් හෝ

6. මම සුවෙත් වෙසෙමි, සුවෙත් වෙසෙමි යනුවෙත් හෝ මේ එක විධියකින් මෛත්‍රී භාවනාව පළමුව තමාම අරමුණු කොට පැවැත්විය යුතුය.

ඉත්පසු හිතවතුන් අරමුණු කොටද මැදහතුන් අරමුණු කොටද සතුරන් අරමුණු කොටද තමා අරමුණු කොට භාවනාකළ වචනයම ගණිමින් භාවනා කිරීමේදී මෛත්‍රී සීමා භේදය වෙයි. හෙවත් සතරදෙනා කෙරෙහිම එකහා සමාන මෛත්‍රියක් ලැබීමෙන් තමා කෙරෙහි හෝ එක් කොටසක් කෙරෙහි තිබුණු මෛත්‍රී සීමාව බිඳී කොටස් සතර කෙරෙහිම එකහා සමාන මෛත්‍රියක් ඇතිවේ. මේ වනාහි මෛත්‍රී ප්‍රතිභාග නිමිත්ත ලැබීමත් උපචාර ධ්‍යානය ලැබීමත්ය.

තවත් විභඞ්ගයෙහි දක්වූ ක්‍රමය නම් ප්‍රිය එක් පුද්ගලයෙකු පෙනෙන්නා සේ අරමුණු කොට ඉහත සඳහන් එක විධියකින් මෛත්‍රී භාවනා කිරීමේදී එම පුද්ගලයාම අරමුණු කොට මෛත්‍රී උපචාර අර්පණ ධ්‍යාන ලැබේ. ඉහත සඳහන් අයුරු කොටස් සතර අරමුණු කොට භාවනා වඩා උපචාර ධ්‍යානයට පැමිණි පසු ඔහුට කොටස් සතරම අරමුණුව අර්පණ ධ්‍යානය ලැබෙන බව සැලකිය යුතුය.

එසේ ලබනලද ප්‍රථම මෛත්‍රී ධ්‍යාන සිත ඇති පුද්ගලයා තව තවත් අර්පණ ප්‍රථම ධ්‍යානාදී සිත් ඉපදවීමට විභඞ්ගයෙහි දක්වා වදාළ පරිදි,

"එමමෙව සබ්බසත්ත මෙත්තාය විරති"

යනාදි වශයෙන්ද

පටිසම්භිදාවෙහි,

"සබ්බසත්තා අවෙරා හොන්තු" යනාදි වශයෙන්ද,

මෙත්ත සූත්‍රයෙහි (කරණීයමෙත්ත)

සුඛිනොවා ඛෙමිනො හොන්තු, සබ්බසත්තා භවන්තු සුඛිතත්තා" යනාදි වශයෙන්ද සියලු සත්වයන් කෙරෙහි මෛත්‍රිය නියමකොට ඇත්තේ අර්පණා ධ්‍යාන ඉපදවූ යෝගියාට මෛත්‍රියෙහි විවිධාකාර දියුණුවක් ලැබීමට තව තවත් අර්පණා (ප්‍රථම ධ්‍යානාදී) සිත් ඉපදවීම සඳහාය.

මේ විසුද්ධිමාර්ගයෙහි දක්වා වදාළ ක්‍රමයයි. බොහෝ දෙනා සියලු සත්වයෝ සුවපත් වෙත්වා යනාදීන් හෝ පාලි වාක්‍යය "අහං අවෙරො හොමි අව්‍යාපජ්ජො හොමි, අනීඝො හොමි, සුඛී අත්තානං පරිහරාමි යනාදීන් කියා අහං විය මයහං හිතසත්තා අවෙරා හොන්තු අව්‍යාපජ්ජා හොන්තු යනාදීන් කියමින් මෛත්‍රී භාවනා කරණවායයි කියති. මෛත්‍රී භාවනාව උගත්වා වදාළ වාක්‍යය කියැවීම මෛත්‍රී භාවනාව නොවේ. එය බේත් සීට්ටුව කියැවීමයි ප්‍රථම ධ්‍යානාදී අර්පණා සිත් 528 ක් ඉපදවිය හැකි ලෙස පළල්වූ මෙම මෛත්‍රී ගුරු උපදෙස් අනුව වඩා එයින් විදර්ශනාවට බැස ශාන්ත නිවන් සැප සාධාගනිත්වා!

# 58

### නමො සඹා සම්බුද්ධස්ස.

### කරුණා මුදිතා උපෙකඛා බ්‍රහ්මවිහාර.

"කතමෙ ධමමා කුසලා?"

යසමිං සමයෙ රූපූපපතතියා මගගං භාවෙති, විවිචෙවව කාමෙහි විවිචච අකුසලෙහි ධමෙමහි සවිතකකං සවිචාරං විවෙකජං පීතිසුඛං පඨමජඣානං උපසමපජජ විහරති කරුණා සහගතං"

කුසල් දහම් කවරහුද?

යම් වේලාවක රූපී බඹලොව ඉපදීම සඳහා මාර්ගය වඩාද (භාවනා කෙරේද) කාමයන්ගෙන් වෙන්ව අකුශල යන්ගෙන් වෙන්ව විතර්ක විචාර සහිතවූ විවේකයෙන් හටගත් ප්‍රීතිය හා සැපය ඇති කරුණා සහගතවූ ප්‍රථම ධ්‍යානයට පැමිණ වෙසේ.

සියල්ල අවබෝධකර වදාළ ශාන්තිනායකයන් වහන්සේ කරුණා භාවනාවෙන් ලබනලද පළමුවැනි ධ්‍යානය මෙසේ වදාළ සේක.

**කරුණා බ්‍රහ්මවිහාර භාවනාව.**

අනුන්ට දුකක් පැමිණී බව දැකීමෙන් ඇසීමෙන් සිතීමෙන් සත්පුරුෂයන්ගේ හෘදය කම්පාකෙරේනුයි කරුණා නම් වේ. සාධූන්ගේ සිතෙහි අනුන්ගේ දුකට උණුවන ගතියක් නිතැතින්ම පිහිටා ඇත. ඒ සිත කම්පාකරන ගතිය කරුණාවයි. (කරෙරාතීති කරුණා)

අනුන්ගේ දුක පළවාහරීනුයි කරුණා නම්වේ. (කිණාතීති කරුණා) දුකට පැමිණියන් කෙරෙහි පතුරුවනු ලැබේනුයි කරුණා නම්වේ. (කිරීයති පසාරීයතීති කරුණා)

මෙයින් අදහස් කරන්නේ සිතෙහි ඇතිවන අනුන් දුකෙහිදී ඒ දුක ඒ දුක්ඛිතයන්ගෙන් අස්කිරීමට තමන්ට ඇතිවන කැමැත්ත මෙන් ශාන්ත චෛතසික ධර්මයකි. මෛත්‍රියට සුවදුක් ආදී භේදයක් නැතිව සියලු සත්වයන්ම අරමුණුවේ. කරුණාවට දුක්ඛිත සත්වයන් අරමුණුවේ. කරුණා චෛතසිකය පෙරදැරි කරගෙන දුක්ඛිත සත්වයන් අරමුණුකොට ධ්‍යාන සිත් උපදවාගැනීම කරුණා බ්‍රහ්ම විහාර භාවනාවයි. බුද්ධාදී මහොත්තමයන් නිරතුරුව කරුණාවෙන් යුතුව වසන හෙයින් හා උත්තම විහරණය හෙයින්ද බ්‍රහ්මවිහාර නම්වේ.

දුකට පැමිණි නොයෙකුත් ලෙඩදුක් රෝගපීඩාවන්ට හෝ වධයට පැමිණි සත්වයෙකු අරමුණු කොට ඔහුගේ දුක් දුරුවේවා, දුක් දුරුවේවා මෙසේ කරුණා භාවනාව පටන්ගත යුතුය. එසේම සැපයෙහි පිහිටි පව්කරන්නවුන් අරමුණු කොට ඔහු මතු මහත් දුකට පැමිණෙන බව සිතා ඔහු දුකින් මිදේවා, දුකින් මිදේවායි මෙසේ හෝ කරුණා භාවනාව වැඩිය යුතුය. සැපයෙහි පිහිටි කුසල් කරන්න වුන් කෙරෙහි සසර දුකින් නොමිදුණු හෙයින් මොහුද දුකින් මිදේවායි කරුණා භාවනාව දියුණුකළ හැකිය.

මෙසේ යම්කිසි විධියකින් දුක්ඛිතයෙකුගෙන් පටන් ගෙන ඉන්පසු තමා අරමුණු කොටද හිතවතුන් අරමුණු කොටද මධ්‍යස්ථයන් කෙරෙහිද සතුරන් කෙරෙහිද දුකින් මිදෙත්වා, දුකින් මිදෙත්වායි කරුණා භාවනා වඩා ඒ සතර කොටස කෙරෙහි එක හා සමානව කරුණාව පිහිටියේ නම් කරුණා භාවනාවෙන් උපචාරධ්‍යානය ලබන ලද්දේ එයම දියුණුකිරීමෙන් පළමුවැනි දෙවැනි තුන්වැනි ධ්‍යාන සිත් ලබන්නේය. මෛත්‍රී බ්‍රහ්මවිහාරය මෙනි.

**මුදිතා බ්‍රහ්මවිහාර භාවනාව.**

කතමෙ ධම්මා කුසලා?

යස්මිං සමයෙ රූපූපපත්තියා ...................................
........ පඨමජ්ඣානං උපසම්පජ්ජ විහරති මුදිතා සහගතං"

කුසල් දහම් කවරහුද?

යම් වේලාවක රූපී බඹලොව ඉපදීම සඳහා භාවනා කෙරේද? කාමයන්ගෙන් අකුසලයන්ගෙන් වෙන්ව විතර්ක විචාර සහිතවූ විවේකයෙන් හටගත් ප්‍රීතිය හා සැපය ඇති මුදිතා සහගත ප්‍රථම ධ්‍යානයට පැමිණ වෙයේ.

**මුදිතා භාවනාව.**

මුදිතා නම් මෝදනය හෙවත් ඉතාම හොඳයයි ප්‍රමුදිත වීමයි, සතුටුවීමයි. මුදිතා භාවනාව පටන්ගත යුත්තේ ඉතා මුදිතව ප්‍රමුදිත සතුටින් වාසයකරණ ප්‍රිය පුද්ගල යෙකු අරමුණු කොට මොහු මුදිතවේවා, මුදිත වේවා ...යි ආරම්භකොට සිතෙහි මෘදුතාවය දියුණුවක්ම තමා කෙරෙහිද හිතවතුන් - මධ්‍යස්ථයන් - සතුරන් අරමුණු කොටද මුදිත වෙත්වා, ප්‍රමුදිත වෙත්වා යි මෙසේ භාවනා වඩා සීමා භේදයට පැමිණි මුදිතා ගුණය ඇත්තේ උපචාර ධ්‍යානය ලබනලද්දේ නම්. පෙර සැපයෙහි පිහිටා පසුව දුක්ඛිතවූවකු අරමුණු කොට වුවද ඔහු පෙර මුදිතව ප්‍රමුදිතව සිටියේයයි සලකා මුදිත වේවායි ඔහු කෙරෙහි මුදිතා භාවනාව පටන්ගත හැකි බව කියනලදී. මෙසේ උපචාර ධ්‍යානයට පැමිණ එම නිමිත්ත අරමුණු කෙරෙමින් පළමුවැනි, දෙවැනි, තුන්වැනි ධ්‍යානයන්ට පැමිණිය යුතුය.

**උපෙක්ඛා බ්‍රහ්මවිහාර භාවනාව.**

"කතමෙ ධම්මා කුසලා?

යස්මිං සමයෙ රූපූපපත්තියා මග්ගං භාවෙති, සුඛස්සච පහාණා දුක්ඛස්සච පහාණා පුබ්බෙව සොමනස්ස දෝමනස්සානං අත්ථඞ්ගමා අදුක්ඛමසුඛං උපෙක්ඛා සතිපාරිසුද්ධිං චතුත්ථජ්ඣානං උපසම්පජ්ජ විහරති.

**උපෙක්ඛා සහගතං.**

කුසල් දහම් කවරහුද? යම් වේලාවෙක රූපී බඹලොව ඉපදීම සඳහා භාවනා කෙරේද, සැපයද දුකද ප්‍රහාණය

(දුරු) කොට පළමුකොටම සොම්නස් දොම්නසුන් දුරුවූ හෙයින් නොදුක් නොසැප මැදහත් සිහි පිරිසිදු ඇති උපෙක්ෂා සහගත සතරවැනි ධ්‍යානයට සමවැද මෙසේ

මෙයින් උපෙක්ෂා භාවනාවට පළමුවැනි දෙවැනි තුන්වැනි ධ්‍යාන සිත් නැති බවත් මෛත්‍රියෙන් හෝ කරුණාවෙන් හෝ මුදිතා භාවනාවෙන් ලබනලද පළමුවැනි දෙවැනි තුන්වැනි පඤ්චකනයෙහි නම් සතරවැනි ධ්‍යාන ඇති යෝගියෙක්ම උපේක්ෂා භාවනා වැඩියයුතු බවත් වටහාගත යුතුය.

**උපෙක්ඛා භාවනාව** මැදහත් බව උපේක්ෂාවයි.

මෛත්‍රී භාවනාව ණය සිට්ටුවෙන් හෙයින්ද කරුණා භාවනාව දොම්නසට ආසන්න හෙයින්ද මුදිතා භාවනාව සොම්නසට උපකාර හෙයින්ද උපේක්ෂාවම ශාන්ත වශයෙන් සලකා යටකී බ්‍රහ්මවිහාර භාවනාවන්ගෙන් ලබනලද (චතුක්කනය) තුන්වැනි (පඤ්චකනය) සතරවැනි ධ්‍යාන ඇති යෝගියා ප්‍රකෘති මධ්‍යස්ථ පුද්ගලයෙක් අරමුණු කොට මැදහත් වේවා, මැදහත්වේවායි මෙසේ උපේක්ෂාව වැඩිය යුතුය. එසේ සිත එකගවූ පසු තමා කෙරෙහිද හිතවතුන් කෙරෙහිද මධ්‍යස්ථයන් කෙරෙහිද සතුරන් කෙරෙහිද උපේක්ෂාව වඩා සීමා සම්භෙදයට පැමිණීමෙන් උපේක්ෂා උපචාර ධ්‍යානයටද චතුර්ථ හෝ පඤ්චම අර්පණා ධ්‍යානයටද පැමිණිය යුතුය. අනිකුත් කසිණාදී භාවනාවකින් තුන්වැනි හෝ සතරවැනි ධ්‍යාන ලැබූ තැනැත්තාට මෙම උපේක්ෂා බ්‍රහ්මවිහාර ධ්‍යානයට නොපැමිණිය හැකිය. මේ වනාහි සත්වයන් අරමුණු කොට උපදවනුලබන උපේක්ෂා බ්‍රහ්මවිහාර සතරවැනි ධ්‍යානය හෙයිනි අනින් ධ්‍යානවට අරමුණු සභාග නොවේ.

මෙත්තා කරුණා මුදිතා උපෙක්ඛා යන මෙම සතර බ්‍රහ්මවිහරණ භාවනාවන් මහත් වැඩදායකය. මේ භාවනා සතරම සත්වාරම්මණය.

මෛත්‍රියෙන් ව්‍යාපාදය විෂ්කම්භනය කෙරේ. කරුණාවෙන් හිංසාවද මුදිතාවෙන් අරතියද උපේක්‍ෂාවෙන් රාගප්‍රතිඝ දෙකද විෂ්කම්භණය කෙරේ.

ටිකදෙනෙකුන් සත්වයන් අරමුණුවීමෙන් ධ්‍යාන ඉපදවීම පරිත්තාරම්මණය.

බොහෝ දෙනෙකුන් සත්වයන් අරමුණු වීමෙන් අප්පමාණාරම්මණය. එසේ අපමණ සතුන් අරමුණු වියහැකි හෙයින් අප්පමඤ්ඤා යනුවෙන් දක්වනලද නමුදු එක සතකු නමුදු අරමුණු කොට ධ්‍යාන ඉපදවිය හැකිය.

ලක්‍ෂණාදිය සත්වයන් කෙරෙහි හිතවත් බව ලක්‍ෂණ කොට ඇත්තේ මෛත්‍රියයි. හිතවත් බව ඇතිකිරීම කෘත්‍යයයි. ආඝාතය දුරුවීම එළෙඹ සිටින අයුරයි. සත්වයන් මනාප බව දැකීම ආධාරයයි.

සත්වයන්ගේ දුක් දුරුකිරීම ආකාර පැවැත්ම ලක්‍ෂණ කොට ඇත්තේ කරුණාවයි.

අනුන්ගේ දුක් නො ඉවසීම කෘත්‍යයයි.

අවිහිංසාව එළෙඹ සිටීමයි.

දුකින් මැඩුන සතුන්ගේ අනාථ බව දැකීම ආධාර කාරණයයි.

සත්වයන් කෙරෙහි ප්‍රමෝදය ලක්‍ෂණකොට ඇත්තේ මුදිතාවයි.

ඊර්ෂ්‍යා නොකිරීම කෘත්‍යයයි.

අරතිය නැසීම වැටහෙන ආකාරයයි.

සතුන්ගේ සම්පත් දැකීම ආධාරයයි.

සත්වයන් කෙරෙහි මැදහත් ආකාර පැවැත්ම ලක්‍ෂණකොට ඇත්තේ උපේක්‍ෂාවයි.

සමව දැකීම කෘත්‍යයයි.

පටිස රාගය සංසිඳීම වැටහෙණ ආකාරයයි.

කර්මය ස්වකීය කොට ඇති බව දැකීම ආධාරයයි.

## සැපත් විපත්

මෛත්‍රීභාවනාවෙන් ව්‍යාපාදය දුරුවීම සම්පත්තියයි. සෝකය ඇතිවීම විපත්තියයි. මුදිතා භාවනාවෙන් අරතිය දුරුවීම සම්පත්තියයි. ලෝභ වශයෙන් ගෙහ සිත සතුටු වීම විපත්තියයි. උපේක්ෂාවෙන් පටිසය අනුනය දුරුවීම සම්පත්තියයි. ගෙහ සිත අඥාන හෙවත් මෝහ උපේක්ෂාව විපත්තියයි.

සතර බඹවිහරණ භාවනාවෙන් විදර්ශනා සැපයද භව සැපයද සාධාරණ ප්‍රයෝජනයයි. මේ සියලු භාවනාවන්ට කරුණු කැමති කුශලච්ඡන්දය මූලයි. නීවරණ දුරුවීම මැදයි. අර්පණා ඉපදවීම අවශානයයි.

පැනවීම් වශයෙන් (ප්‍රඥප්ති ධර්ම) එකෙක් හෝ බොහෝවූ හෝ සතුන් අරමුණුය.

උපචාරයෙහි හෝ අර්පණායෙහි අරමුණු වැඩීම ක්‍රම යෙන් ඉන්නා තැන පටන් රවුමට මුළු ලෝකයම සත්වයන් අරමුණුකොට වැඩිය හැකිය. කසිණයන්ගේ අවසන් ඵලය අරූප ධ්‍යානයයි. විපස්සනාවෙන් ඵලසමාපත්තියයි. සමථ විපස්සනාවන්ගේ නිරෝධ සමාපත්තියයි. මුල් බ්‍රහ්මවිහාර තුනේ අවසන් ඵලය උපෙක්ඛා බ්‍රහ්මවිහාරයයි. මුල් තුණ සොමනස්ස වේදනාව අත්නොහරියි. මෙසේ දහම් දැන විඳසුත් වඩා නිවන් සැප ලබත්වා!

# 59

නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස

## අසුභසඤ්ඤා ධ්‍යාන.

'කතමෙ ධම්මා කුසලා?

යස්මිං සමයෙ රූපූපපත්තියා මග්ගං භාවෙති, විවිච්චෙව කාමෙහි, විවිච්ච අකුසලෙහි ධම්මෙහි, සවිතක්කං සවිචාරං විවේකජං පීතිසුඛං පඨමජ්ඣානං උපසම්පජ්ජ විහරති උද්ධුමාතක සඤ්ඤා සහිතං."

## කුසල් දහම් කවරහුද?

යම් වේලාවෙක රූපී බඹලොව ඉපදීම සඳහා මාර්ගය වඩාද කාමයන්ගෙන් වෙන්ව අකුශලයන්ගෙන් වෙන්ව විතර්ක විචාර සහිතවූ විවේකයෙන් හටගත් ප්‍රීතිය හා සැපය ඇති උද්ධුමාතක සඤ්ඤා සහිතවූ ප්‍රථම ධ්‍යානයට පැමිණ වෙසේ.

ශාන්තිනායක සම්බුදුරජාණන් වහන්සේ සතර බඹ විහරණ ධ්‍යාන කුශල සිත් දේශනා කොට අසුභ භාවනා වන් වැඩීමෙන් ලැබෙන රූපාවචර කුශලයන් දැක්වීම සඳහා ඉහත සඳහන් පාළිය වදාළසේක.

අසුභ භාවනාවද බුහුසම්යට විශෙෂය. බුද්ධ ධර්මයෙහි පමණක් අසුභ භාවනාවන් මනාව දේශනා කොට එහි ආනිසංසයන් බුදුරජාණන් වහන්සේ,

"අමතං තෙ භික්ඛවෙ පරිභුඤ්ජන්ති
යෙ කායගතාසතිං පරිභුඤ්ජන්ති"

මහණෙනි යමෙක් තුමූ කායගතාසති අසුභ භාවනාව වඩද්ද ඔවුහු අමෘතය හෙවත් නිවන් සුව වළඳත්යැයි දෙසූසේක. කේසාදී කොටස් නීලාදී වර්ණ කසිණ වශයෙන්

සතර පස් ධ්‍යානයන්ට අරමුණුවන බව ඉහත දක්වනලදී. අසුභ වශයෙන් ඒ දෙතිස් කොටස්වලින්ද ලැබෙන්නේ ප්‍රථම ධ්‍යානය පමණය ප්‍රථම ධ්‍යානය පමණක් ලැබෙන දස අසුභය වඩා ධ්‍යාන ඉපදවීම හෙවත් රූපාවචර කුසල යන් මෙයින් දක්වන ලදී.

**උද්ධුමාතක සඤ්ඤා සහගතං.**

උද්ධුමාතක හැඟීම සහිත ප්‍රථම ධ්‍යානය මෙයින් කියන ලදී උද්ධුමාතක අසුභය හෙවත් ඉදිමීගිය මලසිරුර අරමුණු කොට සිත එකඟකර භාවනාකිරීමෙදී උද්ධුමාතක අසුභ සඤ්ඤා සහිතව ප්‍රථම ධ්‍යානය පමණක් උපදී.

1. **උද්ධුමාතක:** වාතයෙන් පිම්බුණු මයිනහමක් මෙන් කාමරූප ජීවිත-ඉන්ද්‍රියයන්ගෙන් තොරවුණු ශරීරය කම්මජ, චිත්තජ, ආහාරජ රූපයන්ගෙන් ශූන්‍යව හිස්ව උතුජ රූපකලාපයන් තනිවූ හෙයින් වහා ජරාවට පැමිණේ. එහෙයින් මරණය සිදුවූ මොහොතේ සිට ඉදිමීමට පත්වෙමින් පවතී මෙසේ මරණින් මතු (උද්ධං මතං) උද්ධුමාතන හෙවත් ඉදිමෙන (උද්ධං-උම්මාතං) මල්සිරුර භාවනාවට අරමුණක් කරගැනීම මෙයින් උගන්වන ලදී.

පෙර මලසිරුරු දෙතුන් දින තබාගැණීමක් නොවීය. අද ද ඉන්දියාවේ මෘතශරීර එදිනම ගෙයින් බැහැරකරණු ලැබේ. එම මළසිරුර සොහොන් පිටියක සතුන්ට ආහාර පිණිස බොහෝවිට දමනු ලැබේ. එබඳු ඉදිමුණු මළසිරුරක් උඩු සුළඟේ හෝ යටි සුළඟේ නොසිට පසෙකටවී උද්ධුමාතක අසුභය හෝ උද්ධුමාතක පටිකකූලය හෝ මෙනෙහි කරමින් බලමින් භාවනාකළ යුතුය.

ඇස්පියා බලනවිටද එය මනාව පෙනේනම් වෙනින් තැනකට හෝ ගොස් විවේකව හිඳ භාවනාකළ යුතුය. අසුභ පිළිකුල් සඤ්ඤාව මනාව වැටහෙමින් වඩවඩාන් ප්‍රකට

වෙමින් උපචාරධ්‍යානයටද අර්පණා ප්‍රථම ධ්‍යානයටද පැමිණේ. මේ අරමුණ දුර්වල හෙයින් විතර්කයේ බලයෙන්ම සිත එහි පිහිටවියයුතු හෙයින් ප්‍රථම ධ්‍යානයෙන් එහා ධ්‍යානයක් නොලැබේ. අනිත් අසුභයන් පිළිබඳවද මෙසේය. මළසිරුර තවත් පසුව් මුණගැසීමේදී එය නිල්වීයන අවස්ථාවට පැමිණිය හැකිය.

2. **විනීලක:** එවිට විනීලක අසුභසංඥාව සහිත ප්‍රථම ධ්‍යානය විනීක අසුභය-විනීලක පටිකකූලය යනුවෙන් මෙනෙහිකරණ යෝගියාට ලැබේ.

3. **විපුබ්බක:** කුණුවී සැරව ගලන මළසිරුර විපුබ්බක අසුභයයි. එයද පළමු පරිදි අරමුණු කොට භාවනා කිරීමෙන් ප්‍රථම ධ්‍යානය ලැබේ.

4. **විච්ඡිද්දක:** කුණුවී සැරව ගලා සිදුරු සෑදී පැලී ගැසී ගිය මළසිරුර විච්ඡිද්දක අසුභයයි.

5. **වික්ඛායිතක:** සුනඛ කැණහිල් ආදී සතුන් විසින් තැනින් තැන කාදමා ඇති මළසිරුර වික්ඛායිතක අසුභයයි.

6. **වික්ඛිත්තක:** අත් පා ආදී අඟපසඟ වෙන්වී ගොස් තිබෙන මළසිරුරයි.

7. **හතවික්ඛිත්තක:** වඩ වඩාත් විනාශකොට කපුටු පා මෙන් විසිරීගිය අඟපසඟ ඇති මළසිරුර හතවික්ඛිත්තක අසුභයයි.

8. **ලෝහිතක:** ලේ ගලමින් ඒ මේ තැනින් ලේ වැගිරෙරෙමින් පවත්නා මළසිරුර ලෝහිත නම්.

9. **පුළවක:** පණුවන් වැගිරෙන මළසිරුරයි.

10. **අට්ඨික:** ඇටසැකිල්ල හෝ එක ඇටයක් හෝ අට්ඨික අසුභය වශයෙන් ගෙණ භාවනාකළ හැකිය.

මෙසේ මලසිරුරක් ඒ ඒ අවස්ථාවන්ට පැමිණී තිබෙන ඒ ඒ අසුභය අනුව භාවනා වඩා ප්‍රථම ධ්‍යානය ලැබූ පුද්ගලයා රාගය විෂ්කම්භනයකාය හෙයින් රහතන් වහන්සේ කෙනෙකුන් මෙන් ලොල් බැවින් තොරව ව්‍යාසයකරත් තේය.

මෙ අසුභ දසයක්ම වදළේ ශරීරය මරණින් මතු පත්වන වෙනස්වීම් අවස්ථා සලකාගෙණ හා රාගචරිත යාගේ භේද වශයෙන්ය.

රාගචරිතයාගේ භේද වශයෙන්:

1. ශරීර සටහණ ප්‍රියකරණ රාගචරිතයාට උද්ධුමාතක අසුභය සප්පාය වේ. එකට ඉදිමුණු හෙයින් සිත අලවන සටහණක් වේ.

2. ශරීර වර්ණය ප්‍රියකරණ රාගචරිතයාට විනීලක අසුභ යද,

3. ශරීර ගන්ධය ප්‍රියකරණ රාගචරිතයාට විපුබ්බක අසුභයද,

4. ශරීරයෙහි ඝන භාවය ප්‍රිය කරණ රාගචරිතයාට විච්ඡිද්දක,

5. මස්පිඩු රැස්ව උස්ව තිබීම ප්‍රියකරණ රාගචරිතයාට වික්ඛායිතකයද,

6. අත්පා ආදී අඟපසඟ ලීලා ප්‍රියකරණ රාගචරිතයාට වික්ඛිත්තකයද,

7. ශරීරය අංග එක්වී බැඳීම ප්‍රියකරණ රාගචරිතයාට හතවික්ඛිත්තයද,

8. ශරීර සැරසීම ප්‍රියකරණ රාගචරිතයාට ලෝහිත අසුභයද,

9. ශරීරය කෙරෙහි බලවත් මමත්‍වය ඇතියාහට පුළුවක අසුභයද,

10. දත් පන්තිය ප්‍රිය කරණ රාගචරිතයාට අට්ඨික අසුභ යද සප්පාය වශයෙන් දක්වන ලදී.

අසුභය අප්‍රිය අරමුණක් වුවත් ආනිසංස වැටහීමෙන් හා නීවරණ සන්තාප දුරුවීමෙන් ප්‍රථම ධ්‍යාන සිතෙහි ප්‍රීතිය හා සොම්නස යෙදේ.

මළසුරුරෙහි පමණක් නොව ජීවමාන ශරීරයේද සැගිරි වැනි තිස්ස හාමුදුරුවන්ට මෙන් අසුභසඤ්ඤා ධ්‍යාන ලැබේ.

මෙසේ මේ දස අසුභය ගැනීමෙන් දෙතිස් කොටසද වර්ණ ධ්‍යාන වශයෙන් නවසීවථිකාවක්ද ගත්තේ වෙයි. ආණපාණය වායො කසිණයෙහි ඇතුලත්වන හෙයින් මෙතෙකින් රූපාවචර අපිණ කුසල් ලැබෙන අරමුණු (භාවනා) සියල්ල දක්වූ සේක. රූපාවචර කුසල් නිමි.

මෙසේ දහම් දැන විදසුන් වඩා නිවන් සැප ලබත්වා!

# 60

## නමෝ සම්මා සම්බුද්ධස්ස

## සමාලෝචනය.

රූපාවචර කුසල් උදුරා දැක්වීම.

"කතමෙ ධම්මා කුසලා?"

පසුගිය රූපාවචර කුසල් සිත් පිළිබඳ පාඩම්වලින් ධම්මසඞ්ගණියේ රූප කුසල් ශාන්තිනායක සම්මා සම්බුද්ධ රජාණන් වහන්සේ දෙසූ ආකාරයෙන් දක්වා ඇත. ඒ ඒ සිත් විසුද්ධිමග්ග අභිධම්මත්ථ සඞ්ගහ, අභිධම්මාවතාර යන පොත්වල උදුරා දක්වනලද අයුරු සලකා බැලීම අභිධර්මය උගන්නවුනට ඉතා ප්‍රයෝජනවත්ය. මක්නිසාද යත්? අභිධර්මයේ බුදුරදුන් වදාළ ක්‍රමයට සිත් හා චෛතසික තේරුම්ගෙන ඒවා ආචාර්යයන් වහන්සේලා පහසුවෙන් තේරුම් ගැනීමට සකස්කර ඇති අයුරු වටහාගැනීමට පුළුවන්වන හෙයිනි.

කතමෙ ධම්මා කුසලා? යනුවෙන් රූපාවචර කුසල් දෙසනු කැමති බුදුරජාණන් වහන්සේ මව් දෙව්රජුන් ප්‍රධාන කොට ඇති දිව්‍ය බ්‍රහ්මයන්ට "යස්මිං සමයෙ රූපූපපත්තියා මග්ගං භාවෙති, විවිච්චෙව කාමෙහි විවිච්ච අකුසලෙහි ධම්මෙහි සවිතක්කං සවිචාරං විවේකජං පීතිසුඛං පඨමජ්ඣානං උපසම්පජ්ජ විහරති පඨවිකසිණං"

මෙහි සිංහල තේරුම පසුගිය පාඩම් පත්‍රිකාවත්හි මනාව දක්වා ඇත. ඉතිරි සිත්ද පාඩම් පත්‍රිකාවන් බලා දතයුතුය. මෙහි ධ්‍යාන වශයෙන් සිත වෙන්කර ගැනීමෙහිදී සවිතක්ක, සවිචාර, පීති, සුඛ, ඣාන යන වචන ගතයුතුය. ප්‍රථම ධ්‍යානයාගේ ධ්‍යානාඞ්ග පස එහි ගැබ්වී ඇත

විසුද්ධිමග්ගයේ:

1. "විතක්ක විචාර පීතිසුඛ සමාධියුත්තං පඨමං" යනුවෙන් රූපාවචර පළමු සිත මෙම ධම්මසඞ්ගණී දෙසුමෙන් උදුරා දක්වන ලදී.

එහි තේරුම: විතර්කය, විචාරය, ප්‍රීතිය, සැපය, සමාධිය යන මෙයින් යුක්තවූයේ පළමු සිතය යනුයි. ඉතිරි සිත්ද ඉතා ම කෙටික්‍රමයෙන් දක්වා තිබේ.

2. තතො අතික්කන්ත විතක්කං දුතියං, එයින් විතර්කය ඉක්මවා ගියේ දෙවෙනි සිතයි.

3. තතො අතික්කන්ත විචාරං තතියං, එයින් විචාරය ඉක්මගිය තුන්වැනි සිතයි.

4. "තතො විරත්ත පීතිකං චතුත්ථං" එයින් ප්‍රීතියෙන් වෙන්වූයේ සතරවැනි සිතයි.

5. "අත්ථඞ්ගතං සුඛං උපෙක්ඛා සමාධියුත්තං පඤ්චමං" සැපය බැසගියේ උපෙක්ඛා සමාධි යුක්තවූයේ පස්වැනි සිතයි.

අභිධම්මත්ථ සංගහයේ රූප ධ්‍යාන සිත් උදුරා දක්වා ඇත්තේ මෙසේය.

1. විතක්ක, විචාර, පීති, සුඛ, එකග්ගතා සහිතං පඨමජ්ඣාන කුසල චිත්තං.
2. විචාර, පීති, සුඛ, එකග්ගතා සහිතං දුතියජ්ඣාන කුසල චිත්තං.
3. පීති, සුඛ, එකග්ගතා සහිතං තතියජ්ඣාන කුසල චිත්තං.
4. සුඛ එකග්ගතා සහිතං චතුජ්ඣාන කුසල චිත්තං.
5. උපෙක්ඛා එකග්ගතා සහිතං පඤ්චමජ්ඣාන කුසලචිත්තං

විසුද්ධිමග්ගයේ සමාධි නාමයෙන් දක්වනලද "ධ්‍යාන" ගපිණාවට මෙහි එකග්ගතා යන නාමය යොදන ලදී. මෙම අභිධම්මත්ථ සංගහයේ දක්වනලද අයුරුම බොහෝදෙනා දැන ඉගෙණ පාඩම්කර තිබෙන තසා මෙහිද තේරුම්

අභිධම්මාවතාරයේ:

1. කාමච්ඡන්ද, ව්‍යාපාද, ථිනමිද්ධ උද්ධච්ච කුක්කුච්ච විචිකිච්ඡා, විප්පහීණං විතක්ක, විචාර, පීති, සුඛ, චිතෙතකග්ගතා සම්පයුත්තං පඨමං"

කාමච්ඡන්ද, ව්‍යාපාද, ථිනමිද්ධ, උද්ධච්ච, කුක්කුච්ච විචිකිච්ඡාවන් ප්‍රහීණවූ විතර්ක විචාර පීතිසැප, ඒකාග්‍රතා සමග යෙදුණු පළමු සිත.

2. විතකක විපපහීණං විචාර, පීතිසුඛ, චිතෙතකගගතා සමපයුතතං තතියං.

විතර්කය ප්‍රහීණවූ විචාර, ප්‍රීති, සැප, ඒකාග්‍රතා සමග යෙදුණ දෙවෙනි සිත.

3. විතකක විචාර විපපහීණං පීතිසුඛෙකගගතා සමපයුතතං තතියං,

විතර්ක විචාර ප්‍රහීණවූ ප්‍රීතිය, සුඛය, ඒකාග්‍රතාවය සමග යෙදුණු තුන්වැනි සිත.

4. විතකක, විචාර, පීති, විපපහීණං සුඛෙකගගතා සහිතං චතුත්ථං,

විතර්ක, විචාර, ප්‍රීති තොරවූ සැප ඒකාග්‍රතාවයෙන් යුතුවූ සතරවැනි සිත.

5. විතතක විචාර පීති සුඛ විපපහීණං උපෙකෙඛකගගතා සහිතං පඤ්චමං,

විතර්ක, විචාර, ප්‍රීති, සැපයෙන් තොරවූ උපෙක්ඛා, ඒකගගතා සහිත පස්වැනි ධ්‍යාන සිත

මෙහි දුරුකරණ අංග (පහීණ) සහ එක්ව යෙදෙන සම්පයුතත අඞ්ගද මනාව එකට ගලපා සිත් උදුරා දක්වා ඇත. මෙසේ විසුද්ධිමග්ගයේ ඛන්ධ නිද්දෙශයේ ඉතාම කෙටියෙනුත් අභිධම්මාවතාරයේ ඉතා දීඝීවත් දක්වා ඇති හෙයින් අභිධම්මත්ථ සඞ්ගහයේ සම්පයුත්ත අඞ්ගයන් පමණක් යොදා මධ්‍යම ප්‍රමාණයෙන් සිත් දැක්වීම නිසා එයම බෞද්ධ ලෝකයා අතර සම්භාවිත විය. එසේම රූපාවචර ධ්‍යාන සිත් සතර චතුක්කනය වශයෙන් දැක්වූ ආකාරය සූත්‍රවලදී දක්වා වදාළ සේක.

පඤ්චකනයට අනුව විසුද්ධිමග්ග, අභිධම්මත්ථ සඞ්ගහ, අභිධම්මාවතාර යන පොත්වල සිත් දක්වා තිබේ. මෙම දෙවැදෑරුම් නය පිළිබඳවද පසුගිය පාඩම්වල විශේෂ විභාග දක්වා ඇත.

කාමාවචර කුශලයෙහි විසිමහා නය මෙන්ම මෙම රූප කුසල් සිත්ද හීන, මධ්‍යම, ප්‍රණීතාදී වශයෙන් බෙදෙන බව සැලකිය යුතුය.

# 61

## නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස.

### අරූපාවචර කුසල්?

"කතමෙ ධම්මා කුසලා?

යස්මිං සමයෙ අරූපූපපත්තියා මග්ගං භාවෙති, සබ්බසො රූපසඤ්ඤානං සමතික්කමා, පටිඝසඤ්ඤානං අත්ථඞ්ගමා, නානත්තසඤ්ඤානං අමනසිකාරා, ආකාසානඤ්චායතනසඤ්ඤාසහගතං සුඛස්ස ච පහානා, දුක්ඛස්ස ච පහානා, අදුක්ඛමසුඛං උපෙක්ඛා සති පාරිසුද්ධිං චතුත්ථජ්ඣානං උපසම්පජ්ජ විහරති"

### කුසල් දහම් කවරහුද?

යම් වේලාවක අරූපී බඹලොව ඉපදීම පිණිස මාර්ගය වඩාද? හෙවත් භාවනා කෙරේද? හැම අයුරෙන්ම රූපාවචර ධ්‍යානයන් හා එම අරමුණුද ඉක්මවා හෙවත් දුරු කොට, පටිඝසඤ්ඤාවන් හෙවත් ඇසට රූපාදී අරමුණු හැපීමෙන් ඇතිවන චක්ඛුවිඤ්ඤාණාදී සඤ්ඤාවන් ප්‍රහාණය කොට නොයෙක් නොයෙක් අරමුණුවල පවත්නා සඤ්ඤා මෙනෙහි නොකොට ආකාසානඤ්චායතන සඤ්ඤා සහගතවූ සැපදුක් ප්‍රහාණය කිරීමෙන් නොදුක් නොසුව උපේක්ෂා සිහි පිරිසිදු බව ඇති සතරවැනි ධ්‍යානයට පැමිණ වෙසේ. හීනවූ මධ්‍යමවූ ප්‍රණීතවූ හෝ. රූපාවචර කුසල් දක්වා අරූප කුසල් දක්වනු කැමති සම්මා සම්බුද්ධ ශාන්තිනායකයන් වහන්සේ කුසල් දහම් කවරහුද යනාදීන් වදාළසේක. රූපී බඹලොව ඉපදීම හෙවත් ප්‍රතිසන්ධි විඤ්ඤාණය පහළ වීම රූපාවචර කුසල විපාකයන්ගෙන් සිද්ධවේ. බ්‍රහ්මපාරිසජ්ජාදී බ්‍රහ්මලෝක 16 ක් උත්පත්තිස්ථාන වශයෙන් දක්වේ. එම රූපී බ්‍රහ්මලෝකවලද කාමාවචර ලෝකයෙහි ලැබෙන සියලු රූපකලාපයන් නොලැබේ. අහාරජ රූප සම්පූර්ණයෙන් නොලැබෙන අතර ඝාණ, ජිව්හා, කාය, භාව යන ප්‍රසාද දසක කර්මජ රූපකලාපද නොලැබේ. චක්ඛු, සොත, වත්‍ථු යන දසක තුණත් ජීවිත නවකයත්

යන කම්ජ රූප හා චිත්තජ, ඍතුජ, රූප පමණක් ලැබෙන කාමාවචර ලෝකයට (දෙව් මිනිස් ආදියට) වඩා ඉතා සියුම් අත්බවක් රූපී බ්‍රහ්මයන්ට ඇත.

අරූපී බඹලොව ඒ කිසිම රූපයක් නැත. එහෙයින් මෙය රූපවිරාග භාවනා, බලයෙන් රූපයෙන් සිත වෙන් වන අවස්ථාවකි.

1. රූප සඤ්ඤානං සමතික්කමා.

රූපසඤ්ඤා යනුවෙන් රූපාවචර ධ්‍යාන සිත්ද එම ධ්‍යානයන්ට අරමුණුවූ පඨවි කසිණ ආදී රූපයන්ද ගණු ලැබේ. මෙසේ සියලු රූපාවචර ධර්මයන් හැම ආකාරයෙන්ම ඉක්මවා දුරුකොට යැම සබ්බසෝ රූපසඤ්ඤානං සම-තික්කමා යනුවෙන් උගන්වන ලදී. මෙසේ මෙයින් රූපාවචර සියලු නාමරූප ධර්මයන්ගෙන් වෙන්වීම දක්වූයේය. එසේ නම් කාමාවචර ධර්මයන්ගෙන් වෙන්වීම ගැන නොකිව යුතුය. එහෙත් එයින් අරූපතලයෙහි සම්පූර්ණයෙන් නූපදින කොටසකුත් සමවතට නොපැමිණි අවස්ථාවන්හි ඇතිවියහැකි එහෙත් සමවැදුණු අවස්ථායෙහි නොපවතින චිත්ත සඤ්ඤාවන් හැඳින්වීම සඳහා.

2. පටිඝසඤ්ඤානං අත්ථඞ්ගමා.

පටිඝසඤ්ඤාවන්ගේ ප්‍රහාණය වීමෙන් හෙවත් ඇසට රූපය, කණට ශබ්දය ආදීන් හැපීමෙන් හටගන්නා සිත් වලට මෙහි පටිඝසඤ්ඤා යැයි කියනු ලැබේ. කුසල විපාක දෙපස් විඤ්ඤාණ සිත් ප්‍රහාණය වීමෙන් මෙම අනාසානඤ්චායතන සිත පහළවේ.

රූපාවචර පළමුවැනි ධ්‍යානයට සමවැදුණු තැනෙත් කාට ද මෙම පඤ්චද්වාරාවජ්ජන සිත් නොපවතී. එසේ කල්හි මෙහිදී වදාළේ ප්‍රසාදයත් උත්සාහයත් ඇතිකරවනු සඳහාය. රූපාවචර අවස්ථාවෙහි මේවා නූපන්නාට රූපාවචරයට අයත් හෙයින් ප්‍රහාණයවූවා නොවෙති. ඉක්මණින්

පැමිණිය හැකිය. එහෙයින් ප්‍රථමධ්‍යානයට සමවැදුණුහට ශබ්දය කටුවකැයි (ඉක්මණින් විද බිඳදමන්නකැයි) බුදුරජුන් වදාරණ ලදී. රූපවිරාග භාවනාවෙන් අරූප සිත් පහළවන හෙයින් රූප ශබ්දාදී පටිඝසඤ්ඤාවන් තදෙන් යටපත්වීම දක්වන ලදී. එසේ පටිඝසඤ්ඤාවන් ප්‍රහාණය වන හෙයින්ම අරූප සිත්වලට ආනෙඤ්ජ - නොසැලෙන ශාන්ත සමාපත්තියැයි දක්වන ලදී. කරත්ත පන්සියයක් ලඟින් ගමන්කරද්දී ආළාරකාලාම තවුසාට නොදැණුනේ මෙම අරූප සමාපත්තීන්ට සමවැදීම නිසාය.

**3. නානත්ත සඤ්ඤානං අමනසිකාරා.**

නොයෙක් අත නොයෙක් ගෝචරයන්හි අරමුණුවල පහළවන සිත් නානත්තසඤ්ඤා නාමයෙන් ගැණේ. සමවතට නොපැමිණ සිටින්නහුට ඇතිවන මනොධාතු මනොවිඤ්ඤාණධාතු සිත් පිළිබඳ සඤ්ඤායැයි කියනලදී නා නා ස්වභාවවූ එකිනෙකට වෙනස්වූ එහෙයින් නොයෙක් ස්වභාවවූ සඤ්ඤා ඇති සිත් මෙයින් ගණු ලැබේ.

එනම්: කාමාවචර සිත් අට,

අකුසල සිත් දෙළස.

(මහා වි. 8, සම්. 1, සං. 2) කාම කුසල විපාක එකොළස.
(සම්, 1. සං. 1. ) අකුසල විපාක දෙක.
(මහා කි. 8. ප. 1. ම. 1. හ. 1) කාම කිරිය එකොළස යන සිත් සතළිස් සතර නානත්තසඤ්ඤා නාමයෙන් ගැණේ. මෙයින් අරූපී බඹලොව උපන් බඹුනට සමවතට නොවැද සිටින වේලාවට කාමාවචර කුසල් 1, කිරිය සිත් 9, අකුසල් සිත් 10, (පටිසයන් හැර) මෙම සිත් 27 ක් පහළවියහැකි හෙයින් ඒවා මෙනෙහි නොකර යැයි කියන ලදී.

මෙසේ මෙම ආකාසානඤ්චායතන සිත පහළවනවිට සියලු රූපාවචර ධර්මයන් දුරුවීමත් සියලු කාමාවචර ධර්ම සිත්ගේ දුරුවීමත් මෙනෙහි නොවීමත් කියන ලදී.

මෙසේ දහම් දැන විදසුන් වඩා ශාන්ත නිවන් සුව ලබාගනිත්වා!

# 62

නමො සම්මා සම්බුද්ධස්ස.

**අරූප කුසල් 2.**

'කතමෙ ධම්මා කුසලා;

යස්මිං සමයෙ අරූපූපපත්තියා මග්ගං භාවෙති, සබ්බසො රූපසඤ්ඤානං සමතික්කමා පටිඝසඤ්ඤානං අත්ථඞ්ගමා නානත්තසඤ්ඤානං අමනසිකාරා, ආකාසානඤ්චායතනසඤ්ඤාසහගතං සුඛස්ස ච පහාණා දුක්ඛස්ස ච පහාණා අදුක්ඛමසුඛං උපෙක්ඛා සතිපාරිසුද්ධිං චතුත්ථජ්ඣානං උපසම්පජ්ජ විහරති ඣිණං

**කුසල් දහම් කවරහුද?**

යම් වේලාවක අරූපී බබලොව ඉපදීම සඳහා මාර්ග වඩාද (භාවනා කෙරේද) හැම අතින් රූපසඤ්ඤාවන් ඉක්මවා පටිඝසඤ්ඤාවන් ප්‍රහාණය කොට නානත්තසඤ්ඤාවන් නොමෙනෙහි කොට ආකාසානඤ්චායතන සඤ්ඤා සහගතවූ සුවදුක් දුරුකොට නොදුක් නොසුව උපෙක්ෂා සිහි පිරිසුදු බව ඇති හීණවූ සතරවැනි ධ්‍යානයට පැමිණ වෙසේ.

ශාන්තිනායක සම්මා සම්බුදුරජාණන් වහන්සේ අරූපාවචර කුසල් දේශනාකර වදාරණ සේක් කුසල් දහම් කවරහුද යනාදීන් වදාළසේක.

එහි- රූපසඤ්ඤානං සමතික්කමා.

රූපාවචර සිත් 15 සහ කසිණ අරමුණු 8 ඉක්මා යෑම. මෙහි ඉක්මවා යෑම නම් එම රූපසඤ්ඤාවන්ගේ සීමාවෙන් එහාට යෑමයි.

**2. පටිඝසඤ්ඤානං අත්ථඞ්ගමා.**

පටිඝසඤ්ඤා හෙවත් ඇසත්, රූපයත්, කණත්, ශබ්දයත් නාසයත්, ගන්ධයත්, දිවත්, රසයත්, සිරුරත් පහසත්, හැපීමෙත් ඇතිවන කුශල අකුශල විපාක විඤ්ඤාණ

සිත් දහය අස්තයට යවා හෙවත් දුරුකොට- ප්‍රහාණය කොට, අරූප භූමියේ කොහොමවත්ම රූපයක් නොලැබේ. එනි ඇස කණ ආදී දෙරටු ඇසුරෙන් උපදනා සිත් කෙසේ වත් නොලැබේ. මෙසින් සමතික්කමා--ඉක්මවා යෑම සහ අත්ථඞ්ගමා අස්තයට යෑම යන වචනවලින් අරූපභූමියේදී කෙසේවත් නොලැබෙ ා නොඋපදින සිත් දක්වන ලදී.

3 නානත්තසඤ්ඤානං අමනසිකාරා.

කාමාවචර කුසල් 8, අකුසල් 12, සහේතුක අහේතුක කුසලවිපාක 11, අකුසල විපාක සඤ්ඤ 2, (සම්ප-සන්තීරණ) කාමාවචර කිරිය සිත් 11 යන සිත් 44 මෙනෙහි නොකොට යනුවෙන් මෙසින් අරූපාවචර භවයෙහි උපන් තැනැත්තාට පහළවියහැකි කාමාමාවචර කුසල් 8, කිරිය සිත් 9, (මනොද්වාරාවජ්ජනය සමග) අකුසල් සිත් 10, (ද්වෙෂමූල 2 හැර) යන සිත් 27 ද, මෙනෙහි නොකිරීම් වශයෙන් දුරුකොට මෙම ආකාසානඤ්චායතනය ඉපදවීම දෙසන ලදී. පසුගිය පත්‍රිකාවෙහිද විස්තරව ඇත. අරූප කුසල් පහලවීමෙදී මේ අඞ්ගයන් දුරුකරණ කරුණු හැටි යට වටහාගත හැකිය. ඉහත සඳහන් සිත්වලට මෙහිදී සඤ්ඤානාමයෙන් හඳුන්වන ලද්දේ අරූපධ්‍යානය ඉතා සියුම් හෙයින් සඤ්ඤ හෙවත් හැඟීම් මාත්‍රයෙන් දක්වීම උචිත නිසා වියහැකිය.

ආකාසානඤ්චායතන සඤ්ඤ සහගතං.

ආකාස - අනන්ත - ආයතන යන ශබ්දයන්ගේ එක්වී මෙන් ආකාසානඤ්චායතන ශබ්දය සෑදී තිබේ අනන්තයක් කෙළවරක් නැති අහසම මෙම ධ්‍යාන සිත ඉපදීමට උපකාරවූ ස්ථානය - පිහිටවූ තැන හෙයින් අහස අනන්තය. අහස අනන්තයැයි භාවනා කිරීමෙන් (අහස) පැතුරුණු කසිණ නිමිත්ත උගුලුවා-ගලවා හැර, එයින් ශේෂවූ හිස්බව අරමුණු කිරීමෙන් ලබන අපිණා ජවන් සිත ආකාසානඤ්චායතන නමවේ.

රූපයෙහි හෙවත් රූපාවචර ධ්‍යානයන් කාමච්ඡන්ද සතුරන් ළඟම ඇති හෙයින් ප්‍රණීත නොවන බව සලකා රූප ධ්‍යාන සිත්වලින් හා එම අරමුණුවලින් තුරන්ව සිත පමණක් පැවතීම උතුම් කොට සැලකූ යෝගියා, රූපයෙන් තුරන්ව විසීමේ දැඩි ඡන්දයෙන් චතුර්ථධ්‍යානයට අරමුණුවන කසිණ නිමිත්ත ධ්‍යානයෙන් නැගී කසිණ නිමිත්ත දුරුවේවායි අධිෂ්ඨාන කරයි. කසිණ නිමිත්ත පැතිරී තිබුණ ප්‍රමාණ අහස ඊළඟට අරමුණුවේ. එය අරමුණු කිරීමෙන් රූපාවචර ධ්‍යාන සිත් හා අරමුණුද දුරුව හැපෙන සිත්වලින් හා ඉහත දක්වූ සතළිස් සතරක් සිත්වලින් දුරුව ඉතා සියුම්වූ අරූපාවචර පළමුවැනි සිත චතුර්ථධ්‍යානය වශයෙන්ම පහළවේ. එහෙත් මෙය රූපාවචර තත්වයෙන් මිදුණු රූපයෙන් සිත වෙන්කළ හෙයින් අරූප ප්‍රතිසන්ධියක් දෙන සිතෙහි සියුම් අවස්ථාවකි. එහෙසින්ම සැපදුක් දෙකින් වෙන්වූ උපෙක්ෂා සිහි පිරිසිදු බැවින් යුතු සතරවැනි ධ්‍යානය කියා දේශනාකළ සේක.

අහසද රූපයකි. එහෙත් එය අනිත් රූප නිසා හැඳින්වෙන සියුම් රූපයකි. කලින් තිබුණු ඕලාරික රූපයන්ගෙන් සිත වෙන්කොට ඉතා සියුම්වූ අහස අරමුණු කොට පැවති සඤ්ඤාව හෙවත් හැඳිනීම සහිතවූ සතරවැනි ධ්‍යාන සිත රූපයෙන් සිත වෙන්කොට ප්‍රතිසන්ධිය දීමෙහි සමත්වන බව මෙයින් වටහාගත යුතුය.

සිතෙහි පැවැත්මට රූපයක් හා සම්බන්ධතාවයක් නැත් නම් එයට රූපයක් වුවමනා නැත. එහෙත් අරූපී බඹ ලොව - අරූපධ්‍යාන තලයයැයි ව්‍යවහාරය. ඒ එක්තරා සියුම් දියුණු තත්වයකට පත්වන සිත් එක්තරා අවස්ථාවක පැවතිය යුතුය. ඒ තත්වය සලකා මිස අරූපධර්මයන්ගේ පැවැත්මට රූපී ලෝකයක් අවශ්‍යමය යනු නොසිතිය යුතුය.

මෙසේ දහම් දැන විදසුන් වඩා නිවන් සැප
සාධාගනිත්වා!

# 63

## නමො සමමා සම්බුදධසස.

## අරූපකුසල් (111)

“කතමෙ ධමමා කුසලා?

යසමිං සමයෙ අරූපූපපත්තියා මගගං භාවෙති, සබබසො ආකාසානඤචායතනං සමතිකකමම විඤඤාණඤචායතන සඤඤාසහගතං සුඛසසච පහාණා දුකඛසසච පහාණා අදුකකමසුඛං උපෙකඛාසති පාරිසුද්ධිං චතුත්ථජ්ඣානං උපසමපජජ විහරති, උපෙකඛා සහගතං”

**කුසල් දහම් කවරහුද?**

යම් වේලාවක අරූපී බඹලොව ඉපදීම සඳහා භාවනා කෙරේද, හැම අයුරෙන්ම ආකාසානඤචායතනය ඉක්මවා විඤඤාණඤචායතන සඤඤා සහගතවූ සුවදුක් දුරුකොට උපේක්ෂා සිහි පිරිසුදු බව ඇති සතරවැනි ධ්‍යානයට පැමිණ වෙසේ. උපෙක්ෂාවෙන් යුක්තවූ.

ශාන්තිනායක සම්බුදුරජාණන් වහන්සේ අරූපාවචර දෙවෙනි කුසල් සිත දක්වා වදාරණ සේක් කුසල් දහම් කවරහුද? යනාදීන් වදාළසේක.

**සබබසො ආකාසානඤචායතනං සමතිකකමම.**

හැම ලෙසින්ම ආකාසානඤචායතනය දුරුකොට විඤඤාණඤචායතන කුසල් සිත ඉපදවිය යුතුය. රූපාවචර කුසල් සිත්වල මෙන් මෙහි ධ්‍යානාඞග ඉක්මවා යෑමක් නැත. ඉක්මවන්නෙ පළමු කුසල් සිත (ආකාසානඤචායතනය) හා අරමුණු එම කුසල් සිතමය.

මේ විඤඤාණඤචායතනය නම්වූ දෙවෙනි අරූප කුසල් සිත ඉපදවීමට ආකාසානඤචායතන විඤඤාණය

අරමුණුකළ යුතුය. විඤ්ඤාණය අනන්තයැයි ආකාසානඤ්චා-යතන කුසල විඤ්ඤාණය අරමුණු කරමින් භාවනාකළ යුතුය. අනන්ත අහස අරමුණුකළ ආකාසානඤ්චායතන සිත සියුම්ය. එම පළමුවැනි අරූපධ්‍යාන සිත ඉපදවූ යෝගාවචරයා එයිත් නැගී එම සිත සඳහන් අයුරු එය අත්හැර ඊටවඩා උසස් ධ්‍යාන කුශලයක් ඉපදවීම සඳහා භාවනා කිරීමේදී එම ආකාසානඤ්චායතන සිත අරමුණු කොට භවඞ්ග, චලන, උපච්ඡෙද, මනොද්වාරාවජ්ජන, පරිකම්ම, උපචාර, අනුලොම, ගොත්‍රභූ සිත්ද අර්පණා වශයෙන් විඤ්ඤාණඤ්චායතන අරූප කුසල් සිත උපදී.

**2. විඤ්ඤාණඤ්චායතන සඤ්ඤාසහගතං.**

මෙනෙහිකිරීම් වශයෙන් අන්තයක් (කෙළවරක්) නැති හෙයින් අනන්ත වේ. ඒ අනන්තවූ විඤ්ඤාණය අරමුණුව ගත් හෙයින් මේ සිත විඤ්ඤාණඤ්චායතන නම් වේ.

(විඤ්ඤාණං = අනන්තං = විඤ්ඤාණඤ්චං)

මෙහි විඤ්ඤාණනඤ්චං කියයුතු තැන "න" කාරය ලොප්වී විඤ්ඤාණඤ්ච යන වචනයට එය අධිෂ්ඨානකිරීම-භාවනා අරමුණු වශයෙන් ගැණීම නිසා ආයතන ශබ්දයද එක්වීමෙන් විඤ්ඤාණඤ්චායතන නම් වේ.

අහසෙහි පැවති විඤ්ඤාණය අරමුණුකොට පහළවූ ධ්‍යානයට හෙවත් අරූපකුසලයට මේ නම කියැවේ.

---

ආකාසානඤ්චායතන ධ්‍යානයෙහි ඇලීම (නිකන්තිය) දුරුකිරීම අපහසු වුවහොත් දුක්ඛාපටිපදාය. පහසුනම් සුඛාපටිපදාය. අප්පණා නොඉක්මත් නම් දන්ධාභිඤ්ඤාය. ඉක්මත් වුවහොත් ඛිප්පාභිඤ්ඤාය. ආකාසානඤ්චායතනය අරමුණුකෙළේ කුඩා අහස අරමුණු නම් ඒ සිත අරමුණුම ඉපදවූ විඤ්ඤාණඤ්චායතන සිත පරිත්තාරම්මණය. කිහුණු ඉගිලූ අහස් අරමුණ මහත් නම්නන්තාරම්මණය.

"කතමෙ ධම්මා කුසලා?

යස්මිං සමයෙ අරූපූපපත්තියා මග්ගං භාවෙති, සබ්බසො විඤ්ඤාණඤ්චායතනං සමතික්කම්ම, ආකිඤ්චඤ්ඤායතනසඤ්ඤාසහගතං, සුඛස්ස ච පහාණා දුක්ඛස්ස ච පහාණා අදුක්ඛමසුඛං උපෙක්ඛාසති පාරිසුද්ධිං චතුත්ථජ්ඣානං උපසම්පජ්ජ විහරති. උපෙක්ඛාසහගතං."

තුන්වැනි අරූප කුසල් සිත දක්වන ශාන්තිනායකයන් වහන්සේ,

විඤ්ඤාණඤ්චායතනං සමතික්කම්ම යනුවෙන් විඤ්ඤාණඤ්චායතන ධ්‍යාන සිතත් එයට අරමුණුවූ ආකාසානඤ්චායතන විඤ්ඤාණයත් දෙකම අත්හැර ඉක්මවා හෙවත් නොමෙනෙහි කොට,

මෙයින් විඤ්ඤාණඤ්චායතනට සමවැදුණු යෝගියා එයින් ආකිඤ්චඤ්ඤායතනය සඳහා භාවනා කළයුතු බව වදාරණ ලදී. නත්ථි කිඤ්චි, නත්ථි කිඤ්චි - කිසිත් නැ - කිසිත් නැ යනුවෙන්ය ඔහුගේ භාවනාව.

3. ආකිඤ්චඤ්ඤායතන සඤ්ඤාසහගතං.

කුමක්දැයි කියා අරමුණක් මොහුට නැත. එහෙයින් ආකිඤ්චන නම්වේ. ආකාසානඤ්චායතන විඤ්ඤාණය නැති බව-තිබී නැතිවූ බව මෙයින් ගන්නා ලදී. අකිඤ්චනයාගේ සවභාවය ආකිඤ්චඤ්ඤ නම් වේ. ඒ නැති බව (-නාස්ති භාව ප්‍රඥප්තිය) අධිෂ්ඨාන (අරමුණු ලෙස) කරණ හෙයින් ආකිඤ්චඤ්ඤායතන නම් වේ. විඤ්ඤාණඤ්චායතනයේ නිකාන්තිය දුරුකිරීම් ආදී වශයෙන් දුක්ඛා පටිපදා ආදිය පෙර මෙන් දක්වන ලදී.

"කතමෙ ධම්මා කුසලා? යස්මිං සමයෙ අරූපූපපත්තියා මග්ගං භාවෙති, සබ්බසො ආකිඤ්චඤ්ඤායතනං සම-

තික්කම්ම නෙවසඤ්ඤානාසඤ්ඤායතන සඤ්ඤාසහගතං සුඛස්සච පහාණා දුක්ඛස්සච පහාණා උපෙක්ඛා සතිපාරිසුද්ධිං චතුත්ථජ්ඣානං උපසම්පජ්ජ විහරති. උපෙක්ඛා සහගතං."

යම් වේලාවක අරූපී බඹලොව ඉපදීමට භාවනාකරණ යෝගියා, ආකිඤ්චඤ්ඤායතනං සමතික්කම්ම, ආකිඤ්චඤ්ඤායතනය ඉක්මවා හැම අයුරින්ම දුරුකොට යැයි දක්වන ලදී. මෙහි නාස්තිභාව ප්‍රඥප්තිය අරමුණු කොට ගෙණ ලැබුණු ආකිඤ්චඤ්ඤායතන විඤ්ඤාණය හෙවත් ධ්‍යාන සිත ශාන්තය ඉතා ප්‍රණීතය. සන්තමෙතං පණීතමෙතං යනාදීන් භාවනා කරණවිට ඉතා සියුම්වූ නෙවසඤ්ඤානාසඤ්ඤායතන අරූප සතරවන සිත උපදී.

**4. නෙවසඤ්ඤානාසඤ්ඤායතන සහගතං.**

නෙවසඤ්ඤා - සඤ්ඤාවක් හැඟීමක් සිතක් වේදනාවක් නැත. අසඤ්ඤාවක් අවේදනාවක්, සිතක් නැති බවකුත් නැත. මෙයින් සිතක් ඇත්තේත නැත. නැත්තේත් නැත යන තරමට සියුම් සංඛාරාවශෙෂ සමාපත්තිය නමින් හඳුන්වනලද ධ්‍යාන කුශලය දක්වන ලදී.

මේ ඉතා සියුම්වූ සිතයි. මෙයට එහා සියුම් සංඛත යක් නැත. මෙම ධ්‍යානය ලබාගැනීම සඳහා අරමුණු කොට භාවනාකල ආකිඤ්චඤ්ඤායතන ධ්‍යාන සිත මෙම නෙවසඤ්ඤානාසඤ්ඤායතන අපිණා සිත ඉපදීමෙන් දුරුකරණලද්දේ වේ. මෙහිදී සමවතට පැමිණීමේදී එය සිදුවේ. රජතුමා ඉතා සියුම් කැටයම් කරන්නාවූත් දුන සතුටුවෙයි. එහෙත් රජකම හැර කැටයම් කරුවෙකු නොවෙයි. නෙවසඤ්ඤානාසඤ්ඤායතනය රජකම මෙන් ප්‍රණීත බව මෙයින් කියනලදී.

ඕලාරික සඤ්ඤාවක් නැති හෙයින් නෙවසඤ්ඤායැයිද ඉතා සියුම් සඤ්ඤාවක් ඇති හෙයින් නාසඤ්ඤායැයිද කියනලදී. මනායතන ධම්මායතනයන්ට අයිති හෙයින් නෙවසඤ්ඤානාසඤ්ඤායතනයැයි කියන ලදී.

පාත්‍රයෙහි තෙල් ගා තැබූ පසු එය ගෙණෙන්ට යැයි කීකල පාත්‍රයෙහි තෙල්යැයි කියනලදී. එහෙනම් බෝතලය කට දමන්නයැයි කී කල එසේ තෙල් නැති බව කියන ලදී.

මෙම සතරවැනි ධ්‍යාන සිත සුද්ධ ජලයෙහි තෙජෝ ධාතුව නොදැනෙන්නාසේ සියුම්ය. විදර්ශනාවට අරමුණු නොවේ. සැරියුත් මහරහතන් වහන්සේ වැනි උතුමන්ට කලාප වශයෙන් අරමුණුවේ.

මෙසේ දහම් දැන විදසුන් වඩා උතුම් නිවන් සැප
ලබත්වා!

# 64

## නමො සම්මා සම්බුද්ධස්ස

## විස්තර සහ න්‍යායයන්

(1) "කතමෙ ධම්මා කුසලා?

යස්මිං සමයෙ අරූපූපපත්තියා මග්ගං භාවෙති, සබ්බසො රූප සඤ්ඤානං සමතික්කමා පටිඝ සඤ්ඤානං අත්ථඞ්ගමා, නානත්තසඤ්ඤානං අමනසිකාරා ආකාසානඤ්චායතන සඤ්ඤා සහගතං.

2 හීනං.
3 මජ්ඣිමං
4 පණීතං.
5 ඡන්දාධිපතෙය්‍යං
6 විරියාධිපතෙය්‍යං.
7 චිත්තාධිපතෙය්‍යං.
8 වීමංසාධිපතෙය්‍යං.
9 ඡන්දාධිපතෙය්‍යං හීනං
10 මජ්ඣිමං.
11 පණීතං.
12 විරියාධිපතෙය්‍යං හීනං.
13 මජ්ඣිමං.
14 පණීතං.
15 චිත්තාධිපතෙය්‍යං හීනං.
16 මජ්ඣිමං.
17 පණීතං
18 වීමංසාධිපතෙය්‍යං හීනං.
19 මජ්ඣිමං.
20. පණීතං.

1 කුසල් දහම් කවරහුද?

යම් වේලාවක අරූපී බඹලොව ඉපදීම සඳහා භාවනා කෙරේද, සෑම අයුරින් රූප හැඟුම් ඉක්මවා පටිඝ හැඟුම් දුරුකොට නානත්ත හැඟුම් මෙනෙහි කොට ආකාසානඤ්චායතන හැඟීම් සහිතවූ ධ්‍යානයට පැමිණ වෙසේ.

2 හීනවූ එම ධ්‍යානයට, 3 මධ්‍යම වූ, 4 ප්‍රණීතවූ, 5 ඡන්දය ප්‍රධාන කොට, 6 වීර්‍ය්‍යය අධිපතිකොට, 7 සිත ප්‍රධානකොට, 8 ප්‍රඥාව ප්‍රධානකොට, 9 ඡන්දය අධිපති කොට හීනවූ, 10 මධ්‍යමවූ, 11 ප්‍රණීතවූ, 12 වීර්‍ය්‍යය අධිපතිකොට හීනවූ, 13 මධ්‍යමවූ, 14 ප්‍රණීතවූ, 15 සිත

අධිපති කොට හීණවූ, 16 මධ්‍යමවූ, 17 ප්‍රණීතවූ, 18 ප්‍රඥව අධිපතිකොට හීණවූ, 19 මධ්‍යමවූ, 20 ප්‍රණීතවූ, ආකාසා නඤ්චායතන ධ්‍යානයට පැමිණ වෙයේ,

ශාන්තිනායක සම්බුදුරජාණන් වහන්සේ කාමාවචර හා රූපාවචර කුසල් සිත් පිළිබඳවද මෙම විසිවැදෑරුම් නය දෙසූසේක: මෙසේ අරූපාවචර කුසල් එක එක විසිවැදෑරුම් න්‍යාය ක්‍රමයට බෙදේ. මෙම රූප අරූප කුසල් ත්‍රිහේතුකමය. කාමාවචර කුසල් අධිපති ධර්මයන් සමගත් උපදිති. නැතිමත් උපදිති. රූප අරූප කුසල් අධිපතීන් සමගම උපදිති. කාමාවචර කුසල්වල ආරම්මණාධිපතියද සහජාතාධිපතියද ලැබේ රූප අරූප කුසල්වල සහජාතාධිපතිය පමණයි. එසිත් අදහස් කරන්නේ දානාදී කුසල් අරමුණු කොට ද රූප ශබ්දදී අව්‍යාකතයන් අරමුණු කොට කාම කුශල ජවනයන් ආරම්මණාධිපති වශයෙන් ලැබෙන බවයි. එහෙත් විසති මහානයෙහි කාමරූප අරූප සියලු කුසල්හි ගණුලබන්නේ ඡන්ද විරිය චිත්ත විමංසා යන සතර සහජාත අධිපතියයි.

එසිනුත් ඡන්දය ඡන්දයට අධිපති නොවෙයි. එක්ව යෙදෙන අනික් චිත්තචෛතසිකයන්ටය. මෙසේ මේ සත රම තමා තමන්ට නොව එක්ව යෙදෙන ධර්මයන්ට අධිපති වන අතර එකවර සතරම එක සිතක අධිපතිව නො යෙදේ.

මෙම අරූපාවචර සිත් සතර ධම්මසඞ්ගණියෙන් උදුරා රගෙණ "ආකාසානඤ්චායතන" කුසල සිත යැයි විසුද්ධි මග්ග අභිධම්මත්ථසඞ්ගහ යන පොත්වල දක්නා ලැබේ.

අභිධම්මාවතාරයේ – ධම්මසඞ්ගණියේ දැක්වූ ආකාරය වම. සබ්බසො රූප............ආකාසානඤ්චායතන සඤ්ඤා සහගතං, විඤ්ඤාණඤ්චායතන සඤ්ඤාසහගතං යනාදී වශයෙන් දක්වන ලදී.

මෙම සතර අරූප සිත්වල උපෙක්ෂා ඒකාග්‍රතා යන අඞ්ග දෙක පමණක් යෙදේ. එහෙයින් රූපාවචර ධ්‍යාන යට අයිති අඞ්ග දෙකම පවතින හෙයින් මෙය චතුත්ථජ් ඣාන සංඛ්‍යාවට වැටෙන බව සිතිය යුතුය.

එහෙත් අරමුණු ඉක්මවායයි. එනම් රූප නිමිත්ත ඉක්මවා කසිණ ඉගුළු අහස අරමුණුකොට ආකාසානඤ්චා යතන සිතද,

එම කිසුණු ඉගුළු අහස ඉක්මවා ගොස් ආකාසානඤ්චා යතන විඤ්ඤාණය අරමුණු කරමින් 2 විඤ්ඤාණඤ්චායතන සිතද,

ආකාසානඤ්චායතන සිත ඉක්මවා එම සිත නැතිව ගිය බව අරමුණු කොට 3 ආකිඤ්චඤ්ඤායතන සිතද,

අහස පැවති විඤ්ඤාණයාගේ නැතිබව නමැති අරමුණ ඉක්මවා ආකිඤ්චඤ්ඤායතන සිත අරමුණු කොට 4 නෙව සඤ්ඤානාසඤ්ඤායතන සිතද පහළවේ.

මෙයට ඉතා හොඳ උපමාවක් දක්වා තිබේ. පිරිසිදුවට කැමති මිනිසෙක් මඩුවකට ගියේය මඩුව සැමතැනම අපිරිසිදු දේවල්ය. (අසූචිය) ඔහු මඩුවෙහි උඩ බැඳ තිබුණු බාල්කයක එල්ලුණේය. තවත් එබඳුම මිනිසෙක් පැමිණ පළමුවැන්නා නිසා ඔහු ද එල්ලුනේය. මෙහි නිසායැයි දක්වූයේ නමුදු ඔහුගේ ඇඟෙහි එල්ලුනේයයි ගැණීම උපමාවට. ගැලපේ.

තව මිනිසෙක් පැමිණ මණ්ඩපයට නොගොස් මෙනා සිටියේය. තවත් මිනිසෙක් ඔහු ඇසුරු කොට සිටගත් තේය

අසූචි මණ්ඩපය මෙන් කිසුණු ඉගිලූ අහස දතයුතුය. මිනිසා මෙන් රූප නිමිත්ත පිළිකුල්කොට අහස අරමුණු

කල ආකාසානඤ්චායතන සිත ගතයුතුය. දෙවැන්නා මෙන් ආකාසානඤ්චායතනය අරමුණුකල විඤ්ඤාණඤ්චායතනයද පිරිත සිටි මිනිසා මෙන් ආකාසානඤ්චායතන සිත නැති බව අරමුණුකල සිතද සතරවැන්නා මෙන් ආකිඤ්චඤ්ඤා යතන සිත අරමුණුකල නෙවසඤ්ඤානාසඤ්ඤායතන සිතද ගත යුතුය.

මෙසේ ඉතා සියුම්වූ සතර අරූප සිත් දැන විදසුන් වඩා ශාන්ත නිවන් සැප සිද්ධකර ගණිත්වා!

# 65

## නමෝ සම්මා සම්බුද්ධස්ස

## ලෝකෝත්තර කුසල්.

"කතමෙ ධම්මා කුසලා? යස්මිං සමයෙ ලොකුත්තරං ඣානං භාවෙති, නීය්‍යානිකං, අපචය ගාමිං, දිට්ඨිගතානං පහාණාය පඨමාය භූමියා පත්තියා, විවිච්චෙව කාමෙහි විවිච්ච අකුසලෙහි ධම්මෙහි සවිතක්කං සවිචාරං විවෙකජං පීතිසුඛං පඨමජ්ඣානං උපසම්පජ්ජ විහරති, දුක්ඛා පටිපදං, දන්ධාභිඤ්ඤං.

කුසල් දහම් කවරහුද?

යම් වේලාවක ලෝකෝත්තර ධ්‍යානය වඩාද සසරින් එතර කරවන, සසර රැස් නොකරණ මිසදිටුව දුරුකරණ පළමු ලෝකෝත්තර භූමියට පැමිණීම සඳහා (ලෝකෝත්තර ධ්‍යානය වඩාද) කාමයන්ගෙන් වෙන්ව විතර්කය සහිතවූ විචාරය සහිතවූ විවේකයෙන් හටගත් ප්‍රීතිය හා සැපය ඇති දුක්ඛා පටිපදා දන්ධාභිඤ්ඤා ලෝකෝත්තර ප්‍රථමධ්‍යානයට පැමිණ වෙසේ.

ශාන්තිනායක සම්බුදුරජාණන් වහන්සේ ලෝකෝත්තර කුසල් දක්වනු කැමතිසේක් ත්‍රෛභූමික කුසලයන්ට අනතුරුව ධම්මසඞ්ගණියේ කුසල් දහම් කවරහුද යනාදීන් වදාළසේක

ලොකුත්තර.

ලොකං තරතීති ලොකුත්තරං,
ලොකං උත්තරතීති ලොකුත්තරං,

ලෝකය තරණය කෙරේනුයි හෙවත් ලෝකයෙන් එතෙර වේනුයි ලෝකෝත්තර නම් වේ. මෙයින් ගැනෙන්නේ සෝවාන් ආදී සතර මාර්ග සිත්ය. ලෝකයෙන්

එතෙර වූයේයයි ගත්කල එලසිත් ගැණේ. ලෝකය නම් සංස්කාරය "ලුජ්ජතීති ලොකො" යනුවෙන් විනාශවන නිසා ලෝකයැයි කියැවේ.

මෙතෙක් කාමරූප අරූප සිත් දක්වන ලද්දේ කාම භූමි, රූපභූමි, අරූපභූමින්හි ඉපදීමට කියාය. මේ තුන් භූමියෙන් ඉවත්වීම පිණිස මෙසේ ලෝකෝත්තර සිත් දක්වන සේක.

ඣානං භාවෙති.

මෙහි ධ්‍යානය නම් ඒකචිත්තක්ෂණිකවූ අර්පණ ධ්‍යාන යයි. සෝවාන් ආදී මාර්ග සිත් පහළවන්නේ එකවරක් පමණකි. එහෙයින් මෙම ලෝකෝත්තර ධ්‍යානය එකවරක් පහළවන හෙවත් ඒකචිත්තක්ෂණිකය.

"ඣාපෙතීති ඣානං" (එකම අරමුණක එකම සිතක් බොහෝ වේලා යොදවන්නේ) ධ්‍යානයයි. විරුද්ධ කෙලෙස් හුත් දවන්නේ ධ්‍යානයයි. ලොවුතුරු දහත් (ධ්‍යානයන්) එයින් ගැණේ. (පට්ඨාන දේශනා සාරය 257 බලන්න.)

නීය්‍යානිකං.

ලෝකයෙන් සසරින් එහාට පමුණුවානුයි
නීය්‍යාන නම් වේ.

ලොකතො නීය්‍යාති වට්ටතො නීය්‍යාතීති නීය්‍යාණිකං. මෙයින් ගෙණයානුයි කියාද නීය්‍යාණික නම් වේ.

ඒ කෙසේදයත්:

දුක දැනගන්නේ ගෙණයයි. සමුදය දුරුකරන්නේ ගෙණයයි. නිවණ සිද්ධකරන්නේ ගෙණයයි. මාර්ග වඩන්නේ ගෙණයයි. මේ සතර එකවර මාර්ග සිතෙන් කෙරෙණ හෙයින් මාර්ග සිත ගතයුතුය. මෙයින් ලෝකෝත්තර ධ්‍යානය එයින් යුකත පුද්ගලයා නිවණට ගෙණයන බව කියනලදී.

අපචයගාමිං

එක්රැස් නොකිරීම හෙවත් සසර දිගට පැවැත්මට වුවමනා ප්‍රතිසන්ධි කර්මයන් රැස්නොකරණ, ත්‍රෛභූමක කුශලකර්ම රැස්කොට ප්‍රතිසන්ධි ප්‍රවෘත්ති විපාක දෙමින්, සසර දික්කෙරේ. මේ ලෝකෝත්තර කුශලය රැස්කරන්නේ නැත. සෝවාන් ආදී මාර්ග තුණ ප්‍රතිසන්ධි විපාකය සීමා කෙරේ. ප්‍රවෘත්ති විපාක ගෙනදේ. අර්හත්ත්ව මාර්ග කුශලය ප්‍රතිසන්ධි ප්‍රවෘත්ති විපාක නොදේ. එහෙයින් මෙම ලෝකෝත්තර කුසල් සසර දුක රැස් නොකරණ හෙයින් අපචයගාමී නම් වේ.

දිට්ඨිගතානං පහාණාය.

මිථ්‍යාදෘෂ්ටීන්ගේ ප්‍රහාණය; නැතිකිරීම පිණිස, දිට්ඨින්ම හෝ මිට්ඨිගත නම් වේ. දෙසැට මිසදිටුවට ඇතුළත් නිසාද දිට්ඨිගත නම් වේ. දිට්ඨිසදිස ගමනාති දිට්ඨිගතානි.

දිට්ඨිය හා සමාන ගමන් ඇති හෙයින් හෝ දිට්ඨිගත නම් වේ. සක්කායදිට්ඨිය සමග විචිකිච්ඡා සීලබ්බත පරාමාස අපායට යන තරමේ ලෝභ ද්වේෂ මෝහ අකුසල් සෝවාන් මාර්ගය දක්වා ගමන් කෙරේ. මෙසේ විචිකිච්ඡා ආදී කෙලෙස් හෝ දිට්ඨිගත නම් වේ.

පටිසම්භිදා මාර්ගයේ,

"දිට්ඨෙකට්ඨා කිලෙසා" යනුවෙන් සක්කායදිට්ඨිය හා එකට සිටි කෙලෙසුන් වශයෙන් විචිකිච්ඡා ආදිය ගතයුතුය. මෙසේ දිට්ඨියත් දිට්ඨිය හා එකට වැටෙන කෙලෙසුන් සමුච්ඡේද ප්‍රහාණය පිණිස ලෝකෝත්තර ප්‍රථමධ්‍යානය වඩයි.

පඨමාය භූමියා පත්තියා.

පළමු භූමියට පැමිණීම පිණිස. "භූමි" නාමය මහ පොළවට කියැවේ. "භවන්ති එත්ථාති භූමි" මෙහි ඉවත්නුගී

භූමි නම් වේ. මහපොළොව නොයෙක් දේ පැවැත්මට පිහි-ටීමට උපකාර වේ.

කාමභූමි, රූපභූමි, අරූපභූමි යන තන්හි ඒ ඒ කුසල විපාක සිත් ඉපදීමට පිහිටවන හෙයින් භූමි නම් වේ. කාමාවචරාදි සිත් ඒ හා යෙදෙන චෛතසික ධර්මයන්ට පිහිටීමට උපකාරවන හෙයින් භූමි නම් වේ.

මෙහි වනාහි ප්‍රථම භූමිය යනුවෙන් සෝවාන් ඵල සිත අදහස් කරණ ලදී එක්වයෙදෙන ධර්මයෝ මෙහි වෙත්නුයි භූමි නම් වේ. "භූමි" යන වචනයෙන් පහලවන තැනක් නොව පහලවීම ප්‍රධාන වශයෙන් ගැණේ. වීම, හෙවත් පහලවීම පමණක් භූමි නාමයෙන් ගත්විට මෙය පහසුවෙන් අවබෝධ කළ හැකිය.

කාම භූමීන් පිළිබඳව ස්ථානයක් තැනක් භූමිනාමයෙන් සිතාගතහැකි නමුදු යත්තමින් හෝ රූපභූමීන් පිළිබඳවද සිතියහැකි නමුදු අරූප ලෝකුත්තර නාමයෙන් නම් ගැණෙන්නේ සිත් පහලවීම් මාත්‍රයම බව සැලකිය යුතුය.

මෙම ප්‍රථම භූමියට පැමිණීමහෙවත් සෝවාන් ඵලයට පැමිණීම මෙයින් අදහස්කරණ බව සැලකිය යුතුය.

මෙසේ දහම් දැන විදසුන් වඩා ශාන්ත නිවන් සැප පතාගනිත්වා!

නමො සම්මා සම්බුද්ධස්ස.

## ලොව්තුරු කුසල් 2.

"කතමෙ ධම්මා කුසලා?

යස්මිං සමයෙ ලොකුත්තරං ඣානං භාවෙති. නීය්‍යාණිකං, අපචයගාමිං, දිට්ඨිගතානං පහාණාය පඨමාය භූමියා පත්තියා.

විවිච්චෙව කාමෙහි, විච්ච අකුසලෙහි ධම්මෙහි සවිතක්කං සවිචාරං විවේකජං පීතිසුඛං පඨමජ්ඣානං උපසම්පජ්ජ විහරති, දුක්ඛා පටිපදං දන්ධාභිඤ්ඤං.

කුසල් දහම් කවරහුද?

යම් වේලාවක සසරින් එතර පමුණුවන, රැස්කොට කිරීමට යන හෙවත් ක්‍ෂයවන, සක්කායදිට්ඨිය හා එක්ව යෙදෙන කෙලෙසුන්ගේ ප්‍රහාණය පිණිස පවතින, පළමු භූමියට පැමිණීම පිණිස ලෝකොත්තර ධ්‍යානය වඩා ද?

කාමයන්ගෙන් වෙන්ව, අකුසලයන්ගෙන් වෙන්ව විතර්ක සහිතවූ විචාර සහිතවූ විවේකයෙන් හටගත් ප්‍රීතිය හා සැපය ඇති ප්‍රථමධ්‍යානයට පැමිණ වෙසේ.

ශාන්තිනායක සම්බුදුරදුන් වහන්සේ ලොවුතුරු කුසල් දක්වන සේක් පළමුකොට ලොකුත්තරං ඣානං යනුවෙන් ලොවුතුරු ධ්‍යාන වශයෙන් දක්වා වදාළසේක.

රූප අරූප ලෝකුත්තර කුසල් අපිණා සිත්ය. රූප අරූප කිරිය සිත්ද අපිණාය. ලොකුත්තර විපාක සිත්ද අපිණාය.

"අප්පනිහි අප්පණා" අරමුණෙහි සිත නැග පැවතීම. සිත තදෙන් කසිණාදී අරමුණුවල කාවැදී පැවතීම අදහස් කෙරේ. ඒ සඳහා විතර්ක විචාර ප්‍රීති සැප ඒකාග්‍රතා ධ්‍යානාංග අවශ්‍යය. රූපාවචර සිත්හි යෙදෙන ධ්‍යානාංග රූපාවචරය. අරූප සිත්හි උපෙක්ඛා ඒකාග්‍රතා අරූපාවචරය. ලෝකුත්තර සිත්හි ලෝකුත්තරය.

කාමාවචර සිත්හි යෙදෙන මේ විතර්කාදී චෛතසි ා යන්ට ධ්‍යානාඞ්ග නාමය ධම්මසඞ්ගණියේ දැක්වූයේ . මෙයින් විතර්ක ඒකාග්‍රතා දෙක මාර්ගාඞ්ග නාමයද ල ත් එහෙත් කාමාවචරය.

"විවිච්චෙව කාමෙහි" යන කාමයන්ගේ දුරුකිරීම රූපාවචර සිත්හිදී විෂ්කම්භන වශයෙනි. මෙම ලෝකෝත්තර සිත්හිදී සමුච්ඡෙද ප්‍රහාණයෙන් අපායගාමී ලෝභයෙන් වෙන්වීම හෙවත් විවේකය උගත්වන ලදී. අකුසලෙහි ධම්මෙහි යන තැනද අපායගාමී අනිත් අකුසලයන්ගෙන් වෙන්වීමය.

මෙම ඉතා සියුම්වූ චිත්තධර්මයන් ඔවුනොවුනට උපකාර වන අයුරු ප්‍රත්‍යශක්තීන් අනුව වටහාගත යුතුය. භූම්‍යන්තරය වරදවාගැනීම මිසදිටුවට හේතුවේ. රූපාවචර ප්‍රථම ධ්‍යාන සිත නොලබා දෙවෙනි ධ්‍යාන සිතද දෙවෙනි ධ්‍යානසිත නොලබා තුන්වැනි ධ්‍යාන සිතද තුන්වැනි ධ්‍යාන සිත නොලබා සතරවැනි ධ්‍යාන සිතද නොලැබිය හැකිය. ඒ ඒ ධ්‍යානයන් ධ්‍යානාඞ්ගයන් ඉක්මවා යන හෙයිනි. එසේම උපනිශ්‍රයාදී ශක්තීන් ලබාදෙන හෙයිනි. "පඨමං ඣානං දුතියස්ස ඣානස්ස උපනිස්සය පච්චයෙන පච්චයො" යනාදීන් ඒ බව පට්ඨානයේ දේශිතය. එසේම සතරවැනි ධ්‍යානය නොලබා ආකාසානඤ්චායතනය නොලැබිය හැකිය. ධ්‍යානාඞ්ග වශයෙන් සතරවැනි ධ්‍යානයේත් ආකාසානඤ්චායතනයේත් උපෙක්ඛා ඒකාග්‍රතා පමණකි.

එසේම "චතුත්ථං ඣානං ආකාසානඤ්චායතනස්ස උපනිස්සය පච්චයෙන පච්චයො" යනුවෙන් උපනිශ්‍රයාදී ප්‍රත්‍යශක්තීන් ලබාදෙන හෙයිනි.

ලෝකෝත්තර සිත්වලට අභිඥා ධ්‍යානයක උපනිශ්‍රය ශක්තියක් එපරිද්දෙන් දක්වා නැත.

"පඨමස්ස මග්ගස්ස පරිකම්මං පඨමස්ස මග්ගස්ස උපනිස්සය පච්චයෙන පච්චයො" ප්‍රථම මාර්ගය සඳහා ඇතිවන පරිකර්ම භාවනා ජවන් සිත් ප්‍රථම මාර්ගයට උපනිශ්‍රය වේ.

ප්‍රථම මාර්ග සිත නූපදවා නම් දෙවෙනි මාර්ග සිත ඉපදවිය නොහැකිය. පඨමො මග්ගො දුතියස්ස මග්ගස්ස උපනිස්සය පච්චයෙන පච්චයො යනුවෙන් ප්‍රථම මාර්ග සිත දෙවෙනි මාර්ග සිතට උපනිශ්‍රය ශක්තිය ලබාදෙන හෙයිනි. ප්‍රථමධ්‍යානය ලැබූ තැනැත්තා එය පාදක කොට විදර්ශනා වඩා සෝවාන්වීමේදී එම ලෝකොත්තර සිතද ධ්‍යානාඞ්ග පසෙන් යුතුය. දෙවෙනි ධ්‍යානය ලැබූ තැනැත්තා එය පාදකකොට විදර්ශනා වඩා සෝවාන් වීමේදී ධ්‍යානාඞ්ග තුනකින් යුතුය. මෙසේ පාදක ධ්‍යානයට අනුව ලෝකෝත්තර සිතද ගණන්ගැණෙන්නේ ඉතා සුළු කාලයකට පෙර ධ්‍යානයෙන් පසු කළ ධ්‍යානාඞ්ගයන් එම ලොවුතුරු සිත්හිද නොපහළවන හෙයින්ය. එහෙත් මෙහි රූපී අභිඥා ධ්‍යානයක් සෝවාන් ආදී ලෝකෝත්තර සිත් ඉපදවීමට අවශ්‍යම යැයි නොගත යුතුය.

මක්නිසාදයත් කාමාවචර ඤාණසම්ප්‍රයුක්ත සිතද ධ්‍යානාඞ්ග පසෙකින් යුතුය. ශුද්ධ විපස්සනා වඩන යෝගියාට උපචාර සමාධි තත්ත්වයට දියුණුවූ කාමාමාවචර පරිකර්ම ජවනයද උපනිශ්‍රය ශක්තිය ලබාදෙන හෙයිනි.

නොඑසේ නම් අභිඥා ධ්‍යානයක් අවශ්‍යම නම් "පඨමං ඣානං පඨමස්ස මග්ගස්ස උපනිස්සය පච්චයෙන පච්චයො" කියා වදාළ යුතුමය. එසේ අපේ පට්ඨානයේ නම් දෙසා නැත.

"අරහා අනුප්පන්නං කිරිය සමාපත්තිං උප්පාදෙති" යනාදීන් රහතන් වහන්සේලා කවදාකවත් තම සතන්හි නොම ඉපදවූ කිරිය සමවත් හෙවත් ප්‍රථම ධ්‍යානාදිය උපදවන බව පට්ඨානයේ දක්වේ. එයින් රූපාවචර අජිණා නොලබා රහත්වූ උතුමන් ගැණ කියැවේ.

අපායගාමී ශක්තිය ඇති ලෝභය ද්වේෂය ආදී කෙලෙසුන්ද සමුච්ඡේද ප්‍රහාණය කරමින් විතර්ක විචාර පීතිසුඛ ඒකග්ගතා යන ලෝකෝත්තර ධ්‍යානාඞ්ගයන් සහිතව මෙම ලොවුතුරු ප්‍රථමධ්‍යානයට පැමිණ වෙසේ.

දුක්ඛා පටිපදා දන්ධාභිඤ්ඤා.

දුක්වූ ප්‍රතිපත්ති ඇති ලැසිවූ අවබෝධය ඇති ප්‍රථම ධ්‍යානයට පැමිණ වෙසේ. විපස්සනාභාවනා ආරම්භකරණ යොගියා මුලසිට කෙලෙසුන් විෂ්කම්භණය කරන්නේ දුකෙන් අමාරුවෙන් ප්‍රයෝගයෙන් වෙහෙසෙමින් කෙලෙසුන් දුරුකරයි. ඔහුට දුක්වූ ප්‍රතිපදාය.

එසේ යටපත්වූ කෙලෙසුන් ඇත්තේ විපස්සනා පිරිවෙස් වසන්නේ හෙවත් භාවනා කරන්නේ කල්ගතවී මාර්ගීසිත ලබන්නේ දන්ධාභිඤ්ඤාය.

මෙය හරිහැටි වටහාගැණීමට තරමක් හෝ විදර්ශනාව විස්තරකළ යුතුය.

මෙසේ දහම් දැන විදසුන් වඩා නිවන් සැප ලබත්වා!

# 67

## නමො සම්මා සම්බුද්ධස්ස

## ලොවුතුරු කුසල් 8.

"කතමෙ ධම්මා කුසලා?

යස්මිං සමයෙ ලොකුත්තරං ඣානං භාවෙති, නිය්‍යාණිකං, අපචයගාමිං, දිට්ඨිගතානං පහාණාය, පඨමාය භූමියා පත්තියා, විවිච්චෙව කාමෙහි විවිච්ච අකුසලෙහි ධම්මෙහි සවිතක්කං සවිචාරං විවෙකජං පීතිසුඛං පඨමජ්ඣානං උපසම්පජ්ජ විහරති. දුක්ඛා පටිපදං දන්ධාභිඤ්ඤං.

ශාන්තිනායක සම්බුදුරදුන් වදාළ ලෝකොත්තර පළමු සිත ප්‍රතිපදා අනුව දක්වනසේක්, දුක්ඛාපටිපදං දන්ධාභිඤ්ඤං යනුවෙන් ප්‍රකාශකළ සේක. මේ පිළිබඳ වැටහීමක් ලබා ගැනීමට විපස්සනා භාවනාව පිළිබඳ විමසා බැලිය යුතුය. ධම්මසඞ්ගණියේ විස්තර කථාවවූ අත්ථසාලිනියේ විපස්සනා භාවනාව පටන්ගැණීම මෙසේ දක්වා ඇත.

"යො හි චත්තාරි මහාභූතානි පරිග්ගහෙත්වා
උපාදරූපං පරිග්ගණ්හාති." (199 පිටුව)

යමෙක් සතරමහාභූත රූපයන් පරිග්‍රහණය කොට (අල්ලාගෙණ) උපාදාරූපයන් අල්ලාගනියි. මෙහි විපස්සනා භාවනාවේ මුල් පටන්ගැණීම සතරමහාභූත රූපයන් අල්ලා ගැනීම බව කියැවේ

භූතරූප නම් පඨවි, ආපෝ, තේජෝ, වායෝ යන සතරයි. මේවා පරිග්‍රහණය හෙවත් සිතින් අල්වාගැණීම ඔවුන්ගේ ලක්ඛණ, රස, පච්චුපට්ඨාන, පදට්ඨාන අනුව මෙනෙහි කිරීමෙන් සිදුවියයුතු බව විසුද්ධිමග්ගයේ "ලක්ඛණ රසාදි වසෙන පරිග්ගහෙතබ්බා" යනුවෙන් දැක්වේ.

පඨවි ධාතුවේ ලක්ඛණය, කක්ඛලත්ත ලක්ඛණා පඨවී, කැකුළු හෙවත් තද බව මෘදුබව ලක්‍ෂණකොට ඇත්තේ පඨවිය. ඉතින් පඨවිධාතුව අරමුණුකරණ යොගියා එම තදබව ශරීරයේ දැනෙනවිට දැනෙන තැනක එය අරමුණුකළ යුතුය. අරමුණු කළයුත්තේ මෙනෙහිකළ යුත්තේ එය තමන්ට දැනෙන අයුරෙනි. තදබවක් නම් දැනෙන්නේ තදයි, තදයි යනුවෙන් එම තදබව දැනෙන තැන අරමුණුකළ යුතුය තදබව ටිකවේලාවකින් නැතිව ගොස් ඇතැම්විට එතැන මෘදුබවක් දැනෙන්නට පුළුවන. එවිට මෘදුයි යනුවෙන් මෙනෙහිකළ යුතුය. මෙසේ භාවනා කිරීමට වාඩිවූ විගස තදබව නොදැනෙයි පූජීකෘත්‍යාදිය කොට එක ඉරියව්වෙන් ටික වේලාවක් ගතවනවිට දැනෙන්ට පුළුවන.

තද මෘදුගති කිසිවක් නොදැනෙතොත් අතිත් රූප යෙක ලක්‍ෂණ ඇත්දැයි මෙනෙහිකළ යුතුය. ආපෝ ධාතුව සියුම්ය. එහි ආබන්ධන-පග්ඝරණ ලක්‍ෂණයත් වැටහෙන්නේ සිත දියුණුවූ පසුය. තේජෝ ධාතුව උණ්හලක්ඛණයෙන් යුතුය: උණුසුම් සිසිල් දෙකම තේජෝ ධාතුවය. එවිට ඔබට උණුසුම් සිහිල් ගතියක් දැනේනම් ඒ දැනෙන තැන සිත තබා උණුසුමයි, උණුසුමයි, උණුයි, උණුයි, සීතලයි, සිහිලයි ආදී දැනෙන අයුරෙන් මෙනෙහිකළ යුතුයි එසේ මෙනෙහි කිරීමේදී එසේ භාවනාකිරීමේදී උණුසුම් සිහිල්ගති නොදැනී ගියේ නම් යළි අතිත් යම්කිසි රූපයක ලක්‍ෂණ තිබේදැයි මෙනෙහිකර බැලිය යුතුය. එවිට වායෝධාතුවගේ විත්ථම්භණ ලක්ඛණය දැනෙන්නට පුළුවන. විත්ථම්භණය නම් පිම්බීමයි. පිම්බීම හැකිලීම දෙකම විත්ථම්භණයමය. පිම්බීම් හැකිලීම් අරමුණු කරන්නේද එය දැනෙන තැනකය. පපුවේ හෝ උදරයේ දැනෙන්නට පුළුවන. එසේ දැනෙන තැනක සිත තබමින් පිම්බීම් හැකිලීම් ස්වාභාවිකව තිබෙන අයුරින් මෙනෙහිකරණ යෝගියාට පඨවි ධාතුවේ තදගතිය යම් යම් තැන්වල ශරීරයේ දැනෙන්

නට පුළුවන. එසේ දැනෙන තැනක් මෙනෙහිකළ යුතුය. එය නොදැනී යනවිට යළි දැනෙන්නේ වායෝධාතුවගේ හෝ තේජෝධාතුවගේ ලක්ෂණයක් නම් එය මෙනෙහිකළ යුතුය. මෙසේ සතරමහා භූත රූපයන් ඒ ඒ වැටහෙණ අවස්ථාවන් අනුව මෙනෙහිකිරීම මහා භූතයන් පරිග්‍රහණය කිරීමයි.

මෙසේ මහා භූතයන් පරිග්‍රහණය කරන්නේ උපාදා රූපයන්ද ලැබෙන ලැබෙන අයුරු මෙනෙහිකළ යුතුය. රූපයන් පෙනීමේදී පෙනෙනවා පෙනෙනවා හෝ දකිනවා දකිනවා ආදීන් මෙනෙහිකළ යුතුය සමහරවිට එසේ මෙනෙහිකරණවා සමගම පෙනෙන රූපයන් නොපෙනී යාහැක. එසේ වූවොත් නැවත දැනෙන භූතරූප ලක්ෂණ යට බැසිය යුතුය. මෙසේ පිම්බීම, හැකිලීම හෝ තදවීම, මෘදුවීම හෝ, උණුසුම්වීම සිසිල්වීම හෝ බැඳීම, වැගිරීම හෝ මෙනෙහි කරමින් භාවනාකරණ යෝගියාට බාහිර ශබ්ද රූපයන් ඇසෙන්නට පුළුවන.. එවිට ඇසෙනවා, ඇසෙනවා යනාදීන් එම ශබ්දරූපය අරමුණුකළ යුතුය. එය නොඇසී ගියවිට නැවත කලින් වැටහෙමින් තිබුණු හෝ අමුතුවෙන් වැටහෙණ භූතරූපයන් එහි ලක්ෂණය අනුව මෙනෙහිකරමින් භාවනාකළ යුතුය:

ගඳ සුවඳක් දැනෙනවිටද රස විරසක් දැනෙන විටද ශරීරයට යමක හැපීමක් දැනෙන විටද ඒ ඒ දැනෙන හැටි යෙන් අරමුණුකරමින් භාවනා කළයුතුය. ඒවා නැතිව යෑමෙන් පසු තියන මැට ගෙන භූතරූප ලක්ෂණයක් අරමුණු කරමින් භාවනාකළ යුතුය. මෙසේ උපාදා රූප යන්ගේ පහළවීම අනුව මෙනෙහිකරණ යෝගියා දැන් භූත උපාදා රූපයන් ව්‍යවස්ථාපයකරණ බව සැලකිය යුතුය.

මෙසේ භාවනාකරණ යෝගියාට හදිසියේ අතීත සිහින් සිහියට නැගෙන්නේය. අනාගත කල්පනාවන් එන්නේය. ඒවා පැමිණී විගස වැටහෙනවා, වැටහෙනවා,

කල්පනාවෙනවා, කල්පනාවෙනවා ආදී යම් අයුරකින් ඒ අතීත හෝ අනාගත සිතිවිලි මෙනෙහිකරන්නේය. සිතට එවේලෙහි දුර තිබුණ අරමුණක් (කලින් ගත්) වැටගෙන විට තමන්ගේ සිත එම අරමුණ කරා දිවූවාක් මෙන් ගියාක් මෙන් වැටහේ. එවිට ඒ අනුව සිත දිව්වා, සිත දිව්වා ආදීන් මෙනෙහිකළ යුතුය

තවද අකුසල් සිතක් පහළවූයේ නම් එය මැටහෙන අයුරකින්=ලෝභයක් නම් ලෝභයක්, ලෝභයක්, ද්වෙෂයක් නම් ද්වෙෂයක්, ද්වෙෂයක් ආදී වශයෙන් එම සිත් මෙනෙහිකළ යුතුය. දැන් මෙසේ යෝගියා නාම රූප දෙකම පරිග්‍රහණය කරන්නේය. භාවනා කරන්නේය.

1. මෙසේ රූපාරූපයන් පරිග්‍රහණය- අල්ලාගැනීම දුකසේ සිදුවේ නම් ඒ දුක්ඛාපටිපදාය. මෙසේ රූපාරූපයන් විදශීනාකරන්නේ බොහෝ කල් ගොස් මාර්‍ග සිත් පහළවේ නම් දන්ධාභිඥාය.

2. රූපාරූපයන් පරිග්‍රහණය කොට නාමරූපයන් වෙන් වෙන්ව දකින්නේ දුකින් අපහසුවෙන් දකීද අවබෝධ කෙරේද එසේ දැක කලක් විදශීනා වඩන්නේ මාර්‍ග ප්‍රතිලාභය වේද ඔහුටද දුක්ඛාපටිපදා දන්ධාභිඥාය.

3. නාමරූපයන් වෙන්ව දැක – හෙවත් ලක්ෂණ වශයෙන් අරමුණුකරණ රූපයන්-එම සිතත් දෙක වෙන්ව ඇසිවෙමින් පවත්නා අයුරු දැකීමෙන් ඔවුන් කෙසේ ඇතිවෙත්දැයි ප්‍රත්‍යයන් පරිග්‍රහණය කරන්නේ හෙවත් නාමරූපයන් පහළවීමට උපකාර ධර්‍මයන් අවබෝධ වීම දුකින් සිදුවේද, මාර්‍ගලාභය කලක් ගතවේද ඔහුටද දුක්ඛාපටිපදා දන්ධාභිඥාය.

ප්‍රත්‍යයන් පරිග්‍රහණය කොට හෙවත් ප්‍රත්‍යයන් දන්නා නුවණ ලබා-ඉහත සඳහන් අයුරු ඒ ඒ අවස්ථාවන්හි පහළ වන-සිතට අසුවන නාමරූපයන්, පිම්බීම්, හැකිලීම් ආදී ලක්ෂණ වශයෙන්; හා දැකීම් ඇසීම් ආදී කෘත්‍ය ලක්ෂණ

වශයෙන් මෙනෙහිකරන්නේ මේ නාමරූපයන් කවරකු විසින්මත් කරණ හෝ ඉබේ මැවෙන්නේ නැති බව එවෙලාවෙන් එවෙලාවට පහළවෙමින් පවත්නා නොදැනීම් ආදී හේතුන් උපකාරවන බව වැටහෙන්නේ දුකසේ සිදුවේද මාර්ගලාභය කල්ගතවේද ඔහුටද දුක්ඛාපටිපදා දන්ධාභිඥාය.

4 එසේ ප්‍රත්‍යය පරිග්‍රහණය කොට පළමු කී පරිදිම ස්වභාව ලක්ෂණ විසින් පිම්බීම් හැකිලීම් ආදී වශයෙන් මෙනෙහිකරන්නේ ඒ නාමරූපයන්ගේ අනිත්‍ය ලක්ෂණය දුක්ඛ ලක්ෂණය අනාත්ම ලක්ෂණය දුකසේ අවබෝධකෙරේද විදර්ශනා පරිවාසය දික්වේද ඔහුටද දුක්ඛාපටිපදාය දන්ධාභිඥාය.

මෙහි අනිත්‍ය ලක්ෂණය අවබෝධකරණවා විනා අනිච්චං අනිච්චං යැයි කිය කියා ඉදීමක් නොදක්වේ.

5. මෙසේ නාමරූපයන් තම තමාට අයත් ලක්ෂණ සෙවත් පිම්බීම්, හැකිලීම් ආදී වශයෙන් මෙනෙහි කරන්නේ නාමරූපයන්ගේ අනිත්‍යාදී ලක්ෂණයන් වහ වහා ඇතිවෙමින් නැතිවීම අවබෝධ කොට උදය වය ආදී විදර්ශනා ඥානයන් නිපුණව දක්ෂව පැහැදිලිව පවත්නේ එම විදර්ශනාඥානයන්හිම ඇලීමවූ විපස්සනා නිකාන්තිය දුරුකරන්නේ දුකින් අපහසුවෙන් දුරු කෙරේද විපස්සනා වඩන්නේ කල්ගොස් මාර්ගලාභය වේද ඔහුටද දුක්ඛාපටිපදා දන්ධාභිඥාය.

මේ ප්‍රතිපදාවන්ට අනුව විදර්ශනා භාවනාව අට්ඨසාලි-නියේ දක්වා ඇති අයුරුයි. කියවීමෙහිත්, සිතීමෙහිත් භාවනාකිරීමෙහිත් වෙනස අවබෝධ කොට ගෙණ දහම් දැන විදසුන් වඩා උතුම් නිවන් සැප පතාගනිත්වා!

# 68

## මාර්ග අඞ්ග 8.

කතමෙ ධම්මා කුසලා?

යස්මිං සමයෙ ලොකුත්තරං ඣානං භාවෙති, නීය්‍යානිකං, අපචයගාමිං, දිට්ඨිගතානං පහාණාය, පඨමාය භූමියා පත්තියා.

විවිච්චෙව කාමෙහි විවිච්ච අකුසලෙහි ධම්මෙහි සවිතක්කං සවිචාරං, විවෙකජං, පීතිසුඛං, පඨමජ්ඣානං උපසම්පජ්ජ විහරති, දුක්ඛාපටිපදං දන්ධාභිඤ්ඤං තස්මිං සමයෙ ඵස්සො හොති.

කුසල් දහම් කවරහුද?

යම් වේලාවක සසරින් එතර පමුණුවන රැස්නොකිරීමට යන හෙවත් ක්ෂයවන, සක්කායදිට්ඨිය හා එක්ව යෙදෙන කෙලෙසුන්ගේ ප්‍රහාණය පිණිස පවතින පළමු භූමියට පැමිණීම පිණිස ලෝකෝත්තර ධ්‍යානය වඩාද? කාමයන්ගෙන් අකුසලයන්ගෙන් වෙන්ව විතර්ක සහිතවූ විචාර සහිතවූ විවේකයෙන් හටගත් ප්‍රීතිය හා සැපය ඇති ප්‍රථම ධ්‍යානයට පැමිණ වෙසේ.

එසමයෙහි ඵස්සය වේ.

ශාන්තිනායක සම්බුද්ධරජාණන් වහන්සේ ධම්මසඞ්ගණියේ වදාළ දුක්ඛාපටිපදාදිය පසුගිය දහම් පත්‍රිකාවේ දක්වනලදි. කාමාවචර පළමු මහාකුසල සිතෙහි ධම්ම සඞ්ගණියේ දක්වනලද අයුරු කුසල් දහම් 60 ක් දැක්වෙති. එහි ඉන්ද්‍රිය අටකි. මෙහි අනඤ්ඤාතඤ්ඤස්සාමීතින්ද්‍රියයක් සමග ඉන්ද්‍රිය 9 කි. එහි මාර්ග අඞ්ග පසකි. මෙහි විරති තුනක් සමග (සම්මාවාචා කම්මන්ත ආජීව) මාර්ග අඞ්ග 8 කි.

චෛතසිකයන් කෙටිකර දැක්වීමේදී කාමාවචර පළමු මහා කුසල් සිත්හි චෛතසික 38 ක්ද පළමු ලෝකෝත්තර සිත්හි 36 ක්ද අභිධම්මත්ථසඞ්ගහයෙහි දක්වන ලදී (සිත සිරුර සහ නිවණ 1, බලන්න.)

ඒ කාමකුසල්හි වෙන වෙනම සිත්වල යෙදෙන විරති තුණත්, අප්පමඤ්ඤ දෙකක් එකතුකර දැක්වීමෙන් 38 ක් ගන්නාලද බව සැලකිය යුතුය. අප්පමඤ්ඤා දෙක සත්වා රම්මණය.

ලෝකෝත්තර සිතත් චෛතසිකත් නිබ්බාණාරම්මණ හෙයින් ඒ අප්පමඤ්ඤ දෙක නොයෙදෙන හෙයින් හා අනඤ්ඤාතං ඤ්ඤස්සාමිතින්ද්‍රිය ප්‍රඥවෙහිම ඇතුලත්වන හෙයින් චෛතසික 36 ක් ම කෙටිකර ලෝකෝත්තර පළමු සිතෙහි දක්වන ලදී.

අනඤ්ඤාතං ඤ්ඤස්සාමිතින්ද්‍රියං හොති.

අනඤ්ඤත (න / අඤ්ඤාත) අග්මුල් නොදත් සසර මේ දක්වා නොදත්නාලද නිවණ -චතුස්සත්‍යය.

ඤ්ඤස්සාමි / ඉති දැනගණිමියි ඇතිවන ඉන්ද්‍රිය හෙවත් නුවණයි. පළමු මාර්ග සිතෙහි පහළවන නිවන් අරමුණු කරණ ලෝකෝත්තර ප්‍රඥවයි. දිට්ඨිය හා එක්ව යෙදෙන කෙලෙස් නසමින් පහළවෙයි. ප්‍රඥවෙහි ලක්ෂණාදියම මෙහි ගැණේ (සිත සිරුර සහ නිවණ ප්‍රථම භාගය බලන්න )

සම්මාවාචා හොති.

හොඳ හෝ ප්‍රසංසා කටයුතු වචනය සම්මාවාචාය. සතර වැදෑරුම් වච්දුශ්චරිතය උගුළුවා හරිණ හෙවත් වැරදි වචනයෙන් වැළකීම මෙයින් ගතයුතුය.

සම්මාවාචා විරතියෙහි ලක්ෂණය= පරිග්‍රහණය හෙවත් දැඩිව අල්වාගැනීමයි. කෘත්‍යය= බොරු සතරෙන් වෙන් වීමයි.

එලෙඹි සිටින හෙවත් වැටහෙණ ආකාරය= මිථ්‍යාවච නය සම්පූර්ණයෙන් ප්‍රහාණය කිරීමයි.

**සම්මා කම්මන්තො හොති.**

හොඳ හෝ ප්‍රසංසා කටයුතු කර්මාන්තය සම්මා කම්මන්ත නම් වේ. මිථ්‍යා කටයුතුවල මුල් සිඳලන ප්‍රාණඝාතාදියෙන් වැලකීම මෙයින් ගන්නා ලද්දේ වේ. එය මනාව නැඟීසිටීම ලක්‍ෂණකොට ඇත්තේ වේ. වැරදි කටයුතුවලින් වෙන්වීම් කෘත්‍යකොට ඇත්තේ වේ. වැරදි කර්මාන්ත ප්‍රහාණයකිරීම් වැටහෙණ ආකාරය වේ.

**සම්මා ආජීවො හොති.**

හොඳ හෝ ප්‍රසසථ ජීවත්වීම සම්මා ආජීවයයි. වැරදි ජීවිකාවෙන් වෙන්වීමයි එය පිරිසුදු බව ලක්‍ෂණකොට ඇත්තේය. නුවණින් යුකතියෙන් ජීවත්වීම කෘත්‍යයකොට ඇත්තේය. වැරදි දිවි පැවැත්ම ප්‍රහාණය වැටහෙණ ආකාරය කොට ඇත්තේය. මෙම තුණම එකවරම යෙදෙන්නේ ලෝකොත්තර සිත්හිය. කාමාවචර සිත්හි දක්වූ සම්මාදිට්ඨි සංකප්ප, වායාම, සති, සමාධි යන මාර්ග අඞ්ග පසත් සමඟ මාර්ග අඞ්ග අටක්ම මෙම පළමු ලෝකෝත්තර සිත්හි යෙදේ. එහෙයින් මෙහි සියල්ල ලෝකෝත්තරය.

තවද මෙහි හෙවත් ලෝකෝත්තර පළමු සිතෙහි සම්මාදිට්ඨි ආදී මාර්ග අඞ්ගයන් විසඳා වදාරණ තන්හි සම්බොජ්ඣඞ්ග මග්ගඞ්ග, මග්ගපරියාපන්න යන නම්වලින්ද හැඳින්වූ සේක.

**බොජ්ඣඞ්ග.**

බෝධියෙහි හෝ බෝධිහුගේ අඞ්ග වෙත්නුයි බොජ්ඣඞ්ග නම් වේ. සති ධම්මවිචය විරිය, පීති, පස්සද්ධි සමාධි, උපෙක්ඛා යන ධර්මයන් ලෝකෝත්තර මාර්ග සිතෙහි උපදිමින් කාමච්ඡන්දාදී කෙලෙසුන් හා උච්ඡේදසස්සතාදී දිට්ඨීන්

ප්‍රතිබාහණය කරමින් ආර්‍යශ්‍රාවක තෙමේ නිවණ අවබෝධ කරණ මාර්‍ග සිත බෝධිය. බෝධිවූ එම සිතෙහි අඞ්ග හෙයින් බොජ්ඣඞ්ග නම් වේ.

තවද අවබෝධකරණ එම ආර්‍යශ්‍රාවකයාද බොධි නම් වේ. එම බොධිගේ (පුද්ගලයාගේ) අඞ්ග නිසාද බෝධි නම් වේ. බොජ්ඣඞ්ග සතෙන් සති, ධම්මවිචය, විරිය, සමාධි යන සතරමාර්ග අඞ්ග වෙති.

**මග්ග අඞ්ග යනු මාර්ග කොට්ඨාශය.**

මග්ග පරියාපන්න යනු මාර්ග සනාශ්‍රිතවූ හෙවත් මිශ්‍රවූ යන තේරුමයි. මෙහි කායදුච්චරිත, වචීදුච්චරිත, ආජීව දුච්චරිතයන්ගෙන් දුරින් දුරුවීම (ආරති) හැරදැමීම (විරති) දුරින් දුරුව හැරදැමීම (පටිවිරති) ඇලීම විනාශකර දැමීම (වෙරමණී) සීමාව ඉක්ම නොයෑම් සම්මා කම්මන්ත ආදිය දතයුය.

මෙම සම්මාවාචා කම්මන්ත ආජීවයන් මුලින් මුලින් නොයෙක් නොයෙක් සිත්වලින් විරතිය වේ. එනම් ප්‍රාණ-ඝාතයෙන් වැලැක්ම එක සිතකින් හොරකමින් වැලැක්ම එකකින් ආදී වශයෙනි. ලෝකෝත්තර මාර්ග සිත්හි එකම විරතිය මිච්ඡාකම්මන්ත විරතිය, මිච්ඡාවාචාවිරතිය, මිච්ඡා ආජීවවිරතිය වශයෙන් බලවත්ව යෙදේ. නොයෙක් දෙසින් එකතැනට පැමිණෙන පාරවල් එක ගේට්ටුවකින් වසා දැමිය හැකිවා මෙනි.

**මිච්ඡා ආජීව.**

මෙහි මිච්චාවාචා කම්මන්ත දෙක වචීද්වාර කායද්වාර දෙක්හි හටගැණේ. මිච්ඡාආජීවයට වෙනම දොරක් නැත. එහෙයින් සම්මාවාචා කම්මන්ත ගත්විට සම්මා ආජීවය ගැණේ. එසෙමවුනොත් සම්මාආජීවයැයි වෙනම මාර්ග අඞ්ගයක් දැක්වීම වියයුතුද?

ජීවත්වීම සඳහා කය වචන දෙකින් කරණ වැරදි නිතර සිදුවන හෙයින් එය වෙසෙසින් ඇද දක්වීම මෙහි අදහස බවද සඳහන්කරණ ලදී. කය වචන දෙක්හි සිදුවන වැරදි ජීවත්වීම සඳහාත් වෙයි. එසේ නොමැතිවත සිදුවෙයි.

රජ ඇමති ආදීන් සෙල්ලම් පිණිස සතුන් මැරීම සිනා පිණිස බොරුකීම් ආදිය කෙරෙණ හෙයින් ඒවා දිවිපැවැත්ම සඳහා කය වචනයෙන් කෙරෙණ වැරදි නොවේ. එය අකුසල කායකම්ම වචීකම්මය. ඒවායින් වෙන්වීමද සම්මා කම්මන්ත සම්මාවාචාය.

ජීවත්වීම පිණිස වැදි කෙවුල් ජනයා සතුන් මැරීම, සොරකම් කිරීම, වැරදි දිවිපැවැත්ම කෙරෙත්ද මේ මිච්ඡා ආජීවයයි.

අත්ලස් ගෙණ බොරු සාක්ෂි කීම් ආදියෙන් ජීවත් වෙත්ද මෙයද මිච්ඡාජීවයයි. එයින් වැලකීම සම්ම ආජීවය යි.

විරුද්ධ මතයක්:– අත්තසාලිනී අටුවාවෙ මහාසීව මහ තෙරුන් වහන්සේ -

කායද්වාර වාග්ද්වාර දෙක්හි සිදුවන සතුන් මැරීම ආදිය දිවිපැවැත්ම සඳහාත් දිවිපැවැත්ම නොසඳහාත් විය හැකිය. එම අකුසල් කාය වාග් අකුසල් සඞ්ඛ්‍යාවටම යයි ඒවායින් වැලැක්මත් සම්මාකම්මන්ත සම්මාවාචාමය ආජී වය කොහිදැයි විචාලවිට,

තුන්වැදෑරුම් කුහක වස්තුවෙන් සිවුපසය සෙවීම (එනම්= පච්චය පටිසෙවන, 2 සාමන්ත ජප්පන, 3 ඉරියා පථ සන්නිස්සිත, 1 පසුව හුහක් බලාපොරොත්තුවෙන් එවෙලාවට ලැබුණු දෙය ප්‍රතික්ෂෙපකිරීම, 2 ධ්‍යාන මාර්ගා දිය ලැබුණු හෙවත් එයට කිට්ටුව බව හැඟෙන කථාකිරීම, 3 ගමන් බිමන් ආදිය රහතන් වහන්සේගේ ලෙස හැඟීමට ඇම්ඊම් ආදී ඉරියව් පැවැත්ම) මිච්ඡා ආජීවයයි.

මෙය කෙළවරට ගිය මිච්ඡා ආජීවය බව අත්ථසාලිනී යෙහි දක්වන ලදී. එය මිච්ඡා ආජීවය නම් ගිහියන්ට සමාදන් විය හැකි ආජීව අට්ඨමක සීලයක් ගැණ සිතීම නොහැකිය. එසේම විශුද්ධිමාර්ගයෙහි ආජීව පාරිශුද්ධි ශීලය ආජීවය නිසා පණවනලද ශික්ෂාපද සයකින් වැලැකීම සහ කුහකවස්තූන් නිසා ජීවත්වීමෙන් වැලකීම සම්මා ආජීවය බව දක්වන ලදී. එසේත් මෙය ගිහීන් සමාදන් වියයුතු ශීලයක් ලෙස නොදක්වන ලදී.

සමහරවිට ලෝවැසියන් අතර දිවිපැවැත්ම සඳහා සතුන් මැරීමාදිය එතරම් වැරදි වශයෙන් නොසැලකීමක් තිබෙන බව සිතාගත හැකිය. එම නිසා හා සම්මාවාචා කම්මන්ත දෙකෙහි ඇතුළත්වන හෙයින් පඤ්චසීලයේ සිට සියලු සීලයකම මෙය ගැබ්ව පවතිනා හෙයින් වෙනම විරති යක් ලෙස මාර්ගාඞ්ගයක් ලෙස දක්වා ඇත.

දහම් දැන නිවන් සුව ලබත්වා!

# 69

නමො සම්මා සම්බුද්ධස්ස

## ලෝකෝත්තර කුසල් ධ්‍යාන හා ප්‍රතිපදා වශයෙන්.

"කතමෙ ධම්මා කුසලා?

යස්මිං සමයෙ ලොකුත්තරං ඣානං භාවෙති, නීය්‍යානිකං අපචයගාමිං දිට්ඨිගතානං පහාණාය පඨමාය භූමියා පත්තියා, විවිච්චෙව කාමෙහි විවිච්ච අකුසලෙහි ධම්මෙහි සවිතක්කං සවිචාරං විවේකජං පීතිසුඛං පඨමජ්ඣානං උපසම්පජ්ජ විහරති, දුක්ඛාපටිපදං දන්ධාභිඤ්ඤං,

කුසල් දහම් කවරහුද?

යම් වේලාවක සසරින් එතර පමුණුවන, රැස්නොකිරීමට යන සක්කායදිට්ඨිය හා එක්ව යෙදෙන කෙලෙසුන්ගේ ප්‍රහාණය පිණිස පවතින පලමු භූමියට පැමිණීම පිණිස ලෝකෝත්තර ධ්‍යානය වඩාද?

කාමයන්ගෙන් වෙන්ව අකුශලයන්ගෙන් වෙන්ව විතර්ක සහිතවූ විචාර සහිතවූ විවේකයෙන් හටගත් ප්‍රීතිය හා සැපය ඇති ප්‍රථම ධ්‍යානයට පැමිණ වෙසේ. දුක්වූ ප්‍රතිපදාවෙන් හා ලැසිවූ අවබෝධයෙන්,

දුක්ඛා පටිපදං ඛිප්පාභිඤ්ඤං, 2  
දුක්ඛවූ ප්‍රතිපදාවෙන හා වහා අවබෝධයෙන්;  
සුඛා පටිපදං දන්ධාභිඤ්ඤං, 3  
සැපවූ ප්‍රතිපදාවෙන් හා ලැසිවූ අවබෝධයෙන්  
සුඛා පටිපදං ඛිප්පාභිඤ්ඤං 4

සැපවූ ප්‍රතිපදාවෙන් හා වහා අවබෝධයෙන්- යුක්තවූ ලෝකෝත්තර ප්‍රථමධ්‍යානයට පැමිණ වෙසේ.

මෙසේ ශාස්තෘනායක සම්මා සම්බුදුරජාණන් වහන්සේ ප්‍රතිපදා සතරෙන් එකම මාර්ග කුසල් සිත වෙන් වෙන්කොට දක්වා වදාළසේක. මෙම සතර විස්තර වශයෙන් 67 වැනි අභිධම්ම පාඨමෙහි දක්වා ඇත.

පාදක ධ්‍යාන වශයෙන් ඉහත දක්වන ලද්දේ ප්‍රථම ධ්‍යාන ලෝකෝත්තර පළමු භූමි සිතය. එපරිදි විතර්ක විචාරයෙන් තොරවූ ද්විතීයධ්‍යාන ලෝකෝත්තර පළමු භූමි සිතය ප්‍රීතියෙන්ද තොරවූ තතියජ්ඣාන ලෝකෝත්තර පළමු භූමි සිතය. සැපයෙන්ද තොරවූ උපෙක්ඛා ඒකග්ගතා ඇති චතුත්ථජ්ඣාන ලෝකෝත්තර පළමු භූමි සිතය යනුවෙන් චතුක්කනය වශයෙන් සතරකි මෙසේ එක එක ධ්‍යාන අඞ්ග අඩුකොට පඤ්චකනය වශයෙන් පහට බෙදේ.

**සුද්ධික පටිපදා:**

ඉහත මුලින්ම දක්වූ ලෝකෝත්තර සිත සුද්ධිකනය වශයෙන් දූත් නය හෙවත් ක්‍රම දසයකින් හෙවත් දස ආකාරයකින් ලෝකෝත්තර සිත දක්වන ලදී. මෙසේ ධ්‍යාන සතර පස්ක්‍රමයක්ද දුක්ඛා පටිපදා ආදී ක්‍රමයෙන් වදාරා ඒවා සුද්ධික පටිපදා වශයෙන් හඳුන්වන ලදහ සුඤ්ඤත ආදී නම් නොදී දේශනාකර වදාළ හෙයින් සුද්ධික පටිපදායැයි දක්වනලද බව සැලකිය යුතුය.

**සුඤ්ඤත:**

නැවතද, ශාන්තිනායක සම්බුදුරජාණන් වහන්සේ කුසල් දහම් කවරහුදැයි වදාරා යම් වේලාවක සුඤ්ඤත ලෝකෝත්තර ධ්‍යානය වඩාදැයි මෙසේ සුඤ්ඤත නාමයෙන් වෙසෙසා එම දසවැදෑරුම් ආකාරයෙන් පළමු භූමි සිත දක්වූ සේක. 'හුදෙක් මෙග පටිපදා භේදයක් නැතිව වදාළ බව පෙනේ.

**3. සුඤ්ඤත මූලක පටිපදා:**

නැවතද, එම එකම ලෝකෝත්තර පළමු භූමි සිත,

කතමෙ ධම්මා කුසලා? යස්මිං සමයෙ ලොකුත්තරං ඣානං භාවෙති, නිය්‍යාණිකං අපචයගාමිං දිට්ඨිගතානං පහාණාය පඨමාය භූමියා පත්තියා, විවිච්චෙව කාමෙහි

විච්ච අකුසලෙහි ධම්මෙහි සවිතක්කං සවිචාරං විවේකජං පීතිසුඛං පඨමජ්ඣානං උපසම්පජ්ජ විහරති දුක්ඛා පටිපදං දන්ධාභිඤ්ඤං සුඤ්ඤතං යනුවෙන් මෙසේ ප්‍රතිපදාවත් සමග සුඤ්ඤත නාමය යොදා දස ක්‍රමයට පළමුවෙන් වදාළ සුඤ්ඤත මූලික පටිපදා නාමය තැබූසේක.

අප්පණිහිත:

කතමෙ ධම්මා කුසලා? යනුවෙන් ශාක්‍යනායක බුදුරජාණන් වහන්සේ, යස්මිං -පෙ- පඨමජ්ඣානං උපසම්පජ්ජ විහරති අප්පණිහිතං යැයි මෙසේ අප්පණිහිත නාමයෙන්ද පළමු භූමි ලෝකෝත්තර සිත දසවැදෑරුම් ලෙස දක්වා වදාළ සේක.

5. අප්පණිහිත මූලක පටිපදා.

"කතමෙ ධම්මා කුසලා? යනුවෙන් සම්බුදුපියාණන් වහන්සේ, යස්මිං සමයෙ -පෙ- පඨමජ්ඣානං උපසම්පජ්ජ විහරති දුක්ඛාපටිපදං දන්ධාභිඤ්ඤං අප්පණිහිතං" යනුවෙන් ප්‍රතිපදාවත් සමග ගෙණ අප්පණිහිත මූලක පටිපදානාම යෙන් එම පළමු භූමි ලෝකෝත්තර කුසල සිතම දස වැදෑරුම් කොට වදාළසේක.

1. සුද්ධිකපටිපදා යනුවෙන් දුක්ඛා පටිපදා ආදී සතරත් සමග මුලින් ලෝකෝත්තර පළමු භූමි සිත දක්වීම හා ධ්‍යාන සතර පස් ක්‍රමයෙන් එම සිතම දැක්වීමයි.

2. සුඤ්ඤත නාමයෙන් ලෝකෝත්තර මාර්ග සිත දක්වන ලද්දේ ආගමන වශයෙන් සගුණ වශයෙන් ආරම්මණ වශයෙන් යන තුන් ක්‍රමයෙනි.

යම් යෝගාවචරයෙක් අනිච්ච දුක්ඛ අනත්ත යන යම් ආකාරයකින් සංස්කාරයන් විදර්ශනාවට නගා වුට්ඨානගාමිනී විදර්ශනාවෙහි ත්‍රෛභූමක සංස්කාරයන් අනත්තානුපස්සනා වශයෙන් සුඤ්ඤතා වශයෙන් දැක සුඤ්ඤත විමොක්ඛ වශයෙන් මාර්ගය ලබාද මෙසේ ආවාවූ මාර්ග වශයෙන් එම

ලෝකෝත්තර සිත සුඤ්ඤත නාමය ලබයි. එම ලෝකෝත්තර සිත රාගාදීන්ගෙන් සූන්‍ය හෙයින් සගුණ වශයෙන්ද සුඤ්ඤත නාමය ලබයි.

නිවණ රාගාදීන්ගෙන් සූන් හෙයින් නිවණ අරමුණු කොට ලෝකෝත්තර සිත පහළවන හෙයින් ආරම්මණ වශයෙන්ද සුඤ්ඤත නාමය ලබයි.

මෙහි සගුණ ආරම්මණ වශයෙන් දක්වන ලද්දේ සුත්තන්තික ක්‍රමයෙනි. එහෙයින් ආගමන වශයෙන්ම අභිධර්ම ක්‍රමයෙන් දක්වනලද ආකාරය ගතයුතුය.

ආගමනයද විපස්සනා ගමනය මග්ගාගමනය කියා දෙවැදෑරුම්ය. මාර්ග සිත සඳහා විපස්සනා ගමනය ගතයුතුය. ඵල සිත මාර්ගාගමනය ධුරකොට ඇත්තේය.

**අප්පණිහිත:**

අනිත්‍යාදී යම් අයුරකින් විදර්ශනාවට බැස විදර්ශනා වඩන්නේ සංස්කාරයන් දුක් වශයෙන් දකිමින් වුට්ඨාන ගාමිණී විදර්ශනාවට බැස දුක්ඛානුපස්සනාවෙන් අප්පණිහිත විමොක්ඛ මුඛයෙන් මාර්ග සිත ලබන්නේ එම මාර්ග සිත අප්පණිහිත නාමයෙන් දක්වූ සේක. මෙසේ වුට්ඨානගාමිණී විදර්ශනාව ආ මාර්ගය ගෙණ අප්පණිහිත නාමය දුන්සේක.

වුට්ඨානගාමිණී විදර්ශනාව නම් සඞ්ඛාරුපෙක්ඛා විපස්සනාවයි. එය ලක්ඛණාරම්මණිකය. අනිත්‍යාදී ලක්ෂණ බලවත් ලෙස අරමුණුවන්නේ එහිදීය. මුලින් සවභාව ලක්ෂණ වශයෙන් සංස්කාරයන් අරමුණුව ක්‍රමයෙන් සම්පූර්ණයෙන් අනිත්‍ය දුක්ඛ අනාත්ම ලක්ෂණයන් අරමුණු වෙමින් වුට්ඨානගාමිණී විදර්ශනාවේ මාර්ග සිත පහළවන ත්‍රෛලෞකික සංස්කාරයන්ගේ දුක්ඛ ලක්ෂණය අරමුණු වෙමින් ගොස් නිවණ අරමුණු කොට පහළවන මාර්ග සිතය. අප්පණිහිත නාමයෙන් දක්වන ලද්දේ මෙහි විශෙෂයෙන් සැලකිය යුත්තේ වුට්ඨානගාමිණී විදර්ශනාවට අනිත්‍ය ලක්ෂණය අරමුණුව අනිමිත්ත විමොක්ෂ වශයෙන් පහළවන මාර්ග සිත අමුතු නාමයකින් නොදෙසූ බවයි. සියල්ල දත් බුදුරජාණන් වහන්සේ මාර්ග කුසලය මෙසේ බෙදා වදාළසේක.

මෙසේ දහම් දැන විදසුන් වඩා නිවන් සැප ලබත්වා!

# 70

## නමො සම්මා සම්බුද්ධස්ස

## ලෝකෝත්තර කුසල්.

## විමොක්ඛ සහ පටිපදානය.

1. "කතමෙ ධම්මා කුසලා?

යස්මිං සමයෙ ලොකුත්තරං ඣානං භාවෙති නිය්‍යානිකං, අපචයගාමිං, දිට්ඨිගතානං පහාණාය, පඨමාය භූමියා පත්තියා.

විවිච්චෙව කාමෙහි විවිච්ච අකුසලෙහි ධම්මෙහි සවිතක්කං සවිචාරං විවෙකජං පීතිසුඛං පඨමජ්ඣානං උපසම්පජ්ජ විහරති දුක්ඛා පටිපදං දන්ධාභිඤ්ඤං"
කුසල් දහම් කවරහුද?

යම් වේලාවක ජීවත් පිණිස පවතින, නොරැස්කිරීමට යන, දිට්ඨින් දුරුකිරීම පිණිස ප්‍රථම භූමියට පැමිණීමට ලෝකෝත්තර ධ්‍යානය වඩාද?

කාමයන් අකුසලයන්ගෙන් තොරව විතර්ක විචාර ප්‍රීති සැප ඇති දුක්වූ ප්‍රතිපදාවෙන් හා ලැසිවූ අවබෝධයෙන් යුතු ප්‍රථම ධ්‍යානයට (ලෝකෝත්තර) පැමිණ වෙසේ. මේ ලොවුතුරු බුදුරජාණන් වහන්සේ ප්‍රථම භූමි සිත දක්වා වදාළ අයුරුයි. (ධම්මසඞ්ගණී පෙළ 51 පිටුව)

මෙම ප්‍රථම භූමි සිත සුද්ධ විපස්සකයාගේ වශයෙන් දක්වා වදාලසේ පෙනේ.

එයට හේතුව නම් නැවත ධම්මසඞ්ගනී 59 වන පිටුවෙහි ධ්‍යානයෙන් හා මිශ්‍රකොට දක්වන තැනත්,

2. "කතමෙ ධම්මා කුසලා?

යස්මිං සමයෙ ලොකුත්තරං ඣානං භාවෙති, නීය්‍යානිකං අපචයගාමිං දිට්ඨිගතානං පහාණාය පඨමාය භූමියා පත්තියා විවිච්චෙව කාමෙහි විවිච්ච අකුසලෙහි ධම්මෙහි සවිතක්කං සවිචාරං විවේකජං පීතිසුඛං පඨමජ්ඣානං උපසම්පජ්ජ විහරති දුක්ඛා පටිපදං දන්ධාභිඤ්ඤං'' යනුවෙන් ඇලපිල්ලකවත් වෙනසක් නොකොට රූපාවචර ප්‍රථම ධ්‍යාන සිත පාදකකොට ඇති ලෝකුත්තර පළමු භූමි සිත දක්වා වදාළසේක.

මෙහිදී බොහෝ අය මුළාවන්නේ ලොකුත්තරං ඣානං භාවෙති යනුවෙන් ධ්‍යාන නාමය රැගෙණ දෙසූ නිසාත් විතර්කාදී ධ්‍යානාංගයන් යෙදී තිබීම එම පළමු සිතෙහිත් කිසිම වෙනසක් නැතිව දක්වා තිබීම නිසාත්ය.

ධ්‍යාන ප්‍රත්‍යශක්තිය ලබන චෛතසිකයෝ ධ්‍යානයෝය. ඒවා කාමාවචර කුසල් සිත්වලද, අකුසල් සිත්වලද, රූපාවචර අරූපාවචර, ලෝකෝත්තර සිත්වලද යෙදෙති. කාමාවචර කුසල් සිත්වල විතක්ක විචාර ප්‍රීති සොමනස්ස, උපෙක්ඛා, එකග්ගතා යන සමැදරුම් ධ්‍යානාංගයක් යෙදෙති. ඒ කාමාවචර ධ්‍යානයෝය. අකුසල් සිත්වල විතර්කාදී එම ධ්‍යානාංග සග සහ දෝමනස්සයත් යන සතම අකුසල ධ්‍යානාංගයෝය.

රූපාවචර පඨමජ්ඣාන සිත්හි යෙදෙන කාම කුසලයෙහි යෙදුණු ධ්‍යානාංග උපෙක්ඛා හැර ධ්‍යානාංග පස රූපාවචර ධ්‍යානයෝය. අරූපාවචර සිත්හි උපෙක්ඛා ඒකග්ගතා අරූප ධ්‍යානාංගයෝය.

ලෝකෝත්තර පළමු භූමි සිතෙහි යෙදෙන දෞමනස්ස උපෙක්ඛා හැර ඉතිරි පස ලෝකෝත්තර ධ්‍යානාංගයෝය.

රූපාවචර පළමු ධ්‍යාන සිත පාදකකොට උපදනා ලෝකෝත්තර පළමු භූමි සිතෙහි යෙදෙන ඉහතකී ධ්‍යානාංග පසද ලෝකෝත්තර ධ්‍යානාංගය

මෙසේ රූපාවචර දෙවෙනි ධ්‍යාන සිත පාදකකොට උපදනා ලෝකෝත්තර පළමු භූමි සිතෙහි උපදනා විතක්ක විචාර හැර පීති සොමනස්ස එකග්ගතා ධ්‍යානාඞ්ග තුනද ලෝකෝත්තරය. මෙසේ ධ්‍යානාඞ්ගයෝ රූපාවචර සිත් පාදකකොට ගැණීමේදී ඒ ඒ සිත්වලට අයත් ධ්‍යානාඞ්ග ලෝකෝත්තර සිත්වලද යෙදෙත්තේ ඒවායින් කෙරෙණ කෘත්‍යයක් අරමුණු ගැණීමේදී අනවශ්‍ය නියායැයි සිතිය යුතුය.

අප සිතට බෙහෙවින් නැගෙන්නේ ධ්‍යානයැයි කියැවෙනවිට රූපාවචර අරූපාවචර ධ්‍යානවලටය. කාමාවචර හා ලෝකෝත්තර ධ්‍යානයක් ඇති බවද සැලකිය යුතුය.

එහෙයින් ධම්මසඞ්ගණියේ වදාළ පළමු ලෝකෝත්තර සිත සුක්ඛ විපස්සකයාගේ පළමු මාර්ග සිත බවත් එයද රූපාවචර ප්‍රථම ධ්‍යාන සිත පාදක කොට උපදවාගත් සමථයානිකයාගේ පළමු මාර්ග සිතත් (මෙහි දැක්වූ 2 සිත) ලෝකෝත්තර ප්‍රථම ධ්‍යාන සිත් බව අඨසාලිනී 208 වැනි පිටුවේ (හේවාවිතාරණ මුද්‍රණය) සඳහන්වේ. එසේම එහි ධ්‍යානලාභියා ධ්‍යානය පාදක නොකොට උපදවනලද පළමු මාර්ගයද ලෝකෝත්තර ප්‍රථමධ්‍යානය ලෙසට ගන්නාලදී.

3. කතමෙ ධම්මා කුසලා?”

යස්මිං සමයෙ ලොකුත්තරං ඣානං භාවෙති, නිය්‍යාණිකං අපචයගාමිං දිට්ඨිගතානං පහාණාය පඨමාය භූමියා පත්තියා.

විතක්ක විචාරානං වූපසමා -පෙ- සමාධිජං පීතිසුඛං දුතියජ්ඣානං උපසම්පජ්ජ විහරති, දුක්ඛා පටිපදං දන්ධාභිඤ්ඤං.

මේ දෙවෙනි රූපධ්‍යාන සිත පාදක කොට උපන් පළමු භූමි සිතයි. එහි විතක්ක විචාර නැත.

4. "කතමෙ ධම්මා කුසලා?"

යස්මිං සමයෙ ලොකුත්තරං ඣානං භාවෙති, නීය්‍යාණිකං අපචයගාමිං දිට්ඨිගතානං පහාණාය පඨමාය භූමියා පත්තියා

පීතියාච විරාගා උපෙක්ඛකොච විහරති සතොච සම්පජානො සුඛඤ්ච කායෙන පටිසංවෙදෙති පෙ-තතියජ්ඣානං උපසම්පජ්ජ විහරති දුක්ඛාපටිපදං දන්ධාභිඤ්ඤං.

5. "කතමෙ ධම්මා කුසලා?"

යස්මිං -පෙ-පඨමාය භූමියාපත්තියා සුඛස්සච පහාණා දුක්ඛස්සච පහාණා, පුබ්බෙව සොමනස්ස දොමනස්සානං අත්ථඞ්ගමා අදුක්ඛමසුඛං උපෙක්ඛාසති පාරිසුද්ධිං චතුත්ථජ්ඣානං උපසම්පජ්ජ විහරති දුක්ඛාපටිපදං දන්ධාභිඤ්ඤං.

මේ සතරවැනි රූපාවචර සිත පාදකකොට උපදවන ලද ලෝකෝත්තර ප්‍රථම ධ්‍යාන හෙවත් පළමු භූමි සිතයි. එහි සැපය ප්‍රහාණයවූ බව සලකන්න. මෙසේ පඤ්චක නයින් හෙවත් රූපාවචර සිත් පසක් වශයෙන් ගෙණ ඒ සිත් පාදකකොට ලෝකෝත්තර පළමු ධ්‍යාන සිත පස් ආකාරයකින් ඉපදවීම අනුව පසක් දූයි පළමු භූමි සිත දස ආකාර ප්‍රභේද වන අයුරු සැලකිය යුතුය.

මේ ලෝකෝත්තර පළමු භූමි සිත්හි දසවැදෑරුම් ආකාරය සුද්ධික පටිපදා නාමයෙන් දක්වන ලදී.

1. සුද්ධික පටිපදා මග්ග යනුවෙන් මෙය හඳුනාගැණීම ඉතා උචිතය.

"කතමෙ ධම්මා කුසලා?

යස්මිං සමයෙ -පෙ-පඨමාය භූමියා පත්තියා
විවිච්චෙව කාමෙහි -පෙ- පඨමජ්ඣානං
උපසම්පජ්ජ විහරති සුඤ්ඤතං."

මෙහි සුඤ්ඤත නාමය ඉහත සඳහන් සියලු ලෝකෝත්තර සිත්හි දක්වා වදාළ හෙයින්,

2. මෙය සුඤ්ඤත මග්ග යනුවෙන් හඳුනාගත යුතුය. මේ සිත්හි දුක්ඛාපටිපදා දන්ධාභිඤ්ඤා ආදී පටිපදා භේදය දක්නා නොලැබේ.

"කතමෙ ධම්මා කුසලා?"

> යස්මිං -පෙ- පඨමාය භූමියා පත්තියා විවිච්චෙව කාමෙහි -පෙ- පඨමජ්ඣානං උපසම්පජ්ජ විහරති දුක්ඛා පටිපදා දන්ධාභිඤ්ඤං සුඤ්ඤතං.

මෙහි පටිපදාවන් සමගම සුඤ්ඤත නාමය යෙදුණු හෙයින්,

3. සුඤ්ඤත මූලක පටිපදා මග්ග සිත් නාමයෙන් ධම්ම සඞ්ගණියේ හඳුන්වන ලදී.

"කතමෙ ධම්මා කුසලා"

යනාදි වශයෙන් පෙර මෙන් පඨමජ්ඣානං උපසම්පජ්ජ විහරති අප්පණිහිතං යනුවෙන් අප්පණිහිත නාම යෙන් එම ලෝකෝත්තර සිත දක්වා වදාළ හෙයින්,

4. අප්පණිහිත මග්ග සිත් නාමයෙන්ද ලෝකෝත්තර සිත් හඳුන්වා වදාළ සේක.

කතමෙ ධම්මා කුසලා? යනාදී වශයෙන් පඨමජ්ඣානං උපසම්පජ්ජ විහරති දුක්ඛාපටිපදං දන්ධාභිඤ්ඤං අප්ප ණිහිතං යනුවෙන්

5. අප්පණිහිත මූලක පටිපදා මග්ග සිත් දක්වා වදාළ සේක.

මෙසේ දහම් දූන විදසුන් වඩා උතුම් නිවන් සැප
පතාගනිත්වා!

# 71

### නමෝ සම්මා සම්බුද්ධස්ස

### ලෝකෝත්තර කුසල්.

## විමෝක්ෂ වශයෙන්

"කතමෙ ධම්මා කුසලා?"

යස්මිං සමයෙ ලොකුත්තරං ඣානං භාවෙති නිය්‍යාණිකං අපචයගාමිං දිට්ඨිගතානං පහාණාය, පඨමාය භූමියා පත්තියා, සුඛස්සච පහාණා, දුක්ඛස්සච පහාණා, පුබ්බෙව සොමනස්ස දොමනස්සානං අත්ථංගමා, අදුක්ඛම සුඛං උපෙක්ඛා සති පාරිසුද්ධිං පඤ්චමජ්ඣානං උපසම්පජ්ජ විහරති. සුඛා පටිපදං ඛිප්පාභිඤ්ඤං අප්පණිහිතං"

යම් වේලාවක ලොව්තුරා ධ්‍යානය හෙවත් සෝතාපත්ති ධ්‍යානය වඩා ද නිවන් සඳහා පවත්නා නොරැස් කිරීමට යන දෘෂ්ටීන් ප්‍රහාණය පිණිස, පළමු ලොවුතුරු භූමියට පැමිණීම පිණිස (යම් වේලාවක ලොවුතුරු ධ්‍යානය වඩා ද) සැප දුක් ප්‍රහාණයෙන් මුලින් සොම්නස් දොම්නසුන් දුරුකළ හෙයින් නොදුක් නොසුව මැදහත් සිහි පිරිසුදු ඇති පස්වැනි ධ්‍යානයට පැමිණ වෙසේ. සැපවූ පටිපදාවෙන් හා වහා අවබෝධයෙන් යුතු අප්පණිහිත මූලික පටිපදාවෙන්

ශාන්තිනායක සම්මාසම්බුද්ධ රජාණන් වහන්සේ පළමු භූමි ලෝකෝත්තර කුසල් සිත්

(1) සුද්ධික පටිපදානය
(2) සුඤ්ඤත නය
(3) සුඤ්ඤත මූලක පටිපදානය
(4) අප්පණිහිත නය
(5) අප්පණිහිත මූලක පටිපදානය

යනුවෙන් බෙදා වදාළ ක්‍රමයෙන් 126 වැනි සිත ඉහත සඳහන් ය අප්පණිහිත මූලක පටිපදානයින් වදාළ අවසන් සිතත් එයමය. තවද එම සිත් සතර අධිපති ධර්මයන් සමගද යෙදෙන අයුරු මතු පත්‍රිකාවෙක පැහැදිලිවේ සුඤ්ඤත අප්පණිහිත නාමයෙන් මෙහි විමෝක්ෂ දෙකක් දක්වා ඇත

එහෙත්-

"තයො මෙ භික්ඛවෙ විමොක්ඛා"

1. සුඤ්ඤතො විමොක්ඛො
2. අනිමිත්තො විමොක්ඛො
3. අප්පණිහිතො විමොක්ඛො"

මහණෙනි, මේ විමෝක්ෂ තුනෙකි. එනම්; සුඤ්ඤත, අනිමිත්ත, අප්පණිහිත විමෝක්ෂය කියාය

තවද, අනිමිත්තං ච භාවෙහි-මානානුසය මුජ්ජහ
තතො මානාභිසමයා-උපසන්තො චරිස්සසි.
(රාහුලොවාද)

යනුවෙන් අනිමිත්ත විදර්ශනාව ද වඩව, මානාදී අනුසයන් දුරුකරව, එසේ මානය දුකක් බව අවබෝධකොට උපසාන්තව හැසිරෙන්නැයි අනිමිත්ත විදර්ශනාව දක්වූ සේක.

මෙසේ දක්වා වදාළ අනිමිත්ත විදර්ශනා භාවනාව හෙවත් අනිත්‍ය දර්ශනය අනුව මාර්ග සිතට දෙනලද අනිමිත්ත නාමයෙන් මාර්ග සිත ධම්ම සංගණියේදී බෙදා නොවදාළසේක. එයට හේතු කවරේද?

ඒ යම්කිසි ත්‍රිවිධ අනුපස්සනාවෙන් එකකින් විදර්ශනාවට බැස අනාත්ම වශයෙන් මාර්ග විථා වීථියේදී සංස්කාරයන් අරමුණුව මනොද්වාරාවජ්ජන සහ පරිකර්ම උපචාර අනුලෝම ජවනයන් ඉපද නිරුද්ධ ව ගිය පසු නිවණ අරමුණුව ගොත්‍රභූ සිත පහළව මාර්ග සිත ද කෙලෙස් නසමින්

නිවණ අරමුණු කෙරෙමින් පහළවේ. එම මාර්ග සිතට සුඤ්ඤත විමොක්ඛ නාමයද සුඤ්ඤත නය වශයෙන්ද එයම පටිපදාවන්(දුක්ඛා පටිපදාදි) සමග මිශ්‍රවීමෙන් සුඤ්ඤත මූලක පටිපදා නය වශයෙන් දක්වා වදාළ සේක.

එසේම මාර්ග චිත්ත වීථියේ පරිකම්මාදි ජවනයන් යම් සංස්කාරයක් දුක්ඛානු පස්සනා වශයෙන් අරමුණු කොට ගොත්‍රභූ සහ මාර්ග සිත් පහළ වේ ද එහිදී මාර්ග සිත අප්පණිහිත විමොක්ඛ නාමයෙන් ද අප්පණිහිත නය වශයෙන් ද දුක්ඛාදී පටිපදාවන් සමග මිශ්‍රවීමෙන් අප්පණිහිත මූලික පටිපදානය වශයෙන්ද දෙසූසේක.

අනිමිත්ත නය හෝ අනිමිත්ත මූලක පටිපදානය වශයෙන් ධම්මසංගණියේ පළමු භූමි ලෝකෝත්තර සිත දක්වා නැත.

මුලින් ම දක්වා වදාළ සුද්ධික පටිපදා නය අනිමිත්ත භව වශයෙන් ගත යුතු බව පෙණේ. මක්නිසාදයත් වෙන ක්‍රමයෙකින් අනිත්‍ය දර්ශනය අනුව ලෝකුත්තර සිත ධම්ම සංගණියේ දක්වා නැති හෙයිනි.

පසුගිය පත්‍රිකාවන්හි ද සඳහන් පරිදි අභිධර්මයට අනුව එයට අනිමිත්ත නය නාමය දිය නොහැකිය. සංස්කාර යන් අනිමිත්ත වශයෙන් වැටහෙන්නේ සංස්කාර නිමිත්තම අරමුණුවන හෙයින් නිමිත්ත ධර්මයන්හි පරිකර්මාදී ජවන යන් පිහිටන හෙයින් අභිධර්මයට අනුව අනිමිත්ත යැයි නොදෙසූ බව සැලකිය යුතුය. එහෙයින් එය සුද්ධික පටිපදා නාමයෙන් ම ගත යුතු බව මගේ අදහසයි.

අනිත්‍ය, දුක්ඛ, අනාත්ම යන ත්‍රිලක්ෂණයෙන් යම්කිසි වෙකින් විදර්ශනාවට බැස කලින් කල තුණම අරමුණුව වුට්ඨාන ගාමිණී විදර්ශනාව යම්කිසි ලක්ෂණයක් අරමුණු කෙරේද? එනම්, සංඛාරුපෙක්ඛා ඥාණය යෙදෙන ජවන් සිත්වලට ත්‍රිලක්ෂණයෙන් යම්කිසි ලක්ෂණයක් යම්කිසි නාම

රූපයක දකිමින් පහළව එම චිත්තවීථියේ ගෝත්‍රභූ මාර්ග සිත් පහළ වේද මෙසේ විපස්සනා ආගමන වශයෙන් ප්‍රඥාධික යෝගියාට අනාත්ම ලක්ෂණය අරමුණුව ගිය හෙයින් ඔහුගේ මාර්ගය ශූන්‍යතා විය එසේම සමාධිය අධික පුද්ගලයාට දුක්ඛානුපස්සනාවගේ වශයෙන් අරමුණුවල රාගාදී ප්‍රණිධීන් වියළවමින් විදර්ශනාව පැමිණි හෙයින් ඔහුගේ මාර්ගය අප්‍රණිහිත නාම වශයෙන් වදාළේ විය.

එසේම ශ්‍රද්ධාව අධික යෝගියාට අනිච්චානුපස්සනා වශයෙන් අරමුනුවල හෙවත් සංස්කාරයන්ගේ නිච්චනිමිත්ත දුරුකරමින් පැමිණි නමුත් අවසන් අනුලෝම සිත දක්වාම සංස්කාර අරමුණු වන හෙයින් අනිමිත්ත නාම යනාදී නාමයන් දීම අනිමිත්තයැයි කීයුවද නිමිත්තක් ඇති හෙයින් එය නොගැලපෙන බව සැලකිය යුතුය.

සූත්‍රාන්තයට අනුව නම් සගුණ වශයෙන් හෙවත් රාගාදී නිමිතීන් දුරුකරන හෙයින් හා ආරම්මණ වශයෙන් නිවන අනිමිත්ත හෙයින් අනිමිත්ත නාම වශයෙන් දැක්විය හැකිය.

එහෙත් "සංඛාරාරම්මන මෙව ඤාණං සංඛාරතො වුට්ඨාති"

සංස්කාරයන් අරමුණුවම පවත්නා නුවණ සංස්කාරයන්ගෙන් නැගේ සූත්‍ර දේශනාව පරියාය හෙවත් සම්මුතියට අනුව වටින් පිටින් නැරෙත්නකි.

"අභිධම්මොනාම පරමත්ථ දෙශනා!" අභිධර්මය නම් පරමාර්ථ හෙවත් නොවෙනස්වන දේශනාය. එසේම ඉහත සඳහන් සද්ධා ඉන්ද්‍රිය මාර්ග අංගයක් නොවීමෙන් ද මෙසේ නාම ග්‍රහණයට අනිමිත්ත විදර්ශනාව නොගැනෙන බවද දත්වා ඇත.

මෙසේ දහම් දැන විදසුන් වඩා ශාන්ත නිවන් සැප පතා ගණිත්වා!

# 72

### නමො සම්මා සම්බුද්ධස්ස

## ලෝකුත්තර කුසල්

## පොදු විස්තරයක්.

"කතමෙ ධම්මා කුසලා?"

ශාන්ති නායක සම්මා සම්බුදු රජාණන් වහන්සේ ලොවුතුරු කුසල් දෙසනු කැමතියේක් කුසල් දහම් කවරහුද? යනුමෙන් විමසා "යස්මිං සමයෙ" යනාදීන් ආරම්භ කරණ ලද ලෝකෝත්තර කුසල් දෙසුම දෙව්යන්ගේ අභිප්‍රායානුකූලව සුද්ධික පටිපදා නාමයෙන් ප්‍රථම භූමි (සෝවාන්) සිත් 36 ක්ද, සුඤ්ඤත නාමයෙන් එම සිත් 9 යක් ද, සුඤ්ඤත මූලක පටිපදා නාමයෙන් 36 යක්ද, අප්පණිහිත නාමයෙන් සිත් 9 යක්ද, අප්පණිහිත මූලක පටිපදා නාමයෙන් 36 ක් දැයි මෙසේ පළමු භූමි සිත් 126 දක්වා විසිමහා නය හා අධිපති සතරින්ද යුත් කොට දහසක් ක්‍රමවලින් පරිපූර්ණකොට සෝවාන් මාර්ග සිත දෙසූ සේක. එම දහස්නය ලබන පත්‍රිකාවට තබා මෙහි දී පොදුවේ ලොවුතුරු කුසලයන් පිළිබඳ දතයුතු කරුණු විස්තර කරමු.

එම ප්‍රකීර්ණක විනිශ්චය සඳහා,

"අජ්ඣත්තංච බහිද්ධා ච—රූපාරූපෙසු පඤ්චසු
සත්තට්ඨංග පරිණාමං—නිමිත්තං පටිපදා පති"

ලොවුතුරු මාර්ගය ලැබීමෙහි විදර්ශනා මාර්ගය,

අජ්ඣත්ත බාහිර

1. තමා පිළිබඳ නාම රූපයක් අරමුණුකොට විදර්ශනාවට බැස තමා හා අනුන් පිළිබඳ නාම රූපයන් අනිත්‍යාදි වශයෙන් දැක තමා පිළිබඳ නාමරූපයකම අනිත්‍යාදි ලක්ෂණ දැක මාර්ග සිත පහළවීම

"අජ්ඣත්තං අභිනිවිසිත්වා අජ්ඣත්තං වුට්ඨාති"
යනුමෙන් දක්වන ලදී.

2. මෙසේ අජ්ඣත්ත සංස්කාරයකින් විදර්ශනාවට බැස බාහිර සංස්කාරයකින් මාර්ග සිත උපදවා ද,

3. බාහිර රූපාදී යම් සංස්කාරයකින් විදර්ශනාවට බැස අධ්‍යාත්ම බාහිර දෙකම අරමුණුව බාහිර සංස්කාර යක අනිත්‍යාදී ලක්‍ෂණයක් අනුව ගොස් මග සිත ලබා ද,

4. මෙසේ බාහිර සංස්කාරයකින් බැස අධ්‍යාත්ම සංස්කාරයකින් නැගී සිටීදැයි සතර ආකාරයක්මේ

රූපාරූප.

1. රූපයක අනිත්‍යාදීන් අරමුණුව විදර්ශනාවට බැස රූප අරූප දෙකෙහිම අනිත්‍යාදිය දක අවසානට රූපයකම අනිත්‍යාදීන් දක මගසිත් ලබා ද එය
"රූපෙ අභිනිවිසිත්වා රූපා වුට්ඨාති"
රූපයෙහි බැස රූපයෙන් නැගේ යැයි දක්වන ලදී

2. මෙසේ රූපයෙහි බැස අරූපයෙන් (නාම ධර්මයක් අනිත්‍යාදිය දක) නැගේ.

3. අරූපයෙහි බැස අරූපයෙන් නැගේ.

4. අරූපයෙහි බැස රූපයෙන් නැගේ.

5. එක පැහැර පස්කඳ ම අරමුණුව බැස පස්කඳින්ම නැගේ යයි මෙසේ පස් අයුරකින් දෙසූ සේක. මේ පස්වන විදර්ශනාව තියුණු ප්‍රඥා ඇති මහ පිණැති යනටය.

1. "විපස්සනා නියමේනහි සුක්ඛවිපස්සකස්ස උප්පන්නො මග්ගොපි" (208 අත්‍ථසාලිනී)
විදර්ශනා නියමයෙන් සුක්ඛ විපස්සකයාට උපන් මග ද

3. ප්‍රථම ධ්‍යානය පාදක කොට ලැබෙන ලැබෙන සංස්කාරයන් මෙනෙහි කොට උපන් මාර්ගය ද ලෝකෝත්තර ප්‍රථම ධ්‍යානික නම් වේ. එම සිත් සියල්ලෙහිම බොජ්ඣඞ්ග සතම යෙදෙති. මාර්ග අංග අටම යෙදෙති. ධ්‍යානාංග පසම යෙදෙති. මේ සිත්හි පූර්වභාග විදර්ශනාව සෝමනස්ස සහගතව හා උපෙක්ෂා සහගතව දෙකින් ම මිශ්‍රව විය හැකිය. සංඛාරුපෙක්ඛා හෙවත් ව්‍යුත්ථාන ගාමිනී විදර්ශනාවට පැමිණ මාර්ග සිත් ලැබෙන කාලයෙහි සෝමනස්ස සහගත නම් වේ.

**පඤ්චකනයෙන්**

දෙවැනි, තුන්වැනි, සතරවැනි, පස්වැනි ධ්‍යානයන් පාදකකොට ලැබෙන මාර්ග සිත්හි ධ්‍යානාංග පිළිවෙළින් සතර තුණ, දෙක, යෙදෙති. මේ සියල්ලෙහි විතර්කය නො යෙදෙන හෙයින් මාර්ග අංග සතක්. සතරවැනි පස්වැනි සිත්හි බොජ්ඣඞ්ග සයකි. පීති සම්බොජ්ඣඞ්ගය නොලැබේ. අරූප ධ්‍යානයන් පාදක කොට උපදවන ලද මාර්ග සිත්හිද ධ්‍යානාඞ්ග දෙකකුත් බොජ්ඣඞ්ග සයකුත් මාර්ගාංග සතකුත් ලැබේ.

මෙසේ පාදකධ්‍යානයට අනුව ධ්‍යානාංගාදිය යෙදෙන්නේ පාදක ධ්‍යානයෙන් නැගී (ඉතා ආසන්නයේ දීම) විදර්ශනාවට බට හෙයින් ය. පාදක ධ්‍යානයද අර්පණා සිතකි. ලෝකෝත්තර සිත් ද අර්පණා සිත්ය. අරමුණෙහි ඉතා තදෙන් නැග සිටින්නෝය. නිල් එළියක් යටට පැමිණෙන හැම දෙයක් ම නිල් පැහැය ගන්වන්නාක් මෙන් පාදක ධ්‍යානය ඉතා ලඟම නිරුද්ධවූ හෙයින් එහි තේජාව ගෙණ ලොවුතුරු ධ්‍යානය පහලවන බව තේරුම් ගතයුතුය විතර්කය නැතිව දෙවැනි ධ්‍යාන සිත අර්පණා ප්‍රාප්ත වේද එය පාදක කර ගත් ලෝකෝත්තර සිතට ද විතර්කය නොමැතිව අරමුණු ගත හැකිය. එය න්‍යායානුකූලය. මෙසේ පාදකජ්ඣාන වශයෙන් පමණක් ධ්‍යානයන් පඤ්චවිධාවෙත්

ඉතා හොඳට පුහුණු කළ සිත සිතු කෙණෙහි ඒ ඒ ධ්‍යාන යන්ට පැමිණිය හැකි කෙණෙකුට සමසිත ධ්‍යානයට අනුවත් ධ්‍යානාංග යෙදෙන බව සමහර ඇදුරුවරුන්ගේ අදහසය.

නිමිත්ත හා පැවැත්ම.

ගොත්‍රභූසිත නාමරූප හෙවත් සංස්කාර නිමිත්තෙන් නැගී සිටියි. හෙවත් සංස්කාරයන් අරමුණු නොකොට එය නිවණම අරමුණු කරයි.

මාර්ග සිත සංස්කාරයන්ගේ පැවැත්මෙන් හෙවත් සංස්කාර වෘත්තියෙන් ද නැගී සිටියි. මෙසේ නිවණ අරමුණු කරමින් සංස්කාරයන් කොටස් වශයෙන් නෝ නොපැවැත්වීමට පත්කරණ හෙයින් නිමිත්ත හා පැවැත්ම දෙකෙන්ම නැගී සිටිනා හෙයින් මාර්ග සිත උභතෝ වුට්ඨාන නම්වේ. මාර්ග සිතෙන් අනුසය කෙලෙසුන් ප්‍රහාණය කරයි. නිමිත්ත යනුදු පඤ්චස්කන්ධ නිමිත්තයි.

පැවැත්ම යනුදු පඤ්චස්කන්ධයන්ගේ පැවැත්මයි.

සෝවාන් මාර්ග සිතෙන් දිට්ඨියුක්ත සිත් සතරත් විචිකිච්ඡා සහගත සිතත් යන අකුශල් සිත් පස ප්‍රහාණයවේ. ඒ සමග යෙදෙන වේදනා සඤ්ඤා සංඛාර හා එම සිතෙන් උපදනා චිත්තජ රූපයන් ද යන පඤ්චසකන්ධයම නොපැවැත්මට පැමිණේ.

සකෘදාගාමි සිතෙන් දිට්ඨිවිප්පයුත්ත සතරත් දෞමනස්ස සහගත දෙසිතත් ඕලාරික කාමරාග ව්‍යාපාද වශයෙන් සසිතක් ප්‍රහාණය වේ.

අනාගාමි මාර්ගයෙන් අනුශය සහගත එම සිත් සයම ප්‍රහාණය වේ.

අර්හත් මාර්ගයෙන් දිට්ඨිවිප්පයුත්ත සතරත් උද්ධච්ච සහගතයත් යන පස අකුසල් සිත් හි පැවැත්ම නවතී. ප්‍රහාණය වේ.

## සෝවාන් මගින්

සක්කායදිට්ඨි, විචිකිච්ඡා, සීලබ්බත පරාමාස විචිකිච්ඡානුසය, දිට්ඨානුසය, යන පස්වැදෑරුම් කෙලෙසුන් නැතිකර දමයි. අභිසංඛාර විඤ්ඤාණයාගේ හෙවත් ප්‍රතිසන්ධි විපාක දියහැකි කර්මයාගේ ශක්තිය ආත්ම සතකට සීමා කරණ හෙයින් එයින් මතු පැවැත්මක් ඇති නොකරයි. එහෙයින් උපාදින්නක අනුපාදින්නකයන්ගේ පැවැත්මෙන් නැගීම වේ.

## සකෘදාගාමි මගින්

ඕලාරික කාමරාග, පටිඝ සංයෝජනයන් හා ඕලාරික කාම රාග පටිඝ අනුශයන්ද ප්‍රහාණය වන බැවින් සකෘදාගාමීහට ආත්ම භාව දෙකක ඉපදීම කර්ම ශක්තිය ඉතුරුවී සෝවාන් මගින් නියමිත ඉතිරි ආත්ම භාව පහක ඉපදීමේ ශක්තියද නැතිව යන්නේය.

## අනාගාමි මගින්

අනුසහගත කාමරාග පටිඝ සංයෝජන දෙක ද අනුසහගත කාමරාග පටිඝ අනුශයන් ද ප්‍රහාණය වන බැවින් අනාගාමිහට එක භවයක් හැර දෙවෙනි භවයෙහි ඉපදීම සිද්ධ නොවේ.

## අරහත් මගින්

රූප රාග, අරූප රාග, මාන, උද්ධච්ච, අවිජ්ජා, මානානුසය, භවරාගානුසය, අවිජ්ජානුසය, මෙම අටවැදෑරුම් කෙලෙසුන් නැතිවන හෙයින් රූපාරූප භවයෙහි ප්‍රතිසන්ධියක් නොදේ.

මහා ප්‍රඥයාට අනුලෝම ජවන් දෙකකි. තුන ගොත්‍රභූය. සතර මාර්ග ජවනයයි ඵල සිත් තුනකි.

මධ්‍යමයාට අනුලෝම 3 කි. සතර ගොත්‍රභූය. පස්වැන්න මාර්ග සිතයි. ඵල සිත් දෙකයි.

මන්දප්‍රාඥයාට අනුලෝම 4 යි පස්වැන්න ගොත්‍රභූය

සවැන්න මග සිතයි. සත්වැන්න ඵල සිතයි. එතනින් භවංග ගත වේ.

දූත් මාර්ග සිත පහල වේයැයි සිතෙන තරමට විදර්ශනාව දියුණුවී ගිය පසු භවංගචලන උපච්ඡේද සිත් සිඳී මනොද්වාරා වජ්ජන සිත පහළව විදර්ශනාවට ගොදුරුවූ ස්කන්ධයන් අරමුණුකොට බිඳෙයි.

එම අරමුණම ගණිමින් පළමු අනුලෝම ජවනය ද එම ස්කන්ධයන්හි ම අනිත්‍යාදි ලක්ෂණ අරමුණු කෙරෙමින් සත්‍යයන් වසන අඳුර නසමින් පහල වෙයි. දෙවෙනි අනුලෝම ජවනය පළමු අනුලෝමයාගේ ආසෙවනය ලබමින් බලවත් වද තුන්වෙනි අනුලෝම ජවනය එයටත් වඩා බල වත්වද අඳුර නසමින් පහල වෙයි. ඉන්පසු ගොත්‍රභූ ජවනය නිවන් අරමුණු කොට පහල වෙයි.

- එම ගොත්‍රභූ සිතින් කරන ලද සංඥාව අනුව මාර්ග සිත මින්පෙර නොබිඳි ලෝභාදි කෙලෙසුන් නසමින් ශාන්ත නිවන් සුවය අරමුණු කරමින් පහළ වන්නේය.

73

## නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස

# ලෝකුත්තර කුසල්

# විසි මහා නය.

කතමෙ ධම්මා කුසලා?''

යස්මිං සමයෙ ලොකුත්තරං මග්ගං භාවෙති. නීය්‍යානිකං අපචය ගාමිං දිට්ඨිගතානං පහාණාය පඨමාය භූමියා පත්තියා''

කුසල් දහම් කවරහුද? යම් වේලාවක ලෝකෝත්තර මාර්ගය වඩා ද නිවණට පමුණුවන, නොරැස් කිරීමට යන දෘෂ්ටීන් ප්‍රහාණය සඳහා පළමු භූමියට පමුණුවන (ලෝකෝත්තර මාර්ගය වඩාද?)

මෙසේ ශාන්ති නායක සම්බුදු රජාණන් වහන්සේ සෝවාන් මාර්ග සිතට ලොකුත්තර මග්ග ලෝකෝත්තර මාර්ගය යන නාමය දුන්සේක. මෙයට පෙර ලොකුත්තරං ඣානං යනුවෙන් සෝවාන් මාර්ග සිත දෙසූ සේක. එකම සෝවාන් සිත ඒ ඒ අදහස් තේරුම්වලට අනුව ඣාන - මග්ග සතිපට්ඨාන - යනාදී නම් විස්සකින් (20) දෙසූ සේක. ඒ ඒ පුද්ගලයන්ට ඒ ඒ නම් වඩාත් පහසුවෙන් වැටහෙණහෙයින් පුද්ගලයන්ගේ අදහස් වශයෙන්ද නොඉතුරුව සියල් දත් නුවණින් පිරිසිඳ දේශනා විලාශ වශයෙන්ද මෙසේ දෙසූ බව සැලකිය යුතුය.

1. පළමු භූමි (සෝවාන්) සිතට ලොකුත්තර ඣාන නාමය වදාළේ "උපනිජ්ඣායනට්ඨෙන" අරමුණට සමීපව බලවත් ලෙස සිත යෙදවීම ධ්‍යාන නාමයෙන් ගණු ලබන හෙයිනි. ලෝකෝත්තර අර්පණ සිත් ද ඉතා ලංව අරමුණෙහි බලවත් ලෙස සිත යොදවනු ලැබේ. එහෙයින් ඣාන නමින් මුලින්ම දෙසූ සේක.

2. ලෝකුත්තරං මග්ගං භාවේති නීය්‍යානට්ඨෙන" පැමිණවීමය යන තේරුමෙන් මග්ග (මාර්ග) නම් වේ. මග්ග ශබ්දයේ නොයෙක් තේරුම් ඇත ද මෙහි ගණු ලබන්නේ නිවණ කරා පැමිණවීම යන අර්ථයයි

3. ලෝකුත්තරං සතිපට්ඨානං භාවේති. සතිපට්ඨාන නම් සිහිය එළෙඹ සිටීම යි. සිහිය පිහිටුවීම යි. එහෙයින් එළෙඹ සිටීම. අර්ථයෙන් සෝවාන් මාර්ග සිතට සති පට්ඨාන යැයි කිවහැකිය.

4. ලෝකුත්තරං සම්මප්පධානං භාවේති. සම්මප්පධාන නම් මනා වීය්‍ය්‍යය යි. පදහනට්ඨෙන=මනා උත්සාහයක් දැරීම් අර්ථයෙන් ලොවුතුරු සිතට සම්මප්පධාන යැයි දෙසූ සේක.

5. ලෝකුත්තරං ඉද්ධිපාදං භාවේති. ඉද්ධිපාද නම් ඡන්දාදී සතරයි. අදහස සමෘද්ධ වීම් අර්ථයෙන් (ඉජ්ඣනට්ඨෙන) ඉද්ධිපාද යැයි වදාළ සේක.

6. ලෝකුත්තරං ඉන්ද්‍රියං භාවේති. ඉන්ද්‍රිය නම් සද්ධාදීන්ගේ අධිපති හෙවත් ප්‍රධානත්වය දැරීම් යි. අධිපති අර්ථයෙන් (ආධිපතෙය්‍යට්ඨෙන) ඉන්ද්‍රිය නාමය දැක්වූ සේක.

7. ලෝකුත්තරං බලං භාවේති. බල නම් සද්ධාදීන්ගේ කම්පා නොවීමයි. කම්පා නොවන අර්ථයෙන් (අකම්පියට්ඨෙන) බල නාමය දුන් සේක.

8. ලෝකුත්තරං බොජ්ඣඞ්ගං භාවේති ලොවුතුරු බොජ්ඣඞ්ගය බවයි. මෙහි බොජ්ඣඞ්ග නාමය සෝවාන් මාර්ග සිතට දෙන ලද්දේ අවබෝධ කරවන අර්ථයෙනි බුජ්ඣනකට්ඨෙන) මෙතෙක් සත්තිස් බොධිපාක්ෂිකයන් කොටස් වශයෙන් ගෙණ ඒවා ලොවුතුරු සිත්හි ලොවුතුරු තත්වයෙන් යෙදෙන හෙයින් ඒ ඒ නාමයන්ගෙන් පළමු භූමි සිත හැඳිවීම ද සුදුසු බව දක්වා වදාළසේක.

9. ලෝකුත්තරං සච්චං භාවේති. ලොවුතුරු සත්‍යය වඩාද, මෙහි සත්‍යය යනුවෙන් ලොවුතුරු සිත දක්වා වදාළේ

තථාර්ථ යෙනි. (තථට්ඨෙන) හෙවත් එසේම වන වෙනස් නොවන යන තේරුමෙනි. මාර්ග සත්‍යයෙහි හෙතුට්ඨාදී තථාර්ථ සතරක් දක්වා ඇත.

10. ලොකුත්තරං සමථං භාවෙති. ලොවුතුරු සමථය වඩාද? සමථ නාමයෙන් ලොවුතුරු සිත මෙසේ දක්වා වදාළේ අවික්ෂෙපාර්ථයෙනි (අවික්ඛෙපට්ඨෙන) වික්ෂෙප යක් විපිළිසරයක් වෙනස්වීමක් නොවන යන තේරුමෙනි.

11. ලොකුත්තරං ධම්මං භාවෙති. ලොවුතුරු දහම් වඩාද? ධම්ම ශබ්දයෙන් මෙහි මගසිත හඳුන්වා වදාළේ ආත්ම ශූන්‍ය තාර්ථයෙනි (සුඤ්ඤතට්ඨෙන) නිඃසත්ත්ව නිර්ජීව යනු ද ධර්ම ශබ්දයේ එක් තේරුමකි.

12. ලොකුත්තරං ඛන්ධං භාවෙති. ලෝකෝත්තර ස්කන්ධ යන් වඩයි ද මෙහි ඛන්ධ නාමයෙන් ද සෝවාන් මග සිත ගන්නා ලදී. වෙදනා, සඤ්ඤා, සංඛාර, විඤ්ඤාණ යන ස්කන්ධ සතරය මාර්ග සිතට (රාසට්ඨෙන) එහෙයින් ස්කන්ධ නාමයද යෙදිය හැක.

13. ලොකුතතරං ආයතනං භාවෙති. ලෝකෝත්තර ආයතන වඩ යි ද, මෙහි මනායතන ධම්මායතනයන් ගෙණ ලොවුතුරු ආයතන නාමය යෙදූ බව පැහැදිලිය. ආයතනාර්ථයෙන් (අයතනට්ඨෙන) එක්ව යෙදෙන ධර්මයන්ගේ උත්පත්ති ස්ථානය යන තේරුමෙනි.

14. ලොකුත්තරං ධාතුං භාවෙති. ලෝකෝත්තර ධාතුව වඩා ද ශූන්‍ය ස්වභාවය නිස්සත්තාය යන තේරුම්වලින් (සුඤ්ඤ; සභාව නිස්සත්තට්ඨෙන) ධාතු යනුවෙන් ලොවු මගසිත දෙසූ සේක.

15. ලොකුත්තරං ආහාරං භාවෙති. ලොවුතුරු ආහාරය වඩයි ද මෙහි ආහාර නාමය දී තිබෙන්නේ ප්‍රත්‍යය යන තේරුමෙනි. (පච්චයට්ඨෙන) ඵස්සාදී නාමාහාර යන් ලොවුතුරු සිත්හී යෙදේ.

16. ලොකුත්තරං ඵස්සං භාවෙති. ලොවුතුරු ස්පර්ශය වඩා දී? ඵුසනාර්ථයෙන් ඵස්සය ගණු ලැබේ. එද ලෝකෝත්තර සිත්හි ද යෙදෙන චෛතසිකයෙකි.

17. ලොකුත්තරං වේදනං භාවෙති. ලොවුතුරු වේදනාව වඩයිද? විඳවීම යන අර්ථයෙන් (වෙදයිතට්ඨෙන) වේදනා යැයි මග සිතට නම් දුන්සේක. වේදනා චෛතසිකය ප්‍රධානව ගෙණ වදාළ බවයි.

18. ලොකුත්තරං සඤ්ඤං භාවෙති. ලොවුතුරු සංඥව හෙවත් සඤ්ඤා චෛතසිකය හැඳිනීම් අර්ථයෙන් (සංජානනට්ඨෙන) මග සිත දැක්වූ සේක.

19. ලොකුත්තරං චෙතනං භාවෙති. ලොවුතුරු චෙතනාව චේතනා චෛතසිකය ගෙණ සිතවන හෙසින් (චෙතසි-කට්ඨෙන) චේතනා යැයි මගසිතට නම් දුන් සේක.

20. ලොකුත්තරං චිත්තං භාවෙති. ලොවුතුරු සිත වඩයි. දැනගැනීම් අර්ථයෙන් (විජානනට්ඨෙන) චිත්තයැයි මග සිතට නම් දුන් සේක.

මෙසේ විජම් පිටකය ඇසූ දෙව් පිරිසට මනාව වැට හෙනසේ එකම ලොවුතුරු සිත 20 ආකාරයකට දෙසූ බව සැලකිය යුතුය. සෝවාන් මාර්ග සිත මෙසේ දක්වා වදාල ක්‍රමයට විසි මහා නය යැයි කියනු ලැබේ. සෝතාපත්ති ආදි නාමයන් අභිධර්ම පෙලෙහි දක්වා නැත, එය සූත්‍රාන්ත යේ එයි.

මෙසේ දහම් දැන විදසුන් වඩා නිවන් සැප ලබත්වා!

# 74

### නමො සම්මා සම්බුද්ධස්ස

## ලෝකෝත්තර කුසල්.

# අධිපති සතර සහ දහසක් නය

"කතමෙ ධම්මා කුසලා?"

යස්මිං සමයෙ ලොකුත්තරං ඣානං භාවෙති. නීය්‍යානිකං අපචය ගාමිං දිට්ඨිගතානං පහාණාය පඨමාය භූමියා පත්තියා, විවිච්චෙව කාමෙහි විවිච්ච අකුසලෙහි ධම්මෙහි සවිතක්කං සවිචාරං විවේකජං පීතිසුඛං පඨමජ්ඣානං උපසම්පජ්ජ විහරති, දුක්ඛා පටිපදං දන්ධාභිඤ්ඤං

ඡන්දාධිපතෙය්‍යං-
විරියාධිපතෙය්‍යං-
චිත්තාධිපතෙය්‍යං-
විමංසාධිපතෙය්‍යං-

කුසල් දහම් කවරහු ද? යම් වේලාවක සසරින් එතර පමුණුවන රුස් නොකිරීමට යන සක්කාය දිට්ඨිය හා එක්ව යෙදෙන කෙලෙසුන්ගේ ප්‍රහාණය පිණිස පවතින පළමු භූමියට පැමිණීම පිණිස ලෝකෝත්තර ධ්‍යානය වඩා ද? කාමයන්ගෙන් වෙන්ව අකුශලයන්ගෙන් වෙන්ව විතර්ක විචාර සහිත වූ විවේකයෙන් හටගත් ප්‍රීතිය හා සැපය ඇති දුක් වූ ප්‍රතිපදාවෙන් හා ලැසි වූ අවබෝධයෙන් ඡන්දය අධිපතිකොට ප්‍රථම ධ්‍යානයට පැමිණ වෙසේ. එසේම වීය්‍යීය අධිපතිකොට, චිත්තය අධිපතිකොට, විමංසාව අධිපතිකොට පැමිණ වෙසේ

අධිපති

අතිකුත් චිත්ත චෛතසිකයන් මැඩ පමිත්වා තම

ශක්තිය පෙන්වන අධිපති බව දරණ "ඡන්ද" චෛතසිකය, වීර්‍ය චෛතසිකය, ද්විහේතුක ත්‍රිහේතුක ජවන් සිත් හා ප්‍රඥා චෛතසිකය යන මෙම සතර ඒ ඒ අවස්ථාවන්හි අනුව අධිපති ශක්තියෙන් ක්‍රියා කෙරේ. මෙම සහජාතාධිපතීන් (පට්ඨාන දේශනා සාරය 51 සිට බලන්න) එකක් අධිපති ශක්තියෙන් ක්‍රියා කරණ විට අනික්වා යටත්ව පවතී, සතරම එකවර අධිපති නොවේ.

**අවසාන බෙදීම**

ප්‍රථම භූමි ලෝකෝත්තර අවසාන වශයෙන් සතර අධිපති ධර්මයන්ගෙන් බෙදා වදාළ සම්මා සම්බුද්ධ රජාණන් වහන්සේ එය දහසක් න්‍යායයෙන් යුක්ත කොට දක්වා වදාළ බව අත්ථසාලිනී අටුවාව කියයි. එම දහසක් නය මෙසේ දැක්වේ.

**සහස්‍ර ක්‍රමය**

පළමුව වදාළ ලොවුතුරු සිත (සෝවාන්)

---

"යස්මිං සමයෙ පෙ-(65 වැනි පාඨම බලන්න)

දෙවැනිව වදාළ ලොවුතුරු සිත (සෝවාන්)

"යස්මිං සමයෙ පෙ- (66 වැනි පාඨම බලන්න.)

මේ සිත රූපාවචර ප්‍රථම ධ්‍යානය පාදක කොට දෙසූ සේක මෙසේ ධ්‍යානයන්ගේ සතර පස් ක්‍රමයෙන් සිත් නවයක් වදාළසේක.

**පටිපදා භේදයන්**

(1) එම සිත් සුද්ධික පටිපදා නාමයෙන් ගෙණ චතුක්ක පඤ්චක න්‍යාය භේදයෙන් නය දෙකක් කොට වදාළ සේක.

(2) සුඤ්ඤත නාමයෙන් (දුක්ඛා පටිපදාදීන් තොරව) වදාළ කොටසෙහි චතුක්ක පඤ්චක නයින් නය දෙකකි.

(3) සුඤ්ඤත මූලක පටිපදා නාමයෙන් දැක්වූ කොටසෙහි චතුක්ක පඤ්චක නයින් නය දෙකකි.

(4) අප්පණිහිත නාමයෙන් දැක්වූ කොටසෙහි ද චතුක්ක පඤ්චක නය දෙකකි.

(5) අප්පණිහිත මූලක පටිපදා කොටසෙහි ද චතුක්ක පඤ්චක නය දෙක යැ යි මෙසේ "නය" දසයෙකි.

ලොකුත්තර "ඣාන" නාමයෙන් දෙසූ මෙම නය දසයම ලොකුත්තර "මග්ග" නාමයෙන් දැයි මෙසේ 73වැනි පාඩමේ දැක්වෙන විසි වැදෑරුම් ක්‍රමයෙන් වැඩීවී නය (200) දෙසියයක් වෙයි.

එසේම ඡන්දාධිපති දෙසියයක් ද (200)
චිත්තාධිපති දෙසියයක් ද (200)
විරියාධිපති දෙසියයක් ද (200)
විමංසාධිපති දෙසියයක් ද (200)
දහසක් නය වේ **1000**

මෙසේ සෝවාන් මග සිත දහසක් නයෙන් යුත් නමුදු මුලින්ම දෙසූ- මෙහි සඳහන් පළමු ලොවුතුරු සිත මෙම සහස්‍ර නයට ඇතුළත් නොවේ. මෙම දහසක් නය බෙදෙන් නේ ධ්‍යාන පාදක කොටගත් විදර්ශනාවෙනි. එහෙයින් ලෝකෝත්තර ප්‍රථම භූමි සිත් දහසකුත් එකකි.

**පහළ විය හැකි ගණන**

මෙසේ දහසකුත් එකක් ප්‍රථම භූමි (සෝවාන් මාර්ග) සිත් නම් වශයෙන් දක්වා වදාළ නමුදු යෝගීන්ට පහළ විය හැක්කේ සෝවාන් මග සිත් 81 කි. චතුෂ්ක පඤ්චක දෙනයක් ගත් නමුදු චතුෂ්ක නය පඤ්චක නයෙහි ඇතුළත් වන හෙයින් එකමය. වෙනම සිත් නවයක් දැක්විය නො හැකිය.

ධම්ම සංගණියෙහි දැක්වූ අයුරු මෙසේ කෙටිකර ඒ සිත් නවය ගණිමු. චතුක්ක නය

1. පඨම භූමි සවිතක්ක සවිචාර පීති සුඛ එකග්ගතා
දුක්ඛා පටිපදා දන්ධාභිඤ්ඤා සිත
2. ,, ,, පීති-සුඛ-එකග්ගතා දුක්ඛා පටිපදා ,, ,,
3. ,, ,, සුඛ-එකග්ගතා ,, ,, ,, ,, ,,
4. ,, ,, උපෙක්ඛා එකග්ගතා ,, ,, ,, ,, ,,

පඤ්චක නය.

1. ප්‍රථම භූමි සවිතක්ක සවිචාර පීති සුඛ එකග්ගතා දුක්ඛා පටිපදා දන්ධාභිඤ්ඤා සිත
2. ,, ,, සවිචාර පීතිසුඛ එකග්ගතා දුක්ඛා පටිපදා දන්ධාභිඤ්ඤා සිත
3. ,, ,, පීති සුඛ ,, ,, ,,
4. ,, ,, සුඛ ,, ,, ,,
5. ,, ,, උපෙක්ඛා ,, ,, ,,

චතුක්කනයෙහි සිත් සතර පඤ්චක නයෙහි 1, 3,-4, 5 යන සිත්හි ඇතුළත් වේ.

මෙසේ අගකිත ගහණ නීතියෙන් ගත්නා කල නය දෙක එකම නයක ඇතුළත්වේ.

එවිට,

| | | | | | |
|---|---|---|---|---|---|
| සුද්ධික පටිපදා- | එම සිත් | 5- | පටිපදා භේදයෙන් | 20- | |
| | | | අධිපති භේදයෙන් | | 80 |
| සුඤ්ඤත- | ,, | 5- | | ,, | 20 |
| සුඤ්ඤත මූලක පටිපදා | ,, | 5- | ,, | 20- ,, | 80 |
| අප්පණිහිත | ,, | 5- | | | 20 |
| අප්පණිහිත මූලක | ,, | 5- | ,, | 20- ,, | 80 |
| ධ්‍යාන පාදක නොකොට මුලින් වදාළ සිත | | | | | 1 |
| | | | | | 281 |

මේ සිත් 281 වෙන වෙනම දක්විය හැකි හෙයින් ප්‍රථම භූමි (සෝවාන්) සිත් පහළ විය හැක්කේ මෙතෙක් බව සැලකිය යුතුය.

විසිමහා නය වශයෙන් පුද්ගලාවබෝධය සඳහා ධ්‍යාන-මග්ග ආදී නම් වශයෙන් පමණක් මෙම සිත්වල ටම දෙසූ බව සැලකිය යුතු ය.

සම්‍යග්දෘෂ්ටික පිත්වත් බෞද්ධයින් බලාපොරොත්තු වන්නේ ශාන්තිනායක සම්මා සම්බුද්ධ භාග්‍යවතුන් වහන්සේගේ මෙම උතුම් දර්ශනයෙන් ශාන්ත නිවන් සැප ලැබීමටය

මෙසේ දහම් දැන විදසුන් වඩා නිවන් සැප ලබත්වා !

# 75

නමො සම්මා සම්බුද්ධස්ස.

## ලෝකුත්තර කුසල්

## දුතිය තතිය මග්ග සිත්.

"කතමෙ ධම්මා කුසලා?"

යස්මිං සමයෙ ලොකුත්තරං ඣානං භාවෙති, නීය්‍යා ණිකං අපචය ගාමිං කාමරාග ව්‍යාපාදනං තනුභාවාය දුති යාය භූමියා පත්තියා.

විවිච්චෙව කාමෙහි විවිච්ච අකුසලෙහි ධම්මෙහි සවි තක්කං සවිචාරං විවේකජං පීති සුඛං පඨමජ්ඣානං උප සම්පජ්ජ විහරති. දුක්ඛාපටිපදං දන්ධාභිඤ්ඤං.

කුසල් දහම් කවරහුද?

යම් සමයෙක්හි ලොවුතුරු ධ්‍යානය වඩාද? නිවන් පිණිස නොරැස්කිරීමට යන කාමරාග ව්‍යාපාදයන් තුනී කිරීම පිණිස දෙවෙනි භූමියට පැමිණීමට (ලොවුතුරු ධ්‍යානය වඩාද) කාමයෙන් අකුසලයන්ගෙන් වෙන්ව විතර්ක සහිත වූ විචාර සහිත වූ විවේකයෙන් හටගත් ප්‍රීතිය හා සැපය ඇති ප්‍රථමධ්‍යානයට පැමිණ වෙසේ. දුක්වූ ප්‍රතිපදා වෙත් හා ලැසිවූ අවබෝධයෙන්,

ශාන්ති නායක සම්මා සම්බුද්ධ අමාමෑණියන් වහන්සේ දෙවෙනි මාර්ග සිත දෙසනසේක් කාමරාග ව්‍යාපාදයන් තුනී කිරීමෙක් දෙවෙනි භූමි සිතට පැමිණීමට ලොවුතුරු ධ්‍යානය වැඩීම මෙයින් උගන්වා වදාළ සේක.

මෙතෙක් වදාළ පළමු භූමි සිතින් හෙවත් සෝවාන් මාර්ග සිතෙන් දිට්ඨිගත අකුශලයන්ගේ ප්‍රහාණය හෙවත් වැනසීම දක්වන ලදී. එහි දිට්ඨිගතානං පහානාය සඤ්ඤාය

දිට්ඨි විචිකිච්ඡා සීලබ්බත පරාමාසයන් ද ලෝභමූල දිට්ඨිගත සම්පයුත්ත අකුසල් සතරද විචිකිච්ඡා අකුශලය ද ගන්නා ලදී. එසේම අකුශලයන්ගේ අපායගාමී ශක්තිය ද ප්‍රහාණය කෙරේ.

මෙහි කාමරාග යනුවෙන් ලෝභය හෙවත් කාමාශාවත් ද ව්‍යාපාද යන්නෙන් ද්වේෂය ද ගැණේ. මෙයින් ලෝභ ද්වේෂයන්ගේ බර කොටස් දුරුවන බව දක්වූ සේක. සම්පූර්ණයෙන් කාමරාග ව්‍යාපාදයන් දුරුවීම නොව තුනීවීම තනුභාවය මෙයින් උගන්වන ලදී.

මෙම තුනී බව දෙකරුණකින් දත හැක.

එනම්:- 1. අභිණ්හුප්පත්තියා, කලාතුරකින් උපදින හෙයින් හා

2. පරියුට්ඨාන මන්දතාය නැගී සිටීම දුබලහෙයින්ද යන දෙකරුණෙනි.

සකෘදාගාමී ආර්‍යයන් වහන්සේට සසර ගමන් කරණ මහාජනයාට මෙන් කෙලෙස් නිරතුරු නූපදින් ඉදහිට කලාතුරකින් පහළ වෙත්. එහෙයින් නිතර කෙලෙස් නූපදින නිසා ඔහු කෙලෙස් තුනි කළ පුද්ගලයෙකි. පාලු කෙතක ඉදහිට ගොයම් ගස් පෙනෙන්නා සේ ඔහුගේ සන්තානයෙහි ද කලාතුරකින් කෙලෙස් හටගත හැකිය.

එසේම කෙලෙසුන්ගේ නැගඒම ද මදින් මද ටිකෙන් ටික සිදුවේ. වට්ටානුසාරි (සසර රවුමෙ යන) මහජනතාව මෙන් පෙළමින්, පතුරුවමින්, වසමින් අන්ධකාර කරමින් සකෘදාකාමී උතුමන්ට කෙලෙස් නූපදිත්. සෝවාන් සකෘදාගාමී මාර්ග සිත් දෙකකින් ප්‍රහීණ හා බල අඩුකළ හෙයින් හීන් හීන් වලාකුළු අහසට නගින්නා සේ මද මද තුනීව පහළ වෙත්.

එහෙත් ඇතැම් තෙර කෙනෙක්, සකෘදාගාමීන්ට කෙලෙස් පහලවීම කල් යැමකින් සිදුවුව ද එසේ උපදින කෙලෙස් බහුලව, තදව උපදිත්. එවුනට දූ පුතුන් ද

වෙත්යැයි කීහ. එය ප්‍රමාණවත් සාක්ෂ්‍යයක් නොවේ. දූ පුතුන් ඇඟ අතගෑවීමෙන් පවා විය හැකිය. දෙමඟෙකින් ප්‍රහීණ බැවින් සකෘදාගාමීන්ට කෙලෙස් පහළවීම කලාතුරකින් මෙන් ම මඳව ද පහළ වෙත්.

දුතියාය භූමියා පත්තියා යනුවෙන් ශ්‍රමණ ඵලය හෙවත් මෙහි සකෘදාගාමී බව අභිමතයි.

මෙහි අඤ්ඤින්ද්‍රිය යනු පමණක් චෛතසිකයන් ගෙන් අමුතුව සෝවාන් සිතෙහි අනඤ්ඤාතඤ්ඤස්සාමීතින්ද්‍රිය වෙනුවට දක්වන ලදී. අඤ්ඤින්ද්‍රිය යනු සෝවාන් මග නැණින් දත් චතුරාර්‍ය්‍යයම දැනගන්නා ලොවුතුරු නුවණයි.

මෙහි දක්වන ලද ධ්‍යාන පාදක නොකළ සිත මෙන් ම

සුද්ධික පටිපදානය
සුඤ්ඤත නය
සුඤ්ඤත මූලක පටිපදානය
අප්පණිහිත නය
අප්පණිහිත මූලක පටිපදානය

යන පස් ආකාර සකෘදාගාමී සිත චතුක්ක පඤ්චක ධ්‍යාන භේදයෙන් බිඳී පටිපදා භේදයෙන් හා අධිපති භේදයෙන් ගුණ වී සකෘදාගාමී මග්ග සිත ද දහසක් තයින් යුක්ත වන්නේය.

---

## තතිය මග්ග සිත

කතමෙ ධම්මා කුසලා?

යස්මිං සමයෙ ලොකුත්තරං ඣානං භාවෙති නිය්‍යානිකං අපචය ගාමිං කාමරාගබ්‍යාපාදානං අනවසෙසපහාණාය තතියාය භූමියා පත්තියා

විවිච්චෙව කාමෙහි විවිච්ච අකුසලෙහි ධම්මෙහි සවිතක්කං සවිචාරං විවේකජං පීතිසුඛං පඨමජ්ඣානං උපසම්පජ්ජ විහරති දුක්ඛා පටිපදං දන්ධාභිඤ්ඤං

මෙහි වෙනසකට තිබෙන්නේ කාමරාග හෙවත් කාම තෘෂ්ණාවත් පටිඝ හෙවත් ද්වේෂයත් ඉතුරු නොකොට

නැතිකර දැම්මයි. මෙයින් අදහස් කරන්නේ සම්පූර්ණ ද්වේෂ මූලික සිත් දෙකම නැතිකර දැම්මත් තෘෂ්ණාවගේ කාමාවචර කොට නැසීමෙත් කාමභූමිත් කී ඉපදීම නැති කිරීමත්ය.

පටිඝ සම්පයුත්ත දෙසිත සම්පූර්ණයෙන් අනාගාමී සිතින් ප්‍රහීණවන නිසා ලෝභ මෝහයන්ගේ සියුම් කොටස් තව ඉතුරුවේ. යටට බැඳ තබන හෙවත් ඔරම්භාගිය සංයෝජන ධර්ම පස මෙතෙකින් ප්‍රහාණය වූ බව සැලකිය යුතුය. බහල කෙලෙසුන් සිඳුණු බවත් ඉතිරිව ඇත්තේ ද බෙලහීන වූ සියුම් කෙලෙසුන් බවත් සැලකිය හැක. මේ කාම රාගය, ගේ—පටිඝ හෙවත් ද්වේෂයාගේ බිහිසුණු බහල කම පෙනී යන්නේ සකෘද ගාමී මග්ග සිතින් බෙලහුන් කොට අනාගාමී මග්ග ඤාණීන් ඉතුරු නැතිවම ප්‍රහාණය සිදු කරන්නට මෙසේ මග සිත් දෙකක් ම වුවමනා වූ හෙයිනි.

ඒ අනාගාමී හෙවත් තතිය භූමි සිත ද පෙර පරිදිම සුද්ධික පටිපදා දී භේදයන්ගෙන් හා ධ්‍යාන විසි මහා නය අධිපති ආදී භේදයන් ගෙන් ද ගුණ වී දහසක් නය වන්නේය. මේ නය දහසට බෙදීම මෙන් ම විසිදහස් ආදී න්‍යාය ක්‍රමවලට බෙදී යෑම මතු සඳහන් කරමු.

මෙසේ උතුම් ලොව්තුරු සිත් දැන විදසුන් වඩා එයින් ශාන්ත නිවන් සැප ලබත්වා!

# 76

### නමො සම්මා සම්බුද්ධස්ස

## ලෝකුත්තර කුසල්.

## සතර වැනි මාර්ග සිත

"කතමෙ ධම්මා කුසලා?"

යස්මිං සමයෙ ලොකුත්තරං ඣානං භාවෙති, නීය්‍යානිකං අපචය ගාමිං රූප රාග, අරූපරාග මාන උද්ධච්ච අවිජ්ජාය අනවසෙසප්පහාණාය චතුත්ථාය භූමියා පත්තියා විවිච්චෙව කාමෙහි විවිච්ච අකුසලෙහි ධම්මෙහි සවිතක්කං සවිචාරං විවෙකජං පීති සුඛං පඨමජ්ඣානං උපසම්පජ්ජ විහරති, දුක්ඛාපටිපදං දන්ධාභිඤ්ඤං.

**කුසල් දහම් කවරහුද?**

යම් වේලාවක සසරින් එතෙර පමුණුවන රැස් නොකිරීමට යන රූපරාග, අරූපරාග, මාන උද්ධච්ච, අවිජ්ජා යන කෙලෙසුන්ගේ නොසිතුරු ප්‍රහාණය පිණිස සතරවැනි භූමියට පැමිණීමට ලෝකෝත්තර ධ්‍යානය වඩා ද?

කාමයන්ගෙන් අකුශලයන්ගෙන් වෙන්ව විතර්ක විචාර සහිත වූ විවේකයෙන් හටගත් ප්‍රීතිය හා සැපය ඇති ප්‍රථම ධ්‍යානයට පැමිණ වාසය කරයි. දුක්වූ ප්‍රතිපදාවෙන් හා ලැසිවූ අවබෝධයෙන්,

ශාන්ති නායක සම්මා, සම්බුදු අමා මෑණියන් වහන්සේ සතරවැනි භූමි ලොවුතුරු සිත දෙසන සේක් අතිකුත් ලොවුතුරු සිත් දෙසූ අයුරින්ම ලෞකික ධ්‍යානයන් හා අමිශ්‍රකොට හා ඉත්පසු චතුක්ක පඤ්චක දෙනයින් හා සුද්ධික පටිපදා, සුඤ්ඤත, සුඤ්ඤත මූලික පටිපදා අප්පණිහිත, අප්පණිහිත මූලක පටිපදා යන පස් ආකාරයෙන්ද,

ඣාන 1, මග්ග 2, සතිපට්ඨාන 3, සම්මප්පධාන 4, ඉද්ධි පාද 5, ඉන්ද්‍රිය 6, බල 7, බොජ්ඣංග 8, සච්ච 9, සමථ 10, ධම්ම 11, ඛන්ධ 12, ආයතන 13, ධාතු 14, ආහාර 15, ඵස්ස 16 වේදනා 17, සඤ්ඤා 18, චේතනා 19, චිත්ත 20 යන විසි ආකාර මහා නය භේදයෙන් ද දහසක් නය සමන්විතකොට දෙසූ සේක.

එසේම මෙම සතරවැනි භූමි සිතින් ඉතුරු නොවී ප්‍රහා ණය වන නැසෙන කෙලෙස්- රූපරාග, අරූපරාග, මාන, උද්ධච්ච, අවිජ්ජා යනුවෙන් දක්වා වදාළසේක මෙයින් උද්ධම්භාගිය සංයෝජන පස දක්වන ලදී.

රූපරාග: නම් රූපී බ්‍රහ්ම ලෝකයන්හි ඉපදීමට ඇති කැමැත්ත හා යෙදුණු ලෝභය යි.

අරූපරාග: යනුදු අරූපී බඹ ලො ප්‍රතිසන්ධි ගැණීම පිළි බඳව පැවති කැමැත්ත සහිත ලෝභය යි. මෙයින් ඉතා සියුම් වූ භව රාගයත් දක්වන ලදී. කාමච්ඡන්දාදී බිහි සුණු කෙලෙසුන් බහුල සන්තානයන්හි නොව සමාධි යෙන් යටපත්ව 1, 2, 3 මාර්ගයෙන් නැසූ කෙලෙස් බල සිඳුණු සන්තානයන්හි පැවති ලෝභයයි.

මාන. අරහත් මග නැණින් නැසිය යුතු තරම් සියුම් වූ මාන්නය ද නැසේ. මෙයින් අදහස් කරන්නේ මෙම මාන්නාදී කෙලෙසුන්ගේ ද ඕලාරික බර ගති අතින් මාර්ගඥාන බලයෙන් අඩුවන්නේ යැයි වටහා ගත යුතුය.

උද්ධච්ච: ඉහලින් පෙනී සිටිනු කැමති නොසන්සුන් ගති යයි. එම අකුශල චෛතසිකයාගේ ද බර කොටස් කලින් ප්‍රහාණවී ඇත.

අවිජ්ජා අරහත් නැණින් සිඳීමට තරම් සියුම් වූ අවිද්‍යාවය. අනිත් මග නැණින් එහිද බර කොටස් ප්‍රහාණය වී ඇත. අකුසල් යටපත්වීමේ දී එක අකුශලයක යටපත් වීමේ දී එක අකුශලයක යටපත්වීම අනිත් අකුශල යන්ට දූනේ. සෝවාන් මග නැණින් දිට්ඨිය එක්ව

බිහිදුණු ලෝභයත් සැකයත් ඇති ...
නැති වන්නේය ඒ සමග අපායෙහි දුම... ...රම් බල
ඇති අකුශලයක් එම සන්තානයෙහි පහළ නොවේ.

සකදාගාමි අනාගාමි මග නැණින් ද්වේෂයෙහි බලය මැඩ පවත්වා නො ඉතුරුව නැතිකර දමයි.

මෙසේ අරහත් මග නැණින් දිට්ඨියෙන් තොර ලෝභ අකුසල් සතරද ඒ සමගම රූප අරූප භව තෘෂ්ණාවද උද්ධච්ච මෝහ අකුශලය ද අවිද්‍යාවත් ද සම්පූර්ණයෙන් නැති කර දමයි.

සියලු මාර්ග සිත්වල පද පිළිවෙළින් කුසලයන් 60 කි. අනඤ්ඤාතඤ්ඤස්සාමි තින්ද්‍රිය අඤ්ඤින්ද්‍රිය යන දෙකෙන් එක කුත් සම්මාවාචා කම්මන්ත ආජීව යන තුනත් සමග 61 කි ඒ ඒ ධර්මයන් එකවරක් පමණක් ගැණීමෙන් යෙදෙන චෛතසික 33 කි.

නය සැට දහස.

සතර මාර්ග සිත් පිළිබඳ නය සාර දහස ඉහත සඳහන් පරිදි ඉගෙන ගත් පසු ධම්මසංගණී අභිධර්ම මූලග්‍රන්ථය ලඟට දෙසූ විභංග අභිධර්ම ග්‍රන්ථයේ සච්ච විභංගයෙහි නය සැට දහසක් දක්වා ඇත.

මෙම සාරදහස විභංගයෙහි දෙසූ ආකාරයෙන් අට්ඨංගික වාරය, පඤ්චංගික වාරය, සබ්බසංගාහික වාර යයි තුන් වැදෑරුම් වාරයන්ගේ නය පස බැගින් පසළොසක් හෙයින් සාර දහස 15 න් ගුණවී නය සැටදහසක් ලැබේ

විභංග අභිධර්ම ග්‍රන්ථයෙහි ම එන සතිපට්ඨාන විභංගයෙහි විසිදහසක් නය වශයෙන් බෙදා වදාළහ. එසේම එහිම එන සම්මප්පධාන විභංගයෙහි ද විසිදහසක් නය වශයෙන් සතර ලෝකෝත්තර කුශලයන් දක්වන ලදී.

එහි ම ඉද්ධිපාද විභංගයෙහි දෙතිස් දහසක් නයකි. බොජ්ඣංග විභංගයෙහිද එපමණකි මග්ගවිභංගයෙහි අටවිසි දහසකි මෙසේ දේශනා විලාස වශයෙන් සම්මා සම්බුද්ධ රජාණන් අනුත්තර ලෝකෝත්තර කුශලයන් අනන්ත න්‍යායයන් ගෙන් ගවසා දෙසූ බැව් සලකා දහම් දැන වදසුන් වඩා ශාන්ත නිවන් සැප ලබා ගණිත්වා !

"සමයවර්ධන"
මාළිගාකන්ද පාර,
කොළඹ 10